I have mentioned earlier on the Floor of this House a very interesting matter of public importance relating to a firm in Panadura which is racketeering in cycle parts. Exchange has been allocated to this cycle spare parts manufacturer to import parts to assemble spare parts here. He insists on importing parts to manufacture cycle spare parts only from the Sterling Area. I have with me certain documents but I do not have sufficient time to go into this matter in detail. An interesting feature in this dealer's racket is that the cost of the parts he imports to manufacture the spare parts is about twice that of the finished spare parts manufactured abroad. For instance, he imports parts to manufacture the spare parts of the cycle inflator. His factory is supposed to manufacture cycle parts. He is given exchange as a manufacturer of cycle spare parts. Now, he gets down parts of the inflator and assembles them here. He manufactures in Ceylon only the little washer which costs only about two cents; the other parts of the inflator he imports and assembles them here.

Then, again, he imports the material for assembling the cycle fork which costs a few rupees in India or China. He imports it unfinished or unpainted. The cost of his unfinished product is about twice that of the finished imported product. And he calls this local manufacture! The Hon. Minister denied the other day that this is what this man is doing. I am ready to accept a challenge to show him that this Panadura racketeer, who is racketeering in our foreign exchange, is overloading his invoices and on the pretext of manufacturing cycle spare parts is just transferring sterling currency abroad. As I shall be following up this matter later I will not deal with it at length now.

I would again appeal to this Government to appoint a committee composed of Members from both sides of the House to go into the new education proposals of the Hon. Minister of Education, who is the least qualified in the Government to be the Minister of Education, to advice him on those proposals before he scarifices the interests of several lakhs of our children.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

In Dehiowita, my constituency, he is going to find a lot of resistence on this matter. My supporters are up in arms and he is going to find it rather difficult to enforce his mad and idiotic proposals for education reforms there because we would do anything to prevent 4,000 to 5,000 children from being sacrificed every year.

පූ. භා. 10.39

**සුගතදාස අරඹවල මයා. (අක්මීමන)**
*(திரு. சுகததாச அரம்பவல—அக்மீமன)*
(Mr. Sugathadasa Arambewela—Akmeemana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය ලේඛන විවාදයට සහභාගි වන්නට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මට පළමුවෙන් කථා කළ, බොහෝ කාලයක් තිස්සේ මේ ගරු සභාවේ සිටින පළපුරුදු දක්ෂ ගරු මන්ත්‍රීවරයකු වන දෙහිඕවිට ගරු මන්ත්‍රීතුමා නොයෙක් දේවල් ගැන—දේශ සංචාරක ව්‍යාපාරය ගැන, නින්දගම් ඉඩම් පනත් කෙටුම්පත ගැන, අධ්‍යාපනය ගැන, වලවේ ගමන ගැන—සඳහන් කරන්නට තම කාලයෙන් වැඩි කොටසක් මිඩංගු කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය ඇමතිතුමාගේ අළුත් වැඩ පිළිවෙළ අනුව දේශ සංචාරක කටයුතු දියුණු කිරීම නිසා දැන් මේ රටට විශාල වශයෙන් විදේශීය ධනය ඇදී ගෙන එන බව පෙනී යනවා. මගේ ඡන්දදායක කොට්ඨාශයට කිට්ටුව තිබෙන හික්කඩුව තානායම් පොළත් අභිනව සංස්ථාව භාර ගත්තාට පසු විදේශිකයන් බොහොම ඇල්මකින් දැන් ඒ ස්ථානයට ඇදී ගෙන එන බව පෙනෙනවා. එහෙත් වරදක් හැටියට විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙකු ප්‍රකාශ කළා අප වැනි මධ්‍යම පන්තියේ උදවියට ඒ ස්ථානයට යන්නට නොහැකිය, වියහියදම් වැඩිය කියා. ඒ ස්ථානයේ වියහියදම් වැඩි බව පිළිගත යුතුයි. එහෙත් අප මේ රටට විදේශ විනිමය ගෙන්වා ගත හැකි ක්‍රම ගැන පළමුවෙන් සිත යොමු කරන්නට ඕනෑ. ඒවිට මුල් තැන දෙන්නට ඕනෑ. විදේශ සංචාරක ව්‍යාපාරය තවත් දියුණු කළහොත් මේ රටට විශාල විදේශීය ධනයක් උපයා ගන්නට පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආණ්ඩුව පසුගිය සැසි වාරයේදී නින්දගම් ඉඩම් පිළිබඳව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා. එහෙත් ඒ සැසි වාරයේදීම ඒ පනත් කෙටුම්පත සම්මත කර ගන්නට නොහැකි වූයේ කාලවේලාව ප්‍රමාණවත් නොවූ නිසාය කියා මා කල්පනා කරනවා. දැන් නැවතත් අප ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ පනත් කෙටුම්පත සාකච්ඡා කරන අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන්ට අදහස් ඉදිරිපත් කරන්නට පුළුවන් වෙනවා. මා නියෝජනය කරන්නේ නින්දගම් ඉඩම් තිබෙන ප්‍රදේශයක් නොවෙයි. එහෙත් මගේ ප්‍රදේශයේ නින්දගම් ඉඩම් තිබුණා නම් ඒවා දුක් විඳින ජනතාව අතර බෙදා දීමට මා ආශාවෙන් කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෑම තරාතිරමකම අය සෑම මොහොතකදීම විවේචනය කරන දෙයක් තමයි අධ්‍යාපනය. සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහත්මයා අධ්‍යාපන ඇමති වශයෙන් කටයුතු කළ කාලයේදී ඇති කරන ලද නිදහස් අධ්‍යාපනය නිසා අධ්‍යාපනයේ විප්ලවයක් ඇති වුණා. රට ඉදිරිය කරා ගමන් කරන්නට ගමන් කරන්නට අධ්‍යාපනයේ වෙනස්කම් ඇති කරන්නට සිද්ධ වෙනවා. ඉදිරියට ගමන් කරන ජාතියක් තම අයවැය ලේඛන පිළියෙළ කරන අවස්ථාවලදී අධ්‍යාපන කටයුතුවලට මුල් තැනක් දිය යුතුයි. ඒ මක්නිසා ද? ඉදිරියට මේ රටේ අයිතිවාසිකම් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් සිටින අපේ බාල පරම්පරාව නිසි මග යාමට හැඩ ගැස්විය යුතු නිසයි. අපේ අධ්‍යාපන ක්‍රමයේ වරද නිසා තමයි අද මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය මේ තරම් උග්‍රවී තිබෙන්නෙ. එය කවුරුත් පිළිගන්නා දෙයක්. අපේ ආණ්ඩුවේ අධ්‍යාපන අමාත්‍ය ධුරය දරණ ගරු ඊරියගොල්ල ඇමතිතුමා නොයෙක් අයගේ දෝෂාරෝපණවලට ලක් වෙතත් එතුමා පිළියෙළ කර තිබෙන අධ්‍යාපන ක්‍රමය මේ ගරු සභාවේ සම්මත වී ක්‍රියාත්මක වුණොත්, අවුරුදු පහක් ඇතුළත මේ රැකීරක්ෂා ප්‍රශ්නය පිළිබඳව පවතින උග්‍ර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුගතදාස අරඹවල මයා.]

තත්ත්වය සැහෙන තරම් දුරට මග හරවා ගන්නට අවස්ථාවක් ලැබේ විය කියා මා කල්පනා කරනවා. නව අධ්‍යාපන ක්‍රමය අනුව සෑම ශිෂ්‍යශිෂ්‍යාවක්ම යම් වෘත්තීය කට හුරුපුරුදු වී පාසැලින් පිටවනවාට මා තුළ කිසිම සැකයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ප්‍රථමයෙන් කථා කළ දෙහිඹිවිට ගරු මන්ත්‍රීතුමා වලවේ ගමන ගැනත් සඳහන් කළා. වලවේ ගමන සංවිධානය කිරීම ගැන මා නම් කැමති වුණේ නැහැ. මා නො කැමති වූයේ ඒ ගමනට සහභාගි වෙන්නට මට ඉඩකඩ නො තිබුණු නිසයි. ඒ ගමන පිළිබඳ රසවත් සිද්ධියක් අප ප්‍රවෘත්ති පත්‍රවලින් දුටුවා. වලවේ ගිය ගරු මන්ත්‍රීවරුන් හිස් අතින් නො එවා එහි නිලධාරි මහත්වරුන් තෑගි මල්ල බැගින් මන්ත්‍රීවරුන්ට දී තිබෙනවා. තෑගි මලු බෙදන විට එක් ගරු මන්ත්‍රීවරයකු— මා කවුද කියා දන්නේ නැහැ—පොර කා ඉදිරියට පැන තෑගි මළු තුනක්ම ගත්තාය කියා පත්‍රවලත් තිබුණා. වලවේ වැනි යෝජනා ක්‍රමවලින් මේ රටට අත්වන යහපත හා ප්‍රයෝජනය ගැන ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් දන්නවා. මේවායේ දෙස් දක්වන විරුද්ධ පාර්ශ්ව යේ ගරු මන්ත්‍රීවරුන් නිතර නිතර මේ වැනි ගමන්වලට සහභාගි කරවා ගන්නවා නම් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් තුළ තිබෙන වැරදි මත බොහෝමයක් තුනී කරවන්නට අවස්ථාව ලැබෙන වාට කිසිම සැකයක් නැහැ.

මේ අයවැය ලේඛනය පුස් බම්බුවක් හැටියට පෙන්නුම් කිරීමට විරුද්ධ පාර්ශව යේ ගරු මන්ත්‍රීවරුන් මේ ගරු සභාව තුළ වෑයම් කළ හැටි මා දැක්කා. මේ බම්බුව ලොකු ඉතිහාසයක් ඇති දෙයක්. නොයෙක් විධියේ බම්බු තිබෙනවා. උණ බම්බු, බට බම්බු, පිච්චු බම්බු ආදි වශයෙන් බම්බු වර්ග කීපයක්ම තිබෙනවා. සෙම්බුව ඇතුළේ බම්බුව කියා එකකුත් තිබෙනවා. මේ අයවැය කථාව ඒවායින් කොයි ගණයට වැටෙන බම්බුවක්ද කියා එකම ගරු මන්ත්‍රීවරයකුවත් ප්‍රකාශ නොකිරීම බම්බු කථාවේ අඩුපාඩුවක් හැටියට සඳහන් කරන්ට කැමතියි. දේශපාලන ඇසින් නොබලන, සාධාරණ මධ්‍යස්ථ මතධාරිය කුට නම් එක් වරම පෙනී යනවා, මෙය දුක් විඳින ජනතාවගේ යහපතට සකස් කළ අයවැය ලේඛනයක් බව. දුක් විඳින ජනතාව ආරක්ෂා කරමින්, ඔවුන් පිට බර නොපටවා, බදු අය කර ගැනීමේ ක්‍රම සකස් කර තිබෙන බව මේ අයවැය ලේඛනයේ හැම අංගයකින්ම පෙනී යනවා.

මෙය ධනපතියන්ට රිදවන්නේ නැති අයවැය ලේඛනයක් හැටියට පෙන්නුම් කරමින් සමහර ගරු මන්ත්‍රීවරුන් මෙය විවේචනයට භාජනකළා. ධනපතියන්ට වුණත් රිදවීමේ එක්තරා සීමාවක් තිබෙන්නට ඕනෑ. ලිච්ඡවි රජ දරුවන් රට පාලනය කළ කාලය ගැන මෙහිදී තමුන්නාන්සේට මතක් කරන්නට කැමතියි. ලිච්ඡවි රජ දරුවන් මේ රට පාලනය කළ කාලයේ බදු අය කර තිබෙන්නේ, මීමැස්සා මල නොතළා රොන් ගන්නා ආකාරයටයි. ඒ ප්‍රතිපත්තියම තමයි, ගරු මුදල් ඇමතිතුමා මෙවර අයවැය ලේඛනය සකස් කිරීමේදී අනුගමනය කර තිබෙන්නේ. මුදල් තිබෙන අයගෙන් නොයෙක් විධියේ බදු අය කරනවා. බදු අය කරන ඒ සීමාව ඉක්මවා යන්නට කොහෙත්ම බැරිකම නිසා වෙන්නට ඇති, ගරු මුදල් ඇමතිතුමා ඒ අයට අළුතින් බදු පැනවීමට කල්පනා කර නැත්තේ.

මෙය දුක් විඳින ජනතාවගේ අයවැය ලේඛනයක් හැටියට මා නම් කළේ මෙහි ඇති එක්තරා කැපී පෙනෙන ලක්ෂණයක් නිසායි. සාමාන්‍ය පෙළේ රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට මේ අයවැය ලේඛනයෙන් කටයුතු සලසා තිබීම, ඒ කැපී පෙනෙන ලක්ෂණයයි. රුපියල් 100 කට අඩු මූලික වැටුපක් ලබන අයට රුපියල් 20 ක අමතර දීමනාවක් දීමට කටයුතු සැලසීම, ඇත්ත වශයෙන්ම ඒ දුක් විඳින ජනතාවට අත් වන විශාල සහනයක් බව තමුන්නාන්සේට අමුතුවෙන් කිව යුතු දෙයක් නොවෙයි. 1956 න් පස්සේ මෙවැනි වැටුප් වැඩි කිරීමක් කර නැහැ. සාමාන්‍ය ජනතාව විඳින දුක ගරු මුදල් ඇමතිතුමාට පෙනී යාම නිසා ඔවුන්ගේ වැටුප එසේ වැඩි කර තිබෙන බව, අපට හොඳින්ම පැහැදිළි වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගොවිතැන් කටයුතුවල යෙදී ඉන්නා හැම කෙනකුම දුක් විඳින ජනතා කොට්ඨාශයට අයත් බව අප කවුරුනුත් අනිවාර්ය යෙන් පිළිගත යුතුයි. මේ අයවැය ලේඛනය මඟින් ඔවුන්ට නොයෙක් විධියේ පහසුකම් දී තිබෙනවා. අක්කරයක වප සරියක් වැපිරීම සඳහා ගොවියකුට මීට කලින් ණය ගන්නට පුළුවන්කම තිබුණේ, රුපියල් 175ක් පමණයි. මේ අයවැය ලේඛනය මඟින් ඒ මුදල රුපියල් 220 දක්වා වැඩි කිරීම නිසා ඒ දුක් විඳින ගොවි ජනතාවට විශාල සහනයක් සැලසී තිබෙනවා.

ට්‍රැක්ටර් ගෙන්වන ආකාරයත්, ඒවා පාවිච්චි කරන පිළිවෙළත් ගැන මේ ගරු සභාව තුළ නොයෙක් විවේචන ඇති වුණා. එම ට්‍රැක්ටර් ධනපතියන්ට දීම නිසා ඔවුන් කුඹුරු හිමියන්ගේ කුඹුරු මංකොල්ල කන බව—ප්‍රමාණයට වඩා අධික මුදලක් අය කරන බව—අම්පාරේ ගරු මන්ත්‍රීතුමා (සෝමරත්න සෙනරත් මයා.) සඳහන් කළා. ගරු මුදල් ඇමති තුමා මේ අයවැය ලේඛනයේ සඳහන් කර තිබෙනවා, පළාතේ දිසාපතිවරයාගේ මාර්ගයෙන් මේ ට්‍රැක්ටර් බෙදා දෙන අතර, අක්කරයට රුපියල් 55 කට වඩා අය කර නොගත යුතු බවට ඒ ට්‍රැක්ටර් හිමියන්ගෙන් පොරොන්දු පත්‍රයකට අත්සන් ගන්නා බව. එම ට්‍රැක්ටර් බෙදා හරින්නේත්, දිසාපතිවරයාගේ අදහස අනුව සුදුසු පුද්ගලයන් අතරයි. ඇතැම් පළාත්වල වෙසෙන සමහර ට්‍රැක්ටර් හිමි ධනපතියන් එසේ අහිංසක දුප්පත් මිනිසුන් සූරා කමින් ඔවුන්ගෙන් වැඩිපුර මුදල් අය කර ගත්තත්, දැන් එසේ වැඩිපුර මුදල් අය කර ගැනීමට බැරි වන විධියට කටයුතු සලස්වා තිබෙන බව කියන්නට කැමතියි. ඒ විධියට වැඩිපුර මුදල් අය කර ගන්නා අවස්ථා ඇති වන්නේත් බොහොම කලාතුරෙකින් බව මතක් කරන්නට කැමතියි.

අපේ රටේ කෘෂිකාර්මික කටයුතු වැඩි දියුණු කිරීම සඳහා මේ රජය මඟින් තරුණ කෘෂිකර්ම හමුදාවක් ඇති කර තිබෙන බවත් මතක් කරන්නේ, සන්තෝෂයෙන්. ඒ සඳහා තරුණයන් බඳවා ගැනීම ගැන නොයෙක් විවේචන ඇති වුණා. ඒ කොයි හැටි වෙතත් සාධාරණයේ නාමයෙන් ඉතා හොඳ පරීක්ෂණවලින් පසු තෝරා ගනු ලැබූ තරුණයන් ඒ සඳහා පත් කරන ලද බව අපටත් පෙනී ගොස් තිබෙනවා. ඒ ගැන ගරු කෘෂිකර්ම ඇමතිතුමාට මා ඉතා ස්තුතිවන්ත වෙනවා.

සමුපකාර සමිති මේ රටේ උන්නතියට බෙහෙවින් උදව් වන ඉතාම වැදගත් සංස්ථාවන් හැටියට හඳුන්වන්නට පුළුවනි. සමුපකාර සමිතිවලට නොයෙක් බල තල පවරා දී තිබෙනවා. එහෙත් සමුපකාර සමිති යටතේ සේවයේ යෙදී සිටින්නන්ගේ යහපතට අදාළ වන දේවල් තවමත් සෑහෙන තරම් කෙරී නැහැ. ඒ ගැන කල්පනා කර බලා, සමුපකාර සමිති යටතේ සේවයේ නිරත වී සිටින ලක්ෂ සංඛ්‍යාත පිරිසගේ සුභ සිද්ධියට අදාළ වන කටයුතු වහාම සකස් කළ යුතුව තිබෙනවා. සමුපකාර ව්‍යාපාරයට සේවකයන් තෝරා පත් කර ගැනීම, ඔවුන් සේවයෙන් අස් කර දැමීම, ඔවුන්ගේ පාලනය සහ ඔවුන්ගේ සේවා කොන්දේසි ආදියත්, පඩිනඩිත් විශ්‍රාම වැටුප් වැනි දේ ඇතුළු හැම කරුණක්ම සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට යම්කිසි කොමිෂන් සභාවක් පත් කිරීම අවශ්‍යයි. පළාත් පාලන සේවා කොමිෂන් සභාව පළාත් පාලන ආයතනවල සේවකයන් සම්බන්ධයෙන් ක්‍රියා කරන්නේ යම්සේද, ඒ ආකාරයට සමුපකාර ආයතනවල නියුතු සේවකයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමටත් කොමිෂන් සභාවක් පත් කළ යුතුයි.

කර්මාන්ත දියුණු කිරීම සම්බන්ධයෙනුත් අයවැය ලේඛනයේ සඳහන් වෙනවා. මා නියෝජනය කරන කොට්ඨාශයේත් කර්මාන්ත සම්බන්ධයෙන් යම් දියුණුවක් දකින්නට ලැබීම මගේ සන්තෝෂයට කාරණයක් බව සඳහන් කරන්නට ඕනෑ. ගින්තොට තුනීලැලි කර්මාන්ත ශාලාවේ දියුණුව සියේට 17 සිට 26 දක්වා පසුගිය වර්ෂයේදී වැඩි වී තිබෙනවා. එය උසස් දෙයක්. මෙවැනි නිෂ්පාදන වැඩි වීමෙන්—ඒවා පරිහරණය කිරීමෙන්—අපේ විදේශ ධනය ආරක්ෂා වෙනවා.

මේ රට ආහාරය සම්බන්ධයෙන් ස්වයංපෝෂිත කිරීමට අපේ ගරු අග්‍රාමාත්‍යතුමාත්, ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුගතදාස අරඹවල මයා.]

බලවත් උත්සාහයක් දරනවා. ඒ උත්සාහයේ නියම ප්‍රයෝජනය අපට ලැබී ඇද්දැයි අප විසින් කල්පනා කර බැලිය යුතුව තිබෙනවා. අපේ රටේ වාරි කර්මාන්තය දියුණු කිරීමට ආයතන දෙකක් තිබෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව එයින් එකක් වන අතර, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව අනෙකයි. මේ ආයතන දෙකින්ම අපේ රටේ වාරි කර්මාන්තය නියම අන්දමට දියුණු වී නැහැ. සමහර ඇළවල් අලුත්වැඩියා කිරීම මේ ආයතන දෙකින් කවර ආයතනයකට අයිති දෙයක්දැයි නිගමනය කිරීම පවා ඇතැම් අවස්ථාවල අමාරු දෙයක් වීම අපේ කනගාටුවට කාරණයක්. එවැනි අවස්ථා වන් කීපයකට මුහුණ පාන්නට අපට සිදු වී තිබෙනවා. අඩි දහයකට වඩා පළල ඇති ඇළවල් අලුත්වැඩියා කිරීම තමන්ගේ කාර්යයක් නොවෙතැයි ගොවිජන සේවා දෙපාර්තමේන්තුව කියනවා. ඒ ගැන වාරි මාර්ග දෙපාර්තමේන්තුවට ලියා යැව්වාම එතැනින් ලැබෙන්නේ ඒ ඇළ අඩි දහය කට වඩා පළලින් අඩු එකක් බවත්, එය අලුත්වැඩියා කිරීම තමන්ගේ කාර්යයක් නොවන බවත් කියැවෙන පිළිතුරක් නිසා වාරි කර්මාන්තය දියුණු කරන්නට බැරි තත්ත්වයක් උදා වෙනවා. වාරි කර්මාන්තය දියුණු නොකර කවදා වත් කෘෂිකර්මාන්තය දියුණු කරන්නට බැහැ. ගොවිතැනට ජලය අවශ්‍ය බව අමුතු වෙන් පෙන්වා දෙන්නට වුවමනාවක් නැහැ. ඒ නිසා මේ දෙපාර්තමේන්තු දෙක මගින් කෙරෙන වැඩ කටයුතු හරියාකාර කෙරෙන්නට අවශ්‍ය විධිවිධාන කෙරෙහි ගරු ඇමතිතුමන්ලාගේ අවධානය යොමු කරන්නට කැමතියි.

කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන් දැනට වඩා උනන්දු වෙන්නට ඕනෑ. කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන් හැකි හැම අවස්ථා වකදීම වාගේ ගොවියන් සමග කිට්ටුවෙන් ආශ්‍රය කරන්නට ඕනෑ. සමහර නිලධාරීන් තමන්ගෙන් ඉටු විය යුතු සේවය සම්බන්ධයෙන් දක්වන සැලකිල්ල ප්‍රමාණවත් නැහැ. තමන්ගේ ප්‍රදේශයේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරියා කළුද සුදුද කියාවත් ඇතැම් ගොවීන් දන්නේ නැහැ. කෘෂිකාර්මික කටයුතු පිළිබඳ වැදගත්ම අවස්ථාවලදී පවා මේ නිලධාරීන් දකින්නට නො ලැබෙතොත් එය ඉතාමත් කනගාටු දායකයි. පසුගිය දවසක වල් නෙලීමේ උත්සවයක් නිමිත්තෙන් ඉතා විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් පැමිණ සිටියා. පාසල් ගණනාවකින් දහස් ගණන් ශිෂ්‍යයන් පැමිණ සිටි සථානයේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරියා දකින්නට සිටියේ නැහැ. ගරු ඇමතිතුමාටත් මේ ගැන මා දැනුම් දුන්නා. තමන්ගේ නිදහසට කාරණයක් වශයෙන් මේ නිලධාරියා කියා සිටියේ ඒ වල් නෙලීමේ උත්සවය අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ඇති කළ දෙයක් මිස තමා විසින් සංවිධානය කරන ලද්දක් නොවන බවයි. කර මග හරින්නට මෙවැනි වචන පාවිච්චි කිරීමෙන් ප්‍රයෝජනයක් නැහැ. මෙවැනි නිලධාරීන් නිසා සිදු වන්නේ ගරු අග්‍රාමාත්‍යතුමා සහ කෘෂිකර්ම අමාත්‍යතුමා ඇතුළු මුළු කැබිනට් මණ්ඩලයම මේ රට ආහාරය අතින් ස්වයංපෝෂිත කිරීමට ගන්නා තැත සාර්ථක එකක් නොවීමයි. ඒ නිසා ආණ්ඩුව දරන පරිශ්‍රමය සාර්ථක කර ගැනීමට නිලධාරීන්ගේ සහයෝගය ලැබෙන වාද යන්න ගැන සෙවිල්ලෙන් සිටීම අවශ්‍ය බව ගරු ඇමතිතුමාට මතක් කරන අතර, මගේ අදහස් ප්‍රකාශ කිරීමට අවසථාව ලබා දීම ගැන ගරු නියෝජ්‍ය කථානායකතුමන්ට ස්තුති වන්ත වෙමින් මගේ කථාව අවසාන කරනවා.

පූ. භා. 10.55

**ඩී. ඩී. එල්. ලෙටීෂියා රාජපක්ෂ මිය.** (දොඩන්ගස්ලන්ද)

(*திருமதி டீ. டீ. எல். லெரிஷியா ராஜபக்ஷ —தொடங்கஸ்லந்த*)

(Mrs. D. D. L. Leticia Rajapaksa—Dodangaslanda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය විවාදයේදී මට වචන සවල්පයක් කථා කිරීමට අවසථාව ලබා දීම ගැන තමුන්නාන්සේට මා ස්තුතිවන්ත වෙනවා. එක්සත් ජාතික පක්ෂයේ බලකොටුවක්ව තිබූ දොඩන්ගස්ලන්ද ආසනය දෙවන වරටත් එක්සත් ජාතික පක්ෂය පරාජය කර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සතු කර ගැනීමට මට ඉඩ සැලසීම ගැන දොඩන්ගස්ලන්ද ආසනයේ ප්‍රගතිශීලී ජනතාවට මේ අවසථාවේදී මා මගේ අවංක ආදර ස්තුතිය පිරිනමනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ජනතාව ඉතාමත් ඕනෑකමින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොඉවසිල්ලෙන් බලාපොරොත්තු වන දෙයක් තමයි, අය වැය ලේඛනය. අය වැය ලේඛනයෙන් ඇති වන වෙනස්කම් අනුව ජනතාවගේ ජීවන මාර්ගයන් කොයි අන්දමට වෙනස් වේද, ජනතාවට කොයි අන්දමේ තත්ත්වයක් උද්ගතවේද යන්න ගැන බිය සැක ඇති නිසයි, ජනතාව අය වැය ලේඛනය ගැන එසේ සැලකිල්ලක් දක්වන්නේ. පසුගිය කාලයේ මේ රජයේ ක්‍රියා මාර්ගය දෙසත්, මේ වර ගරු මුදල් ඇමතිතුමාගේ අය වැය ලේඛනය දෙසත් බලන විට, ඉදිරි කාලයේදී මේ රජයේ ක්‍රියා මාර්ගය කුමක් වේද යන්න කැඩපතකින් පෙනෙන්නාක් සේ පැහැදිලිව පෙනෙනවා. මේ වර අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී රජය දුප්පතා කෙරෙහි කිසිම අනුකම්පාවක් දක්වා නැති බව කියන්නට පුළුවනි. මේ රජය ධනපතීන් කෙරෙහිම සිත් යොමු කර තිබෙනවා විනා දුප්පත් ජනතාව කෙරෙහි කිසිම අනුකම්පාවක් දක්වා නැහැ. මේ රජයට දුප්පත් ජනතාව—සුළු ජනතාව—මතක් වන්නේ මැතිවරණයක් පැමිණි විට පමණයි. මේ රට හැම අතින්ම සංවර්ධනය කිරීම සඳහා මේ රජය කෝටි සංඛ්‍යාත මුදලක් වැය කරන්නට බලාපොරොත්තු වෙනවා. එහෙත් මේ රට හැම අතින්ම සංවර්ධනය කිරීමට නම් හැම ජන කොටසකගේම සහාය රජයට අවශ්‍ය බව—දුප්පත් ජනතාවගේ—සුළු ජනතාවගේ—සහාය අවශ්‍යම බව මා මතක් කරන්නට සතුටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් ඇමතිතුමාගේ අය වැය කථාවෙහි එක් තැනක මෙසේ සඳහන් වේනවා:

"සුළු වාරිමාර්ග ඉදි කිරීමේ කටයුතු ඉක්මන් කිරීමත්, ඉඩම් සංවර්ධනයත් සඳහා ගොවි හමුදාවක් පිහිටුවා තිබෙනවා. ඒ පිළිබඳව යෝජිතව ඇත්තේ සම්පූර්ණයෙන් 15,750 දෙනෙකුගෙන් සමන්විත, 350 දෙනකුගෙන් බැගින් යුක්ත කඳවුරු 45 ක් පිහිටුවීමටයි. දැනට ඉන් කඳවුරු 8 ක් පිහිටුවා ඇති අතර, කඳවුරු 45 වන සම්පූර්ණ සංඛ්‍යාව 1967 වර්ෂය අවසන් වන විට පිහිටුවනු ලැබීමට බලාපොරොත්තු වෙනවා. සුළු වාරිමාර්ග ඉදි කිරීම් ඉක්මන් කිරීම හා ආහාර නිෂ්පාදන ව්‍යාපාරය හා සම්බන්ධ අළුත් ඉඩම් සංවර්ධනය කිරීම ද හැරුණු විට ගොවි හමුදාව පිහිටුවීම හේතුකොට රැකිරක්ෂා රහිතතා ප්‍රශ්නයත් සෑහෙන ප්‍රමාණයකින් විසඳෙනවා."

රැකිරක්ෂා ප්‍රශ්නය ඉතාමත්ම උග්‍රව පවතින නිසා සෑහෙන තරමකින්වත් එය විසඳෙනවා නම් අප සතුටුයි. හොඳයි, මේ පිහිටුවාගෙන යන ගොවි හමුදාව ගැන කල්පනා කර බලමු. මේ ආණ්ඩුව ගොවිකම් දියුණුව ගැන, ආහාර වගාව ගැන ලොකු වර්ණනාවක් කළා. මේ ආණ්ඩුව ක්‍රියාවෙන් කෙසේ වුවත් වර්ණනාවෙන් නම් අති දක්ෂයි. ගොවි හමුදාවට බඳවා ගන්නා තරුණයන් එසේ බඳවා ගන්නේ මොන සුදුසුකම් උඩද? එකම සුදුසුකම නම් එක්සත් ජාතික පක්ෂයට පක්ෂපාත වීමයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හිතවත් වීම නුසුදුසුකමක්. අව්ව වැස්ස නොබලා වැඩ කළ හැකි, කැත්තේ උදැල්ලේ වැඩ කළ හැකි තරුණයන් මෙම ගොවි හමුදාවේ ඇතැයි මා හිතන්නේ නැහැ. තවද, ගොවි හමුදාවට තරුණයන් බඳවා ගන්නේ එක්සත් ජාතික පක්ෂයෙන් තරග කොට පරාජයට පත් වූ අපේක්ෂකයා කියන පිළිවෙලටයි. දෙඩම්ගස්ලන්දේ එක්සත් ජාතික පක්ෂයේ පරාජිත අපේක්ෂකයා මේ ගැන ක්‍රියා කළ නිසයි, මෙය මා හොඳින් දන්නේ. මැතිවරණ කාලයේදී එක්සත් ජාතික පක්ෂයේ උදවිය පසුපස්සේ ගිය, සුරුට්ටුවට සිටරැට්ටුවට හා අරක්කු වීදුරුවට රැවටුණු අයයි, වැඩිපුරම මෙම ගොවි හමුදාවල ඉන්නේ. ඒ අයවලුන් තෝරාගෙන ගොවිකම් පුහුණුවක් දිය හැකියයි මා හිතන්නේ නැහැ. මේ පිරිස ගොවි හමුදාවට බඳවාගෙන තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ බලය තහවුරු කර ගැනීමටයි.

ගොවි හමුදාවේ පාවිච්චිය සඳහා දී තිබෙන ජීප් රථ ගැනත් කල්පනා කර බලමු. එක්තරා උප ඇමතිවරයකු තමාගේ දරුවන් පාසල වෙත ගෙන යන්නටත් මෙම ජීප් රථ පාවිච්චි කරනවා. එම්වා මහජනයාගේ හිත් කලකිරෙන වැඩ. මා මේ ගැන මතක් කෙළේ ඒ උප ඇමතිතුමාට නින්දා කිරීමට නොවෙයි. ජනතාවගේ හිත් කලකිරෙන වැඩ නොකරන්නැයි මා මෙම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

ගරු මුදල් ඇමතිතුමාගේ අය වැය කථාවෙහි වී වගාව ගැනත් සඳහන් වෙනවා.

"එච්-4 නම් වැඩි දියුණු කළ වර්ගයේ බිත්තර වී භාවිතය ජනප්‍රිය කිරීම පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය බෙහෙවින්ම සාර්ථක වී ඇති බව එම වී වැපුරු අක්කර ප්‍රමාණය 1965-66 හි මාස් කන්නයෙහි 5,35,000 ක් වූ නමුත් 1966-67 මාස් කන්නයෙහි 6,50,000 ක්ව තිබීමෙන් පෙනී යනවා."

එච්-4 නම් වී වර්ගයෙහි ඔය කියන තරම්ම අස්වැන්නක් නැහැ. ඔය තරම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙටීෂියා රාජපක්ෂ මිය.]

අස්වැන්න තිබෙන්නේ පර්යේෂණාගාරවල පමණයි. එච්-4 ඉක්මණින් බොල් වන වී වර්ගයක්. ඒවා කල් තබා ගන්නට බැහැ. පත්තරවල ඇති ප්‍රචාරයේ හැටියට කුඹුරුවල නම් අස්වැන්නක් නැහැ.

ගොවිතැන් දියුණු කිරීමේ කටයුතු සඳහා යයි කියමින් ට්‍රැක්ටර් මෙරටට ගෙන්වනවා. ඒවා ගෙන්වීමෙන් කොම්පැණිකාරයන්ට මිස ගොවියන්ට නම් ලාභයක්, වාසියක් නැහැ. සමහර කුඹුරුවල ට්‍රැක්ටර් ගෙන යන්නත් බැහැ. කඳු බෑවුම් සහිත කුඹුරුවලටත් කුඩා ලියදි තිබෙන කුඹුරුවලටත් ට්‍රැක්ටර් ගෙන යන්න බැහැ. ට්‍රැක්ටරයකින් හාන්නට නම් දිග පළලින් යුත් ලියදි සහිත කුඹුරු වන්නට ඕනෑ. ට්‍රැක්ටර්වලින් හාන්නට පුළුවන් කුඹුරුවලට වුණත් ට්‍රැක්ටර් යෙදිය හැක්කේ ධනපති අයට පමණයි. ට්‍රැක්ටර්වලින් කුඹුරු හාන්නට නම් ලොකු මුදලක් වියදම් කළ යුතුයි. ඒ නිසා සාමාන්‍ය දුප්පත් ගොවීන්ට ට්‍රැක්ටර්වලින් ප්‍රයෝජනයක් නැහැ. ඒ නිසා ට්‍රැක්ටර් ගෙන්වීම රජය මගින් කර සමුපකාර ව්‍යාපාරය තුළින් ගොවීන්ට ට්‍රැක්ටර් ලබා දීමේ වැඩ පිළිවෙලක් සකස් කරනවා නම් හොඳයි කියා මා කියනවා.

ගම්බද ගොවීන් වැඩි වශයෙන් සීසෑම කරන්නේ නගුල්වලින් හා හරකුන්ගෙන්. ගොවීන්ට විශාල කරදරයක් වී තිබෙන්නේ සීසෑමෙන් පසුව හරකුන් මෙච්චල් කිරීමයි. එක කන්නක් කුඹුරු හෑමෙන් පසුව අනික් කන්නයට කුඹුරු හෑම සඳහා හරකුන් ගෙනෙන තුරු ඒ අතරතුර කාලය හරකුන් මෙච්චල් කිරීම ගොවීන්ට විශාල කරදරයක් වී තිබෙනවා. සමහර විට හැතැප්ම දහය පහළොහ ඈත ඇති වතුවලට හරකුන් ගෙන යෑමට ගොවීන්ට සිදු වී තිබෙනවා. එසේ කිරීමෙනුත් ගොවියාට සැනසිල්ලක් ලබන්නට බැහැ. වතුවලට හරක් දැමීමේදී වත්තේ පාලකයාට නැත්නම් සුපිරින්ටෙන්ඩන්ට්ට පගාවක් වශයෙන් හාල්, කෙසෙල්කැන්, බිත්තර, වැනි දේ සපයන්නට සිදු වෙනවා. අනික් අතට දවසකට පොල් කට්ටි 5 ක් පමණ නොමිලේ කොටා දෙන්නත් ඕනෑ. ඔය ආදී වශයෙන් සීසෑමෙන් පසු බොහෝ කරදරවලට මුහුණ දෙන්නට ගොවීන්ට සිදු වෙනවා. ඒ නිසා ගොවීන්ට මුහුණ දෙන්නට සිදු වී තිබෙන ඔවැනි කරදර පිළිබඳව රජයේ සැලකිල්ල යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවෙහි ආහාර නිෂ්පාදනය ගැනත් සඳහන් වෙනවා :

" ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට රජය විසින් ගනු ලැබූ නොයෙක් පියවර මගින් මහගු ප්‍රතිඵල ලැබී තිබෙනවා. වී නිෂ්පාදනය සම්බන්ධයෙන්, 1965-66 මාස් කන්නයෙහි අස්වැන්න බුසල් 3 කෝටි 10 ලක්ෂයක් වූ නමුත්, 1966-67 මාස් කන්නයෙහි අස්වැන්න බුසල් 3 කෝටි 40 ලක්ෂයක් වෙතැයි අපේක්ෂා කෙරෙනවා. මෙහි වැදගත්ම ලක්ෂණය වනුයේ, මේ කාලය තුළදී, සාමාන්‍ය වී අස්වැන්නෙහි ඇතිවුණු වැඩිවීම යි. 1966-67 මාස් කන්නයෙහි, අක්කරයක සාමාන්‍ය අස්වැන්න පෙර නොවූ විරූ පරිදි, බුසල් 40.5 ක් වුණා. මීට පෙර, වැඩිම සාමාන්‍ය අස්වැන්න ලැබී ඇත්තේ, අක්කරයකට බුසල් 38.6 ක්වූ 1963-64 වර්ෂයේදීය. "

" මෙහි වැදගත්ම ලක්ෂණය වනුයේ, මේ කාලය තුළදී සාමාන්‍ය වී අස්වැන්නෙහි ඇතිවුණු වැඩිවීම යි " කියා තිබෙනවා. 1966 යල් කන්නයේ ගොවිතැන සම්පූර්ණයෙන්ම විනාශයට පත් වුණා. එක කන්නක් ගොවිතැන් විනාශ වූ විට ඊළඟ කන්නයේදී එමෙන් දෙතුන් ගුණයක අස්වැන්නක් ලැබීම සාමාන්‍ය සිරිතක්. කලට වේලාවට වැස්ස ලැබුණොත්, නියම විධියට වතුර ටික හැරෙව්වොත්, අස්වැන්න වැඩිපුර ලැබෙනවාමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉඩම් සංවර්ධන ව්‍යාපාරය ගැන මා ඊළඟට මතක් කරන්ට කැමතියි. දුප්පත් මිනිහෙක් රජයෙන් ඉඩම් කැබැල්ලක් ලබා ගන්ට ගියාම පුළුවන් තරම් ඔහුට කරදර ගිරිහැර කරලයි ඉඩම් කැබැල්ල ලබා දෙන්නෙ. සමහර විට කීප වාරයක් උසාවි ගිහිල්ල දඩ ගැසුවට පසුවයි, ඉඩම් කැබැල්ල ලැබෙන්නෙ. එහෙත් ධනපති උදවියට කිසිම කරදරයක් නැතිව ඉඩම් ලබා ගන්න බලපත්‍ර කෙළින්ම ලැබෙනව. මේ ගරු සභාවේ හිටපු එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරයකු හා ධනවත් ඉඩම් හිමියකු වන ඒ. යූ. රොමානිස් මහත්මයාට හිරියාල හැවැන්තැන්නෙන් වවාපු පොල් අක්කර එකසිය තිස් ගණනක් සඳහා බලපත්‍රයක් දී තිබෙනවා. මේ ඉඩමෙන් අවුරුද්දකට පොල් දස ලක්ෂයක් විතර කැඩෙනව. ඒ ඉඩමෙන් බදු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුදල් වශයෙන් රජය කොපමණ මුදලක් අය කරනවාද කියා, මා අහන්නට සතුටුයි. සාමාන්‍ය දුප්පත් කෙනෙකුට නම් මේ විධියේ ඉඩමක් රජයෙන් දෙයිද? ඉඩමක් ලැබුණත් ඒකට යන්න පාරක් නැහැ. සුසාන භූමි ආදි පහසුකම් නැහැ. දුප්පත් මිනිහා ගැන කිසිම සැලකිල්ලක් නැහැ.

මා නියෝජනය කරන කොට්ඨාශයේ මාදුරේ කෝරළේ වැලිකන්ද ගේනයායේ රජයේ කොස් වගාවක් තිබෙනව. ධනවත් ඉඩම් හිමියන් කීප දෙනකු එකතු වෙලා ක්‍රමයෙන් ඒ කොස් වගාව මරාගෙන යනව. ඒ විධියට දැන් අක්කර 50 ක් විතර කොස් වගාව මරාගෙන ගොස් ඔවුන් පොල් වගා කරගෙන යනව. දොඩම්ගස්ලන්ද අතුරු මැතිවරණයට කලින් සිටි මන්ත්‍රීතුමා විසින් රජයෙන් ඉල්ලීමක් කර තිබෙනව, ධනවතුන් විසින් අල්ලා ගෙන යනු ලබන ඒ ඉඩම දුප්පත් මිනිසුන් අතර බෙදා දෙන්න කියා. ඒ ඉල්ලීම අනුව දුප්පත් මිනිසුන් අතර ඉඩම බෙදා දෙන්න කුරුණෑගල දිසාපතිතුමා ක්‍රියා කරගෙන ගියා. පසුව ඒ ඉඩම දුප්පත් මිනිසුන්ට බෙදා නොදෙන ලෙස ධනවතුන් විසින් ඇමතිවරයාගෙන් කරන ලද ඉල්ලීමක් අනුව ඒ ඉඩම බෙදා දීම ඇණ හිට තිබුණා. ඊට පසුව මගේ ඉල්ලීම පිට නැවතත් වරක් එය ප්‍රදේශයේ ඉඩම් නැති දුප්පත් මිනිසුන් අතර බෙදා දීමට කුරුණෑගල දිසාපතිතුමා ක්‍රියා කරගෙන යනව. එහෙත් මේ වරත් අර ධනවතුන් පිරිස ඉඩම් ඇමතිවරයා මාර්ගයෙන් මෙම ඉඩම බෙදා දීම වළක්වන්න ක්‍රියා කර ගෙන යන බවට මට දූසමාන ආරංචියක් ලැබී තිබෙනව. එම නිසා ධනවතුන්ගේ ඉල්ලීමට කන් නොදී දුප්පත් ජනතාවට මේ ඉඩම බෙදා දෙන්නට ක්‍රියා කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව.

ඊළඟට මා පෙන්වා දෙන්නට කැමතියි, රෙදිපිළි ගෙන්වීම සඳහා විශාල මුදලක් මේ රටෙන් පිටරට ඇදී යන බව. ඒ මුදල මේ රටේම නවත්වා ගැනීමට අපි සැම උත්සාහයක්ම දැරිය යුතු බව කවුරුත් පිළිගන්නව. මා ඒ සම්බන්ධයෙනුත් වචන ස්වල්පයක් කථා කරන්ට අදහස් කරනව. ගම්බද රෙදි මධ්‍යස්ථානවල සේවයේ යෙදී සිටින දුප්පත් කාන්තාවන්ට අද නොයෙක් කරදර හිරිහැරවලට මුහුණ පාන්ට සිදු වී තිබෙනව. මගේ ආසනයේ කලමඩුවාව රෙදි වියන මධ්‍යස්ථානයේ තරුණ කාන්තාවන් 50 ක් 60 ක් පමණ සේවයේ යෙදී සිටිය. දැනට ඒ සියලු දෙනාගේම වැඩ නැවතිලයි තිබෙන්නෙ. මන්ද? මේ රෙදි මධ්‍යස්ථානය පිහිටුවා තිබෙන ඉඩම සමිතිය සතු කරගෙන තිබෙන්නෙ අත් කුවිතාන්සියක් පිටයි. එය කෙසේ හෝ කච්චේරියෙන් නැති වී තිබෙනව. ඉඩම් හිමියා ඔහුගේ ඉඩම සමිතියෙන් ආපසු ලබා ගැනීමට සමිතියට විරුද්ධව නඩුවක් පැවරුව. අවසානයේදී ඉඩම ඔහුට අයිති වන ලෙසට නඩුව තීන්දු වුණා. ඔය විධියට සැම කොට්ඨාශයකම වාගේ තිබෙන්නේ අත් කුවිතාන්සි පිට ඉඩම් ගෙන සාදාගත් රෙදි මධ්‍යස්ථානයි. එම නිසා අත් කුවිතාන්සි පිට ඉඩම් ගෙන සාදා තිබෙන ඒ සැම රෙදි මධ්‍යස්ථාන යක්ම කෙළින්ම රජය වෙත පවරාගන් නැයි මා ඉල්ලා සිටිනවා.

තමුන්නාන්සේලා රටේ සංවර්ධන කට යුතු සඳහා සැම අංශයකින්ම කෝටි සංඛ්‍යාත මුදලක් වියදම් කරනවා. එහෙත් අධ්‍යාපනය අතින් බලන විට අපට පෙනී යනවා අද ඉතාමත් අඳුරු යුගයක් උදා වී තිබෙන බව. මා එසේ කියන්නේ ඇයි? මා නියෝජනය කරන කොට්ඨාශයේ මැතිවරණ කාලයේදීත්, ඊට ප්‍රථමත් ඊට පසුවත් දේශපාලන හේතූන් උඩ ගුරුවරුන් රාශියක් මාරු කර යවා තිබෙන නිසයි. එසේ ගුරුවරුන් මාරු කර යවනවා මිස ඒ පුරප්පාඩු සඳහා නැවත පත් කිරීමක් කරන්නේ නැහැ. ශිෂ්‍ය ශිෂ්‍යාවන් 600ක් පමණ සිටින කොස්වත්ත පාසලේ අද ගුරුවරුන් සිටින්නේ 6 දෙනයි. 1965 දී ගුරුවරුන් 25 දෙනකු සිටි කවිඩිගමුව මහා විද්‍යාලයේ අද ඉන්නේ ගුරුවරුන් 10 දෙනායි. ගුරුවරුන් මාරු කළාට කමක් නැහැ, ඒ පුරප්පාඩු වෙනුවෙන් අභිනවයෙන් ගුරුවරුන් පත් කර එවනවා නම්. එහෙත් එසේ කරන්නේ නැහැ. ඒ නිසා ළමයින්ගේ අනාගතය අඳුරු කරන්නේ නැතිව ඔවුන්ට අධ්‍යාපනයක් ලැබෙන පරිදි ඒ පුරප්පාඩු සඳහා ගුරුවරුන් පත් කරන්න ඕනැ. මොන පක්ෂයකින් හෝ වේවා අපට ඕනැ කරන්නේ ළමයින්ට අධ්‍යාපනයක් දීමයි. දැනට සිටින ඉතුරු ගුරුවරුන් කීප දෙනාත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙටීෂියා රාජපක්ෂ මිය.]

පරාජිත අපේක්ෂකයාගේ මාර්ගයෙන් මාරු කරගෙන යනවා. මේක ලොකු අපරාධ යක්. ළමයින් උදේට පාසලට ගොස් සෙල්ලම් කරමින් ඉඳ හවසට ගෙදර ඒමයි දැන් එහි සිරිත වී තිබෙන්නේ. ඒ සෑම දෙයක්ම සිදු වී තිබෙන්නේ දේශපාලන ඇඟිලි ගැසීම් නිසයි. එම නිසා මා කරුණා වෙන් ඉල්ලා සිටිනවා එවැනි අපරාධ කරන්න එපාය කියා. දැනට තිබෙන ගුරු අඩුපාඩුවද හැකි පමණ ඉක්මණින් සම්පූර්ණ කර දෙන ලෙස මම මතක් කර සිටිනවා.

දොඩම්ගස්ලන්දේ පසු ගිය අතුරු මැති වරණ සමයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සහයෝගය දුන් පිරිසකට මැරවර පිරිසක් විසින් පහර දෙනු ලැබුවා. නොයෙක් විධියේ හිරිහැර කළා. එහෙත් අද වන තුරු ඒ ගැන කිසිම නඩුවක් නැහැ. මෙම ගරු සභාවෙ හිටපු මන්ත්‍රීතුමකු විසින්ම පැමිණිල්ලක් කර තිබෙනවා. ඒත් ඒ ගැන අද වන තුරුත් කිසිම සැලකිල්ලක් දක්වා නැහැ.

මා මුලින් සඳහන් කළ පරිදි, මෙවැනි දේශපාලන හැඟීම් ඇති කරගෙන මේ රට සංවර්ධනය කරන්න බැහැ. රටක් සංවර්ධනය කිරීමට නම් සෑම පිරිසකගේම සහයෝගය ඕනෑ කරනවා. එම නිසා මේ රජය විසින් ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනයට මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරන අතරම, සෑම අතකින්ම රට සංවර්ධනය කරන්න තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙනවා නම් යුක්තිසහ ගතව, සධාරණව කටයුතු කරන්නය කියා ඉල්ලමින් මගේ වචන සවල්පය අවසන් කරනවා.

පූ. භා. 11.18

**එම්. එස්. අමරසිරි මයා. (හිනිදුම)**
(திரு. எம். எஸ். அமரசிறி—ஹினிதும)
(Mr. M. S. Amarasiri—Hiniduma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දොඩම්ගස්ලන්ද ගරු මන්ත්‍රීතුමියගේ කථාවට පසුව මට කථා කිරීමට අවස්ථාව සලසා දීම ගැන මා තමුන්නාන්සේට ස්තුති කරනවා. එතුමියගේ කථාවෙන් වැදගත් කරුණු කීපයක් පෙන්නුම් කර දුන්නා. එතුමිය විශේෂයෙන්ම සඳහන් කළා, රටක් සංවර්ධනය කරගෙන යෑමේ දී සෑම පක්ෂයකම සහයෝගය ලැබිය යුතු බව. ඇත්ත වශයෙන්ම මොන ආණ්ඩුව කින් වැඩ කටයුතු කරගෙන ගියත් සෑම පක්ෂයකම සහයෝගය එයට ලැබෙනවා නම් ඒක තමයි ඒ පක්ෂ විසින් ජාතියට කරනු ලබන සේවය. එහෙත් එහෙම කෙරෙනවාද කියන ප්‍රශ්නයයි මෙහිදී මතු වන්නේ. එතුමිය සාමාජිකත්වය දරන පක්ෂයේත්, ඔය විරුද්ධ පක්ෂයේ සිටින අනික් පක්ෂවලත් ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙකු අප කොපමණ හොඳ වැඩ කරගෙන ගියත් කවදාවත් ඒ වැඩ හොඳය කියා කියන්නේ නැති බව එතුමිය දන්නවා ඇති. ඒ වාගේම එතුමියගේත්, එතුමියගෙ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ගේත් සහයෝගය මේ රජය බලා පොරොත්තු වෙනවා. මෙම අයවැය ලේඛනය දුප්පත් ජනතාවට ප්‍රයෝජන යක් නැති අයවැය ලේඛනයක් හැටියට එතුමිය හඳුන්වන්න යෙදුණා. ඇත්ත වශයෙන්ම විරුද්ධ පාර්ශ්වයෙ හැම මන්ත්‍රීවරයකුගෙන්ම ප්‍රකාශ වුණේ ඒ අදහසමයි. මොන ආණ්ඩුව බලයට ආවත් ඒ ආණ්ඩුවෙන් ඉදිරිපත් කරන අයවැය ලේඛනයට විරුද්ධව, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කථා කිරීම සවභාවයක්. එසේ කරන්නෙ පාර්ලිමේන්තු සම්ප්‍රදාය යක් හැටියට යි. එහෙත් ඇත්ත වශයෙන් ම එතුමන්ලාගෙ හදවත් තුළින් මෙම අය වැය ලේඛනයෙහි හොඳ බව කියනවා ඇති.

මෙම අයවැය ලේඛනයෙන් විශාල මුද ලක් සංවර්ධන වැඩ කටයුතු සඳහා යොදවා ඇති බව තමුන්නාන්සේලා දන්නවා ඇති. මෙසා විශාල මුදලක් සංවර්ධන වැඩ කට යුතුවලට යෙදූ අවස්ථාවක් මෙයට පෙර කිසිම අවුරුද්දකදී පෙනෙන්නට තිබුණේ නැහැ. මෙයට හේතුව, මේ රටේ කෘෂිකාර් මික සංවර්ධනයත්, කර්මාන්ත වර්ධනයත් ඇති කරන්නෙ නැතුව, රජයෙ ඉදිරි ගමන මහජනතාවගේ ප්‍රයෝජනයට හේතුවන පරිදි ගෙන යන්නට බැරි බව ජාතික රජය කල්පනා කිරීමයි. එම නිසා, පසුගිය අය වැය ලේඛනයත්, ඊට පෙර අවුරුද්දෙ ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය මෙන්ම මේ අයවැය ලේඛනයත් සකස් කර ඇත්තෙ ඒ අරමුණ ඉටු කර ගැනීමේ අදහසින් බව මෙහිලා සඳහන් කරන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංවර්ධන වැඩ කටයුතුවලට විශාල මුදලක් යෙදවීමෙන් රජය බලාපොරොත්තු වන්නේ ආහාර ද්‍රව්‍ය මෙන්ම අනිකුත් ද්‍රව්‍ය සඳහා පිටරට ඇදී යන විශාල මුදලක් මෙහිම නතර කර ගැනීමටත්, එම මුදල් මේ රටේ අභිවෘද්ධිය සඳහා යෙදවීමටත් බව සඳහන් කරන්න කැමතියි. එම බලාපොරොත්තුවෙන් ජාතික රජයෙ නායකතුමා ගෙන යන කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපාරය අතිශයින් ප්‍රශංසනීය බව මහජනතාවට තේරුම් ගොස් තිබෙනවා. කෘෂිකර්මාන්තය කෙරෙහි මේ තරම් උනන්දුවක් දක්වන ලද වකවානුවක් මා හිතන හැටියට පසුගිය අවුරුදු තුන් සියයකින් මෙපිට කවදාවත් ඇති වී නැහැ. සිංහල රජ කාලයෙන් පසුව මේ රටේ කෘෂිකර්මාන්තය සඳහා වැඩි සැලකිල්ලක් දක්වන ලද වකවානුව මේ කාල සීමාව යයි අප ඉතාම ආඩම්බරයෙන් කියනවා. මේසා විශාල මුදලක් සංවර්ධන වැඩ කටයුතුවලට යෙදීමට රජය කල්පනා කළේ යම්කිසි දවසක පිටරටින් එන සහල් ලංකාවට ගෙන්වා ගන්න බැරි වුණොත්, විදේශික නැව් ගමනා ගමනය නතර කළොත්, විදේශ රටවලින් ලැබෙන සහල් නැතිව ගියොත්—එවැනි තත්ත්වයක් උදා වුණොත්—ජනතාව බඩගින්නේ නොතබා ආරක්ෂා කර ගැනීමේ විශාල අනාගත බලාපොරොත්තුවක් ඇතුවයි. ජාතික රජය ආරම්භ කළ මෙම සංවර්ධන ව්‍යාපාරයට බාධා කිරීමට විශාල පිරිසක් සිටිනවා. ඒ බාධා මැඩ පවත්වාගෙන අපේ කාලසීමාව තුළදී මහජනතාවට ප්‍රයෝජනවත් වන විධියෙ සැලැස්මක් අනුව රට සංවර්ධනය කිරීමට ජාතික රජය දැඩි ප්‍රයත්නයක් දරන බව මෙහිලා සඳහන් කරන්න කැමතියි.

සංවර්ධන කටයුතු සඳහා යොදවන මුදල් බොහොමයක්ම සමුපකාර සමිති සංගම් මාර්ගයෙන් මහජනතාව අතර යෙදවීමට, කෘෂිකාර්මික කටයුතු සඳහා එමගින් ණය පහසුකම් මහජනතාවට ලබාදීමට රජය බලාපොරොත්තු වෙනවා. එපමණක් නොවෙයි, මෙරටට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදා හැරීම අද සමුපකාර සමිති සංගම් මගින් කරගෙන යනවා. මේ ආණ්ඩුව පමණක් නොවෙයි, මෙයට පෙර පැවති ආණ්ඩුත් පසුගිය කාලය තුළදී සමුපකාර ව්‍යාපාරයෙන් ප්‍රයෝජන ලබාගත් බව සඳහන් කරන්න කැමතියි. සමුපකාර ව්‍යාපාරය සම්බන්ධයෙන් පළපුරුද්දක් ඇති කෙනෙකු හැටියට මෙහිදී මට කියන්න ඇත්තෙ, සමුපකාර ව්‍යාපාරය මෙතෙක් කල් ගෙන ගියත් බොහෝ දෙනාට එයින් ප්‍රයෝජනයක් සැලසෙන අන්දමේ සීඝ්‍ර දියුණුවක් මෙතෙක් ඇති වී නැති බවයි. මීට අවුරුදු 50 කට 60 කට ඉහත දී සමුපකාර ව්‍යාපාරය ආරම්භ වුණත්, ලංකාවේ ජනතාව දියුණු විගෙන යන තත්ත්වයට අනුව සමුපකාර ව්‍යාපාරය දියුණු වී නැහැ. අපගේ සංවර්ධන ව්‍යාපාර සමුපකාරය මාර්ගයෙන් ජනතාවට දීමේ සම්පූර්ණ බර සමුපකාරය මත පැටවීමට අප උත්සාහ කළත්, සමුපකාර ව්‍යාපාරයේ සෑහෙන දියුණුවක් නැති නිසා අප බලාපොරොත්තු වන තරම් ඉක්මනින් ඒ කටයුත්ත කරන්නට බැරි බව සමුපකාරය භාර ගරු ඇමතිතුමාට මා මතක් කරනවා. මේ රටේ ජනතාව අවුරුදු 50 ක් 60 ක් තිස්සේ සමුපකාරයෙන් ප්‍රයෝජන ගත්තා. පසුගිය රජයත් මේ රජයත් සමුපකාරයේ සම්බන්ධය ඇතිව ජනතාව අතර යම් යම් සංවර්ධන සැලැස්මවල් යෝජනා කර ක්‍රියාත්මක කර තිබෙනවා. එහෙත් අද සමුපකාර සමිති බොහොමයක්ම ක්‍රියා විරහිත වීම නිසා ඒ වැඩ පිළිවෙළවල් අඩපණ වී තිබෙනවා. ඊට හේතුව කුමක්දැයි අප කල්පනා කළ යුතුයි. මේ ගැන අප පසුගිය රජයටවත් මේ රජයටවත් දොස් කියන්නේ නැහැ. එහෙත්, සමුපකාරයට නව ජීවනයක් දිය යුතු කාලය දැන් එළඹ තිබෙන බව නම් මා මෙම ගරු සභාව තුළ ප්‍රකාශ කරනවා. සමුපකාරය සම්බන්ධයෙන් ජනතාවට අවශ්‍ය පියවරවල් ගැනීම සමුපකාර ආඥා පනත අනුව පවා අපහසු වන තත්ත්වයක් අද ඇති වී තිබෙනවා. ජනතාවත් ඔවුන්ගේ සංවර්ධන කටයුතුත් ශීඝ්‍රාකාරයෙන් දියුණු වේගෙන යතත්, බොහෝ සමුපකාර සමිති සංගම් දුර්වල වී තිබෙන නිසා එකී ව්‍යාපාරයන් ව්‍යාප්ත කරන්නට පුළුවන් කමක් නැති වී තිබෙනවා.

සමුපකාර ව්‍යාපාරය අතින් මේ විධියේ ප්‍රශ්නයකට මුහුණ පාන්නට අපට සිදු වී තිබෙන්නේ ප්‍රධාන වශයෙන්ම සමුපකාර දෙපාර්තමේන්තුවේ සෑහෙන පමණ සමුපකාර පරීක්ෂකවරුන් නැතිකම නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි මයා.]
මෙය සමුපකාර ව්‍යාපාරයේ දියුණුව අඩු වීමට බොහෝ දුරටම හේතු වී තිබෙන බව මා විශෙෂයෙන් සමුපකාරය භාර ගරු ඇමතිතුමාට මතක් කරනවා. බොහෝ සමුපකාර සමිති සංගම්වල ගණන් හිලවු පරීක්‍ෂණය හරියාකාර කෙරෙන්නේ නැහැ. සමහර ඒවායේ කෙරෙනත් කෙරෙන්නේ බොහෝ කල් ගත වීමෙන් පසුවයි. අවුරුදු 3, 4, 5 තිස්සේ ගණන් හිලවු නොබැලූ. ගණන් පරීක්ෂණ නොකළ සමුපකාර සමිති ලංකාවෙහි තිබෙනවා. ඒ වාගේම, අවුරුදු තුන හතරකින්වත් ගණන් පරීක්‍ෂණයක් නොකළ සමුපකාර සමිති සංගම්ද ලංකාවෙහි තිබෙනවා. රුපියල් දස දහස් ගණනින් කෝටි ගණනින් ගනු දෙනු කෙරෙන මෙවැනි ආයතන කලට වේලාවට නිසි අන්දමට ගණන් පරීක්ෂණ නොකිරීමෙන් ඒවායෙහි විශාල අඩුපාඩුකම් ඇති වී තිබෙනවා. එසේ වූ විට එම සමිතිවලටත් සංගම්වලටත් ඒවායේ කාරක සභාවලටත් දෝෂාරෝපණවලට මුහුණ පාන්නට වන නිසා ඒවායේ කටයුතු තවදුරටත් කර ගෙන යන්නට බැරි වී සම්පූර්ණයෙන්ම ඒවා කඩාකප්පල් වී යනවා.

විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙක්ම—විශෙෂයෙන්ම හබරාදූවෙ ගරු මන්ත්‍රීතුමාත් (ප්‍රින්ස් ගුණසේකර මයා.) මාතර ගරු මන්ත්‍රීතුමාත් (බී වයි. තුඩාවෙ මයා.)—මේ රජය විසින් සමුපකාර සංගම් විසුරුවා හැරීම ගැන කරුණු කිව්වා. එවැනි තත්ත්වයක් උද්ගත වී තිබෙන්නේ මා කී අන්දමට සමුපකාර සමිති හා සමිති සංගම් කලට වේලාවට ගණන් පරීක්ෂණ ආදිය නොකිරීමෙන් ඒවායේ කටයුතු ව්‍යාකූල වී තිබීම නිසයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදූව)
*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ)*
(Mr. Prins Gunasekera—Habaraduwa)
ඒ නිසා නොවෙයි.

**අමරසිරි මයා.**
*(திரு. அமரசிறி)*
(Mr. Amarasiri)
ඒ නිසා තමයි. හරියාකාර පාලනයක් ගෙන යමින් ජනතාවට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආදිය නියම අන්දමට බෙදා දීමට එම සමිති හා සංගම් අපොහොසත් වී තිබෙන නිසා ඒවායේ නියම පාලනය ඇති කිරීමට කටයුතු යෙදීම සඳහා ඒවා විසුරුවා හැර තිබෙනවා. ජනතාවට ප්‍රයෝජනයක් ලැබෙන ආකාරයට ඒවායේ කටයුතු කෙරෙන්නට ඕනෑ නිසා ඒවා රජයට පවරාගෙන ජනතාවට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආදිය කලට වේලාවට ලබා දීම සඳහා කටයුතු කරන්නට රජයට සිදු වුණා. දැන් ඒ විධියට කටයුතු කරගෙන යනවා. නමුත් එය දීර්ඝ කාලයක් කර ගෙන යාමට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදී අන්දමට සමුපකාර සමිති හා සංගම් නියමිත විධියට මහ ජන නියෝජිතයින් ලවා පාලනය කරවීමට විධිවිධාන යෙදීමට රජය ඉතාම ඉක්මනින් ක්‍රියා කරගෙන යනවා. ඒ වාගේම සමුපකාර සමිති හා සංගම්වල පාලන කටයුතු දැනට වඩා ක්‍රමවත් අන්දමින් කරගෙන යාමට සමුපකාර පරීක්ෂකවරුන් පත් කිරීමටත් ගරු ඇමතිතුමා ඉතාම ඉක්මනින් විධිවිධාන යොදාගෙන යන බව මා මතක් කරන්නට සතුටුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ සමුපකාර සමිති හයදහසක් පමණ තිබෙනවා. සමුපකාර සංගම් එකසිය විස්සක් පමණ තිබෙනවා. මේවායින් ලංකාවේ පාරිභෝගිකයින් එකසිය දශ ලක්ෂයකට පමණ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදා හරිනවා. සමුපකාර සමිති හයදහසෙන් ලංකාවේ දශ ලක්ෂයක් පමණ ගොවීන්ට ණය පහසුකම් සලසා දී තිබෙනවා. ගොවීන්ට දැන් ගොවි ජන සේවා දෙපාතීමේන්තුවෙන් හා සමුපකාර දෙපාතීමේන්තුවෙනුත් ණය පහසුකම් සලසා දී තිබෙනවා. එහෙත් සෑම ගොවියකුම සමුපකාර සමිතියක සාමාජිකයකු වී නොමැති නම් මේ පහසුකම් ලබා ගන්නට අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ. සමුපකාර සමිතිවල සාමාජිකත්වය වැඩි කිරීමට රජය වහාම පියවරක් ගත යුතුය කියා මා ප්‍රකාශ කර නවා. එසේ නොකළහොත් රජය ගොවීන්ටය කියා කොයි තරම් පහසුකම් යෙදුවත් කොයි තරම් ණය පහසුකම් යෙදුවත්, කොයි තරම් සංවර්ධන වැඩවලට මුදල් යෙදුවත්, ප්‍රයෝජනයක් වෙන්නෙ නැහැ. සෑම ගොවියකුම සමුපකාර සමිතියක සාමාජිකත්වය ලබා නැත්නම් ඔහුට මේ සලසා දී තිබෙන පහසුකම්වලින් නියමාකාරයට ප්‍රයෝජන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගන්නට අවකාශයක් ලැබෙන්නෙ නැ. එම නිසා ලංකාවේ සෑම ගොවි මහතකුම ප්‍රදේශයේ සමුපකාර සමිතියකට සම්බන්ධ කර වීම ගැන මා ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. එසේ නොකළහොත් මේ සලසා තිබෙන ණය පහසුකම්වලින් උපරිම සේවය ලබා ගන්නට නොහැකි වෙනවා. මේ සම්බන්ධව සමුපකාර දෙපාර්තමේන්තුව මගින් යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නියෝජනය කරන ප්‍රදේශයේ තේ වගා කරන විශාල සංඛ්‍යාවක් සිටිනවා. කුඩා තේ වතු හිමියන් විශාල සංඛ්‍යාවක් සිටිනවා. ඒ වාගේම ජනපද ව්‍යාපාරවල තේ වගාව කරන අයත් විශාල සංඛ්‍යාවක් සිටිනවා. කුඩා තේ වතු හිමියන්ටත් ජනපද ව්‍යාපාරවල තේ වගා කරන අයටත් මුහුණ පාන්නට සිදු වී තිබෙන බරපතළ ප්‍රශ්නයක් තමයි තේ මිළ අඩුවීම. මේ ප්‍රශ්නය පිළිබඳව රජය වරින් වර නොයෙකුත් ප්‍රතිකර්ම යෙදුවත්, ජනතාවට ප්‍රයෝජනයක් ලැබෙන විධියට තවම සෑහෙන ප්‍රතිකර්මයක් කර නැහැ. අපේ ප්‍රදේශවල තේ දළු මිළ ශත දහයට බැස තිබුණාය කියා මා පසුගිය අයවැය ලේඛන විවාදයේදී සඳහන් කළා. අද තත්ත්වය තරමක් සතුටුදායක වී තිබෙනවා. අද අමු දළු රාත්තල ශත 16, 18, 20 දක්වා නැග තිබෙනවා. එහෙත් අමු දළු රාත්තලක් ශත 25 කට 30 කටවත් විකුණා ගන්නට බැරි වුණොත් මේ කුඩා තේ වතු හිමියන්ටත් තේ ජනපද ව්‍යාපාරිකයන්ටත් තම ආර්ථික තත්ත්වය දියුණු කර ගන්නට පුළුවන් වෙන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම අද ඔවුන් ණය බරින් මිරිකෙමින් ජීවත් වෙන්නෙ. එම නිසා මේ ප්‍රශ්නය පිළිබඳව විශේෂ සැලකිල්ල යොමු කරන මෙන් මා ගරු වෙළඳ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. කුමන ක්‍රමයකින් හෝ පහත රට තේවලට සෑහෙන මිලක් ලබා දී කුඩා තේ වතු හිමියන්ටත්, ඒ වාගේම දුප්පත් තේ ජනපද ව්‍යාපාරිකයන්ටත් සහනයක් සලසා දීමට ක්‍රියා කරන මෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජය ගාලු දිස්ත්‍රික්කයේ විශාල සංවර්ධන ව්‍යාපාරයක් ආරම්භ කරන්නට ක්‍රියා කර ගෙන යනවා. ගිංගඟ සංවර්ධනය කිරීමේ හා ජල ගැල්මෙන් ඒ ප්‍රදේශය ආරක්ෂා කිරීමේ යෝජනා ක්‍රමය ගැනයි මා සඳහන් කරන්නෙ. එම යෝජනා ක්‍රමය වහාම ක්‍රියාත්මක කළ යුතුය කියා මා පසුගිය අය වැය ලේඛන විවාදයේදී කරුණු ඉදිරිපත් කළා. ඒ අනුව ජාතික රජයේ වාරිමාර්ග, ඉඩම් හා විදුලි බල කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විශේෂ සැලකිල්ලක් දක්වා එම සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරගෙන යනු දැකීම ගාලු දිස්ත්‍රික්කයේ හැම දෙනාගේම සතුටට කරුණක්. එම සංවර්ධන යෝජනා ක්‍රමය හිනිදුම ඡන්ද දායක කොට්ඨාශයට පමණක් නොවෙයි, බෙන්තර-ඇල්පිටිය, අක්මීමන, බද්දේගම හා ගාල්ල යන ඡන්දදායක කොට්ඨාශවලටත් බලපානවා. මෙම යෝජනා ක්‍රමය නිසා පවුල් 23,000 කට පමණ ගංවතුරෙන් සහනයක් ලැබෙන අතර අක්කර 50,000ක් පමණ සංවර්ධනය කිරීමටත් පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම ගිංගඟ සංවර්ධන යෝජනා ක්‍රමයට ඇතුළත් මාදුගැට ජලාශය ඉදි කිරීමෙන් පසුව එමගින් ජල විදුලි බලය නිපදවීම නිසා ගාලු දිස්ත්‍රික්කයට පමණක් නොව දකුණු පළාතටම විශාල වශයෙන් විදුලි බලය බෙදා හැරීම සඳහා විදුලි බල මධ්‍යස්ථානයක් ඇති කිරීමටත් පුළුවන් වෙනවා. මේ සංවර්ධන ව්‍යාපාරය සඳහා රුපියල් ලක්ෂ 1,000ට පමණ ආසන්න විශාල මුදලක් වියදම් වන බව ගණන් බලා තිබෙනවා. මෙහි මූලික සමීක්ෂණ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහතුන් විසින් ආරම්භ කර තිබෙනවා. එහි වැඩ ඉතා ඉක්මණින් කර ගෙන යන හැටියට අප ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

කෘෂි කර්මාන්ත කටයුතු සඳහා විශේෂ පරිශ්‍රමයක් දරන මේ කාලයේ වී පර්යේෂණාගාරයක් නොබෝද, රජය මගින් ආරම්භ කිරීම නිසා කෘෂි කර්මාන්තයේ යෙදෙන ලංකාවේ බහුතර ජනතාවට එයින් විශාල සේවයක් සිදු වෙනවා. අද ලංකාවේ වී වගා කෙරෙන ඉඩම් සීමා සහිත නිසා වී වගා කරන ඒ ඉඩම්වලින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට කටයුතු කිරීම තමයි, අපේ වදගත්ම කාර්යය විය යුත්තේ. නොයෙකුත් පර්යේෂණ මගින් අපේ වී අස්වැන්න වැඩි කර ගත්තේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි මයා.]
නැත්නම්, වී වගාව සඳහා ගොවීන් අතර කොයි තරම් ඉඩම් ප්‍රමාණයක් බෙදා දුන්නත් එයින් නියම ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. අද ලැබෙන අස්වැන්න දිහා බැලුවාම අපට පෙනෙනවා, වී බුසලකින් ලැබෙන්නේ බුසල් 40 ක් පමණ බව. වී බුසලකින් බුසල් 65 ක අස්වැන්නක් ලබා ගන්නට පුළුවන් නම්, ලංකාවට අවශ්‍ය සහල් ලංකාවෙන්ම ලබා ගන්නට පුළුවන් වෙනවා.

අපට ඒ තත්වයට ළඟා වන්නට පුළුවන්කම ලැබෙන්නේ වී ගොවිතැන සහ අස්වැන්න වැඩි කර ගැනීම සම්බන්ධයෙන් පර්යේෂණාගාරයක් ඇති කර, ඒ පර්යේෂණවල ප්‍රතිඵල අනුව වී වගාව හා අස්වැන්න වැඩි කර ගැනීම පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ගොවියන්ට උපදෙස් බෙදා හැරීමේ වැඩ පිළිවෙළක් යෙදුවොත් පමණයි. විශේෂයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව දැනට වඩා මේ පිළිබඳව සැලකිල්ලක් දක්විය යුතු බව මා කියන්නට කැමතියි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරි මහතුන් ගොවියන් හමුවට ගොස් කලට වේලාවට හරියාකාරව නිසි උපදෙස් නොදෙන නිසා අප බලාපොරොත්තු වන වේගයෙන් කෘෂිකර්මාන්ත කටයුතුවල දියුණුවක් නොලැබෙන නිසා, මා මේ පිළිබඳව එම දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කරවන්නට සතුටුයි. ඒ නිසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරි මහතුන්—විශේෂයෙන් ගොවියන් සමඟ නැත්නම් ගැමියන් සමග ආශ්‍රය කරන ඕවර්සියර් මහතුන්—වැඩි ගණනක් පත් කළ යුතුයි. අද ගම් 4 ක් 5 ක් සඳහා ඉන්නේ එක ඕවර්සියර් මහත්මයෙක් පමණයි. ඒ නිසා රසායනික පෝර දැමීම, කලට වේලාවට පැළෑටි නෙළීම, වී වැපිරීම ආදිය පිළිබඳව ගොවියන්ට උපදෙස් දීම, බිත්තර වී හා ඒ ඒ පොළවට ගැලපෙන අනෙකුත් වී ලබා දීම ආදි කටයුතු හරියාකාරව කිරීම සඳහා එක ගමකට එක ඕවර්සියර් මහත්මයකු බැගින්වත් පත් කරන හැටියට අප ඉල්ලා සිටිනවා. එසේ කිරීම සඳහා වැය වන මුදල වැඩි වුණත් ඒ මුදලට සරිලන ප්‍රයෝජනයක් ලබා ගන්නට පුළුවනි.

එපමණක් නොවෙයි. මට පෙර කථා කළ දෙඩම්ගස්ලන්දේ ගරු මන්ත්‍රීවරිය (ලැටිෂියා රාජපක්ෂ මිය.) ට්‍රැක්ටර් පරිහරණය ගැන විවේචනයක් කළා. අප ජීවත් වන්නේ යාන්ත්‍රික යුගයේ නිසා කෘෂිකාර්මික කටයුතුවලදී ට්‍රැක්ටර් ආදිය පාවිච්චි කිරීමෙන් අපේ වැඩ කටයුතු ඉක්මනින් සහ පහසුවෙන් කර ගන්නට අපට පුළුවන් වෙනවා. ඒ වාගේම වැඩි අස්වැන්නක් ලබා ගැනීමටත් එයින් පුළුවන් වෙනවා. මිනිස් ශ්‍රමය වැය කිරීමෙන් ගත හැකි ප්‍රයෝජනයට වඩා ප්‍රයෝජනයක් ගන්නට යන්ත්‍රවලින් පුළුවනි. මිනිස් ශ්‍රමය පාවිච්චියේත් සීමාවක් තිබෙනවා. වෙනත් කටයුතු මෙන්ම ගොවිතැන් වැඩ කටයුතුත් කඩිනමින් කර ගැනීම දැන් කාටත් අවශ්‍යයි. ඒ සඳහා ට්‍රැක්ටර් උපයෝගි කර ගැනීමෙන් බිය නැතිවම ඉක්මනිනුත් වැඩියෙනුත් ප්‍රතිඵල ලබා ගන්නට පුළුවනි. ඒවා ප්‍රයෝජනයට ගැනීම මේ කාලයට ගැළපෙනවා. ගොවිතැනට ට්‍රැක්ටර් ආදිය යොදා ගැනීමෙන් රක්ෂාවල් නැති වෙතැයි බිය වීමට වුවමනාවක් නැහැ. කෘෂිකර්ම සංවර්ධනය ශීඝ්‍රාකාරයෙන් කරගෙන යාමට නම් ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ අපේ රටට පිටරටවලින් ගෙන්වා ගන්නට ඕනෑ. ගෙන්වා ගනු ලබන ට්‍රැක්ටර් ඇතැම් අය වැරදි විධියට පාවිච්චි කරන අවස්ථා ඇති වෙනවා. ඒවාට ලැබෙන ඉඩ හැකි තාක් දුරට නැති කරන්නට ඕනෑ. දූෂණ සිදු වීමට ඇති ඉඩකඩ නැති කරන්නට විධිවිධාන යොදන්නට ඕනෑ.

මේ අයවැය ලේඛනයෙන් අපේ රටේ පොදු මහජනයාට විශාල සේවයක් සිදු වන බව කියන්නට කැමතියි. ගරු මුදල් ඇමතිතුමා මෙරට රාජ්‍ය සේවයේ නිරත සුළු සේවකයන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වා තිබීම ඇත්ත වශයෙන්ම සැලකිය යුතු කාරණයක්. රජයේ සුළු සේවකයන් මේ නිසා ගරු මුදල් ඇමතිතුමාට පමණක් නොව මුළු කැබිනට් මණ්ඩලයම ඇතුළු ආණ්ඩුවට ප්‍රශංසා කරනවා. තමන්ගේ ආර්ථික තත්ත්වයේ වෙනසක් දකින්නට මේ අය දීර්ඝ කාලයක් තිස්සේ බලාපොරොත්තුවෙන් සිටියා. පඩිනඩි ආදියෙන් තිබෙන අඩුපාඩුකම් නිසා නිතරම පාහේ ආර්ථික තත්ත්වයෙන් පිරිහී සිටි සුළු සේවකයන් ගැන යම් සැලකිල්ලක් දක්වන මේ ආණ්ඩුව රුපියල් 20කින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වුවත් ඔවුන්ගේ පඩිනඩි වැඩි කිරීමට කල්පනා කිරීම මේ අවස්ථාවේ ඇති වැදගත්කම ගැන කල්පනා කරන විට සැලකිය යුතු කාරණයක්. මේ රටේ ආර්ථික තත්ත්වය අවදානම් ලෙස පවතින මේ අවස්ථාවේ පවා අපගේ ආණ්ඩුව රජයේ සුළු සේවකයන්ගේ අමාරුකම් ගැන සලකා ඔවුන්ගේ සුවපහසු තකා ගත් මේ වැදගත් පියවර නිසා අපට ඔවුන්ගේ ප්‍රශංසාව හිමි වෙනවා. ආණ්ඩුවේ මේ ක්‍රියාව ආදර්ශයට ගෙන වෙළෙඳ අයතනවලත් මීට සමාන සැලකිලි ඇති කෙරෙතොත් එය ඉතා වැදගත් කරුණක් බව මා ප්‍රීතියෙන් සඳහන් කරනවා. ස්වාමි පක්ෂයත් සේවක පක්ෂයත් කැඳවා මේ ගැන සාකච්ඡා කර සුදුසු පියවරක් ගන්නට පුළුවන් නම් ඉතා හොඳ බව මා මේ අවස්ථාවේ මතක් කරනවා.

ලංකාවේ ඉතා වැදගත් වැඩ කොටසක් භාරවී සිටින සමුපකාර ව්‍යාපාරයේ යෙදී සිටින්නන් ගැනත් මේ අවස්ථාවේ සඳහන් කළ යුතුව තිබෙනවා. සමුපකාරයේ විසිපන් දහසකට අධික පිරිසක් සේවය කරනවා. ඒ අයටත් රජයේ සුළු සේවකයන් වෙනුවෙන් දීමට අදහස් කරන දීමනාව වැනි දීමනාවක් ලැබෙන්නට වැඩ පිළිවෙළක් සකස් කරතොත් බොහොම හොඳයි. සමුපකාර ව්‍යාපාරයෙන් මේ රටේ විශාල වැඩ කොටසක් බලාපොරොත්තු වෙනවා. මේ ව්‍යාපාරයේ යෙදී සිටින විශාල පිරිසගේ අනාගතය පිළිබඳව යම් වැදගත් වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා ක්‍රියා කළ යුතුව තිබෙනවා. මේ උදවියගේ සේවා කොන්දේසි, පඩිනඩි, සේවයේ ස්ථිරත්වය ආදී නොයෙක් දේ ගැන සොයා බලා නිසි පියවර ගැනීම සම්බන්ධයෙන් සමුපකාර කටයුතු භාර අමාත්‍යාංශය ක්‍රියා කරතැයි අපේක්ෂා කරනවා. මේ සම්බන්ධයෙන් දැනටමත් අමාත්‍යාංශයේත් ආණ්ඩුවේත් සැලකිල්ල යොමු වී තිබීම සමුපකාරයට ලැදියාවක් දක්වන කාගේත් සතුටට කාරණයක් බව මේ ගරු සභාවේදී ප්‍රකාශ කරන්නට කැමතියි. සුළු සේවකයන්ගේ ආර්ථික තත්ත්වය ගැන සලකා මේ ආණ්ඩුව ගත් ඒ වැදගත් පියවර නිසා ලංකාවේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ සහයෝගය ලැබෙන අතර ආණ්ඩුවේ සංවර්ධන කටයුතුවලදී තව තවත් ආණ්ඩුවට ඔවුන්ගේ නියම සහයෝගය ඉදිරි කාලයේදී ලැබෙන බව මට ස්ථිරවම කියන්නට පුළුවනි. ලංකාවේ වැඩ කරන ජනතාව මේ රජයට දක්වන ඒ සහයෝගය නිසා මේ රජය ඔවුන්ගේ දුක්ගැනවිලි ගැන සොයා බලා ඔවුන්ට නොයෙකුත් සහනයන් ලබා දෙනවා ඇති. ඒ නිසා ලංකාවේ ඉදිරි සංවර්ධන කටයුතුවලට ලොකු රුකුලක් ලැබෙනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයවැය ලේඛනය නිසා ලංකාවේ ජනතාවට ඉතාමත් සමෘද්ධිමත් අනාගතයක් උදා වන බව අපට පෙනෙනවා. කෘෂිකර්ම දියුණුව සඳහා පමණක් නොව, ධීවර කර්මාන්තය ආදි වෙනත් කර්මාන්ත දියුණු කිරීම සඳහාත් මේ අයවැය ලේඛනයෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ අනුව කර්මාන්ත අමාත්‍යාංශය මගින් ඉදිරි කාලයේදී මේ රටට විශාල සේවයක් කිරීමට විධිවිධාන සලසා තිබෙනවා. දැනට තිබෙන කර්මාන්තයන් පසුගිය රජය විසින් ඇති කරන ලද ඒවාය කියා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලා විසින් කියන්නට යෙදුණා. රටක් දියුණුව කරා යන විට රටේ නොයෙකුත් කර්මාන්ත ඇති වීම, නොයෙකුත් සංවර්ධන ව්‍යාපාර ඇති වීම ඒ දියුණුවේ ලක්ෂණයක්. ආණ්ඩු වරින් වර වෙනස් වන අතර ඒ ඒ කාලයට ගැළපෙන සංවර්ධන ව්‍යාපාර රටේ ඇති වෙනවා.

පසුගිය රජයේ කාලයේදී ජනසතු ව්‍යාපාර ඇති වුණා. මේ රජය ඒ ව්‍යාපාර තව දුරටත් දියුණු කර ඒ ව්‍යාපාරවල සේවය රටට හරියාකාර ලබා දීමට කටයුතු කරගෙන යනවා. මේ අයවැය ලේඛනයට විරුද්ධව විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් මොනවා කීවත් මේ අයවැය ලේඛනයෙන් රටට විශාල යහපතක් සැලසෙන බවත්, මහජනයා මේ රජයට ලබා දුන් බලය ඉතා හොඳින් පාවිච්චි කර මහජනතාවගේ යහපතට හේතුවන පරිදි මේ රජය රටේ සංවර්ධන කටයුතු කර ගෙන යන බවත් ප්‍රකාශ කරන අතර මේ අයවැය ලේඛනය ඉතාමත් ප්‍රීතියෙන් අනුමත කරන බව සඳහන් කරමින් මගේ කථාව අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 11.45

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.** (ගම්පහ)
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹா)*
(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් අටවා තිබෙන යටත් විජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව 19 වන වතාවටත් මේ 1967 අවුරුද්දේ අයවැය ලේඛනය ඉදිරිපත් කර තිබෙනවා. අධිරාජ්‍යවාදීන්ගේ ආධිපත්‍යය ඇති ආර්ථිකය හා එය බැඳුණු රටාවත් වෙනස් කිරීමට මේ ආණ්ඩුව පියවරක් ගෙන නැති බව මේ අයවැය ලේඛනයෙනුත් අපට පැහැදිලිව පෙනෙනවා. මීට පෙර සිටි සෑම මුදල් ඇමතිවරයකු මෙන්ම මේ මුදල් ඇමතිතුමත් ඔවුන්ගේ පන්ති පදනම අනුව කටයුතු කරන බවයි අපට පෙනෙන්නේ. පිටරට යවනු ලබන තේ, රබර්, පොල් වලට ලැබෙන අඩු මිල නිසා ආර්ථික තත්ත්වය දුර්වල වී ඇති බව පෙන්නුම් කරන අතර ඒ ගැන ආණ්ඩුවට කිසිවක් කළ නොහැකි බව සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයවැය ලේඛනයේ පිටරට අපිනු ලබන ද්‍රව්‍ය සහ මෙරටට ගෙන්වනු ලබන භාණ්ඩ අතර රුපියල් 22,50,00,000 ක හිඟ මුදලක් පෙන්නුම් කර තිබෙනවා. මේ හිඟය නිසා ඇති වන බර දුප්පත් මහජනතාවගේ කර පිට පැටවීමට මේ රජය බලාපොරොත්තු වන බව මුදල් ඇමතිතුමාගේ කථාවෙන් පෙනෙනවා. මේ රටට බඩු ගෙන්වීම සඳහා අය කරන බලපත්‍ර ගාස්තුව සියයට එකේ සිට දහය දක්වා වැඩි කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආර්ථික අර්බුදය ඇති වී තිබෙන්නේ මොන හේතු නිසාදැයි අපි සොයා බලමු. අධිරාජ්‍යවාදීන්ගේ පාලනය යටතේ පවත්නා ලෝක වෙළෙඳ පොළ ඒ ඒ ද්‍රව්‍යයන්ගේ මිල ඔවුන්ට උවමනා විධියට සකස් කර ගන්නවා. අප පිටරට යවන තේ පොල් රබර් ආදියෙහි මිල—විශේෂයෙන්ම තේ මිල—ඔවුන්ට වුවමනා විධියට සකස් කර ගන්නවා. ඒවා අඩු මිලට ගෙන පාරිභෝගිකයාට වැඩි මිලට අළෙවි කිරීමෙන් විශාල ලාභයක් උපයා ගන්නවා. ඒ එක්කම අධිරාජ්‍යවාදීන් මේ රටට එවන පාරිභෝගික ද්‍රව්‍යවල මිළ ක්‍රම ක්‍රමයෙන් වැඩි කරගෙන යනවා. අධිරාජ්‍යවාදීන් ඔය ආකාරයට දෙපැත්තෙන්ම සූරාගෙන කනවා. අධිරාජ්‍යවාදීන් රුපියල් විසි දෙකෝටි පණස් ලක්ෂයක ගසාකෑමක යෙදෙනවා. තේ වලින් ලැබෙන ලාභය පිට රට ගෙන යන්නට එපා යයි එදා තිබුණු ආණ්ඩුව අධිරාජ්‍යවාදීන්ට නියම කළා. කෝටි දහයක් තරම් වූ මුදලක් පිටරට ගෙන යන්නට එපා යයි එදා නියම කළා. දැන් ඒ කෝටි දහය වෙනුවට කෝටි විසි දෙක හමාරක් වෙනත් ක්‍රමයකට ගෙන යනවා. ඒ රුපියල් කෝටි විසිදෙක හමාරේ ලාභ මුදල නැවතත් විදේශීය ණය ආධාර හැටියට මේ රටට දෙනවා.

අවුරුද්දෙන් අවුරුද්ද වැඩි වන ජනගහණය දෙස බලන විට මේ ප්‍රශ්නය විසඳීමට යටත් විජිත කෘෂි කාර්මික ආර්ථිකය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්නට අපට සිදු වෙනවා. තම යටත් විජිතයක කුමන හෝ ද්‍රව්‍යයක් වැඩි දියුණු කිරීම අධිරාජ්‍යවාදීන්ගේ ක්‍රියා මාර්ගයයි. ඔවුන් කියුබාවේ උක් වගාව දියුණු කළා. ඝානාවේ කොකෝ වගාව දියුණු කළා. ලංකාවේ තේ වගාව දියුණු කළා. එසේ දියුණු කරන ඒ වගාවන් සම්පූර්ණ වශයෙන්ම ඔවුන්ගේ පාලනය යටතේ තබා ගන්නවා. අවසානයේ දී ඒ ඒ රටවල් ඒ ඒ ද්‍රව්‍යයන්ගෙන් යැපෙන තත්ත්වයට පරිවර්තනය කර ගන්නවා. අධිරාජ්‍යවාදීන් අපේ රටේ තේ වගාව ඇති කරගෙන ගිය කාලයේදී වියළි කලාපයේ තිබුණු අපේ පැරණි වැව් හරහා පාරවල් යොදා ඒ වැව් අහෝසි කර දමා, කඳුකර ප්‍රදේශයේ තිබුණු කැළෑ විනාශ කර දමා, පැරණි රජ කාලයේ තිබුණු දිය උල්පත් හා ඇළදොළවල් ආරක්ෂා වන ක්‍රම අහෝසි කර දමා ඔවුන්ට උවමනා පරිදි දුම්රිය මාර්ග හා මහා මාර්ග සකස් කර ගත්තා. වරායවල් ආදිය දියුණු කිරීම සඳහා අද වුණත් විදේශීය ආධාර දෙන්නේ ඒ උදව්යට වුවමනා පිළිවෙළට වෙළෙඳාම කර ගෙන යෑම උදෙසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිරාජ්‍යවාදීන් අටවා තිබෙන මේ යටත් විජිත ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව මේ පාර්ලිමේන්තුව පවා අපට පවරා දී තිබෙන්නේ සම්පූර්ණයෙන්ම හොර ගුහාවක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැලැස්මක් අනුව බව අපට පෙනෙනවා. එම නිසා මේ පාර්ලිමේන්තුවේ ඔය පැත්තෙන් හෝ වේවා මේ පැත්තෙන් හෝ වේවා මොන දෙයක් පිට වුණත් ඔන්න ඔය පදනම අනුව තමයි මේ රට ආණ්ඩු කෙරෙන්නේ. අවුරුදු 19 ක් තිස්සේම කෙරුණු පිළිවෙළ ඒකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකාර්මික සංවර්ධනය ගැන අද මේ ආණ්ඩුව කථා කරනවා. කෘෂිකාර්මික සංවර්ධනය කියන්නේ ආහාර වගාකිරීමම නොවෙයි. නවීන යන්ත්‍ර ගොවිතැනට පාවිච්චි කිරීමෙන් රක්ෂාව නැතිව යන වැඩි ජනතාව සඳහා ගම්බද ප්‍රදේශවල කර්මාන්ත සංවර්ධනය කිරීමට වුවමනා කරන අමුද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම කෘෂිකාර්මික සංවර්ධනයෙහි පදනම විය යුතුය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හාල් සේරුවක් කැපුවාට පසුව ආහාර සුලබ කිරීමේ ව්‍යාපාරය වශයෙන් වැඩිපුර වී වගා කර තිබෙනවාය කියා අද මේ ආණ්ඩුව පුරසාරම් දොඩනවා. අපි මේ ප්‍රශ්නය ගැන පරීක්ෂා කර බලමු. මේ රටේ අක්කරයකින් නිපදවන වී ප්‍රමාණයේ කිසිම වෙනසක් අද ඇති වී නැහැ. යම් වෙනසක් තිබෙනවා නම් ඒ වෙනස නිෂ්පාදනයේ අඩුවීමක් පමණයි. එක පැත්තකින් මින්නේරිය, පොළොන්නරුව, පදවිය, අනුරාධපුරය ආදී වියළි ප්‍රදේශවල කුඹුරුවලට වුවමනා ප්‍රමාණය ජලය නොලැබීම නිසා ඒවා පුරන් බිම් වේගෙන යන බව තමුන්නාන්සේලාට පෙනෙනවා. අනික් පැත්තෙන් නව නවත් සංවර්ධනය කරනවා යයි කියමින් කොම්පැනිකාරයින්ට—පෞද්ගලික ව්‍යාපාරිකයින්ට—ආණ්ඩුව ඉඩම් දීගෙන යනවා. 1958 දී ඇති කළ කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වී ගොවිතැනට ඇති හැකියාවන් ගැන පරීක්ෂා කර බලා වී ගොවිතැන සම්බන්ධව එම දිස්ත්‍රික්කය ලංකාවෙන්ම ඉතා හොඳ ස්වාභාවික තත්ත්වයක් ඇති ප්‍රදේශයක් හැටියට සලකා ක්‍රියා කළා අපට මතකයි. එහෙත් අද—අවුරුදු 9 කට පමණ පසුව—ඒ දිස්ත්‍රික්කයේ වී ඇස්වැන්න ක්‍රමානුකූලව අඩු වේගෙන යනවා. මේ ආණ්ඩුව අදහස් කරන්නේ වී අස්වැන්න වැඩි වන්නේ අස්වද්දනු ලැබූ කුඹුරු ප්‍රමාණය අනුවය කියලයි. එය වැරදියි.. මේ රජය විසින් කැලෑ අක්කර දහස් ගණනක් වගා කිරීම පිණිස පුද්ගලික කොම්පැනිකාරයන්ට දෙනු ලැබුවා. ඒ කොම්පැනිකාරයන් එම කැලෑ කපා පුලුස්සා හේන් ගොවිතැන් කරන ආකාරයට වී ගොවිතැන් කරන්ට යෙදුණා. කොම්පැනිකාරයන්ගේ හේන් ගොවිතැන් වලින් ලබාගත් වී ඇස්වැන්න, අද අස්වද්දා තිබෙන කුඹුරු වලින් ලබා ගත් අස්වැන්න හැටියට සංඛ්‍යා ලේඛනවලට ඇතුළත් කොට කුඹුරුවලින් ලැබූ අස්වැන්න වැඩි වෙලාය කියා සම්පූර්ණයෙන්ම වැරදි පිළිවෙළකට ගණන් හිලව් පෙන්වන්නට ආණ්ඩුව උත්සාහ කරනවා. අද මේ කොම්පැනිවලට දී තිබෙන ඉඩම් විනාශ වේගෙන යනවා. එම ඉඩම්වල පවතින සෝදාපාළුව නැති කිරීමට කිසිම වැයමක් දරා නැහැ. නැවත වරක් ආපසු ආණ්ඩුව ඒ ඉඩම් ලබා ගන්නා විට ඒවා පාළු ඉඩම් බවට පරිවර්තනය වීම ගැන කිසිම අඩමානයක් නැහැ. පස සෝදා යාම වැළැක්වීම සඳහා සැලැස්මක් යොදන්නේ නැතුව මේ රටේ ගොවිතැන් පිළිබඳව කිසිම ක්‍රියා මාර්ගයක් පවත්වා ගෙන යාම දුෂ්කරයි. අද දවසේ අක්කර 87,000 ක පමණ ඉඩම් එවැනි සැලැස්මක් අනුගමනය කරන්නේ නැතුවයි, කොම්පැනිකාරයන් වගා කරන්නට කල්පනා කරන්නේ. රසායනික පොහොර යෙදවීමට ප්‍රථම මුළු ලංකාවේම පස පිළිබඳ පරීක්ෂණයක් කිරීම අවශ්‍යයි. එසේ නැතිනම් වැරදි පොහොර යෙදීමෙන් ඉඩම් විනාශ වී යාමට ඉඩ තිබෙනවා. අද මේ රටේ ගොවීන්ගෙන් සියයට 75 ක් පමණම ගොවිතැන් කරන්නේ පැරණි ක්‍රමය අනුවමයි. කාලයක් තිස්සේ පාවිච්චි කරගෙන එන බිත්තර වීමයි, ඔවුන් විසින් පාවිච්චියට ගනු ලබන්නේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ශාස්ත්‍රානුකූලව සකස් කරන හොඳ බිත්තර වී වගී පාවිච්චියට ගැනීම පිණිස පස සකස් කිරීම සඳහා විශේෂ වියදමක් දැරිය යුතුයි. විශේෂයෙන් ට්‍රැක්ටර් යන්ත්‍ර යනාදිය මාර්ගයෙන් පස සකස් කිරීමෙහි නිරත විය යුතුයි. ඒ හැරත්, බිත්තර වී ගැනීම සඳහා වැඩිපුර වියදමක් දැරිය යුතුයි. ශාස්ත්‍රානුකූලව කෘෂිකර්ම දෙපාර්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

මේන්තුව මගින් සකස් කරන බිත්තර වී ගොවීන් කාලාන්තරයක් තිස්සේ පාවිච්චි කරන බිත්තර වී වලට වඩා පහසු වෙන් නොයෙක් රෝගවලට ගොදුරු විය හැකියි. මේ අනුව නැවත වරක් වගාව වෙනුවෙන් තම කාලයත් ධනයත් වැය කරන්ට ගොවීන්ට සිදු වෙනව. "එච්—4" වී වර්ගය හරකුන් යොදවා පාගන්න පුළුවන් වී වර්ගයක් නොවෙයි. ඒ වර්ගය පාගන්න පුළුවන් ට්‍රැක්ටර්වලින් පමණයි. ඒ සඳහා ගොවීන්ට තව මුදලක් වැය කිරීමට සිදු වෙනවා. මෙපමණ මුදලක් වැය කළත් ජල ගැල්ම, නියඟ ආදී දුෂ් කරතාවයන්ට මුහුණ පාන්නට සිදු වන ගොවීන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ශාස්ත්‍රානුකූලව සකස් කළ බිත්තර වී වර්ග පාවිච්චි කිරීමෙන් සාර් ථක ප්‍රතිඵල ලබා ගැනීමට පුළුවන් වේය කියන විශ්වාසයක් නැහැ. කෘෂිකර්ම දියුණුව සඳහා ක්‍රියා කරනවාය කියන මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ කෙරෙහි ගොවීන් තුළ විශ්වාසයක් නැහැ. තවමත් සියයට 75 ක් පමණ ගොවීන් අදහස් කරන්නේ අඩු වියදමින්, අවදානම් අඩු තමන්ගේ බිත්තර වී වර්ග පාවිච්චි කර තමන්ට ඊළඟ කන්නය තෙක් ආහාරය සඳහා අවශ්‍ය අස්වැන්න ලබා ගැනීමයි.

ගොවීන්ට උවමනා කරන උපකරණ සහ වෙනත් සේවාවන් ඒ ඒ ආයතන මගින් ක්‍රියාත්මක කිරීමේදී, සියයට දහයකවත් දක්ෂතාවයක් නැති බැවින්, ගොවීන් තවදුරටත් අධෛර්යමත් වෙනවා. එමෙන්ම සමුපකාර සමිති මගින් ණය පහසුකම් කලට වේලාවට ලැබෙන්නෙ නැහැ. ගොවීන්ට පොහොර ලැබෙන්නෙ සමහර විට ගොයම් කපන කාලයටයි. ට්‍රැක්ටර් ආදිය වුවමනා වෙලාවට ලැබෙන් නෙ නැහැ. සහතික මිළ ක්‍රමයේ සිදු වන වංචාවන් නිසා අස්වැන්න විකුණා ගැනී මේදී තමන්ට නියමිත මිළ ලබා ගැනීමට ගොවීන්ට අවහිරකම් තිබෙනවා. මෙපමණ කලක් ඇති වුණ සියලුම ආණ්ඩු කෘෂි කාර්මික සැලැස්මන් සකස් කිරීමේදී ගොවීන්ගේ සහභාගිත්වය නැතිවය සැලැස්මන් සකස් කර තිබෙන්නේ කියන එක මතක් කරන්න සතුටුයි. එම නිසා එම සැලැස්මන් සකස් කර තිබෙන්නේ ඔවුන්ගේ ඕනෑ එපාකම් සහ බලාපොරොත්තු අනුව නොවේ. ඔවුන්ගේ ඉලක්ක මොනවා දැයි දැන ගෙන ආණ්ඩු වෙන් ඔවුන්ට දිය හැකි උපකරණ සහ වෙනත් ආධාර අවබෝධ කරගෙන මේ රටේ ක්‍රම සම්පාදක මණ්ඩල "Planning Boards" සැලැස්මන් සකස් කිරීමේදී ක්‍රියා කර නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ පවත්වන අංශය "එච්-8" නමැති වී වර්ගය සම්බන්ධයෙන් විශාල පියවරක් ගෙන තිබෙනව. එක ගහකින් පඳුරු තිහ-හතලිහක් වගේ වැඩි අස්වැන්නක් ලැබෙන වී වර්ගයක් තමයි, මේ "එච්-8" නමැති වර්ගය. විශේෂයෙන්ම ඒ වර්ගයෙන් එක්තරා ගොවි මහත්මයකු 1 න් 162 ක අස්වැන්නක් ලබාගෙන තිබෙන බව මා දන්නවා. එම නිසා ගොවීන් අතරේ මෙම වී වර්ගය වැඩි වැඩියෙන් පැතිරී යාම අවශ්‍යයි. ඒ සඳහා වුවමනා කරන ආධාර ගොවීන්ට ලබා දීමත් අවශ්‍යයි.

වී ගොවිතැනින් අස්වැද්දූ අක්කර 12 ලක්ෂයක වගා ප්‍රමාණයක් මේ රටේ තිබෙ නවා. ඇතැම් උදවිය දැන් පොල් වතුවල උස් බිම්වල වී ගොවිතැන් කිරීම පටන් ගෙන තිබෙනවා. ලෝකයේ වෙනත් රටවල වී වගා වලින් ලබා ගන්න අස්වැන්නෙන් දෙකෙන් පංගුවක්වත් මේ රටේ වී ගොවි තැනින් අපට ලබා ගන්නට බැරි මොන හේතුවක් නිසාදැයි, මේ ආණ්ඩුව පොල් වතුවල වී වගා කරන්නට පළමු සොයා බැලිය යුතුව තිබෙනවා. පොල් වතුවල තිබෙන තණබිම් හරකුන් ඇති කිරීමට අවශ්‍ය දෙයක්. අපට අවශ්‍ය කිරි ආදිය ලබා ගැනීම සඳහා හරකුන් ඇති කිරීමට ඒ තණබිම් ප්‍රයෝජනවත් වෙනවා.

මේ ආණ්ඩුව විසින් පෞද්ගලික කොම් පැනිවලට දී තිබෙන ඉඩම් ගැන මොහො තකට කල්පනා කර බලමු. මා හිතන හැටි යට, මේ රජය විසින් ඒ ඉඩම් එම කොම් පැනිවලට දෙන්නට ඇත්තේ ඒවායෙහි මිරිස්, අර්තාපල්, සුදලූනු, ලූනු, කොත්ත මල්ලි, පරිප්පු, මුංඇට, තල, ආදී දේවල් වගා කිරීමටයි. එහෙත් අද ඒ කොම්පැනි කාරයින් එම ඉඩම්වල මොනවාද කරන්නේ ? ඔවුන් ඒවායෙහි කැලෑ කපා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සම්පූර්ණයෙන්ම එළි කොට ගේන් ගොවි තැන් කරනවා. එම නිසා ඒවායෙහි මතු පිට තිබෙන පෝර පස සම්පූර්ණයෙන්ම සෝදාගෙන ගොස් එම ඉඩම් නිසරු පාළු ඉඩම් බවට පරිවර්තනය වෙනවා. කොම්පැනිවලට දී තිබෙන ඉඩම් නවීන ක්‍රම අනුව මිස පැරණි ක්‍රම අනුව පාවිච්චි කරන්නට ඉඩ දීම වැරදියි. මෙම ඉඩම් අක්කර 87,000 වගා කිරීම උදෙසා ට්‍රැක්ටර්, ජීප් හා වෙනත් යන්ත්‍රෝපකරණ ගෙන්වීමට අද මේ ආණ්ඩුව විදේශ විනිමය විශාල ප්‍රමාණයක් වැය කර තිබෙනවා. අද මේ රටේ ගොවීන් 50 ලක්ෂයක් සිටිනවා. එයින් සමහර දෙනකු නමින් පමණක් ගොවීන්. ඔවුන්ට ඉඩම් අඟලක්වත් නැහැ. ඒ ගොවීන්ට මේ ඉඩම් ටික දුන්නා නම් අද කොම්පැනි මාර්ගයෙන් ලබා ගන්නට බලාපොරොත්තු වන අස්වැන්නම කිසිම විදේශ විනිමයක් වැය නොකර ලබා ගන්නට මේ ආණ්ඩුවට පුළුවන්කම තිබුණා. මිරිස් සහ වෙනත් භෝග වගා කිරීමට පෞද්ගලික කොම්පැනිවලට දී තිබෙන ඉඩම්වලින් මෙතෙක් කොපමණ මිරිස් සහ භෝග ප්‍රමාණයක් වගා කර තිබෙනවාද? මට දැනගන්නට ලැබී තිබෙන ආරංචියේ හැටියට නම් අක්කර 87,000න් මිරිස් වගා කර තිබෙන්නේ අක්කර දෙකහමාරක් පමණයි. මිරිස් පිට රටින් ගෙන්වීමට ඇදී යන කෝටි හතර හමාරක පමණ මුදලක් මෙහිම නතර කර ගැනීම උදෙසා ආණ්ඩුව මෙන්න අරගෙන තිබෙන පියවර. මිරිස් අක්කර දෙකහමාරක් වවා තිබෙනවා. එසේම මුසාජීලාට මහියංගන ප්‍රදේශයෙන් කැලෑ ඉඩම් අක්කර දහස් ගණන් දී තිබෙනවා. වෙනකක් තබා මේ වැය කරන මුදල්වලට මේ සමාගම්වලට ආදායම් බදු සහනයන් පවා සලසා දී තිබෙනවා. එහෙත් අද මුසාජී සමාගම මොනවාද කර තිබෙන්නෙ? සත්ව ආහාර යනාදිය වවා, තිරිඟු යනාදිය වවා එක පැත්තකින් රුපියල් ලක්ෂ ගණන් ආදායම් බදු සහනයන් ගන්නවා. අනෙක් පැත්තෙන් අධික මිළකට ඒ ද්‍රව්‍ය විකුණනවා. සත්ව ආහාර ටොන් එකක් පිටරටින් ගෙන්වීමටත් මේ රටේ නිෂ්පාදනය කිරීමටත් වැය වන මුදලෙහි වෙනස කුමක්ද කියා බලමු. මේවායින් ලාභයක් තිබෙනවා නම් කොම්පැනිකාරයින් සත්ව ආහාර මිළ අඩු නොකරන්නෙ කුමන හේතුවක් නිසාද? අද ඉතාමත් සුළු ආදායමක් ඇතිව නැත්නම් කිසිම ආදායමක් නැතිවයි මේ රටේ සත්ව පාලනය ගෙන යන්නෙ. මේ රටේ සත්ව පාලන ව්‍යාපාර වැඩි හරියක තත්ත්වය එයයි. අද බිත්තරයක මිළ ශත 17 දක්වා බැස තිබෙනවා. එහෙත් කුකුළු කෑමවල මිළ කොහොමද? කුකුළු කෑම මිළ ඒ තිබුණු ඉහළ තත්ත්වයෙන්මයි අදත් පවතින්නෙ.

ඊළඟට, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව මගින් කලින් සියයට 2 1/2 පොළියට ගොවීන්ට ණය පහසුකම් සලසා දී තිබුණා. එහෙත් අද සමුපකාර සමිති මාර්ගයෙන් මහජන බැංකුවෙන් සියයට 12 පොළියට ගොවීන්ට ණය මුදල් ලබා ගන්නට සිදු වී තිබෙනවා.

ඒ වාගේම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ට්‍රැක්ටර් මධ්‍යස්ථාන තිබුණා. මේ ට්‍රැක්ටර් මධ්‍යස්ථාන මගින් සාමාන්‍ය ගොවියකුට අක්කරයක් හාන්නට රුපියල් 25ක් පමණ වැය වුණා. එහෙත් අද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ට්‍රැක්ටර් මධ්‍යස්ථාන වසා දමා ඒවා පෞද්ගලික ව්‍යාපාරිකයන්ට භාර දෙන්නට කටයුතු සලසා තිබෙනවා. එමනිසා අක්කරයක් හාන්නට වැය වන මුදල දැනටමත් රුපියල් 25 සිට 50 දක්වා වැඩි වී තිබෙනවා මේ ට්‍රැක්ටර් මධ්‍යස්ථාන හරියාකාරව පාලනය වුණේ නැත්නම් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට තිබුණේ ඒවා වසා දමා පෞද්ගලික ව්‍යාපාරිකයන්ට භාර දෙන්නට නොවෙයි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැරදි හරිගස්සා ගැනීමටයි. ට්‍රැක්ටර් මධ්‍යස්ථාන පවත්වා ගෙන යෑම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නැත්නම් ආණ්ඩුව මහජනයාට අවශ්‍ය සේවාවක් හැටියට සලකන්නට ඕනෑ. එය රජයෙන් ගොවීන්ට කරන සේවයක් හැටියට සලකන්නට ඕනෑ. මේ රටේ ආහාර සුලභ කිරීමේ ව්‍යාපාරය, රට ස්වයංපෝෂිත කිරීමේ ව්‍යාපාරය සාර්ථක කර ගන්නට නම් එසේ කල්පනා කර ක්‍රියා කිරීම අවශ්‍යයි. ගොවියා ගේ කර උඩින් තර වන්නට එක එක පෞද්ගලික ව්‍යාපාරිකයන්ට ආණ්ඩුව ඉඩ දෙනවා නම්, ආණ්ඩුව



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙන යන්නේ රට ආහාරයෙන් ස්වයං පෝෂිත කිරීමේ ව්‍යාපාරයක් නොවන බව එයින් පෙනෙනවා.

එපමණක් නොවෙයි. ගම්බද ප්‍රදේශවල තිබෙන ගොවි පාසල්—පේරාදෙණිය කෘෂි කර්ම පාඨශාලා—ආදිය වසා දමන්නට කෘෂිකර්ම ඇමතිතුමා අදහස් කරන බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. මේ පාඨශාලා නිසා ගම්බද ප්‍රදේශවල ඉන්නා තරුණයන්ට කෘෂිකාර්මික අධ්‍යාපනයක් ලබා ගන්නට පුළුවන්කම තිබුණා. එම නිසා එම කෘෂි කර්ම පාඨශාලා පවත්වාගෙන යාම අත්‍ය වශ්‍ය සේවයක් හැටියට රජය කල්පනා කරන්නට ඕනෑ. එම කෘෂිකර්ම පාඨශාලා වල අධ්‍යාපනය ලබා පිට වන තරුණයන්ට රක්ෂා සැපයීමට ආණ්ඩුවේ කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම අපොහොසත් වී ඇති නිසා නැත්නම් විධිමත් කෘෂිකාර්මික සංවර්ධන සැලැස්මක් නැති නිසා එම පාඨ ශාලා වසා දමන්නට මේ ආණ්ඩුව අදහස් කරනවා. අද රක්ෂා නොමැති ජ්‍යෙෂ්ඨ සම තුන් 10,00,000ක් පමණ ඉන්නවා. ජ්‍යෙෂ්ඨ සමතුන්ට රක්ෂා සැපයීමත් අමාරු නිසා ඒ ප්‍රතිපත්තිය අනුව ආණ්ඩුව අනෙකුත් පාඨශාලාත් වසා දමාවි. ඒ නිසා කෘෂිකර්ම ඇමතිතුමාගෙන් අප ඉල්ලා සිටිනවා, කෘෂිකර්ම පාඨශාලා වසා දැමීමේ ඒ පියවර නොගන්නා ලෙස.

ඊළඟට අර්තාපල් වගාව ගැනත් කරුණු ස්වල්පයක් ඉදිරිපත් කරන්නට මා අද හස් කරනවා. 1945 දී ඇති වුණ යුද්ධ තත්ත්වය නිසා නුවරඑළිය ප්‍රදේ ශයේ මහගස්තොට කියන ගමේ පළමු වරට ආණ්ඩුව විසින් අර්තාපල් ගොවි පොළක් ආරම්භ කළා. එදා අර්තාපල් රාත් තලක මිල රුපියල් 1.50 යි. ඒ පළමු වැනි වතාවේදීම අර්තාපල් වගාවෙන් ඉතා සාර් ථක ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් වුණා. එහෙත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ මතයක් පැතුරුණා, එන්න එන්නම මේ අර්තාපල් ප්‍රමාණයෙන් කුඩා වෙනවාය කියා. මේ ගැන ශාස්ත්‍රීය පර්යේෂණයක් කිරීම සඳහා 1950 දී පමණ කමිටුවක් පත් කළා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මතය වැරදි බව ඒ පර්යේෂණ කමිටුවේ අත්හදා බැලීම්වලින් පෙනී ගියා. ඒ අනුව රහංගල ගුරුතලාවේ පර්යේෂණාගාරයක් ආරම්භ කර, අර්තාපල් වගාව වැඩි දියුණු කිරීම සඳහා රජයේ ගොවිපොළක් පවත් වාගෙන යෑමට කටයුතු කළා. 1952 වන විට තීරණය කළා, අර්තාපල් වගාව මේ රටේ ඉතා සාර්ථක ලෙස කරන්නට පුළු වන් දෙයක් බව. වැලිමඩ ආදී ප්‍රදේශවල එළවළු වගා කරන ගොවීන් පවා ඉතා විශාල ලෙස අර්තාපල් වගාව කරගෙන යාමට පටන් ගත්තා. 1952 සිට 1955 දක්වා අර්තාපල් වගාව අවාසනාවන්ත ලෙස අසාර්ථක වුණා. අර්තාපල් වගාව එසේ අසාර්ථක වුණේ ඇතැම් කොටස් ගෙන ගිය කඩාකප්පල් කිරීමේ ව්‍යාපාරයන් නිසයි. ඒ කඩාකප්පල් කාරී ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් වශයෙන් 1955 දී කෘෂිකර්ම ඇමතිතුමාට සිද්ධ වුණා, රහංගල අර්තාපල් පර්යේෂණ මධ්‍යස්ථානය වසා දමන්නට. ඊට හේතු වශයෙන් කියා සිටියේ, අර්තාපල් වගාවට රෝග වැළදෙන විෂ බීජ මර්ධනය කරන්නට බැරි බවයි. 1955 දී මේ අනුව රහංගල ගොවිපළේ ඉඩම් කොටස් කර ගොවීන් අතරේ බෙදා දුන්නා. ඉන්පසු 1956යේ ඇති වූ ආණ්ඩුව උඩුකින්ද අර්තාපල් ගොවීන්ගේ සංගමය ඉදිරිපත් කළ කරුණු අනුව රහංගල අර්තාපල් පර්යේෂණ යතනය ආරම්භ කර ගොඩනැගිලිත් ඉඩම් ආදියත් ලබා ගෙන නැවත වැඩ ආරම්භ කළා. 1956 ජූනි 2 වැනිදා එවකට සිටි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාත් අර්තාපල් නිලධාරි නෝමන් ගුණතිලක මහත්මයාත් අතර ඇති වූ මතභේදයක් නිසා කෘෂිකර්ම නිලධාරි මණ්ඩලයේ කමිටුව මඟින් අධ්‍යක්ෂවරයාට අභියෝගයක් කළා, 1957 වන විට අර්තාපල් ටොන් දෙදහක් නිපදවන්නට නෝමන් ගුණතිලක මහතාට බැරිවුණොත් තමන් ගේ තනතුරින් පවා අස් වීමට ලැස්ති බවට.

1956න් පසු, එදා තිබුණු සමුපකාර තොග වෙළෙඳ ආයතනය—සී. ඩබ්ලිව්. ඊ. —මාර්ගයෙන් වැලිමඩ ගොවීන් අර්තාපල් විශාල තොගයක් නිෂ්පාදනය කළා. ඒවා සාර්ථක ලෙස විකුණන්නටත් ඒ අයට පුළුවන් වුණා. මේ ව්‍යාපාරය සාර්ථක ලෙස ගෙන යන්නට පුළුවන් වුණේ ලය නල් සමරක්කොඩි මහත්මයාත් නෝමන් ගුණතිලක මහත්මයාත් එම ව්‍යාපාරයේ යෙදී සිටි ගොවි සහෝදරයින්ගේත් උනන්දුව නිසා බව විශේෂයෙන් සඳහන් කළ යුතුව තිබෙනවා. 1959න් පසු, එදා හිටපු කෘෂිකර්ම ඇමතිතුමාගේ වැඩ කට යුතු කොටසත් සී. පී. ද සිල්වා ඇමතිතුමා භාර ගත් පසු, අර්තාපල් වගාවට නැවතත් 1955න් පෙර තිබුණු අවහිරකම් ඇති වෙන්නට පටන් ගත්තා. ආණ්ඩුවෙන් දීගෙන ආ ආධාර සම්පූර්ණ යෙන්ම නැවැත්වූවා. අර්තාපල් වගාවට නොයෙක් නොයෙක් ආකාරයේ ලෙඩ රෝග පැතිරී යන්නට පටන් ගත්තා. අර්තාපල් වගාව කඩාකප්පල් කිරීමට ඇතැම් අය මහන්සි ගන්න බව 1961 වන විට ගොවීන් තේරුම් ගන්නට පටන් ගත්තා. නෝමන් ගුණතිලක මහත්මයාත් එතැනින් මාරු කරනු ලැබුවා. ඒ පළාතට යාම පවා ඒ මහත්මයාට තහනම් කළා. මේ ගැන ගොවීන් එකතු වී නොයෙක් නොයෙක් ආකාරයට ගරු ඇමතිතුමාට කරුණු කියා සිටි නමුත් ඇමතිතුමා ඊට කන් දුන්නේ නැහැ. ගරු ඇමතිතුමා උත්සාහ කරන්නේත් මේ ව්‍යාපාරය අහෝසි කිරීමටය යන්න මේ සිද්ධීන් අනුව ගොවීන් තේරුම් ගත්තා. 1961, 1962 වන විට උඩුකින්ද ප්‍රදේශයේ ඉඩම් සියල්ලක්ම පාහේ තේ වගා කිරීම සඳහා ගොවීන් අතරේ බෙදා දෙනු ලැබුවා. 1962 දී අර්තාපල් වගා කරන්නන්ගේ සංගමය මඟින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවටත්, ඇමති අංශයටත් අර්තාපල් වගාව අහෝසි කිරීම සම්බන්ධව විශේෂ චෝදනා රැසක් ඉදිරිපත් කරනු ලැබුවා.

විදේශාධාර ක්‍රමය යටතේ අර්තාපල් වගාව සම්බන්ධයෙන් උපදෙස් දීමට පැමිණි විශේෂඥයන් ගැන යම්කිසි තීරණයකට බසින්නට ගොවි ජනතාවට සිදු වුණා. ලංකාවට පැමිණි විශේෂඥයන් අතර දෙස්තර ලාබෝ නැමැති ඇමෙරිකානු විශේෂඥයාත් සිම්ලා විශ්ව විද්‍යාලයේ පුෂ්කනාත් මහත්මයාත් බටහිර ජර්මනියේ දෙස්තර සීසර් මහත්මයාත් ලංකාවට ආවේ අර්තාපල් වගාව විනාශ කිරීමට බව ඒ ගොවීන් තීරණය කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1962 දි එදා සිටි සී. පී. ද සිල්වා කෘෂිකර්ම ඇමතිතුමා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා, වැලිමඩ ප්‍රදේශයේ අර්තාපල් වගාව නවත්වා ඇපල් වගාව ආරම්භ කරන්න විශේෂඥයන් එතුමාට උපදෙස් දී තිබෙනවාය කියා. 1962 දි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කළා, නෝමන් ගුණතිලක මහත්මයා අදක්ෂ පාලකයෙක්ය, ඒ නිසා ඔහුව අස් කරන්නය කියා. එහෙත් මේ සෑම අවහිරයකටම මුහුණ පා, සෑම කඩාකප්පල්කාරී ක්‍රියාවක්ම මධ්‍යයේ ලයනල් සමරක්කොඩි මහත්මයත් නෝමන් ගුණතිලක මහත්මයත් අර්තාපල් ගොවීනුත් ඔප්පු කර තිබෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

නවා, මේ ආණ්ඩුවට නියමිත සැලැස්මක් අනුව අවුරුදු දෙකක් තුළ අර්තාපල් වලින් මේ රට ස්වයම්පෝෂිත කිරීමට පුළුවන් බව.

තේ, රබර්, පොල් ආදී ද්‍රව්‍යයන් මෙන් මේ අර්තාපල් වගාව විදේශ විනිමය ලබා ගත හැකි වෙළෙඳ වගාවක්. ලංකාවට වුවමනා කරන්නේ අක්කර 15,000 ක වැවෙන අර්තාපල් පමණයි. අර්තාපල් අක්කරයකින් හොණ්ඩර දහ අටක අස්වැන්නක් ලබාගත හැකියි. නුවරඑළි දිස්ත්‍රික්කයේම අර්තාපල් වවන්නට පුළුවන් අක්කර 5,000ක් තිබෙනවා. ඉහළ ඌව—බදුල්ල—ප්‍රදේශයේ අක්කර 25,000 ක් තිබෙනවා. නුවර, මාතලේ ආදි දිස්ත්‍රික්ක වල පොළොවත් අර්තාපල් වගාවට ඉතාමත්ම සුදුසුයි. වියළි ප්‍රදේශවලත් අර්තාපල් වගාවට සුදුසු අක්කර 3,00,000 ක පමණ සුදුසු බිම් ප්‍රමාණයක් තිබෙනවා. හම්බන්තොට, තිස්සමහාරාමය, මොනරාගල, අම්පාරේ, මඩකලපුව, ත්‍රිකුණාමලය, මයියංගනය, මිණිපේ, බුත්තල, වැල්ලවාය, පොලොන්නරුව, අනුරාධපුරය, දඹුල්ල, එලහැර, ලග්ගල, සීගිරිය, මිහින්තලේ, වව්නියාව, මැදවච්චිය, මන්නාරම, ගලිගමුව, මාහෝ, නිකවැරටිය, තබ්බෝව, යාපනය, කිලිනොච්චිය, ඇඹිලිපිටිය, ආනමඩුව, කන්තලේ, කොට්ටුකච්චිය, රාජාංගනය, ගල්ඔය ආදි ප්‍රදේශ අර්තාපල් වගාවට සුදුසු බව ඒ ප්‍රදේශවල ගොවීන් ඔප්පු කර තිබෙනවා.

පැරණි යටත්විජිතවාදී, අධිරාජ්‍යවාදී පාලන ක්‍රමය අනුව කච්චේරියක දිසාපතියෙක් හෝ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයෙක් ලයනල් සමරක්කොඩි මහත්මයාට හෝ නෝමන් ගුණතිලක මහත්මයාට හෝ අර්තාපල් වගාව සම්බන්ධයෙන් මේ පිළිවෙළට කටයුතු කරන්නය කීවාට, මේ වගාව දියුණු වන්නේ නැහැ. දැනට තිබෙන යටත්විජිතවාදී, අධිරාජ්‍යවාදී පරිපාලන යන්ත්‍රය සංවර්ධන සැලැස්මක් අනුව සම්පූර්ණයෙන්ම පරිවර්තනය කිරීම අවශ්‍යයි. එසේ කළොත් මේ රටේ ගොවීන්ගෙන් අවශ්‍ය සහයෝගය ලබා ගන්නට පුළුවන් වෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්මය පිළිබඳ යටත්විජිතවාදී ආර්ථික ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්නට ඕනෑ. තේ, රබර්, පොල් වෙනුවට කපු, උක්, දුම්කොළ, හණ, ඉරිඟු රටකජු, මයියොක්කා ආදී වගාවන් මේ රටේ දියුණු කරන්නට ඕනෑ. ලෝක වෙළෙඳ පොළේ තේ මිළ දිනෙන් දින අඩු වීම දැක දැකත් ඉඩම් ඇමතිතුමා රජයේ වැවිලි සංයුක්ත මණ්ඩලයට කියන්නේ තව තවත් තේ වවන්නටයි. තේ වෙනුවට යටත් විජිත වගාවලින් පිටස්තර වූ වගාවන් වැවිලි සංයුක්ත මණ්ඩලයෙන් ආරම්භ කරනවා නම් එයින් මේ රටට ලොකු යහපතක් සැලසෙනවා. ගොවි හමුදාවත් සම්බන්ධ කරගෙන කෘෂිකර්ම ඇමති අංශය යටතේ ඒ අනෙක් වගාවන් ඇති කිරීමට පියවර ගන්නවා නම් බොහොම හොඳයි. හැබැයි, ඒ ඒ වගාවන් සඳහා සහතික මිලක් ගොවීන්ට දීම සඳහා ඇති කිරීම අවශ්‍යයි. මේ රටේ කෘෂිකම් ආර්ථිකය මේ ආකාරයට විප්ලවීය වෙනස් කිරීමක් අනුව; වී සඳහා සහතික මිළ යෝජනා ක්‍රමයක් ඇති කර තිබෙන්නා වාගේම අනෙකුත් වගාවන් සඳහාත් සහතික මිළ යෝජනා ක්‍රම ඇති කොට ඒ වගාවල යෙදීමෙන් ගොවියන් හට සැලසෙන ලාභ ප්‍රයෝජන ඔවුන්ට පැහැදිළිව පෙන්නුම් කර දෙමින් ඔවුන්ගේ සහයෝගය ලබා ගතහොත් පමණයි, මේ රටෙහි කෘෂිකම් සංවර්ධනයක් ඇති කර ගන්නට අපට පුළුවන් වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා තවත් මිනිත්තු කීපයකට වඩා කථා කරන්නට අදහස් කරන්නෙ නැහැ. අවසාන වශයෙන් ගරු මුදල් ඇමතිතුමාට මෙන්න මේ කරුණු ටික පෙන්වා දෙන්නට කැමතියි. 1934 තරමේදී මින්නේරිය, පොළොන්නරුව වැනි ප්‍රදේශවල මීහරක් බානක් රුපියල් පණහකට හැටකට වඩා මිළ වුණේ නැහැ. එහෙත් අද මීහරක් බානක මිළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රුපියල් හාරසියයයි; නැත්නම් පන්සිය යයි. 1956 දී ට්‍රැක්ටර් යන්ත්‍ර මාර්ග යෙන් අක්කරයක් හාන්නට වියදම් වුණේ රුපියල් විසිහතහමාරයි. එහෙත් අද ඒ සඳහා රුපියල් හැත්තෑවක් වුවම නායි. 1956 දී උදැල්ලක මිළ රුපියල් හත රයි. එහෙත් අද රුපියල් දෙළහමාරක් නැතිව උදැල්ලක් මිළයට ගන්නට බැහැ. 1956 දී පෝර හොණ්ඩරයක මිළ රුපියල් අටහමාරයි. අද ඒ සඳහා රුපියල් දහ තුනක් දෙන්නට ඕනෑ. 1940 දී අක්කර පහක් වගා කිරීම සඳහා ගොවි මහතකුට සාමාන්‍යයෙන් රුපියල් පණහකට නැත් නම් සියයකට වඩා එක කන්නයකට ණය වන්නට සිදු වුණේ නැහැ. 1956 දී රුපියල් හත්සිය පණහක් හෝ දාහක් නැතිව අක්කර පහක් වගා කරන් නට බැරි වුණා. එහෙත් අද අක්කර පහක් වගා කිරීම සඳහා ගොවි මහතකුට රුපියල් දෙදාහක් පමණ ණය වන්නට සිදු වී තිබෙ නවා. අද ආණ්ඩුව ඇමෙරිකන් අධිරාජ්‍ය වාදීන්ට ණයින් යට වෙනවා මෙන්ම ගොවීනුත් ඒ ආකාරයටම ණයින් යට වී සිටින බව සඳහන් කිරීමට සතුටුයි. මේ ආණ්ඩුව රට ආහාරය අතින් ස්වයංපෝෂිත කරන්නට යන්නේ ඔය පදනම උඩයි. වී සඳහා ලැබුණු සහතික මිළක් හැරුණු විට 1932 සිට 1956 දක්වා මේ රටේ සිටි ගොවියන්ට වෙනත් අයිති වාසිකමක් ලැබුණේ නැහැ. 1956 දී උදා වූ නව යුගයෙන් පසුව ගොවියන්ට පහසුකම් සැලසුණා. ණය මුදල් ලබා ගැනීමේ හා පෝර ලබා ගැනීමේ පහසුකම් ගොවියන්ට ලැබුණා. ඒ වගේම තම තමන් නිෂ්පාදන ය කරන දේ සඳහා නියමිත ස්ථිර මිළක් ලැබුණා. විශේෂයෙන්ම කුඹුරු පනත නිසා ගොවියන්ට අයිතිවාසිකම් ලැබුණා. දැනට අවුරුදු දෙකකට පෙර ගොවි මහතකු විකුණු වී බුසලකට ඔහුට රුපියල් දොළහක් ලැබුණා නම් ඒ මුදලින් ඔහුට අල හොණ් ඩරයක් ගත හැකිව තිබුණා. එහෙත් අද රුපියල් දොළහකට වී බුසලක් විකිනී මෙන් ඔහුට ගන්නට පුළුවන් වන්නේ අල රාත්තල් දහයයි. අද ජීවන වියදම ඒ තරමටම ඉහළ ගිහිල්ලා. අපනයන තීරු ගාස්තු සියයට එකේ සිට සියයට දහය දක්වා ඉහළ නැංවීමෙන් මෙම ආණ්ඩුව එක් පුද්ගලයකුට රුපියල් හතළිහක වැඩි පුර බරක් පටවා තිබෙනවා. රුපියල් හත ළිහක බරක් පටවා ඇතැම් කොටස්වලට රුපියල් විස්සක දීමනාවක් ලබා දෙන් නට ක්‍රියා කර තිබෙනවා. එහෙත් ගොවි ජනතාවට කිසිම සහනයක් ලබා දී නැහැ. එසේ හෙයින් ගොවි ජනතාව ඉල්ලා සිටින්නේ—විශේෂයෙන් ලංකා කොමි යුනිස්ට් පක්ෂ විප්ලවකාරී කඳවුරේ මාගී දේශකත්වයෙන් තිබෙන සමස්ත ලංකා ගොවි සම්මේලනය මාගීයෙන් ගොවි ජන තාව ඉල්ලා සිටින්නේ—ඔවුන්ගේ වීවල මිළ රුපියල් දෙළහේ සිට පහළොව දක්වා වැඩි කරන ලෙසටයි. ගරු මුදල් ඇමතිතුමා මෙම ගරු සභාවට පැමිණ සිටින්නේ ගොවි ප්‍රදේශයකිනුයි. ඒ මහතා ගුරුවරයකු වශයෙන් සිටියදී වුණත් ප්‍රධාන වශයෙන් ගොවියකු බව අප දන්නවා. එසේ හෙයින් මා එතුමාට කියන්නේ ගොවි ජනතාවගේ විශ්වාසය දිනාගෙන සමාජවාදී පදනමක් අනුව මෙම ආණ්ඩුව ප්‍රශ්න විසඳීමට ලෑස්ති වෙනවා නම් ඉදිරියට යන්නට පුළුවන් බවයි. එසේ නොකළහොත් 1970 දී හාල් පිටරට යවන්නට පුළුවන් වන තරමට මේ රට ස්වයංපෝෂිත වෙනැයි ගරු අගමැතිතුමා කීවත්, ඇත් තෙන්ම ඊට පෙර මෙම ආණ්ඩුව පෙරළී යන්නට ඉඩ ඇති බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 12.38

**ඩී. බී. රණතුංග මයා.** (කොත්මලේ)
(*திரு. டீ. பி. ரணதுங்க—கொத்மலே*)
(Mr. D. B. Ranatunga—Kotmale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කළ ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මයා.) විසින් සඳ හන් කරන ලද කාරණා කීපයක් ගැන මුලින්ම මගේ අදහස් ප්‍රකාශ කරන්නට කැමතියි. 1956දී ගොවි උපකරණවල මිළත් අද ඒවායේ මිළත් ගැන එතුමා සඳහන් කළා. එතුමාට එක කාරණයක් අමතක වන්නට ඇති. 1956 දී පහසු මිළකට ගොවි උපකරණ ගන්නට පුළුවන් වුණා නම් එසේ පුළුවන් වුණේ ඊට කලින් පැවැති ආණ්ඩුව විසින් කරන ලද වැඩ නිසයි. 1956 සිට 1965 දක්වා වූ කාලය තුළදී ගොවි උපකරණ ලබා ගැනීමේ අපහසුකම් කොතරම්දැයි ගම්පහ ගරු මන්ත්‍රීතුමාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රණතුංග මයා.]

අමතක වුණා. අපේ ගරු මුදල් ඇමතිතුමාගේ පළමුවැනි අයවැය ලේඛනයෙන්ම ගොවි ජනතාවට සහනයක් සලසා දුන් බවත් ගම්පහ ගරු මන්ත්‍රීතුමාට අමතක වුණා.

ගොවි ණය ගැනත් එතුමා සඳහන් කළා. ගොවියන් ණය බරින් බැඳ තබමින් කෘෂි කර්ම පදනම ආරම්භ කර ඇති බවටත් එතුමා මෙම ආණ්ඩුවට චෝදනා කළා. මේ වර ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය මගින් ගොවියන්ට පහසුවෙන් ණය ලබා ගන්නට කටයුතු යොදා තිබෙනවා. මීට පෙර ඇපකාරයන් සොයාගෙන නොයෙකුත් අපහසුකම්වලට මුහුණ පාමින් ණය ලබා ගන්නටයි, සිදු වුණේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
දැනුත් ඇපකාරයන් ඕනෑ.

**රණතුංග මයා.**
*(திரு. ரணதுங்க)*
(Mr. Ranatunga)
එසේ වුනත් ඉස්සරට වඩා පහසුයි.

අපනයන තීරු ගාස්තු සුළු ප්‍රමාණයකින් වැඩි කිරීම ගැන ලොකු භයක් විරුද්ධ පාර්ශ්වයට තිබෙනවා. ඒ වැඩි කරන තීරු ගාස්තුව පාරිභෝගිකයා පිට නොපටවන බව ගරු මුදල් ඇමතිතුමා සිය අය වැය ලේඛන කථාවේදී ප්‍රකාශ කළා. රටට බඩු ගෙන්වන විට එසේ ගෙන්වනු ලබන්නේ පාරිභෝගිකයා නොව විශාල ධනපතියන් විසින් බව අප තේරුම් ගන්නට ඕනෑ; විශේෂයෙන් විරුද්ධ පක්ෂයේ උගත් මන්ත්‍රීවරුන් තේරුම් ගන්නට ඕනෑ. ඒ නිසා ඒ විධියේ බද්දක් අය කිරීමෙන් ඒ බර පාරිභෝගිකයා පිට පැටවෙන්නේ නැත්නම් එවැනි බද්දක් අය කළාට වරදක් නැහැ. එහෙත් ඒ බර පාරිභෝගිකයා පිට නොපැටවෙන බවට පොරොන්දුවක් ඕනෑ. ඒ පොරොන්දුව ගරු මුදල් ඇමතිතුමා විසින් එතුමාගේ අයවැය කථාවේදී පැහැදිලිව දී තිබෙනවා. ඒ නිසා ගම්පහ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ඒ තර්කයෙහි ඒ තරම් සත්‍යයක් නොපෙනෙන හෙයින් ඒ පිළිබඳව බිය වීමට කරුණක් අපට නැහැ.

දිගටම කතාවන්ගෙන් වෙහෙසව ඉන්න
ගරු මැති ඇමතිවරුනට කවි රස දන්න
අයවැය පිළිබඳව කවියෙන් අමතන්න
මැති සබ මූලසුනෙන් මට අවසර දෙන්න

රටෙත් නායක ජගත් නායක අපේ අගමැති සේන නායක
උගත් ඇමතින් පිරිස එක් වී තෙවෙනි වසරට රජයෙ ජාතික
සකස් කළ අයවැයෙකි මේ මැති සබාවට ගරු වන්නි නායක
උසස්කම එහි කියා පැමට මෙන්න මේවයි හොඳම සාදක

මහා පැරකුම් දකුසෙන් රජ දරුවො මහ වැව් සයුරු කරවා
අපේ මීමුත්තනගෙ ඇට කටු රැඳුන පස් කඳු තුළට හරවා
වගාකොට වී ඉරිඟු කුරහන් නිල් ගොයම් සළු බිමට පොරවා
කවා සනසා ලූහ ජාතිය බතින් බුලතින් හෙලය පුරවා

යොදු මුළු වෙර වැයමින් හැම අහලකම බිම අහර වැව්වා
බෙදු ජනතාවටම අස්වනු වැඩිමනත් පිට රටට යැව්වා
මුදු ජාතිය බඩසයින් අන්රටුනගේ බඩගිනි ද නිව්වා
එදු හෙලයට ''පෙරදිගෙහි ගබඩාව'' යන නම ලොවම කිව්වා

එකම දිය බිංදුවක් තරමට වැටෙන මේ ලක් පොලොව මත්තේ
රටට කිසියම් පලක් නොමගෙන අහක යන්නට නොදිය යුත්තේ
එවැනි අදහස් පිරුණු පැරකුම් යුගය ආදූරුසයට ගත්තේ
ඩඩ්ලි—ඩී. ඇස්. වගේ ගොවි රජ පුතුන් පමණයි මොකද නැත්තේ

ලක් බිම සරු කරන්නට දුර දකින ඇසින්
සැලසුම් සදන හැටි ජාතික රජය විසින්
අයවැය කතාවෙන් වැටහී නියම ලෙසින්
මහ ජනතාව පසසති අද හතර දෙසින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැතිනිගේ කාලයෙදි ජාතික දනය වැය මරු මුවට ගැලුවේ
තිබුන ටික කෑවා විනා නැත සොයන උපයන මගක් බැලුවේ
කවුද රට දූය බේද කරවා එවැනි පරිහානියක හෙලුවේ
වමේ නායක පිරිස වෙති රත්තරන් මොළ ඇත කියන ඔළුවේ

මැණික් ගල තම පයේ හැපුනට කනෙක් එය අහුලා ගනීවිද
ගොනෙක් පිට උඩ හකුරු පැටවූවාට ඌ පැණි රස විඳීවිද
මලක් සුවඳින් පිරී තිබුණත් එයට නිලමැස්සෙකු ඇදේවිද
බණක් දහමක් නොදත් කොමිනිස්වරුන් රට හැදූමක් දනීවිද

කලක් තිස්සේ රජයෙ සේවක පිරිස ගෙන ගිය තියුණු සටනේ
පලක් ගෙන්නා දෙන්ට තුන් හවුලටම ඉඩකඩ නැද්ද තිබුණේ
හුදෙක් ඔවුනගෙ සහන සලසා වැටුප වැඩි කර දෙන්න යෙදුණේ
මෙතෙක් මේ අය වැයෙන් මිස වෙන කාට ඔවුනගෙ රිදුම දැනුණේ

අපේ දනයද විදෙස් විනිමය විනාසෙට යොමු කරපු යුගයක
අනාගත පරපුරෙහි රැකියා පැණය විසඳනු පිණිස ටිකටික
නොයෙක් දේවල් නිපදවන කම්හල් තනන්නට රටෙහි එකිනෙක
මුදල් වෙන් කර තිබුම මේ අයවැයෙහි වෙසෙසක් බවද කිවහැක

මුදල් ඇමතිව සිටිය කාලෙදි විසාරදයැයි කියන ලොක්කේ
උදළුතලයයි අමුඩ කෙටියයි මිරිස් ලූණු කියටද වික්කේ
කාලයක් යන විටයි මේ අඩු පාඩු හැම පිරිමැසිය හැක්කේ
වමට මේවා මතක නැති හැටි රටේ අගහිඟ අදද දැක්කේ

ගෙයක් සාද ගන්න හෝ ගොවිතැනක් ඉඩමක් දියුණු කෙරුමට
ණයක් ගන්නට වුවමනා වූ විටදි අසරණ දිලිඳු ගැමිනට
මහත් කරදර තිබුණි බදු ගෙවනවුන් පසුයනු පිණිස ඇපයට
තවත් නැහැ ඒ අතුරු බාදක පහසුවෙයි ණය මුදල් ගැනුමට

බිඳුණු වැව් කඳු පණ පෙවේවි—අලුත් වැව් තව තව හැදේවී
කඳුකරෙන් එන සිසිල දරා වියළි බිම් අතරට ඇදේවී
යෙදුණු කරදර නැතිව ගොවිනට සියලු සෙත පහසුව සැදේවී
නුදුරු කාලෙදි රටේ හැම තැන නිල් ගොයම් කෙත් කිරි වැදේවී

නොයෙක් රට රටවල
නැගෙද්දී යුද කලබල
නැගුණි හැම බඩු මිල
එයයි ආහර හිඟයෙ සුලමුල

පිටරටින් මෙහි එන
අහර බඩු ටික නැති තැන
මැරෙන්නට සිදු වන
බවක් පැහැදිලි ලෙසින් දැන ගෙන

අපහට වුව මනා
අහර රෙදිපිළි අදිනා
මෙරටෙහි නිප දනා
පියවරක් අරගන්ට යෙ දුනා

ඒ හැම සලස් වන
දූයෙහි දියුණට දෙස් දෙන
විලසින් සකස් වුණ
අයවැයකි මෙය හරිම ලස්සන

යුක්තිය අබය වීරත්වය බලය පිට
සත්තිය දුන්න හෙල මහරජ දරුව කුට
කොත්මල් මවුන් ගැන තොරතුරු ලුහුඬු කොට
විස්තර කරන්නට අවසර ලැබෙනු මට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රණතුංග මයා]

පිය රජුගෙන් වෙන්ව ගාමිණී කුමරු    එද
රට දූය සමය ගැන සිතිවිලි පහළුවෙ    රඳා
ගතකළ කලක් අතහිත ගොවිතැනට    යොද
මගෙ කොත් මලය මට ලෝකෙට වැඩිය    හොඳා

සිංහල හාලෙ බත කොස් දෙල් බුදින    කටයි
සංකර නොමැති ලේ හැම සිරුරකම    නටයි
උන්ගේ හපන්කම ගොවිතැන් කරන    විටයි
තුන් සිංහලය කොත්මලෙ ගොවියනට    යටයි

අහසින් වැටෙන පොළොවින් එන වතුර    පොදත්
ගොවිතැන් කරන බිම තෙත් වනු පිණිස    යොදත්
ගුණදම් රකින අකුසල අවගුණය    නොදත්
පැරකුම් ගැමුණු දරුවන් මෙහි වෙසෙති    අදත්

සස්වග සුලබ කඳුහෙල් මිටියාව    ත්‍ය
දිය ඇලි සාන්තයි නිල්වන් වන පෙ    ත්‍ය
දෙනයන පිණයි බැලූ බැලූ තැන රසව    ත්‍ය
ලස්සනකමින් කොත්මල් ලඳ පොහොස    ත්‍ය

මුළුරට දියුණට ඇදෙන    වෙලාවක
ඒ වැනි ලස්සන සොඳුරු    පලාතක
පවතින දුක් කම්කටොලු    බලා දුක
කෙටියෙන් පලකළ යුතුය    මගේ දුක

හතරවටින් මහ තේවතු වට    වී
ගැමියෝ ජීවත් වෙති තදබද    වී
ඉඩම් ලබා ඔවුනට සහනය    වී
ජීවත් වන්නට ඉඩ දෙනු මැන    වී

මින්නේරිය ගල්ඔය උඩවල    වෙ
යන්නට මේ අය රුවි බව පල    වෙ
ඔවුනට ඉඩ දුන්නොත් ඒ පොල    වෙ
ලංකාවෙන් සාගිනි බිය ගැල    වෙ

මහගස් මුල් එක භූස්මට    ගලවයි
ගොවිතැන් කොට සාගිනි යකු    එලවයි
කොත්මල් ගොවියන් මුළු රට    නලවයි
රට සරුකරවා ලෝකය    හොලවයි

ඒ විදියට ඉඩකඩ සැල    සේනම්
රජයෙන් දියහැකි අනුබල    දේනම්
රට වැඩුමට යුගයක    අවදනම්
කොත්මල් ජනතාවම    සූදනම්

ඉතා වැදගත් දෙයකි මේ ගරු සබාවට නොකියාම    බැනේ
අපේ තේ දළු දනුත් විකුණනු ලැබේ සත අට නවය    ගානේ
අසාධාරණයක්ය මේ ගැන කිසිම රජයක් හිතුවෙ    නැනේ
කුඩා තේ වතු හිමියනට සහනයක් සලසා දෙන්ට    ඕනේ

තරුණ තරුණියො දහස් ගණනට රැකී රක්සා තවම    නැත්තේ
ටික දෙනෙක් වැඩ කරනි සුළු පඩියකට සුදු මිනිසුනගෙ    වත්තේ
සැලසුමක් ඇති සියුම් වැඩ පිළිවෙළකි මේ ගැන යෙදිය    යුත්තේ
මෙයද විසඳනු පිණිස ජාතික රජය පමණයි අපට    ඇත්තේ

ගෙන ආ අයවැයක් දියුණට සිහල    බිම
මුදල් ඇමතිහට ඉස්තුති කරමි    මම
ඉල්ලා එයට ඡන්දය හැම කෙනෙකු    ගෙම
මගෙ කවි කතාවත් මෙතෙකින් කරමි    නිම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! The Sitting is suspended till 2 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්සිටුවන ලදින් අ. භා. 2ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு பி.ப. 2 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 2 p.m. and then resumed.*

**ස්ටැන්ලි තිලකරත්න මයා.** (කෝට්ටේ)
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)*
(Mr. Stanley Tillekeratne—Kotte)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ බංකු දිහා බැලුවාම කලින් කථා කළ මන්ත්‍රී කෙනෙකුයි, මට පසුව කථා කරන මන්ත්‍රීතුමායි ඇරෙන්න අගමැතිතුමා ඇතුළු මුළු කැබිනට්ටුවවත් මෙතැන නැතිවා විතරක් නොවෙයි, පාර්ලිමේන්තු ලේකම්වරුන් නැතිවා විතරක් නොවෙයි, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ද නැති බව පෙනී යනවා. හිස් මොළ තිබෙන හිස් ආණ්ඩුවකට මෙවැනි අවස්ථාවකදී විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් කථා කරන්නට ඉඩ ප්‍රස්තාව ලැබීම ගැන, වරප්‍රසාදය හිමිවීම ගැන ඔබටයි මගේ ස්තුතිය; ආණ්ඩු පක්ෂයට එම ස්තුතිය කිසිසේත්ම හිමි වෙන්නෙ නැහැ. දැන් පිළ වෙලාවකට ප්‍රථමයෙන්, කෑම පැයට ප්‍රථමයෙන්, ඇමති පුටුවල කොනක වාඩි වී හිටිය එක්තරා මන්ත්‍රීවරයෙක්. අගමැතිතුමා නම් හිටියෙ නැහැ. මක්නිසාද? එයා වර්තමාන අගමැති. අනාගත අගමැති නම් මුල්ලක වාඩිවෙලා හිටිය. ඒ තමයි, කන්කසන්තුරේ පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. ජේ. වී. චෙල්වනායගම් මහත්මයා. අද කථාවක් කළ හිනිදුම ගරු මන්ත්‍රීතුමායි (අමරසිරි මයා.) කථාවක් බලාපොරොත්තුවෙන් සිටින වත්තේගම මන්ත්‍රීතුමායි (වීරකෝන් මයා.) ඇරෙන්න වෙනත් කිසිම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් මේ ගරු සභාවේ නැහැ. මෙවැනි බංකොලොත් භාවයක් මේ ආණ්ඩුවට මෙතරම් සුළු කාල සීමාවකදී ලැබෙයි කියා අපි බලාපොරොත්තු වුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය ලේඛනත් ඇහුව, මේ විධියේ අයවැය ලේඛනයක් නම් ජීවිතයෙදීම අපි ඇහුවෙ නැහැ. මමත් මේ ගරු සභාවේ අවුරුදු 7 ක් හිටිය. මේ කාලය තුළදී නොයෙක් මුදල් ඇමතිවරුන්ගේ අයවැය ලේඛන මම ඇහුව. මේ අයවැය කථාව අහන්ට මම ආවෙ නැහැ. මම කල්පනා කළා, අහන්ට දෙයක් නැහැ කියල. එහෙත් ඓතිහාසික නමක් තිබෙන කෝට්ටේ ශ්‍රී ජයවර්ධන පුරය වෙනුවෙන් පෙනී සිටින නිසා වචන ස්වල්පයක් මේ අයවැය ලේඛනය ගැන කථා කිරීම මගේ යුතුකමක් වශයෙන් මා සලකන නිසයි, අද මේ විවාදයට සහභාගි වන්ට මා අදහස් කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉංග්‍රීසි කථාවක් තිබෙනව, "The writing is on the wall" කියා. ආණ්ඩු පක්ෂය පිටිපස්ස බලන්නෙ නැහැ. ඇයි? ඒගොල්ලන්ට අනාගතයක් නැති බව ඒ අය දන්නව. ඒ බව බිත්තියේම ලියල අවසානයි. මේ හත් හවුල් රජයට අනාගතයක් නැහැ. මේ ගරු අගමැතිතුමාගේ හත් හවුල් ආණ්ඩුව මහා මැතිවරණයකට ගියොත් 1956 දී වගේ ඒ අයගේ ආසන සංඛ්‍යාව පහළ බහිනව. 1956 දි 8ට බැස්ස. සමහර විට අනාගතයේදී දැනට මේ ගරු සභාවේ සිටින වත්තේගම ගරු මන්ත්‍රීතුමායි, (වීරකෝන් මයා.) හිනිදුම මන්ත්‍රීතුමායි (අමරසිරි මයා.) ඇරෙන්න අනික් කට්ටිය මේ සභාවට පත්ව එයි කියා මම විශ්වාස කරන්නෙ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

ඇයි, මම නැද්ද?

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නම් ඇවිල්ල ඉන්නෙ හුඟක් සටන් කරලයි. අද රටේ තිබෙන තත්ත්වය අනුව නැවත වරක් මම නම් මේ ගරු සභාවට එනව කියලයි මම හිතන්නෙ. නැවත ආණ්ඩුවක් පිහිටුවන කාලය ආවාම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට පෙනෙයි, 1956 දි විරුද්ධ පාර්ශ්වයට එක්සත් ජාතික පක්ෂයෙන් 8 දෙනෙක් ආව වගේ අඩු ගණනක්—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි තිලකරත්න මයා.]

සමහරවිට ඊටත් අඩු ගණනක්—විරුද්ධ පාර්ශ්වයට එක්සත් ජාතික පක්ෂයෙන් පත් වී එන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයවැය ලේඛනය දිහා බලන්න. මට මේ ගැන කථා කරන්ට සිදුවෙලා තිබෙන්නෙ "පොයින්ට්" ක්‍රමය අනුවයි. පැය භාගය කින් අයවැය ගැන කථා කරන්ට බැරි බව තමුන්නාන්සේ දන්නව. අයවැය ලේඛනයේ පළමුවෙනි ප්‍රශ්නය මොකක් ද? රටට ලොකු ප්‍රකාශයක් කර තිබෙනව "අපි පඩි වැඩි කෙරුව" කියා. මේ පඩි වැඩි කිරීම බලපවත්වන්නේ රජයේ හා පළාත් පාලන අංශයේ සේවකයන්ට විතරයි. 3,00,000 කට ආසන්න සංඛ්‍යාවකට මෙය බලපානව. මූලික පඩිය රුපියල් 100 ට අඩු අයට රුපියල් 20 කුත් මූලික පඩිය රුපියල් 300 ට, අඩු එහෙත් සියයට වැඩි අයට රුපියල් 10 කුත් වශයෙන් අතිරේක දීමනාවක් ගෙවන්ට යෝජනා කර තිබෙනව. අද ලංකාවේ ජනගහනය ලක්ෂ 120 ක් පමණ වෙනව. එයින් ලක්ෂ $3\frac{1}{2}$ කට විතරක් රුපියල් 20 සහ 10 වශයෙන් පඩි වැඩි කර මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්දැයි මා තමුන්නාන්සේගෙන් අහන්ට කැමතියි. කට අඬ ඇහෙන කොට එක් එක්කෙනා එන හැටි පේනවා නේද? නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම හොඳයි. ඔය විධියට තමයි හැදෙන්න ඕනෑ. ඒ කෙසේ හෝ මේ රටේ ජීවත් වන ජනතාවගෙන් ඉතා සුළු කොටසකට පමණක් මාසයකට රු. 10, 20 ආදී වශයෙන් පඩි වැඩි කිරීමෙන් පමණක් මහ ජනයාගේ ආර්ථික ප්‍රශ්න සියල්ලම විසඳන්නට පුළුවන්යයි මේ ආණ්ඩුව කියනවාද?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
කියන්නේ නැහැ.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)
කියන්නට බැහැ. මේ රටේ 120 ලක්ෂයක් ජනතාවගේ ප්‍රශ්න විසඳෙන්නට—ජීවන අංකය පහළ දමන්නට, තමන්ට ලැබෙන පඩියෙන් ජීවත් වන්නට පුළුවන් මාර්ග ජනතාවට සලස්වා දෙන්නට—මේ ආණ්ඩුව අදහස් කරනවා නම් කළ යුතුව තිබුණේ මේ වගේ පඩි වැඩි කිරීමක් නොව අද සීඝ්‍රයෙන් වැඩි වේගෙන යන ජීවන අංකය පහළ දැමීමට මාර්ගයක් සකස් කිරීමයි.

මේ අය වැය ලේඛණය ඉදිරිපත් වුණායින් පසු මිනිසුන් මේ ගැන කියන්නේ මොනවාදැයි තමුන්නාන්සේලා ටිකක් සෝදිසි කර බලන්න. ගරු මුදල් ඇමතිවන්තිනායක මහත්මයා අවුරුදු තුනකට පසු නැවතත් පාර්ලිමේන්තුවේදී පුස්සක් බින්දායයි ඔවුන් කියනවා. මේ වර අය වැය ලේඛනය ඉස්තරම්ම එකක් වේය, එයින් රටට යහපතක් වන්නට යනවාය, ආදී වශයෙන් විශාල බලාපොරොත්තු අය වැය කථාව කරන්නට කලින් නම් මිනිසුන් තුළ ඇති වී තිබුණා. එහෙත්, අය වැය කථාව මෙම සභාවෙහි කෙරුණු දා හැන්දෑවේ මිනිසුන් කීවේ, මුදල් ඇමතිතුමා තුන් වැනි වරටත් පුස්සක් බින්ද බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අය වැය ලේඛනයේ ප්‍රතිඵල මොනවා දැයි අපි ටිකක් කල්පනා කර බලමු. මේ ආණ්ඩුවේ සිටින අය බලයට එන්නට කලින් ජනතාවට කිව්වේ මොනවාද? රටපුරා මැතිවරණ රැස්වීම් පවත්වාගෙන යන කාලයේ දී පළාත් පාලන කටයුතු පිළිබඳ ගරු උප ඇමතිතුමා ප්‍රයිස් පාක් පිට්ටනියෙහි තිබුණු රැස්වීමකදී කියා සිටියේ——

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ප්‍රයිස් පාක් එකේ රැස්වීමක් තිබ්බෙත් නෑ.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)
මැද කොළඹ ආසනයේ සෑම රැස්වීමකදීම එතුමා කිව්වේ සිරිමා බණ්ඩාරනායක ආණ්ඩුව පරාජය කළාට පස්සේ අපේ අම්මලාට, අක්කලාට, නංගිලාට, මල්ලිලාට සම්බා හාලේ බත් කන්නට මාර්ගය සකස්

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

කරන බවයි. අම්මේ, කෑව නේද සම්බා ? සම්බ දෙන්නම් කී උදවිය ගිය අවුරුද්දේ හාල් සේරු දෙකෙන් එකකටත් තව්වු කළා. ජනතාවට හාල් සේරුවක් නොමිලයේ දෙනවායයි දැන් මේ ගොල්ලන් කියනවා. ඇත්ත ඒක නොවෙයි. ජනතාව මේ ගොල්ලන්ට හාල් සේරුවක් නොමිලයේ දී තිබෙනවා, ආණ්ඩුව ගෙනියාගන්නට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සිරිමාවෝ බණ්ඩාරනායක රජය පමණක් නොව දිවංගත ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක සිරිමතාණන්ගේ රජයත්, එදා මේ රටට ගෙන්වමින් තිබුණු යම් යම් පාරිභෝගික භාණ්ඩ අඩු කළ බව ඇත්ත. එදා එහෙම අඩු කෙළේ ශීතකරණ හෙවත් "රිෆ්‍රිජරේටර්ස්", කාර්, වටිනා සාරි හා ධන පති කොටස් විසින් පරිභෝග කළ වෙනත් යම් යම් භාණ්ඩයි. එහෙත්, සාමාන්‍ය මහ ජනයා පාවිච්චි කරන ද්‍රව්‍ය ගෙන්වීම නතර කරන්නට අප සූදානම් වුණේ නැහැ. [බාධා කිරීම්] කොච්චර රිදෙනවාද යන බව පේනවා නේද නියෝජ්‍ය කථානායක තුමනි ? ලුණු අඹරන්නට ඕනෑ තුවාලවල ටයි. මෙන්න තුවාල. ජනතාවට ඇපල් මුද්දරම්පලම් දෙන්නට කථා කළ මිනිසුන්, "කිවු" නැති කරන්නට කෑගැසූ මිනිසුන් අද කර තිබෙන්නේ මොනවාද ? 1965 මාර්තු මාසයේදී ඡන්ද ප්‍රතිඵල පිට වුණු දා යූ. එන්. පී. කණ්ඩායමක් නුගේගොඩ සමූපකාර කඩය ළඟට ගොස් කිව්වේ, "මේ සිරිමා බණ්ඩාරනායකගේ අන්තිම 'කිවු' එකයි, ඒකත් අදින් අවසානයි" යනුවෙනුයි. එහෙත් අද මේ ආණ්ඩුව පෝලිම් දික්කර නැද්ද ? අප කවදාද පොතකට දෙන මිරිස් ප්‍රමාණය අවුන්ස 3ට බැස්සුවේ ? අප කවදාද උම්බලකඩ අවුන්ස බාගෙට බැස්සුවේ ? අප සූදුරු අවුන්සයට බැස්සුවේ කවදාද ? අප කවදාද හාල් සේරු දෙක එකට බැස්සුවේ ? යුද්ධ කාල යේදී එවැනි තත්ත්වයක් තිබුණා මිස අප එවැනි දෙයක් කරන්නට ලෑස්ති වුණේ නෑ. අද මේ රටේ කොත්තමල්ලි ටික නැහැ ; සුදු ලූනු ටික නැහැ. ලංකාවෙ අල වගා කර තිබෙනවාලු. අල තිබෙනවාද කියා ගිහින් බලන්න. මන්ත්‍රීවරුන්ට අල කොහෙන් සොයා ගන්නට ලැබුණත් කඩ වලින් නම් සොයා ගන්නට ලැබෙන්නෙ නැහැ. එවැනි තත්ත්වයකටයි අද රට වැටී තිබෙන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව බලයට පැමිණ අවුරුදු දෙකහමාරක් ගත වී තිබෙනවා. මේ කාලසීමාව ඇතුළත මේ රටේ ජනතාවට, මේ රටේ පාරිභෝගිකයන්ට පහරක් වැදුණාද නැද්ද කියා මා ප්‍රශ්න කරනවා. අපේ ආණ්ඩුව ශීතකරණ—රේෆ්‍රිජරේටර්ස්—ගෙන්වීම නවතා දැමුවා. එහෙත් ඊට පසු අඩුපාඩුකම් තිබුණත් අප ලංකාවේම ශීතකරණ සෑදීමට කටයුතු සැලැස්වූවා. අල්පෙනෙත්ති කටුවේ සිට ශීතකරණ දක්වා මේ රටේ කර්මාන්ත හාරසිය ගණනක් ආරම්භ කළේ, මේ රටේ කර්මාන්තමය විප්ලවයක් ආරම්භ කළේ, දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් 1956 දී බලයට පත් වූවාට පසුව නොවේද කියා මා ප්‍රශ්න කරනවා.

**ආර්. පී. විජේසිරි මයා.** (කුණ්ඩසාලෙ)
*(திரு. ஆர். பீ. விஜேசிறி—குண்டசாலை)*
(Mr. R. P. Wijesiri—Kundasale)
කවුරුවත් කළ දේවලට දැන් පුරසාරම් දොඩනව. ඇයි, කොමියුනිස්ට් පක්ෂයෙ හිටියෙ ?

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)
මම ඒ කාලෙ කොමියුනිස්ට් පක්ෂයෙ හිටිය තමයි. සෝවියට් සමාජවාදී ජන රජයෙන් ලැබුණු ආධාර උඩ තමයි ටයර් කර්මාන්ත ශාලාව පිහිටුවා තිබෙන්නෙ. සමාජවාදී ජන රජයකින් ලැබුණු ආධාර උඩ තමයි ලෝක කර්මාන්ත ශාලාව පිහිටුවා තිබෙන්නෙ. එපමණක් නොවෙයි. ලංකාවේ ආර්ථික දියුණුව සඳහා ඇති කළ සෑම කර්මාන්තයකටම වාගේ ආධාර ලැබුණේ සමාජවාදී රටවලින් බව මා මේ ගරු සභාවට මතක් කරන්නට සතුටුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ඇයි එහෙම නම් කොමියුනිස්ට් පක්ෂය අත්හැරියෙ ?

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

අත්හැරියෙ එක් හේතුවකටයි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියට නව ශක්තියක් දී, මේ කළුවාමෝදර මැතිවරණයෙන් එළියට ගහපු වහුකුණු ටික ලබන මැතිවරණයේදී අවසන් කිරීම සඳහා මා ඒ පක්ෂයට එක් වූ බව ආඩම්බරයෙන් මතක් කරන්නට සතුටුයි. තොන්ඩමන්ගේ ඡන්ද අරගෙන, ඉන්දියානු ඡන්ද අරගෙන නාවලපිටියේ ගරු මන්ත්‍රීතුමා (චන්ද්‍ර කරුණාරත්න මයා.) මේ සභාවට ආවෙ සිංහලයාගේ අයිතිවාසිකම් බේරා ගන්නවද කියා මා ප්‍රශ්න කරනවා. [බාධා කිරීමක්] අන්න අර බලන්න තොන්ඩ පැටව්. අර බලන්න එහා පැත්තෙ ආසන වල සිටින අය. [බාධා කිරීමක්]

**චන්ද්‍ර කරුණාරත්න මයා.** (නාවලපිටිය)
*(திரு. சந்திரா கருணாரத்ன—நாவலப்பிட்டி)*
(Mr. Chandra Karunaratne—Nawalapitiya)

I want to rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

He says it is a point of Order. Let me hear what the point of Order is.

**චන්ද්‍ර කරුණාරත්න මයා.**
*(திரு. சந்திரா கருணாரத்ன)*
(Mr. Chandra Karunaratne)

A certain charge is being made against me.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

A charge is not a point of Order. You can reply when your turn comes.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

ඉන්දියානු ඡන්ද අරගෙන, තොන්ඩමන් ආරක්ෂාව ඇතිව උඩරට ආසන දිනා ගෙන මේ පැර්ලිමේන්තුවට ඇවිත් සිංහල ජාතිය බේරා ගන්නවද තමුන්නාන්සේලා ඇස්සි වෙන්නෙ ? [බාධා කිරීමක්] හිස් කළය ශබ්ද වැඩිය කියනව. පෙන්ව නේද? මෙවැනි කළ ගිය මැතිවරණයේදී හරියට පා වුණා. වැඩි කල් නොගොස්ම ඔව ගිලෙන ලකුණු දැනටමත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනය දෙස තමුන්නාන්සෙ ටිකක් බලන්න. රක්ෂා පිළිබඳ ප්‍රශ්නය ගනිමු. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ සභාග ජන රජය පරදින අවස්ථාවෙදී රැකීරක්ෂා කාර්යාල වල රැකීරක්ෂා නොමැතිව ලියාපදිංචි වී සිටි ගණනට වඩා ලක්ෂ හයහමාරක් අද රැකීරක්ෂා නැතිව ලියාපාදිංචි වී සිටිනවාය කියා මහ බැංකුවේ වාර්තාවේ සඳහන් කර තිබෙනවා. එපමණක් නොවෙයි. විශ්ව විද්‍යාල තුනෙන් පිට වූ උපාධිධරයන් දහස් ගණන් සිටිනවා. මා කණගාටු වෙනව මේ පාසැල් ශිෂ්‍යශිෂ්‍යාවන් ගැන. පාර්ලිමේන්තුව බලල යන්න මේ පාසැල් ශිෂ්‍යශිෂ්‍යාවන් එනව. ඔවුන් මොනවද මේකෙ බලන්නෙ ? පාර්ලිමේන්තුවට අනාගතයක් නැහැ. පාර්ලිමේන්තුවට ඇවිත් මොනවද මේ ළමයින්ට බලන්නට සිද්ධ වෙලා තියෙන්නෙ ? තමන්ගෙ අනාගතය ගැන සළකුණක්වත් පහළ වී තිබෙනවාද ? සෑම වර්ෂයක් පාසාම විශ්ව විද්‍යාල තුනකින් සාමාර්ථය ලබා පිට වන හාර දහසක් පමණ උපාධිධරයන්ට අද අනාගතයක් නැහැ. අද ලංකාවේ 5,000 ක් පමණ උපාධිධරයන් රැකීරක්ෂා නොමැතිව ඉන්නවා. ඒ විතරක් නොවෙයි. විශ්ව විද්‍යාල තුනෙන් වර්ෂයක් පාසා පිට වන 4,000 ක් පමණ උපාධිධරයන් නිසා නව අවුරුදු 2½ ක් යන්නට ප්‍රථම ලංකාවේ උපාධිධරයන් 10,000 කට වඩා රැකීරක්ෂා නැතිව ඉන්නට සිද්ධ වෙනවා.

රැකීරක්ෂා ප්‍රශ්නය වෙනදාට වඩා මේ කාලය තුළ විසඳී තිබෙනවාද ? අපේ කාල සීමාව තුළදී කර්මාන්ත හාරසිය ගණනක් ඇති කොට—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
සීනි බෝල කර්මාන්ත.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்னே)*
(Mr. Stanley Tillekeratne)

ඒ කර්මාන්ත භාරසිය ගණනින් කීයක් තමුන්නාන්සේලා වසා තිබෙනවාද? එකක්වත් වසා නැහැ. ඒ කර්මාන්ත මේ ආණ්ඩුව විසිනුත් පවත්වාගෙන යනවා විතරක් නොවෙයි, අපේ කාල සීමාව තුළ ඇරඹූ කර්මාන්ත උත්සවශ්‍රීයෙන් තමුන්නාන්සේලා විසින් විවෘත කිරීම, ඒ පැරදුණු ආණ්ඩුවට—සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ප්‍රධානත්වයෙන් යුත් සභාග රජයට—ලැබී තිබෙන ලොකුම කීර්තියයි. මේ ආණ්ඩුව ගෙන යන්නේ ඒ කර්මාන්තවලින්. ටයර් සංස්ථාව ආරම්භ කළේ, අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ගෙනාවේ, වැඩ කටයුතු නිම කළේ අපේ කාලයේයි. තමුන්නාන්සේලා කළේ, අපේ කාලයේ ඇරඹූ ඒ කර්මාන්තශාලාව විවෘත කිරීමයි. ඒ විතරක් නොවෙයි. ලෝහ සංස්ථාව ඇති කළේ කවුද? ඒ වාගේම මේ ළඟදී තමුන්නාන්සේලා විසින් ගාල්ලේ සිමෙන්ති කර්මාන්ත ශාලාව විවෘත කළා. තමුන්නාන්සේලා අද එකින් එක කර්මාන්ත ශාලා විවෘත කළත්, ලංකාවේ කර්මාන්ත පසුබිම ඇති කළේ දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා සහ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියත් බව ආඩම්බරයෙන් මතක් කරන්නට කැමතියි. තමුන්නාන්සේලා ඇති කළේ එකම කර්මාන්තයයි. මේ අවස්ථාවේ සෞඛ්‍ය ඇමතිතුමා නැති වීම ගැන මා කණගාටු වෙනවා. ඒ එකම කර්මාන්තය නම් සෞඛ්‍ය ඇමතිතුමා නිකුත් කළ පෙත්තයි. බෝ වීම වැළැක්වීමේ පෙත්ත පමණයි, මේ අය ඇති කළ එකම කර්මාන්තය. ඒකට කියන්නේ ප්‍රසූත වැළැක්වීමේ පෙත්ත කියායි. ඒ ප්‍රසූත පෙත්ත හෙවත් "බර්ත් කොන්ට්‍රෝල් පිල්" එක ඇරෙන්නට තමුන්නාන්සේලා එකම කර්මාන්තයක්වත් ඇති කර තිබෙනවාද? ජ්‍යෙෂ්ඨ සමතුන්ට රැකීරක්ෂා දෙන්නට, උපාධිධරයන්ට රැකීරක්ෂාවල් සපයන්නට, ඉංජිනේරු වෘත්තීය පිළිබඳ විභාගවලින් සමත් වූවන්ට රැකීරක්ෂා ලබා දෙන්නට තමුන්නාන්සේලා වැඩ පිළිවෙළක් යොදා තිබෙනවාද?

ඒ විතරක් නොවෙයි. ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවෙන් පස්සේ ගරු සෞඛ්‍ය ඇමතිතුමා ප්‍රසිද්ධ ප්‍රකාශයක් කර තිබෙනවා, "මගේ අමාත්‍යාංශයට වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය අනුව ලබන වර්ෂයේදී අළුතින් දොස්තරවරුන් පවා බඳවා ගැනීමට අපහසුකම් තිබෙනවා" කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේට කවදා හෝ "කථානායකතුමනි" කියා අමතන්නට ලැබේයයි මා බලාපොරොත්තු වෙනවා. එදාට අප සාමාන්‍යයෙන් උත්සවයක් පවත්වනවා. කෙසේ හෝ වේවා නියෝජ්‍ය කථානායකතුමනි, අප තමුන්නාන්සේගෙන් මේ ප්‍රශ්නය අහනවා: අද සෑම කොට්ඨාශයකම රැකීරක්ෂා ප්‍රශ්නය උග්‍රව පවතිනවා. ගරු මුදල් ඇමතිතුමා කියනවා, "10,000 කට පමණ අළුතින් රැකීරක්ෂා සපයනවාය" කියා. එහෙත් ගරු සෞඛ්‍ය ඇමතිතුමා කියනවා, "මගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙන් ලක්ෂ 70 ක් 80 ක් පමණ කපා තිබෙන නිසා එය ක්‍රියාත්මක කරන්නට මට බැහැ" කියා. මධ්‍යම බැංකු වාර්තාවෙන් කියනවා රැකීරක්ෂා නොමැති අය ලක්ෂ 6 1/2 ක් ඉන්නවාය කියා. එහෙම නම් අප අහනවා, මේ ආණ්ඩුව රැකීරක්ෂා නොමැති අයට රැකීරක්ෂා සපයන්නේ කොහොමද කියා. අපේ කාලයේ—

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
රට කෑවා.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்னே)*
(Mr. Stanley Tillekeratne)

අප තමා හැමදාමත් වැරදිකරුවන් වන්නේ. ගරු මන්ත්‍රීවරයෙක් කීවා, අප රට කෑවාය කියා. එක මිනිහෙක් කීවා, රට කෑවා නොවෙයි, බල්ලන්ට රට ගියා කියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
බැල්ලී ගියා, හඳට.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

උණ පුරුකක් අරගෙන මේ අය ඒ ඇතුළට දමා ටික කලක් තබා එළියට ඇදල ගත්තත් බල්ලගෙ නඟුට වගේ නැවෙන ජාතියක් තමා, මේ අය. මේ වගේ අවස්ථාවක තමුන්නාන්සේ කල්පනා කරන්නට ඕනෑ, රැකීරක්ෂා නොමැතිකමේ ප්‍රශ්නයට නියම විධියට මුහුණ දෙන්නට, නියම උත්තරයක් දෙන්නට මේ ආණ්ඩුවට පුළුවන් කමක් නැති බව. එපමණක් නොව, ගත වූ දැවුරුදු සාරමසක කාල සීමාව ඇතුළත මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන් එකතු වී මහා ලොකුවට අණබෙර ගස්වා, හේවිසි නාදයත් පතුරුවා මේ රටේ සෑම පළාතකම පාහේ විවෘත කළ සෑම කම්මාන්තයක්ම, සෑම කර්මාන්ත ශාලාවක්ම—මහනුවර ජල විදුලි සේවය, ජල සම්පාදන සේවය ආදී හැම එකක්ම—පාහේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුව තිබුණු කාලයේදී පටන් ගත් කර්මාන්ත බව මේ උදවියගේ දැන ගැනීම පිණිස ප්‍රකාශ කරන්නට ඕනෑ.

මේ රටේ පවතින රැකීරක්ෂා හිඟය පිළිබඳ දරුණු ප්‍රශ්නය නිසි පරිදි විසඳිය හැක්කේ සී. ටී. බී. එකට—ලංකා ගමනාගමන මණ්ඩලයට—මිනිසුන් ඇමීමෙන් පමණක්ද? දේශපාලන පදනම උඩ ලංගමයට දහස් ගණන් මිනිසුන් පත් කර යවා සිටිනවා. දැන් කෙරෙන අඳුමට දිගටම කර ගෙන ගියොත් නම් වැඩි කල් යන්නට ඉස්සර වෙලා ලංකා ගමනාගමන මණ්ඩලයටත් මුහුණ පාන්නට සිද්ධ වන්නේ කොළඹ මහා නගර සභාවේ ට්‍රොලි බස් සේවයට මුහුණ පාන්නට සිද්ධ වුණු භයානක තත්ත්වයටයි.

කෘෂිකර්ම හමුදාවට බඳවා ගනු ලබන අය ගැන අපට වරින්වර පුවත්පත්වලින් තොරතුරු දැන ගන්නට ලැබෙනවා. මේ හමුදාවෙන් යවනු ලබන උදවියගෙන් සියේට හතළිහක් පමණ හමුදුව අත්හැර දමා යන බව පත්‍රයක තිබුණා. 40 per cent. are deserters. දැන් ඉස්සර වාගේ නොවෙයි. දැන් මේ රටේ උදලු හරි ලාබයි. ඇයි? ගොවිතැන් දියුණුවට යවනු ලබන උදවියට ලැබෙන්නේ කලිසම් කුට්ටම් දෙකයි. හැබැයි, නූල් බෝලයකුත් ලැබෙනවා. කලිසම්වල පැච් එක මහගන්නටයි ඒ. දවාලටත් පාන්, රෑටත් පාන්. බත් අවුන්ස තුනකුත් ලැබෙනවා තමයි. දවසකට රුපියල් දෙකක් බැගිනුත් මේ උදවියට ගෙවනවා. බොහොම වෙහෙස මහන්සියට පත් වන මේ තරුණයන් ඊළඟට දැන් මොකද කරන්නේ? "අනේ අම්මේ, කිසිම සම්පතක් නැහැ මේ ඩඩ්ලි සේනානායක මහත්මයාගේ ව්‍යාපාරයේ වැඩ කිරීමෙන්. ගරු කෘෂිකර්ම ඇමතිතුමාගේ තරුණ ගොවි හමුදාවේ ඉඳීමෙන් කිසිම සම්මානයක්—කිසිම සම්පතක්—ලැබෙන්නේ නැහැ," ආදී වශයෙන් කියනවා. මේ උදවිය තමන් ළඟ තිබෙන උදැල්ලේ තලය ගලවා, ළඟම තිබෙන ගෙයි කෙනකුට රුපියල් පහකට විකුණා, පුළුවන් තරම් ඉක්මනින් කොළඹටම සේන්දු වෙනවා.

කෘෂිකම් හමුදුව ගැන වරින්වර අපට තොරතුරු දැන ගන්නට ලැබෙනවා. මහා ලොකුවට සක් පිඹ ගම්භීරාකාරයෙන් වැඩ පටන් ගත්ත ලංකා ගුවන් විදුලි සේවයෙනුත් ඒ ගැන අපට අහන්නට ලැබෙනවා. දේශාභිමානය ගැන ගුවන් විදුලි සංස්ථාවෙන් ප්‍රකාශ කළත් එක්සත් ජාතික පක්ෂයට නම් දේශාභිමානයක් ඇති කිරීමට පුළුවන්කමක් ඇතැයි මා විශ්වාස කරන්නේ නැහැ. කෘෂිකර්ම හමුදාවට මොකක්ද වෙලා තියෙන්නේ? මැයි මාසයේ පළමු වැනිදා හැම සී. ටී. බී. බස් රියකම වාගේ පැහැදිලි අකුරින් පෝස්ටර් අලවා තිබුණා. "රට හැදීමේ මහා සංවර්ධන ශ්‍රමදානය" යන පාඨය එහි තිබුණා. ගිහිල්ලා බලන්න, කෝට්ටේ ශ්‍රී ජයවර්ධන පුරයේ දියවන්නා ඔයේ මහා ශ්‍රමදානය පටන් ගන්නවාය කිව්වා. දවල් දහයටයි පටන් ගත්තේ. ගිහිල්ලා බලන්නැයි කියනවා. දවල් දහයට පටන් ගත් නමුත් දවල් දොළහට ඉවර වුණා, ඒ වැඩේ. බෝට්ටුවක් ගෙනැවිත් තිබ්බා. ඇයි, මඩට බහින්නට බැරිද? බෝට්ටුවක් ගෙනැවිත් තබා ගරු රාජ්‍ය ඇමතිතුමා ගරු අගමැතිතුමාත් වාඩි කෙරෙව්වා. කෝට්ටේ හිටපු මන්ත්‍රීතුමා වන ජීනදාස නියතපාල මහත්මාත් වාඩි වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තමුන්නාන්සේට පෙන්වා දෙන්නම්, ඊට පස්සෙ මොකක්ද සිද්ධ වුණේ කියන කාරණය. බෝට්ටුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුළට නායකයන් දමාගෙන මඩ මැදින් ගමන් කළා. වතුර උඩින් නොවෙයි ගියේ, මඩ මැදින්. පැය දෙකක් වැඩ කර මේ හත් හවුල් ආණ්ඩුවේ උදවිය, මේ ශ්‍රම දාන ව්‍යාපාරයට ආ පිරිස, කෝට්ටේ හන් දියේ සිට ආයුර්වේද වෛද්‍ය ආයතනය ළඟට ආවා. අක්කර එකහමාරක්වත් ශුද්ධ කළේ නැහැ. ඒ කොයි හැටි වෙතත්, ඊට සුමාන දෙකකට පමණ පසු බයිස් කෝප් ශාලාවල පින්තූර පෙන්වන්නට පටන් ගත්තා. "ජාතික මහා ශ්‍රමදාන ව්‍යාපාරය කෝට්ටෙන් ආරම්භ වෙයි" යනුවෙන් මහා ශීර්ෂපාඨ ඇතිව බයිස් කෝප් ශාලාවල පින්තූර පෙන්වන්නට පටන් ගත්තා.

කෝට්ටේ මන්ත්‍රීවරයා ඔය බොරු වැඩ වලට යන්නේ නැහැ. රටේ සංවර්ධන වැඩ වලට කෝට්ටේ මන්ත්‍රීවරයා ඇතුළු විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන් විරුද්ධ නැහැ. රටේ කෘෂිකර්මය වැඩි දියුණු කිරීමට ගන්න කිසිම වැඩ පිළිවෙළකට විරුඬ පාර්ශ්වය කවදාවත් විරුද්ධ නැහැ. අපේ සහයෝගය එවැනි හොඳ දේ සඳහා හැමදාම ලැබෙනවා. මේ රට ස්වයංපෝෂිත කිරීමේ වැඩට අප විරුද්ධ නොවන නමුත් අපේ අනාගත කර්මාන්ත ඇමතිතුමාගෙනුත්—වර්තමාන පාර්ලිමේන්තු ලේකම්තුමාගෙනුත්—අනාගත කෘෂිකම් ඇමතිතුමාගෙනුත්—වර්තමාන පාර්ලිමේන්තු ලේකම්තුමාගෙනුත්—අප ඉතාමත් කරුණාවෙන් ඉල්ලා සිටින්නේ ශ්‍රමදානයේත් කෘෂිකර්ම සංවර්ධනයේත් නාමයෙන් සහ දියවන්නා ඔය සංවර්ධනයේ නාමයෙනුත් පසුගිය දවස්වල ගෙන ගිය බොරු වැඩ ගැන පරීක්ෂා කර බලන ලෙසයි. ආණ්ඩුව ලොකු වැඩක් කළායයි ලංකාවේ සැම බයිස්කෝප් ශාලාවකම මෙවැනි දේ පෙන්වනවා නම්—මේ රටේ කෘෂිකාර්මික ව්‍යාපාරය දියුණු කරන්නේ ඔය ආකාරයට නම්—1970 වන විට ඔය බලාපොරොත්තු වන විධියට අල බතල වගාවන් දියුණු කිරීම ආදිය හෝ මිරිස්, ලූනු වැනි දේ වගාකිරීම හෝ හරියාකාර නොකළොත් අපට ඇති වන්නේ දුක්ඛර අනාගතයක් බව ඉතා කරුණාවෙන් මතක් කරන්නට ඕනෑ. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ශබ්ද එක ලීලාවෙන් මට පෙනෙනවා, එය ස්වභාවික ශබ්දයක් නොවන බව. හුඟක් අමුතු දේවල් මේ ශබ්දවලට මිශ්‍ර වී තිබෙනවා. කෙසේ හෝ වේවා අපේ අඩුපාඩු තිබුණා නම් ඒවා හරිගස්සන්නට මේ රජයට අවුරුදු දෙක හමාරක කාලයක් ලැබුණා. අද රටේ සාමාන්‍ය පාරවල තත්ත්වය කුමක්ද කියා බලන්න. මා මේ ගරු සභාවෙදී ආඩම්බරයෙන් කියනවා, අපේ හිටපු අධ්‍යාපන ඇමති පි. බී. ජී. කළුගල්ල කෑගල්ලේ මන්ත්‍රීතුමා මේ රටේ සැම කොට්ඨාශවලම, විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ කොට්ඨාශවල පවා පාඨ ශාලාවල වැඩ කටයුතු සඳහා මුදල් දුන්නා. තමුන්නාන්සේලාගේ කොට්ඨාශවලටත් ඒ මුදල් ලැබුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කාටද ලැබුණේ?

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

කෝට්ටෙට ලැබුණා. ඒ කාලයේ මා සිටියේ විරුද්ධ පාර්ශ්වයේ. මා ගොස් අධ්‍යාපන ඇමතිතුමාට කිව්වා, නුගේගොඩ ගර්ටන් විද්‍යාලයේ බිලැකර් නමැති විද්‍යාලයාධිපතිනිය ඒ විද්‍යාලය විකුණන්නට යනවාය ඒ ගැන මොනවා හෝ කරන්නටය කියා. අධ්‍යාපන ඇමතිතුමා මොකද කළේ? වහාම fපයිල් එක ගෙනෙන්නය කියා ස්ථිර ලේකම්තුමාට කියා එවේලේම නියම කළා, ඒ විද්‍යාලය වහාම රජයට පවරා ගත යුතුය කියා. ඒ විධියට වැඩ කරන්නට තමුන්නාන්සේලාට පිටකොන්දක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාලයේ සැම පාසලකටම ගොඩනැගිලි ලැබුණා; රසායනාගාර ලැබුණා.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பீ. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

කොහොමද ලැබුණේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

කෝට්ටෙට ලැබුණා. ඒ කාලයේ මා කෝට්ටේ මන්ත්‍රීවරයා. මා හිටියේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට නොවෙයි. වැඩක් කරවා ගන්නට බැරි නිවටයන් ටික දෙනෙක් එදත් හිටියා. ඒ අය අද ඔය පැත්තේ ඉන්නවා. ඒක ඇමතිතුමාගේ වැරැද්දක් නොවෙයි. අවිස්සාවේල්ලේ මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.)—දැන් සිටින කම්කරු ඇමතිතුමා—අවිස්සාවේල්ලේ පාසල්වලට ආධාර ඉල්ලූ විට ඔහු විරුද්ධ පක්ෂයේ සිටියත් අපේ ආණ්ඩුවෙන් ආධාර ලැබුණා. සමහරවිට ආණ්ඩුවක් තියෙන විට තමන්ගේ අයට ටිකක් වාසි වන විධියට බෙදන්නට පුළුවන්.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

ඒ මොකද ?

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

තමුන්නාන්සේලා අපට ටිකක්වත් බෙදන්නෙ නැහැ නේ. තමුන්නාන්සේ බෙදනවද ? තමුන්නාන්සේ ඔක්කොම හංගගෙන ඉන්නවා. අද පාසල්වල ඉඩ නැහැ. කෝට්ටේ ප්‍රදේශයේ පාරවල් අද බොහොම අබලන් වී තිබෙනවා. මේ වර්ෂය අවසාන වන විට පාසල්වලට ඇතුළු කරන්නට සිටින ළමයින්ට අවශ්‍ය ගොඩනැගිලි නැත්තේ අපේ ප්‍රදේශවල පමණක් නොවෙයි. ලංකාවේ ඡන්ද කොට්ඨාශ එකසිය පනස් ගණනක වැඩ කටයුතු සකස් කිරීමට මොළයක් ඔබේ අධ්‍යාපන උප ඇමතිතුමාට තියෙනවා ; නමුත් ඇමතිතුමාට තියෙනවද කියා පරීක්ෂා කර බලන්නට ඕනෑ. ඒ ගැන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කිප දෙනෙක්ම හිනහ වෙනවා. ඒ අය මා කියන දේ අනුමත කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හත් හවුල් ආණ්ඩුව අවුරුදු දෙකකුත් මාස 4ක් මේ රට පාලනය කළ පසු මේ රටේ පාරිභෝගිකයාගේ ජීවිතය වෙනදාට වඩා අමාරු තත්ත්වයකට පත් වී තිබෙනවාද නැද්ද කියා මා තමුන්නාන්සේගෙන් අහනවා. ලංකාවේ රැකීරක්ෂා ප්‍රශ්නය උග්‍රවී තිබෙනවා නම්, කර්මාන්ත දියුණුව ඇනහිට තිබෙනවා නම්, කෘෂිකර්ම දියුණුව ඇනහිට තිබෙනවා නම් රට සංවර්ධනය කරන්නෙ කොහොමද ? යුද හමුදාවක තිබෙනවාට වඩා ජීප් රථ, මිනිමෝක් රථ අද තියෙන්නේ කොළඹයි. අක්කර 50 ගන්නවා ; ජීප් එක ගන්නවා ; මිනිමෝක් රථය ගන්නවා ; ළමයින් ස්කෝලයට යවනවා ; මඟුල් ගෙවල්වලට යනවා ; විනෝද ගමන් යනවා. මා ඒ ගැන මේ ආණ්ඩුවට දෙස් කියන්නෙ නැහැ. මේ කූට ව්‍යාපාර ගෙන යන පුද්ගලයන්ට රටක් ජාතියක් වුවමනා නැහැ. ඒ විධියේ පුද්ගලයන් හුඟ දෙනෙක් ඉන්නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කොහේද ?

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

මේ පැත්තේ අය ජීප් 3 ක් අරගෙන තියෙනවා. ඒ තුනම කෘෂිකර්මයට යොදා තිබෙනවා. ව්‍යාපාරිකයන් අද මේ ආණ්ඩුවට ලං වෙලා කෘෂිකර්ම ව්‍යාපාරයට යොදවන සල්ලි නාස්ති කරනවා. එසේ නාස්ති කිරීමෙන් අවුරුදු ගණනකට පසු ලංකාවේ ඇති වන කරදරය ඔබටත් අපටත් පොදු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ආහාර වගා කිරීමේ කාර්යය තව දුරට දියුණු කරන්නට නම් එහි තිබෙන දේශපාලන පෙනුම සැහෙන ප්‍රමාණයකට ඉවත් කරන්නට ඕනෑ. ජාතික පදනමක් උඩ අපත් ඒ වැඩ පිළිවෙළට කැඳවනවා නම් අප ඒවාට සහයෝගය දෙන්නට සූදානම්. මේ රට ස්වයංපෝෂිත වෙනවාට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ.

මේ අයවැය ලේඛනය ගැන ටිකක් කල්පනා කර බලන විට පෙනී යන්නේ කුමක්ද ? මේ රටේ ජීවන අංකය පහළ බස්සන්නට බැරි වූ, මේ රටේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳන්නට බැරි වූ, උපාධිධාරීන් 5000 කට රක්ෂා සපයන්නට බැරි වූ, පාරිභෝගික ද්‍රව්‍ය තව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තවත් අඩු කරමින් ජනතාවගේ ජීවිත කටුක කරන්නා වූ, ආණ්ඩුවේ සේවකයින් තුන් ලක්ෂයකගේ පමණක් පඩි වැඩි කර "අපි රජයේ සේවකයින්ගේ පඩි වැඩි කළා" යයි කියන්නා වූ, අධ්‍යාපන ප්‍රශ්නය විසඳන්නට බැරි වූ මේ අය කෙරෙහි මේ රටේ ජනතාවගේ විශ්වාසයක් නැති බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් කරුණක් කියන්නට ඕනෑ. එය අද "ඩේලි මිරර්" පත්‍රයේ පළ වී තිබෙන කරුණක්.

Mr. Deputy Speaker, you will permit me to speak a few words in English.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Your time is up, but I will give you five minutes.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

I read this morning a report in the "Daily Mirror" newspaper regarding a much advertized tender where certain railway locomotives are to be brought to Ceylon. I am glad—I do not know how far this "Daily Mirror" report is accurate—a number of Government Members of Parliament have also shown an interest on this question and in point of fact they want a thorough investigation held into this matter.

You will be aware that in the early fifties, 25 locomotives at a cost of over Rs. 15 million were purchased from the Brush-Bragnell industrial concern in Germany. These locomotives were purchased on a specification drawn up by the present G.M.R. and recommended by him. It was well known at that time that Brush-Bagnell, when they tendered, had never built diesel electric locomotives before. In fact, Brush-Bragnell came into existence as a firm in order to submit that particular offer with the goodwill of the present G.M.R. Brush-Bragnell, when they submitted the offer, was no more than a combination of miscellaneous British technical enterprises and one amongst them was a steam locomotive manufacturer.

On the strength of an overwhelming recommendation from the present G.M.R. the order was placed on Brush-Bragnell and even a cash advance running into millions of rupees was made by the Government of Ceylon. With this cash advance it was well known that Brush-Bragnell built the erecting shop for the execution of the Ceylon order.

It will please you to know that Brush-Bragnell were not equipped to build this type of locomotives. Immediately they got the advance from Ceylon, they set up the locomotive sector of their industry and started building locomotives with the money that we advanced them in order to import the locomotives to Ceylon.

This new firm Brush-Bragnell delayed for years the delivery of the first two locomotives for trial purposes. The locomotives of Brush-Bragnell, when they finally arrived, failed repeatedly—like the aeroplane we have, the Nord. You do not travel in that aeroplane. You do not know at what time you will have to land. Since landing facilities are very much available in Ceylon you can land at any point, but if you take a long distance flight you do not know where you are going to end yourself.

The G.M.R. at that time wanted to cancel this order. The C.M.E. at that time, who is now the G.M.R., opposed the cancellation and strongly recommended the confirmation of the order. The present G.M.R. due to his technical authoritativeness convinced the powers that be that he was correct. The result was that Ceylon was the recipient of dud locomotives which the British experts themselves failed to rectify fully because the basic design, material and workmanship were faulty. Even today in spite of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි තිලකරත්න මයා.]

the present G.M.R.'s personal concern over the last decade, these Brush-Bragnell units continue to be a headache for the Ceylon Railways.

Mr. Deputy Speaker, when railway officers and other specialists on this type of locomotives made certain recommendations and criticized this purchase, all of them were dealt with summarily by the present G.M.R.

ජී. ජේ. පාරිස් පෙරේරා මයා. (ජාඇල)
*(திரு. ஜீ .ஜே. பாரிஸ் பெரோரா—ஜா-எல)*
(Mr. G. J. Paris Perera—Ja-Ela)

Who ?

ස්ටැන්ලි තිලකරත්න මයා.
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

You know him too well.

In point of fact, few people know these facts and I am glad that some of the Government Parliamentarians are aware of these facts, because if we go on purchasing this unit of locomotives in the future it will be again like the purchase of the Nord aircraft. It will be a dud purchase. Already the tender is being discussed at Ministerial level. In point of fact the agents of Brush-Bragnell are behind this tender They are trying to put the deal through. No opinions of specialists have been made available but for the opinion of the General Manager of Railways.

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

Whose opinion do you want ?

ස්ටැන්ලි තිලකරත්න මයා.
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

This matter must be fully investigated. Otherwise what is going to happen will be similar to what happened in the case of the Nord purchase. These locomotives have not been tested internationally. They have not got an international reputation. In point of fact, this is the correct stage when someone has to intervene in this matter. What would happen if for instance this country finds that after the locomotives are purchased, they are not fit to be run in this country ? We would have spent by that time about fifty million rupees on the purchase of these locomotives. These are matters I would place before the Government. Unfortunately, the Front Benches of the Government are depleted. That shows how gradually they will get depleted and go into political non-existence. I am glad one Front Bencher is coming in.

The victim of all the misfortunes is sitting before us. When this Government decided to make him Minister of Finance, I thought it was not the best thing to do at the end of a very distinguished parliamentary career. In fact the writing is on the wall.

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

For whom ?

ස්ටැන්ලි තිලකරත්න මයා.
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

He laughs, Sir. I can assure him that on this question he who laughs last laughs best. Whatever is said about him, I must say that if there is a Gentleman at Ministerial level, one who has been conscientious, who has been loyal in his duties, one who has always displayed a sense of humility in his conduct it is he. I must congratulate and thank the Hon. Minister of Finance for that. All of us share that view. But as regards his capacity for budgeting, I must say with due respect, he has failed to establish a reputation as a good Finance Minister. I do not blame him.

ගරු මන්ත්‍රීවරයෙක්
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

He is no grass cutter.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

In point of fact he has not proved himself to be a very efficient Finance Minister. The charge against his Government is that in the last one year, they have depended on foreign aid, and their Foreign Exchange Budget has gone for a six. In point of fact, our foreign assets have remained the same or have declined. The prices of our export commodities in the foreign markets have declined, unemployment is on the increase, and the cost of living is also on the increase. Those are the charges that we level against this Government. This Government has no future.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

You are very sorry about it ?

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

In conclusion, I must say that there is at present a dangerous trend of thought manifested through local authorities. Today a number of local authorities are passing resolutions that this Government should run for a term of ten years. I wish to tell this Government that if they wish to run for ten years, they should run for ten years constitutionally, please ! They can run for ten years after facing the general election which is scheduled to take place at the end of their five-year term of office. It is good to have hopes and good intentions, but if there is a democratic election in this country, I can assure you that most of them on that side of the House will never come back to this House, and the remainder of them will sit on this side while we will be the governing party on that side.

අ. භා. 2.40

**ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting )

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මිත්‍ර කෝට්ටේ ගරු මන්ත්‍රීතුමාගේ (ස්ටැන්ලි තිලකරත්න මයා.) විනෝදජනක කථාවෙන් පසුව මා විසිනුත් වචන ස්වල්පයක් කථා කළ යුතු යයි මට කල්පනා වුණා. කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා කාර් එකේ ගියත්, මහ පාරේ ගියත්, උසාවියට ගියත්, මන්ත්‍රී මණ්ඩලයට පැමිණියත්, භෝජනාගාරයේ සිටියත්, කෝට්ටේ මන්ත්‍රීතුමා පැමිණ සිටිනවාය කියා අඟවන්නට එතුමා කැමතියි.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

එය කෝට්ටේ හැටියක්.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

කෝට්ටේ හැටියක්ලු. එතුමා එය පිළිගන්නවා. එමෙන්ම එය එතුමාගේ සමත්කමක්. අප මෝටර් රථයකින් පාරේ යන විටක වුවත් කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා අප පසුකරගෙන යනවා නම් කෑගසාගෙන අපට කථා කරලයි යන්නේ. එතුමා එයින් අදහස් කරන්නේ කෝට්ටේ මන්ත්‍රීතුමා සිටිනවාය කියන එක පෙන්නුම් කර දීමටයි. කොතනකදී වුවත් තමා සිටිනවාය කියන එක පෙන්වන්නට කෝට්ටේ ගරු මන්ත්‍රීතුමාට ඕනෑ කරනවා. මෙවැනි සභා ගැබක සියලුදෙනාගේම අවධානය යොමු වන්නේ කථානායකතුමාගේ අසුන දෙසටයි. ඒ යොමුවීම තමා දෙසට හරවා ගන්නට කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා බොහොම කැමතියි. මගුල් ගෙදරකට ගිය විට එහි කාගේත් අවධානය යොමු වන්නේ එක්කෝ මනාලිය දෙසට නැත්නම් මනාලයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

දෙසටයි. ඒ ගැන කෝට්ටේ ගරු මන්ත්‍රීතුමාගේ හිතට බොහොම අමාරුයි. එවැනි තැන්වලදී කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා කල්පනා කරන්නේ මනාලයා වෙන්නටයි. මරණ ගෙදරකට ගිය විටක කාගෙත් අවධානය යොමු වන්නේ මළකඳ දෙසටයි. එයට කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා බොහොම අකමැතියි. එතනදී එතුමා කල්පනා කරනවා මළකඳ වන්නට. කාගේත් අවධානය යොමු කරවා ගන්නට කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා බොහොම කැමතියි. එයට ලොකු ආසාවක් දක්වනවා. ගැමි බසින් කියනවා නම් දොළදුකක් තිබෙනවා. ඒ නිසා මොනවා හෝ කියා කාගේත් අවධානය යොමු කරවා ගන්නට එතුමා කවදත් කැමතියි. කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා අද කළ කථාව එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැඳෙන්නට කලින් ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂයේ වැඩ කටයුතු විවේචනය කරමින් එතුමාම මේ ගරු සභාවේදී කළ කථාවට කිසිසේත්ම වෙනස් වන්නේ නැහැ.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

මා ඒ රජය විවේචනය කර නැහැ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

කවදාවත්ම නැද්ද ?

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

බොහොම සුළුවෙන් තමයි, විවේචනය කළේ. එසේ කළෙත් හදන්නට හිතාගෙන.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයට විරුද්ධව කිව්වේ මොකක්ද ? රැකීරක්‍ෂා ප්‍රශ්න විසඳුවේ නැත, පාඨශාලා ප්‍රශ්නය විසඳුවේ නැත, ජීවන වියදම පිළිබඳ ප්‍රශ්නය විසඳුවේ නැත ආදී වශයෙන් එදා කීවෙත් එතුමා අද මේ රජයට විරුද්ධව කියන ඒවාමයි. එය බොහොම දක්ෂ ලෙස එතුමාට කරන්නට පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේත් නීතිඥයෙක් නිසා දන්නවා ඇති, එවැනි දේවල් බොහොම දක්ෂ ලෙස කරන්නට නීතිඥයින්ට පුළුවන් බව. කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා කළ කථාවේ පරස්පර විරෝධී තැනක් පෙන්වන්නට මට පුළුවන්. එතුමා හිටපු ගරු අධ්‍යාපන ඇමතිතුමාට ප්‍රසංශාත්මකව මේ ගරු සභාවේදී පෙන්වන්නට හැදුවා, සියලුම අධ්‍යාපන ප්‍රශ්නවලට පිළිතුරු හිටපු අධ්‍යාපන ඇමති පී. බී. ජී. කලුගල්ල මහතා විසින් සපයා තිබෙනවාය කියා. එසේ කියා අවසාන වී තව මොහොතකින් කියනවා, පාඨශාලාවලට විද්‍යාගාර නැත, පාඨශාලාවලට ගුරුවරුන් නැත, පාඨශාලාවලට උපකරණ නැත කියා. එහෙත් "අපේ කළුගල්ල අධ්‍යාපන ඇමතිතුමා සිටින විට මගේ කොට්ඨාශයේ පමණක් නොව මුළු ලංකාවේම අධ්‍යාපන ප්‍රශ්නවලට පිළිතුරු දුන්නාය; ෆයිල් එක ගෙන්වා එවේලේම ඕඩරය ගසා ප්‍රශ්න ඔක්කොම විසඳා අවසාන කරනවා" ය යනුවෙන් ඊට මොහොතකට කලින් කියා තිබෙනවා. [බාධා කිරීමක්] කථා කරන්නට ගිය විට අනික් අයගේ අවධානය තමා කෙරෙහි යොමු කර ගැනීම සඳහා එසේ කරනවා යැයි මා කීවේ එම නිසයි. මළ ගෙයකදී මළ මිනිය දිහා මිනිසුන් බලා සිටින විට ඒ ගැන ඊෂ්‍යාවක් එතුමාට ඇති වෙනවා. ඊළඟට තමන් වෙත ඒ අයගේ අවධානය යොමු කරවා ගැනීම සඳහා මොකක් හරි පෙරළියක් කරනවා. එසේ නොවෙයි, වග කිවයුතු මන්ත්‍රීවරයකු හැටියට කතා කරන විට ඇත්ත වශයෙන්ම එතුමාගේ යුතුකමක් තිබෙනව, ඇත්ත තත්ත්වය මෙයයි කියා විස්තර කර දෙන්නට. ඒ යුතුකම එතුමා පැහැර හැර තිබෙනවා.

එතුමා සිය කතාව අවසාන කළේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන සඳහන් කරමිනුයි. ප්‍රජාතන්ත්‍රවාදය ගැන හුඟක් පරක්කු වෙලා කතා කරන්නට වුවමනා මන්ත්‍රීවරුන්ගෙන් එක්කෙනෙක් තමයි, කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා. පසුගිය මහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැතිවරණයෙන් පසු බණ්ඩාරනායක මැති නියට අගමැති ධුරයෙන් අස් වන්න එපාය කියමින් ගිය පෙළපාලියේ නායකයා වූයේ එතුමායි. ඒ ප්‍රජාතන්ත්‍ර වාදයද කියා මා එතුමාගෙන් ප්‍රශ්න කර නවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කස්ත්‍රෝ වාගේ කෙළින් සිටින්නය කීවා.

**ප්‍රේමදස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

කස්ත්‍රෝ වාගේ රැවුලක් වවාගෙන සිටින්නැයි නොකී එකයි පුදුමය. [බාධා කිරීම්]

අවුරුදු 10ක් යනතුරු අප පාලන බලය ගෙනයනවා යැයි කීවේ කවුද? අප ප්‍රජා තන්ත්‍රවාදය අනුව බලයට පත් වුණා. ඒ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය අපි එම විධිය ටම පවත්වාගෙන යනවාය කියා ප්‍රකාශ කර තිබෙනවා. නොයෙකුත් පළාත් පාලන ආයතන එවැනි යෝජනාවක් සම්මත කළා ය කියා අපට ප්‍රජාතන්ත්‍ර විරෝධි චෝදනා ඉදිරිපත් කිරීමට කෝට්ටේ ගරු මන්ත්‍රී තුමා ඉක්මන් වෙලා තියෙනවා. ප්‍රජා තන්ත්‍රවාදය ගැන අපට කරුණු කියන්න එතුමාට යුතුකමක් ඇත්තේ නැහැ. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැති කිරීමට ගෙන ගිය ව්‍යාපාරයේ පෙරමුණේ කෝට්ටේ ගරු මන්ත්‍රීතුමාත් සිටි බව එතුමා පිළිගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත පිළිබඳව කතා කරමින් එතුමා ප්‍රකාශ කළා, කලින් තිබුණු ආණ්ඩුව අල් පෙනෙත්තියේ පටන් සීතකරන යන්ත්‍රය දක්වා තියෙන හැම දෙයක්ම නිෂ්පාදනය කළාය කියා. එසේ නම් අපේ ප්‍රශ්න ඔක් කෝම විසඳා ඉවරයි. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) 1963-64 අයවැය විවාදයේදී කළ කථාව මා ළඟ තියෙනවා. මා එම කථාවේ සාරාංශය එහෙන් මෙහෙන් ඉදිරිපත් කරන් නට අදහස් කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා යනවා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

උසාවි යනවා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)

මළ ගෙයක යනවාද මඟුල් ගෙයක යන වාද දන්නේ නැහැ. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා එදා ඉතා වැදගත් කථාවක් කර තිබෙනවා. එතුමා එසේ කථා කර තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හවුල් වන්නට පෙරයි. කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන්නට යෙදුණු කර්මාන්ත පිළිබඳව එතුමා සඳහන් කර තිබෙනවා. එම රජය ගෙන ගිය කර්මාන්ත ප්‍රතිපත්තිය එතුමා විසින් ඉතා දැඩි ලෙස විවේචනයට පත් කර තිබෙනවා. ඒ විධියේ යේ ප්‍රතිපත්තියක් ගෙන යමින් මේ රටේ නියම කර්මාන්ත සංවර්ධනයක් ඇති කරන්නට බැරි බවයි එතුමා කියා තිබෙන්නේ. නියම පදනමක් හා සැලැස් මක් අනුව කර්මාන්ත ප්‍රතිපත්තිය ගෙන යන්නේ නැති බව එතුමා කියා තිබෙනවා. අපිත් එම අදහස් අනුමත කළා; අනුමත යුගයක් බිහි කළයුතුයි. මෙවැනි රටක නි යම සංවර්ධනයක් ඇතිවීම සඳහා කර්මාන්ත යුගයක් බිහිකළ යුතුයි. මෙවැනි රටක නියම සංවර්ධනයක් ඇතිවීම සඳහා කර්මාන්ත දියුණුවක් සැලසීම අවශ්‍යයි. මා එය නැතෙයි කියනවා නොවෙයි. එය නැතෙයි කියා මෙම රජය කියන්නේත් නැහැ. එහෙත් යම් කිසි කර්මාන්ත සංවර්ධන යක් ඇති කිරීම සඳහා වුවමනා අවශ්‍යතාව යන් කීපයක් තිබෙනවා. ඒ ඒ කර්මාන්ත වලට වුවමනා කරන අමු ද්‍රව්‍ය, ඒ ඒ කර්මාන්තවලට වුවමනා කරන යන්ත්‍රෝප කරණ රටක තිබෙන්න ඕනෑ, රටකට ලබා ගන්න ඕනෑ. ඔය ආරම්භ කළාය කියා පුර සාරම් දොඩන කර්මාන්ත—අල්පෙනෙත් තේ සිට කටුකම්බිය, "රිෆ්රිජරේටය", "බ්ලේඩ්" තලය දක්වා—සැම දෙයකටම අමු ද්‍රව්‍ය ගෙනෙන්නෙ කොහෙන්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

යන්ත්‍රෝපකරණ ගෙනෙන්නෙ කොහෙන්ද? ඒ අමු ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ ගෙන්වීම සඳහා අපේ විදේශ විනිමය වැය කළ යුතු නේද? ආහාර පාන, ඇඳුම්පැළඳුම් ආදි අපේ රටේ වැසියාට ජීවත් වන්ට අත්‍යාවශ්‍ය දේවලුත් පිටරටින් ගෙන්වීම සඳහා විදේශ විනිමය වැය කිරීමට සිදු වී තිබෙන වෙලාවක, ඒ වියදමම විදේශ විනිමය පිටරට යවා අමු ද්‍රව්‍යත් යන්ත්‍රෝපකරණත් ගෙන්වා කළයුතු වන කර්මාන්ත කීපයක් ආරම්භ කොට, කර්මාන්ත යුගයක් ඇති කළායයි කීම තරම් විහිළුවක්—පුරසාරමක් වශයෙන් ලජ්ජාභයක් නැතිව කියන්නට තරම් විහිළුවක්—තවත් තිබෙනවද, නියෝජ්‍ය කථානායකතුමනි? ලෝකයේ හාල් හිඟයක් ඇති වී චීනයෙන් වුවමනා තරම් හාල් ලබා ගන්ට බැරි වෙලාවෙ, බුරුමයෙන් ඕනෑ තරම් හාල් ලබා ගන්ට බැරි වෙලාවෙ, සියමෙන් ඕනෑ තරම් හාල් ලබා ගන්ට බැරි වෙලාවෙ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නැගිටලා කියන්ට පුළුවන්ද, "හාල් ඕනෑ නැහැ, අපි හදන අල්පෙනෙත්ති කාපල්ල; අපේ රිෆ්රිජරේටර්ස් කාපල්ල; ඒවා යින් ජීවත් වෙන්ට පුළුවන්" කියා? තමුන්නාන්සේලාගේ අනිතය ඒක නේද?

අද තිබෙන තත්ත්වය මොකක්ද? අපේ රටේ වැසියන් බත ආහාර කොට ජීවත් වන ජාතියක්. මොනව කරන්ටත් යම් ජාතියකට කෑම ඇඳීම කියන දෙක තිබෙන්න ඕනෑ. කෑම සහ ඇඳීම වෙනුවෙන් අපි තවමත් පිට රට දෙස නේද බලන්නෙ? යම් ආණ්ඩුවක් තම රටේ නියම සංවර්ධනයක් ඇති කරන්ට ක්‍රියා කරනවා නම් ඒ ආණ්ඩුවේ ප්‍රධාන යුතුකම ඒ රටේ වැසියාට කෑම ඇඳීම පහසුවෙන් ලබා ගැනීමට ක්‍රියා කිරීම නේද? මේ ගැන විරුද්ධ පාර්ශ්වයට මොකද කියන්ට තිබෙන්නෙ?

කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා (ස්ටැන්ලි තිලකරත්න මයා.) ඇතුළු මන්ත්‍රීවරුන් රට පුරා ගිහින් කර්මාන්ත ගැන පුරසාරම් දොඩනව. මේ රජය කර්මාන්ත ඇති කරනවාට විරුද්ධ යයි ඇතැම් මන්ත්‍රීවරුන් කර තිබෙන ප්‍රකාශ මම ඊයේ—පෙරේද ප්‍රවෘත්ති පත්‍රවල දැක්කා. එහෙම එකක් නැහැ. කිසිම වග කියයුතු ආණ්ඩුවක් කර්මාන්ත සංවර්ධනයකට විරුද්ධ වෙනවා යයි මා හිතන්නෙ නැහැ. එහෙත් අපේ රටේ ජනතාවට කෑම බීම ඇඳීම ආදි ඉතා අවශ්‍ය දේවල් නැති වෙලාවක, ඒ සඳහාත් විදේශ විනිමය වැය කරන්නට සිදු වී තිබෙන අවස්ථාවක, තමුන්නාන්සේලා ආහාරයෙන් මේ රට ස්වයංපෝෂිත කරන්ට ක්‍රියා කරනවා වෙනුවට කටු කම්බි හදන්ට පටන් ගත් බව ඇත්ත; තමුන්නාන්සේලා අල්පෙනෙත්ති හදන්ට පටන් ගත් බව ඇත්ත; තමුන්නාන්සේලා "රිෆ්රිජරේටර්ස්" හදන්ට පටන් ගත් බව ඇත්ත. එහෙත් ඒකෙන් අපේ මිනිසුන්ගේ කුස ගින්න නැති කරන්ට බැහැ; අපේ මිනිසුන්ගේ ගතට වතක් දෙන්ට බැහැ. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තියේත් අපේ ප්‍රතිපත්තියේත් විශේෂ වෙනස ඒකයි. අපේ බලාපොරොත්තුව කර්මාන්ත සංවර්ධනය අඩාල කිරීම නොවෙයි. අපේ බලාපොරොත්තුව අපේ රටේම නිපදවන්ට පුළුවන් අපේ අවශ්‍යතාවන් මෙහිම නිපදවන විට ඒ සඳහා පිටරට යමින් තිබුණු විදේශ විනිමය මේ රටේ කර්මාන්තවලට යොදවා ඒ මගින් මේ රටේ කර්මාන්ත සංවර්ධනයක් ඇති කිරීමයි. ඒකයි, අපේ ක්‍රියා මාර්ගය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ මහජනතාවගේ පැවැත්මට අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය, රෙදිපිළි ආදිය මේ රටේම නිපදවන්ට පුළුවන්. එහෙත් පිටරටින් ගෙන්වන ඒ ද්‍රව්‍ය වෙනුවෙන් අවුරුද්දපතා රුපියල් ලක්ෂ 9,000 ක පමණ මුදලක් පිටරට ඇදී යනව. ඒ ද්‍රව්‍ය මෙහිම නිෂ්පාදනය කර ගන්නට අපට පුළුවන් නම් එසේ කොට පිට රට ඇදී යන අර මහා ධනස්කන්ධය මෙහි ඉතුරු කරගෙන මේ රටේ නිෂ්පාදනයන් තව තවත් වැඩි දියුණු කිරීම වගකිව යුතු රජයක යුතුකම නොවේදැයි මා අහනවා. එසේ ඉතුරු වන මහා ධනස්කන්ධය නොයෙකුත් කර්මාන්ත සඳහා යොදවන්නට අපට පුළුවන් වනවා නේද? ඒවාගේම, එම කර්මාන්ත සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍යත් යන්ත්‍රෝපකරණත් ගෙන්වා ගැනීම සඳහා ඒ ධනය යොදවන්නට අපට පුළුවන් වනවා නේද? එහෙම නම්, අපේ ආහාර ද්‍රව්‍ය අතින්, රෙදි පිළි ආදී ද්‍රව්‍ය අතින් මේ රටේ යම් දියුණුවක් ඇති කිරීමට මේ රජය ගෙන තිබෙන පියවර දෝෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දර්ශනයට ලක් කිරීම විරුද්ධ පක්ෂය විරුද්ධ වන්නත් වාලේ කරන දෙයක් විනා වගකීමක් ඇතිව කරන දෙයක් නොවන බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. අද අපේ රටේ තත්ත්වය මොකක්ද? අපට වුවමනා කරන හාල් ප්‍රමාණයෙන් පවා සියයට 50 ක් තවමත් අප පිටරටින් ගෙන්වා ගන්නවා. රෙදිපිළි මෙහි නිෂ්පාදනය කර ගන්නට පුළුවන් වුවත් ඊට අවශ්‍ය අමු ද්‍රව්‍ය තවමත් පිටරටවලින් ගෙන්වා ගන්නට අපට සිදු වී තිබෙනවා.

විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් "රිෆ්‍රිජරේටර්ස්" ගැනත් අල්පෙනෙත්ති ගැනත් කටුකම්බි ගැනත් කථා කළා. අපට තිබුණු අඩුව මේවාද? මේවා නැතිව ජීවත් වන්නට බැරි තත්ත්වයක් අපට තිබුණාද? අද මේ ආණ්ඩුවේ සිටින මැති ඇමතිවරුන් එදා විරුද්ධ පක්ෂයේ සිටියදී මේ චෝදනාව රජයට එල්ල කළා. අද අප එය වෙනස් කර තිබෙනවා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඒ චෝදනාව කළා. ඒ වෙනස ඇති කිරීමෙන් අප අදහස් කරන්නේ ගොවිතැන් සංවර්ධනයට පමණක් අපගේ අවධානය යොමු කිරීම නොවෙයි. අපේ බලාපොරොත්තුව, අපේ ප්‍රාර්ථනය, අපේ උත්සාහය අපේ ජනතාවගේ පැවැත්මට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය හා රෙදිපිළි ආදී අනෙකුත් ද්‍රව්‍යත් මෙහිම නිපදවාගෙන ඒ මඟින් ඉතිරි කර ගන්නා ධනයෙන් නොයෙකුත් කර්මාන්ත ඇති කිරීමට මාර්ගය පාදා ගැනීමයි. දැනට ආරම්භ වී තිබෙන කර්මාන්ත හෝ වෙනත් ව්‍යාපාර හෝ අඩාල වන්නට විනාශ වන්නට ඉඩ හැරීමක් එයින් බලාපොරොත්තු වන්නේ නැහැ. පසුගිය රජය රට පාලනය කළ කාලයේදී පාඩුවට පවත්වාගෙන ගිය කර්මාන්ත ගණනාවක්ම අද ලාභ උපදවන සංස්ථා බවට පත් වී තිබෙන බව අප ඉතා ආඩම්බරයෙන් සඳහන් කරන්නට කැමැතියි. ඒ මොනවාදැයි මගෙන් ඇහුවොත් මම ඊට උත්තර දෙන්නම්. කඩදාසි සංයුක්ත මණ්ඩලය පාඩුවට පවත්වාගෙන ගියා. අද එයින් ලාභ ලැබෙනවා. වෙනත් සංයුක්ත මණ්ඩලවල වාර්තා දෙස බලන විට අද ඒවායේ තත්ත්වය ක්‍රමානුකූලව දියුණු වේගන යන බව පෙනෙනවා. ඒවායේ කටයුතු නියම පදනමක් උඩ ගෙන යාමට මේ රජය වැඩ කළ බව අද කවුරුනුත් පිළිගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා බොහොම වේගවත්ව කථා කරමින් පෙන්නුම් කරන්නට උත්සාහ කළේ කුමක්ද? ඒ අය පටන් ගත් කර්මාන්ත ව්‍යාපාර බලන්නය, මේ රජයට ඒ අතින් කිසිම දෙයක් කරන්නට නොහැකිවී තිබෙනවා නොවේද, ආදී වශයෙන් එතුමා වැරදි දර්ශනයක් මවා පාන්නට උත්සාහ කළා. එක් එක් දේශපාලන පක්ෂවලට කොටුවී වාද භේදවලින් වෙන්ව දේශපාලන ප්‍රයෝජනය පිණිසම අපේ රටේ අනාගතය දෙස බැලිය යුතු කාලයක නොවෙයි අද අප ජීවත් වෙන්නෙ. කොයි කාලයකදී කොයි පක්ෂයක් බලයට පත් වුණත් මුහුණපාන්නට වන ප්‍රශ්නය තමයි ආර්ථික ප්‍රශ්නය. අද අපේ පාඨශාලාවලට ගුරුවරුන් නැත්නම්, උපකරණ නැත්නම්, විද්‍යාගාර නැත්නම්, අපේ ආරෝග්‍යශාලාවලට බෙහෙත් හේත් නැත්නම්, ඇඳන් නැත්නම්, වෛද්‍යවරුන් සහ වෙනත් උපස්ථායකවරුන් පත් කරන්නට මුදල් නැත්නම්, අපේ පාරවල් සාදන්නට මුදල් නැත්නම්, අපේ ගම් නියම්ගම්වලට ජල පහසුකම්, විදුලි බල පහසුකම් සපයන්නට මුදල් නැත්නම්, අපේ රටේ රැකීරක්ෂා නැති අයට රක්ෂා ලැබෙන විධියට නොයෙකුත් කර්මාන්තශාලා ආරම්භ කරන්නට මුදල් නැත්නම්, ඊට හේතුව අපේ රටේම නිෂ්පාදනය කර ගන්නට පුළුවන් දේවල් සඳහා අපේ රටේ විශාල ධනස්කන්ධයක් පිටරට ඇදී යාම බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. ඒකයි තත්ත්වය. මේ පිටරට ඇදී යන විශාල ධනස්කන්ධය මේ රටේම රඳවාගෙන අපේ පාඨශාලාවලට, ආරෝග්‍යශාලාවලට අවශ්‍ය දෑ සැපයීමටත්, පාරවල් පාලම් බෝක්කු සෑදීම සඳහාත්, ගම් නියම්ගම්වලට විදුලි බලය හා ජලය සම්පාදනය කිරීමේ යෝජනා ක්‍රමවලටත් යෙදවිය යුතුයි. රැකීරක්ෂා ප්‍රශ්නය තුනී කර ගැනීමටත් පුළුවන් වන ආකාරයට නොයෙකුත් කර්මාන්තශාලා පිහිටුවන්නට මේ මුදල් යෙදවිය යුතුයි. රටේ පොදු සංවර්ධනයට මේ මුදල් යෙදවිය යුතුයි. අද ජාතිය මුහුණපා සිටින්නේ අන්න ඒ තත්ත්වයටයි. පක්ෂ භේදවලින් යුක්තව මතභේදවලින් යුක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

තව මුහුණ දෙන්නට පුළුවන් තත්ත්වයක් නොවෙයි මේ. අප අතර නොයෙකුත් දේශපාලන මතභේද තිබෙන්නට පුළුවනි. එහෙත් කොයි පක්ෂයක් වුවත් බලයට පත් වුවහොත් කරනවාය කියන්නෙ මේ රටේ උපදින හැම පුරවැසියකුටම අගහිඟයක් නැතිව ජීවත්වන්නට පුළුවන් තත්ත්වයක් ඇති කරනවාය යන්න නොවේද? ලංකාවේ ඉපදීම පාප කර්මයක් යයි සිතන තරමටම අද අපේ රට දිළිඳු වී තිබෙනවා නොවේද? රටක යම් මනුෂ්‍යයකු ඉපදුණොත් ඒ මනුෂ්‍යයාට කල්පනා වුණොත් මගේ පාප කර්මයකට මේ රටේ ඉපදුනාය කියා ඒ තරම් ශාපයක් තවත් තිබෙනවාද? උගත්කමක් ඇති උදවියත් අද කරන්නට රක්ෂාවක් නැතිව, ජීවත් වෙන්නට නිවහනක් නැතිව, අඳින්නට නියම වතක් නැතිව, කුසට නියම අහරක් නැතිව දුකසේ ජීවත්වෙනවා නොවේද? අද මේ රටේ එවැනි තත්ත්වයක් පවතින්නේ කුමන හේතුවක් නිසාද කියා සොයා බලා ඒ තත්ත්වයට පිළියම් කරන්නට යම් රජයක් උත්සාහ කරන විට එයින් එම රජයට දේශපාලන වාසියක් ලැබේය යන කල්පනාව උඩ එය හෙළාදැකීම සාධාරණද කියා මා ප්‍රශ්න කරනවා. රටේ නියම සංවර්ධනයක් ඇති කරනවා නම් ඒකට සහයෝගය දෙන්නට ලෑස්තිය කියා කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. අපේ රජය නියම සංවර්ධනයක් ඇති කරන්නට ක්‍රියා නොකරනවාය යන්න පෙන්වන්නට එතුමා මොකක්ද ගෙනහැර පෑවේ? එතුමා දියවන්නා ඔය ශ්‍රමදාන ව්‍යාපාරය ගැන සඳහන් කළා. ඇත්ත වශයෙන්ම ඒ ව්‍යාපාරය ගැන එතුමාට හිතේ අමාරුවක් ඇති. එතුමාගේ කොට්ඨාශයේ යම් පිරිසක් ඉදිරිපත්වී ඒ දියවන්නා ඔයේ ජලය බැසගෙන යන්නෙ නැති හරියේ ඉඩම් අමාත්‍යාංශයෙන් උදව්ව ඇතිව එදා යම් ශ්‍රමදාන වැඩ පිළිවෙළක් ආරම්භ කළා. පැය දෙකක් හෝ වේවා දහස් ගණනක් එකතු වී ඒ ස්ථානයේ යම් වැඩක් කළා. එතුමාම කීවා, "බෝට්ටුවක් තල්ලු කළා; දියේ නොවෙයි, මඩේ" කියා. වතුර ගලා යා යුතු ඔයේ මඩ පිරිලා. ඒ මඩ ඉවත් කිරීම සඳහා පැය දෙකක් හෝ ඒ පිරිස ශ්‍රමදානයෙන් වැඩ කළා. දියවන්නා ඔයට ගිය කලදසාව එතුමාගේ කථාවෙන් කීවා. එහෙත් එතුමා කල්පනා කළේ නැහැ, ඒ කාර්යයට යම් උදව්වක් කරන්නට. මඩේ බෝට්ටුවක් තල්ලු කළ බව එතුමා කීවත්, දියවන්නා ඔය මඩ වුණේ ඇයිදැයි කීවේ නැහැ. එදා ශ්‍රම දානයේ යෙදුනේ, ඒ මඩ ඉවත් කිරීමටයි. මා ඒ කාරණය ගැන සඳහන් කළේ, මේ රජය ගෙන යන සංවර්ධන වැඩ පිළිවෙළවල් හාස්‍යයට, උපහාසයට ලක් කිරීම, දේශපාලන වශයෙන් අවඥාවට භාජන කිරීම සාධාරණ නොවන බව පෙන්නුම් කිරීමටයි. ලංකාවේ බලයට පත් වන කුමන රජයකට හෝ වේවා මුහුණ පාන්නට වන බරපතළම ප්‍රශ්නය මෙයයි.

ලක්ෂ 5 ක් 6 ක් රැකිරක්ෂා නොමැතිව සිටිනවා නම්, අපේ ජනතාවට ප්‍රමාණවත් ගෙවල් දොරවල් නැත්නම්, පාරවල් පාලම් බෝක්කු අබලංව තිබෙනවා නම්, රටේ අවශ්‍යතාවන්ට සරිලන තරමට ජල සම්පාදනය, විදුලි බල සම්පාදනය සංවර්ධනය නොවෙනවා නම්, අප ඊට හේතු මොනවාදැයි සොයා බැලිය යුතුයි. ඒ හේතුව නම් අනෙකක් නොව අපේ රටේ නොදියුණුකමයි. අපේ රටට අවශ්‍ය දේවල්, අපේ රටේම නිපදවා ගන්නට පුළුවන් දේවල්, පිටරටින් ගෙන්වා ගැනීම සඳහා අපේ විදේශ විනිමය වැය කිරීම නතර කරන තුරු අපට මේ ප්‍රශ්නයට සාර්ථක ලෙස මුහුණ දෙන්නට බැහැ.

සමහරුන් කල්පනා කරනවා, රටක් සංවර්ධනය කිරීමය කියන්නේ ලෝකයේ වෙනත් රටවල නිෂ්පාදනය වන හැම දෙයක්ම ඒ රටේත් නිෂ්පාදනය කිරීමය කියා. ඒ අදහසට මා එකඟ වන්නේ නැහැ. ලෝකයේ අනෙක් හැම රටකම නිපදවන හැම දෙයක්ම නිපදවන්නට කොයි රටටද පුළුවන්කම තිබෙන්නේ? ලෝකයේ කිසිම රටක එහෙම ක්‍රමයක්, එවැනි වැඩ පිළිවෙළක් ගෙන යන්නේත් නැහැ. එහෙම කරන්නට පුළුවන්කමකුත් නැහැ. සමහර රටවල් සමහර දේවලින් ස්වයම්පෝෂිතව තිබෙනවා. තවත් සමහර රටවල් එක් එක් දේවල් වෙනත් රටවලට විකිණීමෙන් යම්කිසි ආදායමක් ලබා ගන්නවා. මේ රට දිහා බලන්න. මේ රටේ ජාතික ආදායමෙන් නැත්නම් විදේශ විනිමයෙන් සියයට 80 ක් ලැබෙන්නේ, තේ වෙළඳාමෙනුයි. තේ, පොල්, රබර් යන නිෂ්පාදන තුන තමයි, අප වැඩි වශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලෝක වෙළෙඳ පොළේ අලෙවි කරන්නේ. ඒවාට ලැබෙන විදේශ විනිමයෙන් තමයි, අද අපට ජීවත් වන්නට පුළුවන්කම ලැබී තිබෙන්නේ.

එහෙත් අද ලෝක වෙළෙඳ පොළේ ඇති වී තිබෙන තත්ත්වය මොකක්ද? අද තේ වෙළඳ පොළට තවත් නොයෙකුත් වෙළෙන්දන් ඇවිත්. තවත් නොයෙක් රටවල් දැන් අප හා තරඟයට තේ වෙළඳාමට ඇවිත්. ඒ නිසා අද තේ වෙළෙඳාම පිළිබඳව විශාල තරඟයක් ඇති වී තිබෙනවා. ඒ අනුව තේ මිළ පහත බසින විට අපේ ආදායම් තත්ත්වයත් පහත බහිනවා. එසේ අපේ ආදායම් තත්ත්වය පහත බහින විට අපට පුළුවන්ද, හැම දාමත් මේ නිෂ්පාදන කෙරෙහිම විශ්වාසය තබාගෙන ඉදිරියටත් මේ ගමනම යන්නට? ප්‍රශ්නය, ඒකයි. මේ රටේ තේ විකුණා, මේ රටේ රබර් හා පොල් විකුණා, අපේ රටට අවශ්‍ය හාල් පිටරටින් ගෙන්වනවා; පිටරටින් රෙදි-පිළි ගෙන්වනවා; පිටරටින් කිරි හා අතිරේක ආහාර ද්‍රව්‍ය ගෙන්වනවා. මේ හැම දෙයක්ම පිටරටින් ගෙන්වන්නේ, ඒ හැමෙකක්ම මේ රටේ නිපදවන්නට පුළුවන්කම තිබෙද්දීයි.

ලංකාව කෘෂිකාර්මික රටක්. ලංකාවේ ඈත අතීතය දෙස බැලුවත්, මෑත ඉතිහාසය දෙස බැලුවත්, මේ යුගය දෙස බැලුවත්, අනාගතය දෙස බැලුවත්, මේ රටේ කෘෂිකාර්මික පරිසරය එහෙමම තිබෙන බව පැහැදිලිව පෙනෙනවා. ජාත්‍යන්තර වෙළඳාමක් වශයෙන් අපට අනාගතයේදී බයක් සැකක් නැතිව ගෙන යන්නට පුළුවන් තේ වෙළඳාම නොවෙයි.

අපේ රටේ ජනතාවගේ ප්‍රධාන ආහාරය වන බත් සඳහා වුවමනා හාල් ප්‍රමාණය පුරාණයේ අපේ රටේම නිපදවා ගත්තා. අපේ ජාතිය මේ රටට වුවමනා හාල් ප්‍රමාණය මෙහිම නිපදවා වැඩි ප්‍රමාණය විදේශවලට පවා විකුණා අතීතයේදී ලොකු ධනයක් ඉපැයූ ජාතියක් බව ආඩම්බරයෙන් මතක් කළ යුතුව තිබෙනවා. අද ආසියාවේ පමණක් නොව ලෝකයේ වෙනත් රටවල පවා මීට පෙර කවදාවත් බත් අනුභව නොකළ ජාතීන් බොහොමයක් තමන්ගේ ආහාරයට බත් ස්වල්පයක් වුවත් මිශ්‍ර කර ගැනීමේ පුරුද්දක් ඇතිව සිටිනවා. ඒ තත්ත්වය දැන් ලෝකයේ හැම තැනකම වාගේ ඇතිවෙගන යනවා. ඒ මේ කරුණු නිසා අද ලෝකයේ හාල්වලට ලොකු වෙළෙඳ පොළක් ඇතිවීගෙන යනවා. හාල් නිපදවන රටවල් අතර ලංකාවට වැදගත් තැනක් තිබෙනවා. එහෙම නම් අප ඒ ගැන උත්සාහ නොකරන්නේ ඇයි? අද මේ ආණ්ඩුව මේ රටේ ජනතාවට අවශ්‍ය හාල් නිෂ්පාදනය කිරීම සඳහා ගෙන යන වැයම අනුව 1970 වන විට අපේ රටට අවශ්‍ය හාල් ප්‍රමාණයෙන් සියේට 75 ක් පමණ අපේ රටේම නිෂ්පාදනය කරන්නට පුළුවන් වනු ඇතැයි අප විශ්වාස කරනවා. 1970 දී සියේට 75 කින් ස්වයංපෝෂිත වන්නට පුළුවන් වන අන්දමේ සැලැස්මක් අනුවයි මේ ආණ්ඩුව වැඩ කට යුතු කරගෙන යන්නේ. ඉදිරි කාලයේදී අපේ මේ කාර්යය පක්ෂභේදයෙන් තොරව, ජාතික අර්බුදයකට රට මුහුණ දී තිබෙන අවස්ථාවක ක්‍රියා කරන ආකාරයට සියලු දෙනාගේම සහයෝගය ඇතිව කටයුතු කර ගෙන ගියොත් අනාගත ආර්ථික සංවර්ධනය සාර්ථක වී ජාත්‍යන්තර වෙළෙඳපොළට පවා අපේ හාල් යවන්නට අපට බැරි වන්නේ නැහැ. අපේ රටේ අද තිබෙන බරපතළම ප්‍රශ්නය ආර්ථික ප්‍රශ්නය නම්, ඒ ප්‍රශ්නය ගොනු වී තිබෙන්නේ දැනට පවතින තත්ත්වය උඩ නම්, ඒ ගැන වහ වහා ක්‍රියා කළ යුතු බව අප සියලු දෙනාම පිළිගත යුතුව තිබෙනවා.

විරුද්ධ පාර්ශ්වය අද ආණ්ඩුවෙන් අහන ප්‍රශ්නය කුමක්ද? කෝ තමුන්නාන්සේලා මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳුවාද? කෝ තමුන්නාන්සේලා ජීවන වියදම ඉහළ යාමේ ප්‍රශ්නය විසඳුවාද? මේ රටේ ආරෝග්‍යශාලාවල තදබදය නැති කිරීමට කළේ මොනවාද? ඒ වගේම ඉස්කෝල ප්‍රශ්නය තමුන්නාන්සේලා විසඳා තිබෙනවාද? ඔන්න ඔය විධියේ ප්‍රශ්නයි විරුඬ පාර්ශ්වයෙන් එන්නේ. මාත් විරුඬ පාර්ශ්වයෙන් ප්‍රශ්නයක් අහන්නට කැමතියි. මේ ප්‍රශ්න විසඳන්නට ඇති බාධාවන් නැති කරන්නට තමුන්නාන්සේලා බලයේ ඉන්න අවස්ථාවේදී කළ දේ මොනවාද? ඒකයි මා අහන ප්‍රශ්නය. ඒ නිසා ඒ මූලික හේතුව ගැනයි අපේ සැලකිල්ල දැන් යොමු විය යුත්තේ. ඒ මූලික හේතුවට මුහුණ දී මූලික බාධකයන් නැති කර රටේ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කරන්නට ක්‍රියා කරගෙන යන අප

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

ගත වූ අවුරුදු දෙකහමාර තුළ ගත් පිය වර තව දුරටත් නොනවත්වා ඉදිරියට ගෙන යා යුතුව තිබෙනවා. මෙතෙක් අප ලත් ප්‍රතිඵල අප ලැබූ ජයග්‍රහණයක් හැටි යට සලකන්නට පුළුවනි.

මේ වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනයෙන් අපේ වැඩ පිළිවෙළ සඳහා ගන්නා පදනම පෙන්වා දී තිබෙනවා. නොයෙක් අමාරුකම් වලට මුහුණ පා සිටින ජාතියට තවත් බර නොපටවා හැකි තාක් දුරට වෙනත් ක්‍රම වලින් අයවැය පරතරය පියවන්නට ගරු මුදල් ඇමතිතුමා උත්සාහ දරා තිබෙනවා. ඒ උත්සාහයේදී එතුමා රජයේ සේවක යන්ගේ වැටුප් තාවකාලික වශයෙන් වැඩි කර තිබෙනවා. එය එක්තරා කොටසකට පමණක් ලැබෙන සහනයක් බව අප පිළි ගන්නවා. ඒ වැඩ පිළිවෙළත් දැන් විරුද්ධ පාර්ශ්වය අවඥාවට භාජන කර තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයට පෙනෙන්නේ ඒ විධියටයි. අප වැඩ කළත් වැරදියි; නොකළත් වැරදියි. සච්චකයා දවසක් බුදු හාමුදුරුවන් වහන්සේ ළඟට ගියා. තමන් නොදන්නා දෙයක් ගැන අසා දැන ගන්නට නොවෙයි සච්චකයා ගියේ. තමුන්නාන්සේ අපට කරන්නට කියනවාදැයි අහන්නටයි ගියේ. කරන්නැයි උන්වහන්සේ පිළිතුරු දුන්නොත්, පව්කරන්නට කියනවා දැයි අහන්නටත් නොකරන්නැයි පිළිතුරු දුන්නොත් පින් නොකරන්නට කියනවාදැයි අහන්නටත් හිතාගෙනයි ඔහු බුදු හාමුදුරු වන් වහන්සේ ළඟට ගියේ. ඔය විධියටයි ඇතැමුන් ක්‍රියා කරන්නේ. ඒ උදවියට නම් ආණ්ඩුව හොඳක් කළත් වැරදියි, නරකක් කළත් වැරදියි. හොඳක් කළත් නරක විධියටයි පෙන්නුම් කරන්නට උත් සාහ කරන්නේ. එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරතොත් එය සාධාරණ දෙය කැයි මා නම් හිතන්නේ නැහැ. යම් ආණ්ඩුවක් යම් හොඳ පියවරක් ගෙන වැඩ කර ගෙන යනවා නම් ඊට ඉත සිතින්ම ප්‍රශංසා කරන්නට ඕනෑ.

රජයේ සේවකයන් තමන්ගේ මාසික වැටුප් ප්‍රමාණය රුපියල් තිහකින් වැඩි කළ යුතුයයි ඉල්ලා සිටියා. ඒ බව තමුන්නාන්සේ දන්නවා. අපේ රටේ ආර්ථික තත්ත්වය උඩ එවැනි දෙයක් කරන්නට අමාරු බව විරුද්ධ පාර්ශ්වය දන්නවා. එහෙත් දෙන්නට පුළුවන් යම් සහන යක් තියෙනවා නම් එය දීමට මේ රජයේ තිබෙන උනන්දුව පහළ ශ්‍රේණියේ අඩු වැටුප් ලබන සේවකයන්ට ගරු මුදල් ඇමතිතුමා දී ඇති සහනයෙන් පෙනෙනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යටි යන්තොට මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) විරුද්ධ පාර්ශ්වයේ සිටින විට ඉල්ලීම් 21 සකස් කළ ආකාරය ඔබ තුමාට මතක ඇති. ඒ ඉල්ලීම් 21 න් එකක් තමයි මසකට රුපියල් 30 ක වැඩි වැටුප. ඉල්ලීම් 21 ඉදිරිපත් කර මාස කීපයක් යන්නට කලින් එතුමාට සිදු වුණා, හවුල් රජයේ මුදල් ඇමති ධුරය භාර ගන්නට. කොපමණද, අයවැය ලේඛ නයෙන් එතුමා දුන්න ප්‍රමාණය? ආණ්ඩු වේ සේවකයන් රුපියල් 30 ක වැටුප් වැඩි වීමක් ඉල්ලුවා. ස්වභාව ධර්මයා විසින් ඒ ඉල්ලීම් සකස් කළ කාරක සභාවේ ප්‍රධානයාටම පැවරුවා, පුළුවන් නම් ඒ වැඩේ කරපන් කියා. ඔහු මොකක්ද කෙළේ? කීයක්ද වැඩි කෙළේ? මට ගණන හරියට මතක නැහැ; මසකට රුපියලකුත් ශත පනහකට කිට්ටු ගණනක් පමණයි, වැඩි කෙළේ. ඇයි? එතුමා දන්නවා, ඒ ඉල්ලීම ඉටු කරන්නට බැරි බව. ඒ වෙලාවේ හැටියට ඒක කරන්නට බැරි වැඩක්. එහෙත් අද මොකක්ද කියන්නෙ? මස කට රුපියල් සියයකට අඩු වැටුපක් ලබන ලක්ෂ කීපයකට පමණක් තමුන්නාන් සේලා රුපියල් 20 ක් වැඩි කළාය, මස කට රුපියල් තුන් සියයකට අඩු වැටුපක් ලබන අයට රුපියල් 10 ක් වැඩි කළාය, ඕක මහා ලොකු දෙයක්ද කියා අද කිය නවා. ඒ මුදලවත් වැඩි කිරීම ගැන අබ මල් රේණුවක තරම්වත් ප්‍රශංසාවක් මේ රජයට කරන්නට ඔවුන්ට පුළුවන් වුණේ නැහැ. අපට දෙන්නට පුළුවන් වුණේ රුපියලකුත් ශත ගණනක් පමණය, තමුන්නාන්සේලා රුපියල් විස්සක් නැත් නම් දහයක් වැඩි කර තිබෙනවාය කියා සවල්ප වශයෙන්වත් ප්‍රශංසාවක් කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඒ කාරණය සඳහන් කෙළේ තර්කයක් හැටියට නොවෙයි; දේශපාලන වාසිය පිණිස ඕනෑම දෙයක් වැරදි අන්දමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෙන්වන්නට විරුද්ධ පාර්ශ්වය උත්සාහ කිරීම වැරදි බව—සම්පූර්ණයෙන්ම අසාධාරණ බව—පෙන්වීමටයි. මා මූලික වශයෙන්ම බලාපොරොත්තු වුණේ පොදුවේ මේ රට මුහුණ පා තිබෙන ආර්ථික ප්‍රශ්නයත්, ඒ ප්‍රශ්නයට මේ රජය යෝජනා කරන පිළියමත්, සඳහන් කරන්නටයි. ඒ පිළියමින් මේ ආර්ථික දුර්දශාවට යම් ප්‍රතිකාරයක් කරන්නට අපට පුළුවන් වුණොත් මේ රටේ සංවර්ධනයත්, සමෘද්ධියත් රඳා පවත්නේ එතැන බව මොන දේශපාලන මතයක් දරුවත් කව්රුනුත් පිළිගන්නට ඕනෑ.

ඊ ළඟට මා තවත් පොදු කාරණයක් ගැන සඳහන් කරන්නට කැමතියි. ඒ කාරණය නම් අපේ පරිපාලන යන්ත්‍රය පිළිබඳවයි. මොන දේශපාලන පක්ෂය බලයට ආවත් අද තිබෙන පරිපාලන යන්ත්‍රය අනුව වැඩ කටයුතු කිරීම අපහසු බව අවුරුදු දෙකහමාරක පළපුරුද්දෙන් මට කියන්නට පුළුවන්. මේ පරිපාලන යන්ත්‍රයේ ඇති රෝදවල යම් යම් දේ හිර වීම නිසා මැති ඇමතිවරුන් කොයි තරම් උත්සාහ කළත්, මහජනයාට එයින් ලැබිය යුතු නියම සහනය නොලැබෙන බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. හාල් පොතක් ලබා ගැනීම, දිව්රුම් පෙත්සමක් ඉදිරිපත් කිරීම වැනි ඉතාමත්ම සුළු ප්‍රශ්නයක සිට ඉතාමත්ම ඉහළ ප්‍රශ්නය දක්වාම, විරුද්ධ පාර්ශ්වයේ හෝ වේවා, ආණ්ඩු පාර්ශ්වයේ හෝ වේවා ඡන්දයෙන් තේරී පත් වී සිටින මන්ත්‍රීවරුන් අත ගැසුවේ නැත්නම්, සොයා බැලුවේ නැත්නම් පරිපාලන යන්ත්‍රය තුළින් මහ ජනතාවට ඒ සේවය ලබා ගැනීම ඉතාමත්ම දුෂ්කර කාර්යයක් බවට පත් වී තිබෙනවා. පරිපාලන යන්ත්‍රයේ ඇති රෝද ශුද්ධ කිරීමට කාලය පැමිණ තිබෙන බව ඒ පරිපාලන යන්ත්‍රයේ භාරකාරීත්වය දරණ පුද්ගලයා හැටියට ගරු මුදල් ඇමතිතුමාට මා විශේෂයෙන් මතක් කරන්නට සතුටුයි. වැඩියෙන් වැටුප් ලබන මිනිසුන් අඩුවෙන් වැඩ කරන තත්ත්වයක් තමයි, අද පරිපාලන යන්ත්‍රය තුළ තිබෙන්නේ. මහා ලොකු උපාධි ලබාගෙන, මහා විශාල විශේෂඥකම් ලබාගෙන රජයේ සේවයට බැඳෙන ඇතැම් උදවියට යම් වැඩක් පැවරූ විට ඔවුන් කල්පනා කරන්නේ එය කළ හැකි, කළ යුතු ක්‍රමය ගැන නොව එය නොකර සිටීම ගැනයි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி. சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
සෑම දෙනාම එහෙම නෑ.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
වැඩි දෙනෙක් එහෙමයි. ඇමතිකමක් කළ මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා රජයේ සේවය තුළ පවත්නා තත්ත්වය දන්නවා. කිසියම් වැඩක් කරවා ගැනීම සඳහා පුරවැසියකු පැමිණියහොත් "මේ වැඩේ මේ විධියට කෙරෙන්නට ඕනෑ. මේ මනුෂ්‍යයාට සේවයක් සැලසීමට ඉදිරිපත් වන්නට ඕනෑ," යන අදහසින් කටයුතුවල යෙදෙන්නේ ටික දෙනයි. අනෙක් පිරිස හැම විටම කල්පනා කරන්නේ "නොකර සිටීම" ගැනයි. යමක් කී විට එය කළ හැකි මාර්ගය සොයා බලා අපේ අහිංසක රටවැසියන්ට සේවයක් කරන සුළු පිරිසක් සිටියත් දැන් වැඩි දෙනාට වැඩ නොකර සිටීමේ ගතිය පුරුද්දකට ගොස් තිබෙනවා. මේ නිසා ඇමතිවරුන්ටත් වෙනත් නොයෙකුත් කොටස්වලටත් අමාරුකම්වලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. මේ ප්‍රශ්නය ගැන අප සියලු දෙනාගේම විශේෂ අවධානය යොමු විය යුතුයි.

අද කොළඹට නොපැමිණ කිසියම් රජයේ කාර්යයක් කරවා ගන්නට අපේ ගම්බද ජනතාවට අපහසුයි. කච්චේරි ක්‍රමය නැති කොට ඒ වෙනුවට ප්‍රාදේශීය සභා ඇති කරන්නට මෙම ආණ්ඩුව කල්පනා කර ඇත්තේ පෙඩරල් පක්ෂයේ ඉල්ලීමක් ඉටු කිරීමට නොව පරිපාලන ක්‍රමයේ වෙනසක් ඇති කොට ජනතාවට පහසුවෙන් තම කට යුතු කරවා ගැනීමට ඉඩකඩ සැලසීම සඳහායි. ලංකාවේ ඈත කෙළවරක සිටින පුද්ගලයෙකුට වුවද කොළඹට නොපැමිණ තම වැඩක් කරවා ගන්නට දැනට තිබෙන අපහසුව ගැන කල්පනා කොට රජයේ ක්‍රියා මාර්ගය කොළඹ නගරයේ පමණක් නොව අනෙක් පළාත්වලත් ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීමේ බලාපොරොත්තුව උඩයි, රජය ප්‍රාදේශීය සභා ක්‍රමයක් ගැන කල්පනා කර ඇත්තේ. ප්‍රාදේශීය සභා අවශ්‍ය යයි ප්‍රති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රේමදාස මයා.]

පත්තියක් හැටියට පිළිගෙන තිබෙන්නේ අන්න ඒ කී කාරණය නිසයි. එසේ නැතිව ඒ ඒ ප්‍රදේශවලට වෙන වෙන ආණ්ඩු දීම සඳහා ප්‍රාදේශීය සභා පිහිටුවන්නට යනවා යයි යම් යම් අය තුළ වැරදි වැටහීමක් තිබෙනවා නම් පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්වරයා හැටියට මා මේ අවස්ථාවේදී ඒ අයට ප්‍රකාශ කරන්නේ අප මොන පක්ෂයක් සමග එකතු වී සිටියත්, මොන පක්ෂයක් සමඟ එකතු වී වැඩ කරගෙන ගියත් සමස්ත ලංකාව එකම ආණ්ඩුවක් යටතේ පාලනය කිරීම මේ රජයේ එකම ප්‍රතිපත්තිය බවයි. ඒ ආණ්ඩුවට "මධ්‍යම ආණ්ඩුව" යන වචන පාවිච්චි කරන්නට මා කැමති නැහැ. මධ්‍යම ආණ්ඩුවක් තිබෙනවා නම් ප්‍රාදේශීය ආණ්ඩුත් තිබෙන්නට පුළුවනැයි හැඟීමක් ඇති වෙනවා. මේ රටේ තිබෙන්නේ එකම රජයයි. අපේ ප්‍රතිපත්තිය ඒකයි. ප්‍රාදේශීය සභා පිහිටුවීමෙන් අප බලාපොරොත්තු වන්නේ රජයේ පාලන ක්‍රියා මාර්ගය, සංවර්ධන වැඩ පිළිවෙළවල් මේ රටේ හැම කොණටම ගලාගෙන යෑම සඳහා පරිපාලන යන්ත්‍රය වඩාත් හොඳින් සකස් කිරීම බව අවධාරණයෙන් ප්‍රකාශ කරන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අවුරුද්දේ සැප්තැම්බර් මස 30 වැනිදායින් අවසන් වන මුදල් වර්ෂය තුළදී පළාත් පාලන අමාත්‍යාංශයෙන් කරගෙන ගිය හා කරගෙන යන විවිධ සුභසාධක වැඩ පිළිබඳව කාරක සභා අවස්ථාවේදී පැහැදිලි කර දෙන්නට මා බලාපොරොත්තු වන අතර, ජල පහසුකම් සැලසීම, විදුලි බලය සැපයීම පාරවල් සෑදීම වැනි ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනයට අවශ්‍ය කටයුතු සඳහා විශේෂ සැලකිල්ලක් දක්වා ක්‍රියා කරගෙන යන බව මේ අවස්ථාවේදී පොදුවේ සඳහන් කරන්නට සතුටුයි. පළාත් පාලන අමාත්‍යාංශයට මේ වර්ෂය සඳහා ඉතාමත් සතුටුදායක වාර්තාවක් ඉදිරිපත් කරන්නට පුළුවන් තත්ත්වයක් පවතිනවා. අපට මුහුණ පාන්නට සිදු වී තිබෙන වැදගත් ප්‍රශ්න දෙකක් තිබෙනවා. පළාත් පාලන ආයතන කොට්ඨාශ නම් නියම කර තිබෙන ක්‍රමයේ වෙනසක් වහාම ඇති කළ යුතුය යන්න ඉන් එක කාරණයක්. සමහර ප්‍රදේශවල ඉවක් බවක් නැතිව නොයෙකුත් දේශපාලන හේතු නිසා සහ නොයෙකුත් පෞද්ගලික හේතු නිසා විටින් විට කඩින් කඩ පළාත් පාලන ආයතන කොට්ඨාශවල නම නියම කොට තිබෙනවා. මුළු රටම සඳහා සීමා මණ්ඩලයක් ඇති කොට පුළුවන් තරම් දුරට ප්‍රාදේශීය කොට්ඨාශවල සීමා නැවත සකස් කිරීමට මෙම වර්ෂයේදී අප බලාපොරොත්තු වෙනවා. පළාත් පාලන ආයතන කොට්ඨාශවල සීමාවන්හි ඇති සාවද්‍යතාව අප මුළු රටම පිළිගන්නවා. මහජනතාවගේ අදහස් ද ලබාගෙන අප පුළුවන් තරම් දුරට ඒවා නිවැරදි කරන්නට උත්සාහ කරනවා. මුදල් ප්‍රශ්නය උඩ එය ටිකක් ප්‍රමාද කරන්නට සිදු වුණා. එහෙත් ඒ අදහස අප අතහැර දමා නැහැ. මෙය අවශ්‍යයෙන්ම සිදු විය යුතු දෙයක්. ප්‍රාදේශීය නිලධාරීන්ගේ ආධාරවත් ලබාගෙන මේ ප්‍රදේශවල කොට්ඨාශ නැවත බෙදා වෙන් කිරීමේ කටයුතු කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

අනික් කරුණ රජයේ ආධාර මුදල් බෙදා හැරීමේ ප්‍රශ්නයයි. අද කෙරීගෙන යන පිළිවෙළ අනුව නගර සභා, පළාත් ආණ්ඩු සභා, සුළු නගර සභා, ගම්සභා ආදී වශයෙන් ඇති හැම පළාත් පාලන ආයතනයකටම අවුරුදු පතා රජයෙන් බෙදන ආධාර මුදල එක සමානයි. එය සතුටුදායක තත්ත්වයක් නොවෙයි. සමහර නොදියුණු ප්‍රදේශවලට වැඩිපුර ආධාර දෙන්නට ඕනෑ. එහෙත් පක්ෂපාතිත්වය අනුව බෙදුවාය කියන චෝදනාව ලැබෙයි කියා තවමත් හැම කෙනෙකුටම එක සමානවම බෙදාගෙන යනවා. සමහර පළාත් පාලන ආයතනවලට වැඩිපුර ආදායම් ලැබෙනවා. තවත් සමහරකට කිසිම ආදායමක් නැහැ. එහෙත් ඒ හැම එකකටම ආධාර දෙනු ලබන්නේ එක ප්‍රමාණයටමයි. මේ ක්‍රමය සතුටුදායක නොවන බව තමුන්නාන්සේත් පිළිගන්නවා ඇති. ඒ නිසා මේ ප්‍රශ්නය පිළිබඳව අපේ අවධානය යොමු වුණා. මා විසින් මේ සම්බන්ධව ගරු පළාත් පාලන ඇමතිතුමා වෙත නිර්දේශයක් ඉදිරිපත් කර තිබෙනවා. මේ ප්‍රශ්නයට පිළියම් වශයෙන් යෙදිය යුතු හොඳම ක්‍රමය හැටියට මා කල්පනා කරන්නේ ආණ්ඩු පක්ෂයෙන් හා විරුද්ධ පක්ෂයෙන්ද මන්ත්‍රීවරුන් ඇතුළත් කොට පත් කරනු ලබන විශේෂ කාරක සභාවක් මගින් මේ ගැන කරුණු සොයා බලා පළාත් පාලන ආයතනවලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආධාර මුදල් දිය යුත්තේ මොන පදනමක් හා මොන ප්‍රතිපත්තියක් මතද කියා ඉදිරිපත් කිරීමයි. මා සන්තෝෂයි කියන්න ගරු පළාත් පාලන ඇමතිතුමා මගේ ඒ නිර්දේශය පිළිගෙන එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවෙන් සිටින බව.

මේ අවස්ථාවේදී මීට වඩා කථා කිරීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. අපේ රටත් ජාතියත් ඉතාමත්ම භයානක අවදානමකට මුහුණදී සිටින මේ අවස්ථාවේදී අපේ දේශපාලන මතිමතාන්තර මොනවා වුණත්, යම් යම් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී කුමන පිළියමක් අනුගමනය කළත්, අප කවුරුත් එක් වී මේ ආර්ථික අර්බුදයට හේතුව සොයා ගෙන ඒ හේතුවට—නැත්නම් ඒ අභියෝගයට—මුහුණ දීමට ක්‍රියා කිරීම සඳහා සියලුදෙනාගේම ආධාරය ලැබී අනාගතයේදී මේ ලංකාව සමෘද්ධිමත් රටක් කිරීමට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 3.26

**ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර)
(*திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை*)
(Mr. Leslie Goonewardene—Panadura)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1965 මාර්තු මස 25 වැනි දින මේ නව රජය පිහිටුවන අවස්ථාවේදී මේ නව රජය විසින් අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාට (ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන) ඇමති ධුරයක් දුන්නේ මක්නිසාදැයි යන්න මේ දක්වාම මට ප්‍රහේලිකාවක් වෙලයි තිබුණේ. පළාත් පාලන ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා අද පැවැත් වූ කථාවෙන් එයට හේතුව පෙනී යනවාය කියා මට කල්පනා වෙනවා. "රේප්රිජරේටර්ස්" සහ කටුකම්බි කර්මාන්තය දියුණු කිරීම ගැන එතුමා විරුද්ධ වුණා. ඒ අනුව අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාට ඒ ඇමති ධුරය බාර දී තිබෙන්නේ එතුමාගෙන් ගන්නට තිබෙන ප්‍රයෝජන ගත්තාට පසුව "ඇයි උඹ කටුකම්බි හැදුවේ" කියා එතුමා පන්නා දමන්නටය කියන අදහස මට ඇති වෙනවා. ඒ ගැන වචන දෙක තුනක් දෙවනුව කථා කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

මේ අවස්ථාවේදී අප සාකච්ඡා කරන අයවැය ලේඛනය මේ ගරු මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කළ තුන් වැනි අය වැය ලේඛනයයි. මේ ආණ්ඩුව ඇති වී අවුරුදු 2 යි, මාස 4 කුත් දින ගණනක් ගත වී තිබෙනවා. මේ කාලය ඇතුළත මේ ආණ්ඩුවට මේ රටේ ආර්ථික තත්ත්වය කොතරම් ප්‍රමාණයකට වෙනස් කරන්නට පුළුවන් වුණාද කියා සොයා බලන්නට නම් මේ ගරු මුදල් ඇමතිතුමා විසින්ම 1965 දී ඉදිරිපත් කරන ලද එතුමාගේ ප්‍රථම අයවැය කථාව දෙස බැලීම හොඳයි කියා මා හිතනවා. 1965 අගෝස්තු 9 වැනිදා අයවැය කථාව කරමින් ගරු මුදල් ඇමතිතුමා කිව්වේ මොකක්ද ? "අප රජය පිහිටුවන ලද්දේ උග්‍ර ආර්ථික අර්බුදයකින් රට පෙළෙමින් සිටි අවස්ථාවක බව අමුතුවෙන් කිව යුතු නොවෙයි" කියමිනුයි එතුමා කථාව පටන් ගත්තේ.

ඒ සම්බන්ධයෙන් රජයේ පරමාර්ථය වූයේ කුමක්ද යන්න ඉංග්‍රීසියෙන් විස්තර කරන්නේ මෙසේයි :

"The principal objective of the National Government is to achieve a higher rate of economic growth than in the past, thereby raising the per capita income and the living standards of the people."

ජාතික රජයේ මූලික පරමාර්ථය වූයේ ආර්ථික සංවර්ධනය පෙරට වඩා ශීඝ්‍රයෙන් ගෙන යන අතර පුද්ගලයන්ට ලැබෙන ආදායම වැඩි කරමින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමයි. අවුරුදු දෙකහමාරකට ආසන්න කාලයකින් පසුව එම පරමාර්ථ කොතෙක් දුරට ඉටු වී තිබෙනවාද යන්න එතුමාගේ අයවැය ලේඛනවලින් ම පෙන්වා දිය හැකියි. 1965 අයවැය ලේඛනයේදී 1964 තත්ත්වය විස්තර කර තිබෙන්නේ මෙසේයි :

"The increase of the Gross National Product in real terms, that is, after making adjustments for the increase in the price level during this period, was 4.5 per cent in 1964. . . ."

1964 දී "Gross National Product" යනුවෙන් අර්ථ ශාස්ත්‍රඥයන් නම් කරනු ලබන නිෂ්පාදනය සියයට 4.5 ක් වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

තිබෙන බව කියනවා. එහෙත් අවුරුදු දෙකහමාරකට පසුව ඒ පිළිබඳ තත්ත්වය එතුමා පෙන්නුම් කරන්නේ මෙසේයි :

"The Real Gross National Product in 1966 increased by 1.6 per cent."

"Gross National Product" එක වැඩි වී තිබෙන්නේ කෙසේ ද? 1964 දී සියයට 4.5 යි. 1966 දී සියයට 1.6 යි. ඒ අනුව අපට පෙනෙනවා, සියයට 4.5 සිට සියයට 1.6 දක්වා පහත බැස තිබෙන බව. ඒ ඒ පුද්ගලයාගේ නිෂ්පාදනය පිළිබඳව කීවේ මෙසේයි :

"The per capita real product increased by 2.1 per cent in 1964."

1964 දී එක් එක්කෙනා බැගින් බලන විට නිෂ්පාදනය වැඩි වී තිබෙන්නේ සියයට 2.1 යි. නමුත් ඒ ගැන අද කියන්නේ මෙසේයි :

"The per capita real product declined by .7 per cent."

1964 දී එය සියයට 2.1 ක් වැඩි වුණාය කියන අතර, 1965 දී එය තවදුරටත් අඩු වී තිබෙන බව කියනවා. අපේ රටේ ආර්ථික තත්ත්වය දියුණු කිරීම පිණිස, අපේ රටේ නිෂ්පාදනයත් වැඩි කිරීම පිණිස, අපේ රටේ ජීවන තත්ත්වය නගාලනු පිණිස, මුලින් ඇති කර ගන්නා ලද පරමාර්ථයන් ඉටු වෙනවා වෙනුවට, එම පරමාර්ථයන් ඉදිරිය කරා ගමන් කරනවා වෙනුවට, ආපස්සට ගමන් කරන බවයි ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවලින් පැහැදිලි වන්නේ.

මේ රජයේ සියලු දෙනාම විදේශ විනිමය ප්‍රශ්නය පිළිබඳව කථා කරන බව පෙනෙනවා. විදේශ විනිමය පිළිබඳ ප්‍රශ්නය වැදගත් එකක්. මේ අවුරුද්දේ පමණක් නොව පසුගිය අවුරුදු 10 තුළද විදේශ විනිමය බැස තිබෙනවාය කියන එක ඇත්තයි. ඒ කාරණය මතම වගකීම තබා මේ රජය බේරෙන්න හදනවා නම් එය වැරදියි. වෙළඳ ගිණුම්—terms of trade—අඩු වීමක් තිබෙනවාය කියන කාරණය මේ රජය වැඩ භාර ගන්නා අවස්ථාවේදී පවා දන්නවා. එම අමාරු තත්ත්වයෙන් මිදීම සඳහා 1965 දී අපේ මුදල් ඇමතිතුමා යෝජනා කළේ කුමක් ද? එතුමා කිව්ව, මේ අමාරු තත්ත්වයෙන් අපි බේරෙන්න ඕනෑ කියා. මුලින්ම තත්ත්වය විග්‍රහ කරමින් කියන්ට යෙදුණා මේ විධියට :

"Our Government is resolved to change this sorry state of affairs and initiate a serious effort in the field of planning and plan implementation."—[OFFICIAL REPORT, 9th August 1965; Vol. 61, c. 84.]

සැලැස්මක් අනුව වැඩ කිරීමට, පැවති තත්ත්වය දියුණු කිරීමට බලාපොරොත්තු වෙනවාය කිව්ව. ඒ තත්ත්වය පසුගිය අවුරුදු 2 1/2 තුළදී කොයිතරම් දුරට ඉෂ්ට වෙලා තිබෙනවා දැයි සොයා බලන්ට වටිනවා. යම්කිසි සුළු ප්‍රමාණයකට සැලැස්මක් අනුව වැඩ කරන්ට උත්සාහ දරා තිබෙන බව නම් මා පිළිගන්නවා. ඒ සුළු ප්‍රමාණයටවත් උත්සාහයක් දරා තිබෙන්නෙ විශේෂයෙන්ම කෘෂිකර්ම අංශයයි. කෘෂිකර්ම ඇමතිතුමා යටතේ තිබෙන දෙපාර්තමේන්තු සැලැස්මක් අනුව වැඩ කිරීමට යම්කිසි ප්‍රමාණයකවත් උත්සාහයක් දරා තිබෙනව. එහෙත් ඒ අංශයේ වුණත් ඒ කටයුත්ත කිසිසේත්ම සාර්ථක වී තිබෙන බවක් මට නම් පෙනෙන්ට නැහැ. ඒ සම්බන්ධයෙන් එක නිදසුණක් පමණයි, මා ඉදිරිපත් කරන්ට අදහස් කරන්නෙ. මක්නිසා ද? මා ඒ අංශය ගැන විශේෂයෙන් දන්නව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කුකුළන් ඇති කිරීමේ ව්‍යාපාරය අපි ගනිමු. කුකුළන් ඇති කිරීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් සමුපකාර සමිති පිහිටුවා ඒ මගින් බිත්තර නිෂ්පාදනය මේ රටේ විශාල වශයෙන් වැඩි කිරීමට මීට පෙර පැවති රජය යම්කිසි උත්සාහයක් දැරුව. ඒ උත්සාහයට පුද්ගලයකු වශයෙන් මාත් පෞද්ගලිකව සම්බන්ධ වුණා. ඒ සැලැස්ම සකස් කිරීමේදී මාත් සහභාගි වුණා. හලාවත සිට කළුතර දිස්ත්‍රික්කය දක්වා සමුපකාර සමිති 100 ක් පමණ මුලින්ම ආරම්භ කිරීමේ සැලැස්මක් සකස් කළා. තරමක් දුරට නොයෙක් අමාරුකම් මධ්‍යයේ ඒ වැඩ සැලැස්ම ඉදිරියට ගමන් කළ නමුත් කියන්න කනගාටුයි, සැලැස්මකින් තොරව ක්‍රියා කිරීම නිසා අද ඒ වැඩ පිළිවෙල බොහොම අමාරු අබලන් තත්ත්වයකට වැටී තිබෙනව. විශාල වශයෙන් බිත්තර දමන කුකුළු වර්ග පිටරටින් ගෙන්වා අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රටේ බිත්තර නිෂ්පාදනය වැඩි කිරීමටයි ඒ සැලැස්මෙන් අදහස් කළේ. විශාල වශයෙන් බිත්තර දමන කිකිළියන්ගෙන් ඉහළම ප්‍රයෝජනය ලබන්න නම් ඔවුන්ට ඉතා හොඳ ආහාර දෙන්න ඕනෑ. සාමාන්‍ය ගම්බද කුකුළන්ට වගේ පණුවන් අල්ලා ගෙන කෑමට ඉඩ හැරීමෙන් පමණක් ඔවුන්ගෙන් හොඳ ප්‍රතිඵල ලබා ගන්න බැහැ. එම නිසා මේ විශේෂ කුකුළු වර්ගය සඳහා "ෆිෂ් මීල්ස්" සහ "මේස්" නමැති විශේෂ ආහාර වර්ග පිට රටින් ගෙන්වන්ට ඕනෑ. මේ විශේෂ ආහාර වුවමනා කරනා කුකුළු පැටවුන් විශාල වශයෙන් ඇති කිරීමට සමුපකාර සමිති හා පුද්ගලයන් මාර්ගයෙන් රජය ක්‍රියා කරගෙන ගිය නමුත් ඒ පැටවුන්ට සහ බිත්තර දමන කිකිළියන්ට අවශ්‍ය "ෆිෂ් මීල්ස්" සහ "මේස්" නමැති ආහාර මෙරටට ගෙන්වා ගැනීම ක්‍රමයෙන් වැඩි කළේ නැහැ. එසේ නැත්නම් මේ රටේ නිෂ්පාදනය කිරීමට වැඩ පිළිවෙළක් යෙදුවේ නැහැ. ඒ පිළිබඳ ලේඛන මේ අවස්ථාවේදී කියවන්ට අවශ්‍ය නැහැ. ඒ ගැන මා ප්‍රශ්න මාර්ගයෙන් විස්තර ලබා ගෙන තිබෙනව. පසුගිය අවුරුදු දෙක—තුන ඇතුළත මේ ආහාර ගෙන්වීමේ වැඩි වීමක් සිදු වෙලා නැහැ. ඒ තත්ත්වයෙමයි, තිබෙන්නෙ. සමහර විට ටිකක් අඩු වෙලා ඇති. එතකොට කොහොමද මේ කිකිළියන් බිත්තර දමන්නෙ? ඒ හොඳ ආහාර වර්ග නැත්නම් මේ කිකිළියන්ට බිත්තර දාන්න බැහැ. [බාධා කිරීමක්] බොහොම අඩුවෙන් දාන්නෙ. ඒක පාඩුයි. සෞඛ්‍ය ඇමතිතුමාට මේ කාරණය තේරෙන්නේ නැතිව ඇති. එතුමාට තේරෙන්නේ ළමයින් ලැබීම පාලනය කිරීම ගැන පමණයි. මා මේ ගැන හොඳට දන්නවා. සෑහෙන වියදමක් දරා හොඳ ආහාර වර්ග ගෙන්වනවා නම් වැඩි ලාභයක් ලබන්න පුළුවනි. මේ ප්‍රශ්නය විසඳන්නට අදහස් කර තිබුණේ ඒ මාර්ගයෙනුයි. කිකිළියන්ට වුවමනා කරන නියම ආහාර නොදෙතොත් ලැබෙන බිත්තර ප්‍රමාණය ලැබිය යුතු ප්‍රමාණයෙන් බාගයකටත් වඩා අඩුවෙනවා. තමන් ලබාගත් ණය මුදල් ආපසු ගෙවන්නට සමුපකාර සමිති කීපයකටම මේ තත්ත්වය නිසා බැරි වී තිබෙනවා. ඒ, එම සමිතිවල වරදක් නිසා නොවෙයි. කිකිළියන්ට අවශ්‍ය නියම ආහාර වර්ග ලබා ගැනීමට බැරි වීමෙන් ඒවායේ ආදායම් තත්ත්වය පහළ වැටීම නිසයි. තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලයෙන්වත් මේවා ගෙන්වන්නෙ නැති නිසා අද බොහෝ දෙනෙකු කිකිළියන්ට පුන්නක්කු දෙනවා.

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. ஷெல்றன் ஜயசிங்ஹ—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

තමුසෙට කවුද ඔව කිව්වෙ?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

මා හොයා ගත්තා.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**

*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*

(Mr. Shelton Jayasinghe)

කොහෙන්ද හොයා ගත්තෙ?

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

තමුන්නාන්සේලාගේ ම නිලධාරීන් ගෙන්. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Order, please! It is his statement, and the hon. Parliamentary Secretary can reply to it.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**

*(திரு. லெஸ்லி குணவர்தன)*

(Mr. Leslie Goonewardene)

මා කථා කර ඉවර වුණාට පස්සේ එතුමාට ඕනෑනම් බිත්තර ගැන පමණක් නොව අරක්කු ගැන වුවත් කථා කරන්නට පුළුවනි. ඕනෑනම් කසිප්පු ගැනත් කථා කරන්නට පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

රජය මේ සම්බන්ධයෙන් සැලැස්මක් අනුව වැඩ කරන බවට පොරොන්දුවක් ජනතාවට දී සැලැස්මක් නැතිව වැඩ කර තිබෙන බව පෙන්වීමටයි මා මේ කරුණු කිව්වේ. කිකිළියන්ට වුවමනා කරන ආහාර වර්ග නොගෙන්වීම නිසා අද කුකුළන් ඇති කරන බොහෝ සමුපකාර සමිති අමාරුවෙ වැටී තිබෙනවා.

සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමටත් අද මේ රජය විශාල උනන්දුවක් ගන්නා බව පෙනෙනවා. ඒකත් කිසියම් සැලැස්මක් ඇතුව කරගෙන යනවාදැයි රජයෙන් මා අහන්නේ නොදන්න කරුණක් දැන ගැනීම සඳහායි. අපේ ගරු අගමැතිතුමාත් ගරු රාජ්‍ය ඇමතිතුමාත් සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් බොහෝම පුදුම ප්‍රකාශ වගයක් කර තිබෙනවා. 1966 සැප්තැම්බර් 30 වැනිදා රාජ්‍ය ඇමති ජේ. ආර්. ජයවර්ධන මහත්මයා මෙන්න මේ විධියේ ප්‍රකාශයක් කළ බව පත්‍රවල පළ වී තිබෙනවා :

"If Ceylon can attract a minimum of 100,000 visitors a year, the foreign exchange eouivalent of the minimum sum they would spend in Ceylon would be equivalent to Rs. 130 million."

මේ ප්‍රකාශයන් කර තිබෙන්නේත් විශෙෂඥයන්ගෙන් කරුණු දැනගෙනද යන්න මා දැන ගන්නට කැමැතියි. ඊළඟට අපේ ගරු අගමැතිතුමා 1966 ඔක්තෝබර් 1 වැනිදා කථාවක් කරද්දී මෙම ප්‍රකාශය කර තිබෙනවා :

"Tea has been our chief exchange earner in the years gone by. We have to achieve a revolution in our economy in a comparatively short time. That is a challenge that faces us, and I have the fullest confidence that, with certain areas of tea which eventually may have to go out of production in the years to come, tourism and its further development may more than adequately fill the void that has been created."

මේ ප්‍රකාශය නිසා ගරු අගමැතිතුමා පත්‍ර වල විවේචනයටත් ලක් වුණා. එතුමා කියා තිබෙන්නේ, තේ මිල පහත බැසීම නිසා තේ වතු වසා දමන්නට සිදු වුණොත් එයින් වන පාඩුව පිරිමසා ගැනීමට පමණක් නොව ඊට වඩා විශාල ප්‍රමාණයක ආදායමක් ලබා ගන්නටත් සංචාරක ව්‍යාපාරයෙන් පුළුවන් වේයයි කල්පනා කරන බවයි. මෙය, අපේ විශෙෂඥයන්ගෙන් අසා කරුණු දැනගත සැලැස්මක් අනුව කරන්නට බලාපොරොත්තු වන දෙයක්ද එසේ නැත්නම් ඒ මොහොතේ කටට ආවට කී දෙයක්ද යන වග මා දැන ගන්නට කැමැතියි. මෙය මහා පුදුම ප්‍රකාශයක්. එපමණක් නොවෙයි. ගරු රාජ්‍ය ඇමතිතුමාත් එතුමාගේ කථාවකදී සංචාරක ව්‍යාපාරය ගැන හුඟක් දුරට කරුණු කියා තිබෙනවා. දස වර්ෂයකින් පමණ සංචාරකයින් 1,50,000 ක් ගෙන්වා ගැනීමට බලාපොරොත්තු වන බවත් එයින් වර්ෂයකට විදේශ විනිමය ආදායම වශයෙන් රුපියල් කෝටි 20 ක් ලැබෙන බවත් එතුමා කියා තිබෙනවා. තවත් තැනක කියනව රුපියල් කෝටි 25 ක් ලබා ගන්නට පුළුවන් වෙනවාය කියා. මේකෙ ඇත්ත කුමක්ද කියා කියන්නට මා දන්නෙ නැහැ. මෙතැන ලේඛන දෙකක්. රුපියල් කෝටි 5 ක වෙනසක් තිබෙනවා. සමහර විට ඇමරිකාව වැනි රටකට නම් කෝටි පහක් සුළු මුදලක් වෙන්නට පුළුවනි. එහෙත් අපේ රට වැනි රටකට කෝටි පහක් කියන්නෙ විශාල මුදලක්. එතරම් පරතරයක් ඇති වුණේ කෙසේද කියා මා දන්නේ නැහැ. දෙවනුව ඒ කාරණය තේරුම් කර දෙන මෙන් මා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එහෙත් මේ ගණන් වලට පැමිණීයේ කෙසේද කියා අප දැන ගන්නට සතුටුයි. වැඩ කර බැලුවාම මේ ගණන් අනුව එක සංචාරකයකුගෙන් රුපියල් 1,333ක් නැත්නම් රුපියල් 1,666 ක් ලබා ගන්නට පුළුවන් වෙනවා. රාජ්‍ය ඇමතිතුමා මේ ගණන් පිළියෙළ කර ගත්තේ කෙසේද කියා අප දැනගන්නට සතුටුයි. එක සංචාරකයකුගෙන් රුපියල් එක්දහස් තුන්සිය ගණනක නැත්නම් රුපියල් එක් දහස් හයසිය ගණනක විදේශ විනිමයක් ලැබෙනවාය කියා තීරණයකට එළඹුණේ කොහොමද ? අපට ඒ මුදල ලැබෙන්නේ කොහොමද ? මේ රජය ලැස්ති කර තිබෙන, ලැස්ති කරගෙන යන වැඩ පිළිවෙළ අනුව මෙතරම් ප්‍රමාණයක මුදලක් අපට ලැබෙන්නෙ කොහොමද ? අහස් යාත්‍රාවලින් පැමිණෙන සංචාරකයින්ගෙන් අපට ලැබෙන විදේශ විනිමයක් නැහැ. මේ රටට ඇවිත් මේ රටේ හෝටල් වල නතර වන සංචාරකයින්ගෙන් තමයි අපට විදේශීය විනිමය ලැබෙන්නෙ. මේ විදේශීය සංචාරකයින් පාවිච්චි කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දේවල් කුමන ප්‍රමාණයකට ලංකාවේ නිෂ්පාදනය කරනවාද? ආහාර ගැන වුවත් තත්ත්වය කුමක්ද? ලංකාවේ නිෂ්පාදනය කරන ආහාර මේ සංචාරක යින්ට දෙනවාය කියා අප කොහොමද දන්නෙ? සමහර විට මේ සංචාරකයින් කියන්නට පුළුවනි, ලංකාවෙ මිනිසුන් කන කෑම අපට කන්නට බැරිය කියා. සමහර විට ඇමරිකාවෙන්, එංගලන්තයෙන් නැත්නම් ඕස්ට්‍රේලියාවෙන් ටින් කෑම වර්ග පවා ගෙන්වන්නට පුළුවනි. මස් ගැන නම් අපට සහතික වෙන්නට පුළුවනි. ලංකාවෙ මස් නොවෙයි පාවිච්චි වෙන්නෙ. ඕස්ට්‍රේලියාව, ආජන්ටිනාව, කැනඩාව යනාදි රටවලින් ගෙන් වන ටින් මස් තමයි අද පාවිච්චි කරන් නෙ. මේ සංචාරකයින්ට එහා මෙහා ගමන් කරන්නට රථ වාහනත් වුවමනා කරනවා. මේ රථවාහන සඳහා දැනටමත් සෑහෙන මුදලක් වියදම් කර තිබෙනවා. ඒ රථ වාහන කිසිවක් මේ රටේ සාදන ඒවා නො වෙයි. ඒවා ගෙන්වන්නේත් පිටරටින්. හෝටල් ගොඩනැගිලි ගැන බලමු. විශාල හෝටල් හයක් පමණ සාදන්නට යනවා. ඒවාට වුවමනා කරන උපකරණත් සියල්ලම විශාල වශයෙන් පිටරටින් ගෙන් වන්නට ඕනෑ. හැබැයි, ගොඩනැගිලිවලට වුවමනා ගඩොල් නම් ලංකාවෙන් ගන්නට පුළුවනි. මෙයින් ලංකාවේ ගඩොල් කර්මාන්තයට නම් යම් ප්‍රයෝජනයක් ලැබෙනවාය යන්න මා පිළිගන්නට ලෑස්තියි. එහෙත් ඒ සෑම අංශයක් ගැනම කල්පනා කරගෙන යන විට එක සංචාරකයකුගෙන් මේ රටට රුපියල් එක්දහස් තුන්සිය ගණනක නැත්නම් එක්දහස් හයසිය ගණනක විදේශ විනිමයක් ලැබෙනවාය යන්න අප පිළි ගන්නෙ කොහොමද? එම නිසා මේ ගණන් පිළියෙළ කළ ආකාරය පිළිබඳව තවත් විස්තර සපයන මෙන් මා ඉල්ලා සිටිනවා. එසේ නොකළහොත් අපට මේ ගණන් පිළිගන්නට අමාරුයි.

සංචාරක ව්‍යාපාරය පිළිබඳව අද තිබෙන තත්ත්වය කුමක්ද? සංචාරක ව්‍යාපාරය අද කුමන තත්ත්වයක තිබෙනවාද කියා රාජ්‍ය ඇමතිතුමා දන්නවාද කියා මා දන් නෙ නැහැ. නැව්වලින් නොයෙකුත් උදවිය ලංකාවට එනවා. ඒ අය ගෙන එන මුදල් වලට මොකද වෙන්නෙ? නැව්වලම සිටින "purser" ලට ඒ උදවිය මුදල් දෙනවා. ඊටපසු ගොඩබිමට ආවාම ඔය නොයෙක් නොයෙක් සංචාරක සමාගම් ඒ අයට ලංකාවේ මුදල් දෙනවා. මේ පිටරැටියන් ලංකාවට ඇවිත් ලංකාවේම මුදලින් ලංකාව වටා සංචාරය කරනවා. ඔවුන් ගෙන එන විදේශ විනිමය ස්ථිර වශයෙන්ම අපට ලැබෙන්නේ නැහැ. අද පවතින තත්ත්වයේ හැටියට ලංකාවට ලැබෙනවාට වඩා වැඩි මුදලක් පිටරටට යනවා. සියලුම සංචාරකයින් ගෙන එන මුදල් ඒ අන්දමට රටින් පිට යවනවාය කියා මා කියන්නෙ නැහැ. එහෙත් විශාල වශයෙන් සංචාරක ව්‍යාපාරය පුළුල් කරන් නට යනවා නම් මේ සංචාරකයින් ගෙන එන විදේශ විනිමය රටින් පිට යා නොදී ආරක්ෂා කර ගැනීම ගැනත් කල්පනා කරන්නට ඕනෑ. සංචාරක ව්‍යාපාරය දියුණු කරනවාට අප කවුරුවත් අකැමැති නැහැ. සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමෙන් මේ රටට විශාල විදේශ විනිමය ආදායමක් ලබා ගැනීමට ගරු රාජ්‍ය ඇමතිතුමා කල් පනා කරනවා. එහෙත් ඒ සමගම මේ විදේශීය සංචාරකයින් ගෙන එන මුදල් වංචා කරන්නට ඉඩක් නොලැබෙන අන් දමට එතුමා පිළියෙළ කර තිබෙන නීතිරීති මොනවාද කියා මා ප්‍රශ්න කරනවා. එවැනි නීතිරීති පිළියෙළ නොකළහොත් මොකද වෙන්නෙ? අවසානයේදී මේ රටට ලැබෙ නවාට වඩා වැඩි විදේශ විනිමයක් පිටරට යාවි. එවැනි තත්ත්වයක් ඇති වුණොත් අපට කිසිම ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. සමහර සංචාරකයින් මාගීයෙන් අද විශාල වශයෙන් මේ රටේ මැණික් අයුතු අන්දමට, නීති විරෝධි අන්දමට පිට කරන බව අප දන්නවා. ඒවා ගැන කටයුතු නොකර සංචාරක ව්‍යාපාරය තව තවත් දියුණු කරන විට හොර ජාවාරම් කරන උදවියට තව තවත් ඉඩකඩ ලැබෙන බව අප අමතක නොකළ යුතුයි. ඒ කරුණු ගැන කල්පනා කොට හොඳ සැලැස්මක් අනුව මේ රජය යම් වැඩ පිළිවෙළක් ගෙන යන බව අපට පිළිගන්නට අමාරුයි. ඒ නිසා රජයට චෝදනා ඉදිරිපත් කරන්නට අපට සිදු වී තිබෙනවා.

මට පෙර කථා කළ පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්තුමා කීවා, "පටන් ගත් ජනසතු ව්‍යාපාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

දියුණු කිරීමට මේ රජය කටයුතු කර තිබෙනවා" කියා. ඊට නිදසුනක් වශයෙන් කලින් පාඩුවට වැඩ කළ කඩදසි කම්හලින් දැන් යම්කිසි ලාභයක් ලැබෙනවාය කියාත් එතුමා කිවා. එසේ දැන් ලාභ ලැබෙනවා නම් අප බොහොම සන්තෝෂ වෙනවා. එහෙත් මාත් එක් ජනසතු ව්‍යාපාරයක් නිදර්ශනයක් වශයෙන් පෙන්වා දෙන්නට කැමතියි. පසුගිය කාලයේ ඇති කළ ජනසතු ව්‍යාපාර කාබාසිනියා කිරීමට මේ රජය ක්‍රියා කරන බවට උදාහරණයක් වශයෙන් ලංගමය පෙන්වන්නට පුළුවන්. මීට පෙර තිබුණු රජයයන් යටතේ ලංගමයෙන් ලැබුණු ලාභය අවුරුද්දෙන් අවුරුද්ද වැඩි වුණා. මා හිතන හැටියට 1964 අවුරුද්දේදී ලංගමයෙන් රුපියල් 1,90,00,000 ක් ලාභ ලැබුණා. දැන් ඒ ලාභය අවුරුද්දෙන් අවුරුද්ද අඩු වේගන යනවා. එසේ ලාභය අඩු වේගෙන යන්නේ, පාඩු සිදු වේගෙන යන්නේ සම්පූර්ණයෙන්ම මේ රජය ගෙන යන වැරදි ප්‍රතිපත්තිය නිසයි.

නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ වේරහැර වැඩ පොළෙන් දවසකට බස් තුන බැගින් පිට කළ බව තමුන්නාන්සේ දන්නවා ඇති. අද දවසකට එක බසය බැගින්වත් ඒ වැඩ පොළෙන් පිට කෙරෙන්නේ නැහැ. ඇයි, එසේ දවසකට එක බසය බැගින්වත් පිට නොවන්නේ? 1966 ජනවාරි 8 වනි ද සිද්ධිය උඩ මුලින්ම වේරහැර වැඩ පොළේ සේවකයන් 2,000 කගේ පමණ වැඩ තහනම් කළා. දැන් නවතත් ඒ පිරිසෙන් 1,300 ක් පමණ වැඩට ගෙන තිබෙනවා. තවත් 700 ක් පමණ ඉතිරිව ඉන්නවා. මෙතෙක් වැඩට නොගත් ඒ 700 දෙනා දේශපාලන වැඩ කළ හෝ වෘත්තීය සංගම් වැඩ කළ හෝ අය නොවෙයි. සාමාන්‍යයෙන් හොඳට වැඩ දන්න අයයි, මෙතෙක් වැඩට නොගෙන ඉන්නේ. වැඩ අඩුවෙන් දන්න අයත්, වැඩ නොදන්න අයත් නොයෙක් දේශපාලන බලපෑම් උඩ, මන්ත්‍රීවරුන්ගේ ලියුම් උඩ රක්ෂාවට ගෙන තිබෙනවා. එහෙත් වැඩ දන්න අර පිරිස තවම වැඩට අරගෙන නැහැ. සමහර විට ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයට කල්පනා වෙන්නට ඇති, "පරණ බස් අළුත්වැඩියා කරන්නට වුවමනා නැහැ; අපට අළුත් ලේලන්ඩ් බස් ගෙන්වා ගන්නට පුළුවන්" යනුවෙන්. අළුතෙන් ලේලන්ඩ් බස් ගෙන්වීමෙන් කොමිස් ලැබෙන්නේ කාටදැයි මා නම් දන්නේ නැහැ. එහෙත් අවාසනාවකට වගේ ඒකත් කරන්නට බැරි වුණා. විදේශ විනිමය හිඟය නිසා අළුතින් ලේලන්ඩ් බස් ගෙන්නුවෙත් නැහැ. වේරහැර වැඩ පොළෙන් බස් පිට වන්නෙත් නැහැ. ඒ නිසා අද පාරේ දුවන බස් ප්‍රමාණය කොහෙත්ම ප්‍රමාණවත් නැහැ; හොඳටම මදි. ඒ නිසා තමයි, මිනිසුන් ෆුට් බෝඩ්වල පවා නැඟී ගමන් කරන්නේ. ඒ මිස ෆුට් බෝඩ්වල යෑමේ ආශාවෙකින් නොවෙයි. එහෙත් දැන් තමුන්නාන්සේලා ෆුට් බෝඩ් යෑමත් තහනම් කර තිබෙනවා.

ලංගමය දිහා බැලුවාම කාටත් හොඳින් පෙනෙනවා, මේ රජය කටයුතු කරන්නේ ජනසතු ව්‍යාපාර දියුණු කිරීමටද, එහෙම නැත්නම් ඒවා නැති කිරීමටද කියා. එසේ ජනසතු ව්‍යාපාර කාබාසිනියා කිරීමට කටයුතු කරන්නේ ලොකු ප්‍රතිපත්තියක් මත දැයි මා දන්නේ නැහැ. සමහර විට පෞද්ගලික ලාභය නමැති සුළු ප්‍රතිපත්තිය උඩ මෙසේ ක්‍රියා කරනවා වෙන්නට පුළුවනි. එසේ ක්‍රියා කරන්නේ ලොකු ප්‍රතිපත්තියක් උඩද නත්නම් පොඩි ප්‍රතිපත්තියක් උඩද කියා තමුන්නාන්සේලාම කරුණා කර සොයා බලන්න.

ඊළඟට අපි ගනිමු, රක්ෂණ සංස්ථාව. රක්ෂණ සංස්ථාව පිහිටුවීම පසුගිය රජයෙන් කළ ඉතා වැදගත් වැඩක්. එහෙත් අද මොකක්ද සිදු වී තිබෙන්නේ? මා කථා කරන්නේ, මා දන්න දේ ගැන පමණයි. පානදුරේ රක්ෂණ සංස්ථා ශාඛාවක් තිබුණා. එයට වර්ෂයක් පාසා බිස්නස් තොග ගණන් ලැබුණා. එහෙත් අද ඒ රක්ෂණ සංස්ථා ශාඛාව වසා දමා තිබෙනවා. ඒ ශාඛාව වසා දැම්මේ ඇයි? සමහර විට රක්ෂණ සංස්ථාවේ ලාභය වැඩි කර ගැනීමේ අදහසින් වෙන්නට පුළුවනි. පානදුරේ මිනිසුන්ට කොළඹට එන්නට තිබෙන්නේ හැතැප්ම 17 යි. හොරණ හරහා නම් හැතැප්ම 20ක් විතර වෙයි. පානදුරේ රක්ෂණ සංස්ථා ශාඛාව වසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇම්මේ ඒ හැතැප්ම 20 ඇවිත් කොළඹින්ම කර ගන්නට පුළුවන්ය යන අදහසින් වන්නට ඇති. ලාභය ගැන පමණක් කල්පනා කර බැලුවාම නම් එහි යම්කිසි සාධාරණත්වයක් තිබෙනවා. රක්‍ෂණ සංස්ථාව පිහිටුවන්නට කටයුතු කළ හිටපු ඇමතිතුමා—කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංගරත්න මයා.)—දැන් ඉන්නේ විරුද්ධ පාර්ශ්වයේ යි. රක්‍ෂණ සංස්ථාව පිහිටුවීමෙන් එතුමා බලාපොරොත්තු වුණේ, ලාභ ලැබීම විතරක්ම නොවෙයි. කොම්පැණිකාරයන් වර්ෂයක් පාසා පිටරට ගෙන ගිය ලාභය මෙහිම නතර කර ගැනීම ඉතා වැදගත් කටයුත්තක්. එහෙත් රක්‍ෂණ ව්‍යාපාරය තව තවත් දියුණු කිරීමත්, රක්‍ෂණ සංස්ථාව පිහිටුවීමේ එක් පරමාර්ථයක්. ඒ මාර්ගයෙන් ආර්ථික සංවර්ධනයටත් රුකුලක් දීමට අදහස් කළා. ලාභය ගැන පමණක් කල්පනා කර ක්‍රියා කළොත් එවැන්නක් කරන්නට බැහැ. ශාඛාවල් වසා දැම්මා. එය අදූරදර්ශී දෙයක් හැටියට විස්තර කරන්නට ඕනෑ. රක්‍ෂණ සංස්ථාවක් පවත්වාගෙන යන මේ ආණ්ඩුව්ට රක්‍ෂණයෙහි තිබෙන වටිනාකම තේරෙන්නේ නැහැ. එහෙම නැත්නම් තේරෙන්නේ නැති විධියටයි වැඩ කරගෙන යන බව පෙනෙන්නේ. තේරෙන්නේ නැත්තේ අපේ ප්‍රදේශවල තිබෙන වැඩ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරන විට පමණයි. පානදුර රක්‍ෂණ සංස්ථා කාර්යාලයෙන් කෙරෙන වැඩ ප්‍රමාණයෙන් අඩක්වත් අම්බලන්ගොඩ රක්‍ෂණ සංස්ථා කාර්යාලයෙන් කෙරෙන්නේ නැහැ. මේ දෙකම වසා දමන්නට තීරණය කළා. එහෙත් පානදුර ආයතනය වසා දැම්මා. එක්සත් ජාතික පක්‍ෂයේ නියෝජිතයකු විසින් නියෝජනය කරනු ලබන කොට්ඨාශයක් තුළ පිහිටි ආයතනයක් නිසාදෝ, අම්බලන්ගොඩ තිබෙන ආයතනය වසා දමන්නට තීරණය කළත් වසා දැම්මේ නැහැ.

**වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන** (අම්බලංගොඩ)
*(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன—அம்பலாங்கொடை)*
(Dr. M. H. Saddhasena—Ambalangoda)
ඒකත් වසා දැම්මා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
මොනවා ? අම්බලංගොඩ රක්‍ෂණ සංස්ථා කාර්යාලය වසා දැම්මා ?

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddhasena)
වහලා ඇරියා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
ඒකත් වැහුවා. එහෙත් අම්බලංගොඩ මන්ත්‍රීතුමාගේ ඉල්ලීම අනුව නැවත විවෘත කළා. ඒ ගැන මා විරුද්ධ වන්නේ නැහැ. පානදුරයට එක් ප්‍රතිපත්තියකුත් අම්බලංගොඩට තවත් ප්‍රතිපත්තියකුත් මේ ආණ්ඩුව අනුගමනය කිරීම ගැනයි අප විරුද්ධ වන්නේ. කොළඹ සිට පානදුරයටත්, ගාල්ලේ සිට අම්බලංගොඩටත් ඇති දුර ප්‍රමාණය ගැන කල්පනා කරතොත් දෙකම එක සමානයි. ඒ නිසා ජනසතු ව්‍යාපාරයන්ගේ දියුණුවට හේතු වන ආකාරයට එකම ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ඇතැයි අප බලාපොරොත්තු වෙනවා. දේශපාලන වාසිය ගැන කල්පනා කර කටයුතු කිරීමෙන් සමහර විට තමන්ගේ ආසනය රැක ගන්නට පුළුවන්කමක් ලැබෙනවා වෙන්නට පුළුවනි. එහෙත් අපේ යුතුකම විය යුත්තේ එයද ? එවැනි පටු දේශපාලන වාසි තකා ක්‍රියා කරතොත් ජනතාව දියුණු කරන්නටත් රට දියුණු කරන්නටත් කිසිසේත් කවදාවත් පුළුවන්කමක් ඇති වන්නේ නැහැ. ඒ නිසා මේ විධියට පටු දේශපාලන මත උඩ ක්‍රියා නොකරන ලෙස මතක් කරන්නට කැමතියි.

මීට පෙර මේ ගරු සභාවේදී මා ඉදිරිපත් කළ එක්තරා වැදගත් ප්‍රශ්නයක් කෙරෙහි සැලකිල්ල යොමු කරවන්නට සිදු වී තිබෙන්නේ ඊට මේ දක්වාම පිළිතුරක් නොලැබුණු නිසයි. කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාගෙන් මේ ගැන මීට පෙර දෙවතාවක්ම විමසූ නමුත්, අද වන තුරු පිළිතුරක් ලැබුණේ නැහැ. මගේ ප්‍රශ්නය [illegible] විවිධ සේවා සමුපකාර සංගමය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

ගැනයි. හදිසි අවස්ථාව් පිළිබඳ බලතල පාවිච්චි කරමින් ගරු ඇමතිතුමා පානදුරේ විවිධ සේවා සමූපකාර සමිති සංගමයේ කාරක සභාව විසුරුවා හැර එහි බලය රජය අතට ගත්තා. එසේ කළේ මන්දැයි දෙවරක්ම ඇසූ නමුත් තවමත් මට පිළිතුරක් ලැබුණේ නැහැ. පසුව පිළිතුරක් දෙන්නට එතුමා පොරොන්දු වුණා. ඒ නිසා අප ඒ පිළිතුර ඉතා ඕනෑකමින් බලාපොරොත්තු වන බව කියන්නට කැමතියි. අය වැය විවාදය කෙරෙන අවස්ථාවේදී එම ප්‍රශ්නයට පිළිතුරු දෙන්නට එතුමා එකඟ වුණා. හදිසි අවස්ථාව යටතේ ගරු ඇමතිතුමාට ලැබී ඇති බලය පාවිච්චි කර පානදුර විවිධ සේවා සමූපකාර සමිති සංගමයේ කොමිටිය විසුරුවා හැර තමන්ගේ අතට බලය අරගෙන තිබෙන්නේ මන්ද? ඒකයි ප්‍රශ්නය. ඊට පිළිතුරු දෙනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

රක්ෂණ ව්‍යාපාරය කෙරෙහි පමණක් නොව ජනසතු කරන ලද වෙනත් ව්‍යාපාර කෙරෙහිත් මේ ආණ්ඩුව ඒ තරම් සැලකිල්ලක් දක්වන්නේ නැහැ. එය මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියයි. පෞද්ගලික ව්‍යාපාරිකයන් ගැන සෑහෙන සැලකිල්ලක් දැක්වීම මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියයි. මේ ආණ්ඩුව ධනපති පෞද්ගලික ව්‍යාපාරිකයන්ගේ දියුණුවට හේතු වන දේවල් කිරීමට උත්සාහ කර තිබෙන බව අපට පැහැදිලියි.

සංචාරක ව්‍යාපාරය ගැන ගරු රාජ්‍ය ඇමතිතුමා කථා කළා. ලංකාණ්ඩුව විසින් නැත්නම් පළාත් පාලන ආයතන මගින් සෑහෙන ලාභයක් ඇතිව කරගෙන ගිය හෝටල් නැත්නම් රෙස්ට් හවුස් ගණනාවක් තිබුණා. ඒ සියල්ලක්ම තෝරා පෞද්ගලික ආයතනවලට භාර දී තිබෙනවා. ඒ එක් කරුණක් පමණයි.

කිරි මණ්ඩලය ගැනත් දැන් තිබෙන තත්ත්වය ගැන කාටවත් සතුටු වන්නට බැහැ. කාටවත් දැන් කිරි මණ්ඩලයෙන් කෙලින්ම කිරි ගන්නට පුළුවන් කමක් නැහැ. මීට පෙර නම් පාරිභෝගිකයන් කෙලින්ම තමන්ගේ අවශ්‍යතාවන් අනුව කිරි මණ්ඩලයෙන් කිරි ලබාගෙන පාවිච්චි කළා. දැන් එය නවත්වා දමා තිබෙනවා. දැන් "මිඩ්ල්මන්" හෙවත් මැද සිටින්නා මගිනුයි ගන්නට සිදු වී තිබෙන්නේ. කෙලින්ම මණ්ඩලයෙන් ලබා ගන්නට බැහැ.

මීට පෙර ආණ්ඩුව ගෙන ගිය වැඩ පිළිවෙළ මේ ආණ්ඩුව වෙනස් කිරීමයි මෙවැනි තත්ත්වයක් ඇති වීමට හේතුව. කලින් පැවැති ආණ්ඩුව මෙන් නොව මේ ආණ්ඩුව තුළ පෞද්ගලික ව්‍යාපාරිකයා කෙරෙහි විශේෂ ඇල්මක් පවත්නා බව සත්‍යයක්. පෞද්ගලික ව්‍යාපාරිකයාට විශේෂ ධෛර්යයක් දෙනවා. ඔවුන් සංවර්ධනය කරන්නට, ඔවුන් දියුණු කරන්නට මේ ආණ්ඩුව ක්‍රියා කරනවා. දැන් ගුවන් විදුලියෙනුත්, අවමංගල්‍ය කටයුතු භාර ගන්න ජේමන්ඩ් බ්‍රදර්ස්ලා ගැන විශේෂ ප්‍රචාරයක් ගෙන යනවා. එය මේ ආණ්ඩුවේ එක් ප්‍රතිපත්තියක්දැයි දන්නේ නැහැ.

ගරු එම්. ඩී. එච්. ජයවර්ධන
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

පන්ති භේදයෙන් තොරව වළ දමන්නටයි.

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Are you coming to a new point?

ලෙස්ලි ගුණවර්ධන මයා.
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

Yes, Sir.

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please!

The sitting is suspended for half an hour. On resumption the Hon. Deputy Chairman of Committees will take the Chair.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින් අ. භා. 4.30 ට ශ්‍රීමත් රසික් ෆරීඩ් ඕ.බී.ඊ., මැතිතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 4.30 மணிக்கு ஆரம்பமாயிற்று. குழு உப அக்கிராசனர் [ஸ்ரீமான் ரஸிக் பரீத், ஓ.பி.ஈ.] தலைமை தாங்கினார்.*

*Sitting accordingly suspended till 4.30* P.M. *and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [SIR RAZIK FAREED, O.B.E.], *in the Chair.*

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීළඟට මා කථා කරන්නට අදහස් කරන්නේ කෘෂිකර්මය සම්බන්ධවයි. මේ රජය පටන් ගත් මුල් අවස්ථාවේදී රටේ ප්‍රශ්න විසඳීමට බලාපොරොත්තු වුණේ විදේශ ආධාර ලබා ගැනීමෙන්. එහෙත් අවුරුදු දෙකකට පසු විදේශ ආධාර නොලැබෙන බව පෙනී ගිය විට අළුත් ගැළවීමේ මාර්ග දෙකක් මේ රජය මවාගෙන තිබෙනවා. එකක් නම් රාජ්‍ය ඇමතිතුමාගේ සංචාරක ව්‍යාපාරයයි. ඒ ව්‍යාපාරයෙන් මේ රටට ලැබෙන විදේශ විනිමය ප්‍රමාණයට වඩා වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් පිටරටවලට ඇදී යා දෝ යන සැකයක් මා සිත තුළ තිබෙන බව මා කලින් ප්‍රකාශ කළා. මේ රජයේ දෙවැනි ගැළවීමේ මාර්ගය හැටියට තිබෙන්නේ ආහාර වගා කිරීමේ ව්‍යාපාරයයි. ඒ ව්‍යාපාරය කෙරෙහි මුලින්ම මේ රජයේ කල්පනාව යොමු නොවුණේ කුමක් නිසාද යන ප්‍රශ්නයත් මා අසන්නට සතුටුයි.

ආහාර වගා කිරීමේ ව්‍යාපාරය සමහරවිට හොඳ අදහසින්ම කරන එකක් වුණත් ඒ ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට පුළුවන් වේ ද යන සැකයක් මා තුළ තිබෙනවා. මට පසුව කථා කරන්නට සිටින අගලවත්තේ මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) ආහාර වගා කිරීමේ ව්‍යාපාරය පිළිබඳව සෑහෙන විස්තරයක් කිරීමටත්, ඒ දර්ශනයේ තිබෙන වරද පෙන්වා දීමටත් බලාපොරොත්තු වන නිසා ඒ පැත්ත ගැන මා යමක් කියන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ආහාර වගාව දියුණු කිරීමට මේ රජය බලාපොරොත්තු වුයේ කෘෂිකර්මය ගැන යම්කිසි පළපුරුද්දක් තියෙන අපේ රටේ ගොවි ජනයා මාර්ගයෙන් නම් තරමක් දුරටවත් එයින් සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් වේය කියා මා සිතනවා. අපට පෙනෙන්නට තිබෙන සැටියට මේ රජය කෘෂිකර්මය පිළිබඳවත් වැඩි විශ්වාසය තබා ඇත්තේ පෞද්ගලික ධනපතියන් සහ ධනපති ව්‍යාපාර කෙරෙහි පමණයි. මේ දක්වා ආහාර වගාව සඳහා විශේෂ ආධාර දී තිබෙන්නේ ධනපතීන්ට සහ ධනපති කොම්පැනිවලට පමණයි. දැනටත් අක්කර 31,000 ක් ධනපති කොම්පැනිවලට සහ විශාල ධනපතීන්ට දී තිබෙනවා. ආහාර වගා කිරීමට වුවමනා යන්ත්‍රෝපකරණ—විශේෂයෙන්ම ට්‍රැක්ටර්—ගෙන්වීමත් භාර දී තිබෙන්නේ ධනපති කොම්පැනි තුන හතරකට පමණයි. එහෙත් වගාවට ඉතා ප්‍රයෝජනවත් වන ඒ ට්‍රැක්ටර් ඒ ධනපති කොම්පැනි කාරයන්ගෙන් ගොවි ජනතාවට ලබා ගැනීම ඉතාමත් අමාරු බව අපට දැන ගන්නට ලැබී තිබෙනවා. ධනපති කොම්පැනි කාරයන් ඒ ට්‍රැක්ටර් පළමුවෙන්ම සපයන්නේ වතු අයිතිකාරයන්ට බවත්, ඊට පසු පුළුවන්කමක් තිබෙනවා නම් පමණක් ගොවීන්ට ට්‍රැක්ටර් සපයන බවත් අපට දැන ගන්නට ලැබී තිබෙනවා. ගොවි ජනයා මාර්ගයෙන් ආහාර වගා කිරීමට රජය බලාපොරොත්තු වෙනවා නම් ගොවි ජනයාට දෙන ණය මුදල් සඳහා සියයට දොළහක අසාධාරණ පොලියක් ඔවුන්ගෙන් අය කරන්නෙ නැති බවයි, අපේ හැඟීම. එසේ බලාපොරොත්තු වෙනවා නම් අඩු පොලියට ගොවීන්ට ණයට දෙන්නට ඕනෑ. ධනපතීන්ට සියයට පහක පොලියට බැංකුවලින් ණය ගැනීමට පුළුවන්කම තියෙද්දී රජය ගොවියාට දෙන ආධාරයට සියයට දොළහක පොලියක් අය කරනවා නම් ආහාර වගා කිරීමේ කටයුත්ත ගොවියා මාර්ගයෙන් කරන්නට බලාපොරොත්තු වෙනවාය කියා අපට පිළිගන්නට අපහසුයි.

මේ ගැන අපට රජයට දෙස් කියන්ට බැහැ. මේ රජය යම් යම් පන්තීන් නියෝජනය කරනවා. සාමාන්‍යයෙන් එක්සත් ජාතික පක්ෂය ධනපතීන් නියෝජනය කරන පක්ෂයක්. එසේ කීම වැරදි බව මා කියන්නෙ නැහැ. එහෙත් එසේ කීමෙන් පමණක් ඇත්ත හෙළි වන්නෙ නැති බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

කියන්නට ඕනෑ. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන්නේ මොන විධියේ ධනපතීන්ද? ඉන්දියාවේ නම් කාර්මික ධනපතීන් නමින් කොටසක් ඉන්නවා. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ඉන්දියාව පාලනය කරන කාලයේදීත් අධිරාජ්‍යවාදීන් සමග පවා හැප්පෙන්නට සූදානම් වුණු ඉතා බලවත් කාර්මික ධනපති කොටසක් ඉන්දියාවේ සිටියා. ඒ නිසා ඉන්දියානු ජාතික සංගමය වැනි දේශීය සංවිධානවලට ඒ ධනපතීන් පිටුපස්සෙන් සිට ආධාර දුන්නා, අධිරාජ්‍යවාදීන් සමග හැප්පෙන්නට. ඒ නිසා අධිරාජ්‍යවාදීන් සමග හැප්පී, දහස් ගණන් හිරේ වැටී, දහස් ගණන් මරුමුවට පත් වී නිදහස ලබා ගන්නට ඉන්දියාවට පුළුවන් වුණා. අවාසනාවකට මෙන් මේ රටේ ඇති වී තිබෙන්නේ කාර්මික ධනපති පන්තියක් නොවෙයි. සුළු වශයෙන්වත් කාර්මික ධනපති පන්තියක් ඇති වන්නට පටන් ගත්තේ පසුගිය රජය පවතිද්දීයි. විදේශික අධිරාජ්‍යවාදීන්ගේ බඩු මිළයට ගෙන විකුණන හෝ කොමිස් ලබා ගන්නා හෝ එසේ නැත්නම් ඒ අධිරාජ්‍යවාදීන් සමග එකතු වී වතු වවන හෝ ධනපති කොටස් තමයි, ලංකාවේ සිටින්නේ. වෙනත් විධියකට කියනවා නම් ලංකාවේ සිටින ධනපතියන් විදේශික අධිරාජ්‍ය වාදීන්ගේ ඒජන්තවරුනුයි. "කොම්ප්‍රදෝරු" යනුවෙන් පෘතුගීසි වචනයක් තිබෙනවා. ලංකාවේ සිටින ධනපතියන් "කොම්ප්‍රදෝරු ධනපතියන්" වශයෙනුත් හඳුන්වන්නට පුළුවනි.

එක්සත් ජාතික පක්ෂයට නියෝජනය කරන්නට සිදු වී තිබෙන්නේ ඒ විධියේ ධනපතියන් නිසා කර්මාන්ත දියුණු කිරීම සම්බන්ධයෙන් වැඩි උනන්දුවක් නො දැක්වීම පුදුමයක් නොවෙයි. කර්මාන්ත දියුණු කරන්නට වුවමනා නම් අධිරාජ්‍ය වාදීන් සමග හැප්පෙන්නට සිදු වෙනවා. එහෙත් අපේ රටේ ධනපතියන් වැඩ කරන්නේ අධිරාජ්‍යවාදීන් කැමැත්ත දක්වන පිළිවෙළටයි. වෙනත් රටවල කාර්මික ධනපතියන් අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව සටන් කළ කාලයේදී අපේ රටේ සිටි ධන පතියන් අධිරාජ්‍යවාදීන්ට පන්දම් අල්ල මින් ජනතා නියෝජිතයන් වූ සමසමාජ පක්ෂයේ උදවිය හිර ගෙට යැවීම අනුමත කළා. ඒ විධියේ ධනපතියන් ලවා ලංකාවේ කාර්මික දියුණුවක් ඇති කිරීමට බලා පොරොත්තු වෙනවා නම් එය මෝඩ කමක්. මෙසේ කීම ගැන මා වරදවා තේරුම් ගන්නට එපා. කර්මාන්ත පමණක් දියුණු කිරීම විරුද්ධ පාර්ශවයේ අදහස යයිද, හැම දේම ජනසතු කිරීම විරුද්ධ පාර්ශ්වයේ අදහස යයිද කල්පනා කරන්නට එපා. එසේ කල්පනා කරනවා නම් ඒක වැරදියි. සමාජවාදී සැලැස්මක් යටතේ පෞද්ගලික ධනපතියන්ට පවා කිසියම් තැනක් තිබෙනවා. එහෙත් මේ රජයේ අදහස ඒක නොවෙයි. ධනපති සැලැස්මක් තුළ එසේ නැත්නම් ධනපති ව්‍යාපාරයන් රාශියක් අස්සේ සමාජවාදී ව්‍යාපාරවලටත් තැනක් තිබෙනවා යයි මේ රජය කල්පනා කරතත් අපට නම් ඊට එකග වන්නට පුළුවන්කමක් නැහැ. මේ 20 වැනි ශත වර්ෂයේ දෙවැනි භාගයේදී ඒ විධියට දියුණු වන්නට බැහැ.

බඩු මිළ ඉහළ යෑම සහ බඩු හිඟය අද මේ රටේ ඇති වැදගත් ප්‍රශ්නයක්. තමුන් නාන්සේ කොළඹ වැසියකු නිසා කොළඹ නගර සභාවේ හරක් මස් කඩවල හරක් මස් විකුණන මිළ ගණන් දන්නවා ඇති. දැන් පාලන මිළ වැඩි කරන්නට යෙදී තිබෙනවා. කලින් කටු නැති මස් රාත්තලක පාලන මිළ ශත 95 යි. එහෙත් හරක් මස් විකුණන ලද්දේ පාලන මිළට නො වන බව තමුන්නාන්සේ දන්නවා ඇති. හරක් මස් මහජනයාට ගන්නට ලැබුණේ රුපියල් 1.25 ගණනේයි. මස් කඩකාර යන්ගේ උද්ඝෝෂණයක ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් හට සාධාරණයක් ඉටු කළ යුතු බව කියමින් මස් රාත්තලක පාලන මිළ ශත 95 සිට රුපියල් 1.20 දක්වා වැඩි කරන්නට යෙදුණා. එහෙත් මහජනයාට විකුණන මිල 1.20 නොවෙයි; කලින් විකුණූ මිලටත් වඩා සත 15 ක් වැඩි කර 1.40 කර තිබෙනවා. මේ සම් බන්ධව මේ රජය කරන්නට යන්නේ මොකක්ද? මොකුත්ම කරන්නේ නැත කියා මා කල්පනා කරනවා.

අතීතය ගැන කල්පනා කරනවා නම් මස් වෙළඳුන් ගැන මෙන්ම මාළු වෙළෙ ඳුන් ගැනත් කල්පනා කරන්නට ඕනෑ. මාළු මුදලාලිලා ගැන මේ ආණ්ඩුව ක්‍රියා කළේ කොහොමද? 1965 අවුරුද්දේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ නව රජය බලයට එන විට සංස්ථාවෙන් අල්ලන මාළු තොග වෙළෙඳුන් විසින් අඩු මිලට අරගෙන වැඩි මිලට විකුණනවාය කියා ඒ තත්ත්වය වෙනස් කිරීම පිණිස ධීවර සංස්ථාවේ සභාපති හැටියට සිටි සෑම් සිල්වා මහතා හොඳ යෝජනාවක් ගෙනාවා. එනම්, සංස්ථාවේ මාළු සංස්ථාව මගින්ම මහජනයාට විකිණිය යුතුයි; නැත්නම් මාර්කට්වල කඩ බක්කි අරගෙන සිටින සිල්ලර වෙළෙඳුන්ට විකිණිය යුතුයි කියන එකයි ඒ යෝජනාව. එතෙක් කල් කරගෙන ආවේ එහෙම නොවෙයි. කොළඹ සිටිනවා "හෝල් සේල්" මුදලාලිලා හතර පස් දෙනෙක්. සංස්ථාවෙන් අඩු මිලට මාළු විකුණන්නේ ඒ තොග වෙළෙඳුන් හතර පස් දෙනාටයි. ඒ මුදලාලිලාගෙන් තමයි කඩබක්කිවල සිටින සිල්ලර වෙළෙඳුන්ට මාළු ගන්නට පුළුවන් වන්නේ. එතනට යන විට මිල හුඟක් වැඩි වී තිබෙනවා. වැඩි මිලට විකිණීම වැළැක්වීමට සෑම් සිල්වා මහතාගේ යෝජනාව අනුව තොග වෙළෙඳුන් අයින් කර දැමීමේ වැඩ පිළිවෙළක් ආවා. එසේ කර කඩ බක්කිවල විකුණන සිල්ලර වෙළෙඳුන්ට කෙලින්ම සංස්ථාවෙන් මාළු සැපයීමටත් සංස්ථාව මගින් මාළු විකුණන තැන් ඇති කිරීමටත් ඒ යෝජනාවෙන් බලාපොරොත්තු වුණා. ඒ යෝජනාව ඉදිරිපත් වූ විට අර තොග වෙළෙඳුන් කළේ මොකක්ද? විශාල උද්ඝෝෂණයක් ඇති කළා. පත්‍රිකා පවා පිට කළා. ආණ්ඩුවට තර්ජනයකුත් කළා. "අපි තමයි තමුන්නාන්සේලාට ඉලෙක්ෂන් එක දිනවලා දුන්නේ. මෙය ක්‍රියාත්මක කළොත් 1965 දෙසැම්බර් වල පවත්වන කොළඹ නගර සභා මැතිවරණයේදී අපි තමුන්නාන්සේලා පරදවා වමට බලය දෙනවා" කියා මේ රජයට තර්ජනය කළා. ඒ තර්ජනය උඩ රජය පල්ලම් බැස්සා. ඒ අනුව තවමත් මහජනයාට මාළු ලැබෙන්නේ අර තොග වෙළෙන්දන්ගේ මාර්ගයෙන්මයි. මිල අඩු කිරීමට මේ ආණ්ඩුව ක්‍රියා කරාවිය කියා මා විශ්වාස කරන්නේ නැහැ. හැබැයි සුළු වෙළෙන්දන්ට පහර ගසා මිල අඩු කරන්නට පුළුවන් නම් කරාවි. තොග වෙළෙන්දන්ට නම් කවදාවත් පහර ගහන්නේ නැහැ. බඩු මිල බස්සනවාට මේ ආණ්ඩුව විරුද්ධයි කියා මා හිතනවා.

තිඹිරිගස්යායේ සිල්ලරට මාළු වෙළඳාම කරන බණ්ඩා මුදලාලි කියා කෙනෙක් සිටිනවා. තෝර මාළු රාත්තල රුපියල් 2ට විකිණීමේ වරදට ඔහුගේ ලයිසන් එක අවලංගු කර තිබෙනවා. අනික් අය තෝර මාළු රාත්තල රුපියල් 3 ට විකුණන විට මේ මිනිහා ගොස් රුපියල් 2 ට විකුණුවා. හැබැයි ඔය තෝර මාළු රාත්තල අරගෙන තිබෙන්නේ පකිස්තානියෙක්. කෙසේ වෙතත් මහජනයාට රුපියල් 2 ට තෝර මාළු විකිණීමේ වරදට ඒ නැනැත්තාගේ ලයිසන් එක අවලංගු කළා. සුළු මිනිහාට පහර ගසා බඩු මිල අඩු කරන්නට පුළුවන් නම් මේ ආණ්ඩුව එය කරාවි. අවාසනාවකට එහෙම කරන්නට පුළුවන් කමක් නැහැ. බඩු මිල බස්සන්නට නම් පහර ගසන්නට ඕනෑ ලොකු මිනිහාටයි. එය කරන්නට මේ ආණ්ඩුව ලෑහැස්ති නැහැ. මේ ආණ්ඩුව නියෝජනය කරන වැදගත් ධනපති කොටසක් තමයි මේ රටේ තොග වෙළෙන්දෝ. සමහරෙක් සිංහලයෝ. වැඩි කොටස සිංහල නොවෙයි; එක්කෝ විදේශීය, නැත්නම් වරප්‍රසාද ලත් පුරවැසියෝ. එම ප්‍රශ්නය විසඳීම පිණිස පළමුවෙන් කළ යුත්තේ ඉම්පෝටර්ස්ලා මගින් බඩු ගෙන්වීමේ වැඩ පිළිවෙළ නවත්වා රජයේ ආයතනයක් මගින් ඒ බඩු ගෙන්වීමයි. ඊළඟට, අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදීමේ කටයුත්ත තොග වෙළෙන්දන් අතළොස්සකට භාර දෙන්නේ නැතුව තොග වෙළඳාමත් රජය අතට ගත යුතුයි. එසේ ක්‍රියාකොට රජය මගින්ම සිල්ලර වෙළෙන්දන්ට බඩු බෙදා හැරීමේ වැඩ පිළිවෙළක් යෙදිය යුතුයි. එසේ නොකළොත් අසාධාරණ අන්දමට බඩු මිල ඉහළ යාමේ ප්‍රශ්නය විසඳන්නට පුළුවන් වන්නේ නැහැ. එවැනි ක්‍රියා මාර්ගයක් අනුගමනය කිරීමට නම් සමාජවාදය කරා ගමන් කරන රජයක් පවතින්නට ඕනෑ. මෙම ආණ්ඩුවෙන් එය ඉටු වේයැයි මා විශ්වාස කරන්නේ නැහැ.

මට ලැබී ඇති කාල සීමාව දැන් අවසාන වී ගෙන යන නිසා අවසාන වශයෙන් වචන කීපයක් ප්‍රකාශ කර මගේ කථාව සමාප්ත කරන්නට මා කල්පනා කරනවා. මට ප්‍රථමයෙන් කථා කළ පළාත් පාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා අද ඉදිරිපත් කළේ සාමාන්‍යයෙන් එක්සත් ජාතික පක්ෂයේ මහත්මයෙක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

කරන කාලයේ කතාවක් පමණයි. මේ රජයට කරනු ලබන යම් යම් චෝදනාවලට පිළිතුරු දෙනවා වෙනුවට එතුමා කළේ "තමුන්නාන්සේලා හිටපු කාලේ කළේ මෙහෙමය" කියා නොයෙකුත් කරුණු ඉදිරිපත් කිරීමයි. එතුමා ඉදිරිපත් කළ කරුණුවලින් දෙක තුනක් මා සටහන් කරගෙන තිබෙනවා. වර්තමාන රජය කර්මාන්ත පිළිබඳව ක්‍රියා කරන ආකාරය ගැන කරන ලද විවේචනයට එතුමා පිළිතුරු දුන්නේ කෙසේද? මීට අවුරුදු තුන හතරකට ඉහත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව කර්මාන්තවලට ධෛර්ය දෙන විට ඔය පැත්තේ හිටපු ආචාර්ය එන්. එම්. පෙරේරා මහතා එය හැදින්වූයේ කෙසේද? සීනිබෝල කර්මාන්තයක් වශයෙන් අවමාන කරමින් ඒ ප්‍රතිපත්තියේ තිබෙන වරද පෙන්වා දුන්නා නේද? මේ ආදී ප්‍රශ්න එතුමා ඇසුවා. එහෙත් එල්ල කරන ලද චෝදනාවලට උත්තර දීමක් එමගින් සිදු වුණේ නැහැ. රක්ෂා නැතිකමේ ප්‍රශ්නය පිළිබඳව කතා කළේ කෙසේද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද රක්ෂා සඳහා ලියාපදිංචි වූවන් 2,45,000 ක් ඉක්මවා සිටිනවාය කියා මා සිතනවා. මේ රජය බලය ලබා ගන්නා අවස්ථාවේදී ලියාපදිංචි වී සිටියේ 1,60,000 ක් පමණ පිරිසකුයි. රක්ෂා නැතිකම පිළිබඳ ප්‍රශ්නයට පිළිතුරු දුන් එතුමා ඇසුවේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව ඒ වෙනුවෙන් මොනවාද කළේ කියන ප්‍රශ්නයයි. ඒ අන්දමට පිළිතුරු සැපයීමෙන් යම්කිසි ප්‍රශ්නයක් විසඳන්නට පුළුවන් වන්නේ නැහැ. බොහෝ අවස්ථාවලදී රජයට වදින පහරවලින් බේරීම සඳහා විරුද්ධ පාර්ශ්වයට බොරු චෝදනා එල්ල කරනවා. මා ඊට නිදර්ශනයක් දෙන්නම්. රාජාසන කතාව පිළිබඳ විවාදයේදී ගරු අගමැතිතුමා කතා කරමින් සිටියා. අවසාන පිළිතුර දෙන අවස්ථාව වෙන්නට ඕනෑය කියා මා සිතනවා. එතුමා එවේලේ එක්තරා චෝදනාවකට පිළිතුරු දීමට උත්සාහ දැරුවා. වර්තමාන රජය පත්කිරීම් පිළිබඳව, කම්කරුවන් පත්කිරීම් පිළිබඳව, දූෂණ විධියට ක්‍රියා කරනවාය, දේශපාලන වාසිය තකාගෙන, යම් යම් දේශපාලන බලපෑම්වලට අනුව සුදුස්සන්ට ඉඩ නොලැබෙන පරිදි, රක්ෂා දෙනවාය කියන චෝදනාවට එතුමා පිළිතුරු දුන්නේ කෙසේද? ඒක එහෙම නම් එහෙමය කියා හෝ ඒක එහෙම නොවන්නේ නම් එහෙම නොවන්නේය කියා හෝ ප්‍රකාශ කරනවා වෙනුවට කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට (ඉලංගරත්න මයා.) විරුද්ධව චෝදනාවක් කළා. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා පසුගිය ආණ්ඩුව කාලයේ ඇමතිවරයෙකු වශයෙන් සිටියදී කියා තිබෙන්නේ මොනවාද; එතුමා නම් මීටත් වඩා නරක විදියට ක්‍රියා කර තිබෙනවාය; එදා රක්ෂා දෙන විට සුදුසුකමක් හැටියට සැලකුවෙ හිටපු අගමැතිනියට තිබුණු පක්ෂපාතකමය යනුවෙන් ප්‍රකාශ කළා. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා තමා එවැනි දෙයක් කිව්වේ නැති බව. එම ප්‍රකාශය බොරුවක්ය, තමා එසේ කීවේ අධ්‍යක්ෂවරුන් පත් කිරීම සම්බන්ධයෙන්ය, කියා තත්ත්වය පැහැදිලිකර දීමට කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා සූදානම් වූ නමුත් එතුමාට කතා කරන්නට ඉඩ දෙන්නේ නැති බව කී නිසා කරන්නට දෙයක් නැතිකමින් සභාවේ නීතිරීතිවලට අනුව වාඩි වෙන්නට සිදු වුණා. නමුත් පෙරේදා අයවැය විවාදය ආරම්භ කරද්දී ඊට පිළිතුරු වශයෙන් එතුමා කීවේ කුමක්ද? කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා විසින් අගමැතිතුමාගේ ප්‍රකාශයක් උපුටා දක්වමින් මේ විධියට පිළිතුරු දී තිබෙනව:

"'His criterion for choosing people for jobs was—first, loyalty to the Prime Minister; second, loyalty to him; and third, loyalty to the Government.'—[OFFICIAL REPORT, 19th July 1967; Vol. 72, c. 1008.]

එහෙම ප්‍රකාශයක් මා කිසි කලෙක කර නැහැ. මගේ ප්‍රකාශය ඒක නොවෙයි. මගේ ප්‍රකාශයත්, මා ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළත්, කවදා හෝ නැවතත් බලයට ආවොත් ක්‍රියාත්මක කරන දෙයත් මෙන්න මේකයි:

සංයුක්ත මණ්ඩලවල අධ්‍යක්ෂවරුන් පත් කිරීම ගැන මගේ ප්‍රතිපත්තිය: (1) අගමැතිතුමාට පක්ෂපාත කම. (2) ඇමතිවරයාට පක්ෂපාත කම. (3) රජයෙ ප්‍රතිපත්තිය පිළිගැනීම. (4) ආයතනයට පක්ෂපාතකම." [නිල වාර්තාව 1967 අගෝස්තු 2; 73 වන කාණ්ඩය, 183 තීරුව.]

ගරු සභාපතිතුමනි, කොළොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා කරුණු පැහැදිලි කරමින් කියා සිටියා, අගමැතිට පක්ෂපාතකමක් තිබිය යුතු යයි එතුමා සඳහන් කළේ කම්කරුවන් ගැන නොවේය,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අධ්‍යක්ෂවරුන් ගැනය කියා. මෙයින් අගමැතිතුමාගේ ප්‍රකාශය බොරු වෙනවා. එහෙත් මේ කාරණය එකම ධනපති දිනපතා ප්‍රවෘත්ති පත්‍රයකවත් පළ කර තිබුණෙ නැහැ. එසේ කළා නම් අගමැතිතුමා බොරුකාරයකු වන නිසයි. තමන් ආධාර කරන, තමන් පක්ෂපාතව සිටින දේශපාලන පක්ෂයේ අගමැතිතුමා බොරුකාරයකු කරන විධියේ ප්‍රවෘත්තියක් පළ කරන්න ධනපති පත්‍ර සූදානම් නැහැ, ඒ ප්‍රවෘත්තිය කොතරම් ඇත්ත වුණත්. අද මා කියන මේ කියමනත් හෙට පත්‍රවල පළ වෙයි කියා මා විශ්වාස කරන්නෙ නැහැ. ඒ විධියේ තත්ත්වයක් තමයි රටේ තිබෙන්නෙ. මම ධනපති පත්‍ර 7 ක් විතර කියෙව්ව. ඒ එකකවත් තිබුණෙ නැහැ. ධනපති පත්‍ර හුඟක් තිබෙනව. සමහරවිට එකක තිබුණා දැයි මා දන්නෙ නැහැ. මම අභියෝග කරනව, පළ කරන්න කියා. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා නොකළ ප්‍රකාශයක් කළාය කීමෙන් කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට කර තිබෙන්නෙ වරදක්. තමන්ගේ ආණ්ඩුවෙන් කෙරෙන වැරදි වසා ගන්ට, අපේ ප්‍රතිපත්තිය එහෙම නම් තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය ඊටත් වඩා නරක යයි පෙන්වා දෙන්න, ගරු අගමැතිතුමා කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා විසින් නොකරන ලද ප්‍රකාශයක් එතුමා කළා යයි ඉදිරිපත් කළා. අගමැතිතුමා කොලොන්නාවේ මන්ත්‍රීවරයාට කළ ඒ චෝදනාව වැරදියි. වැරදි බව ඔප්පු කිරීමෙන් පසුවත් ඒ ප්‍රවෘත්තිය පත්‍රවල පළ කෙළේ නැහැ.

කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාට එතරම් විරුද්ධත්වයක් තිබීම ගැන මා පුදුම වන්නෙ නැහැ. තෙල් ජනසතුව, රක්ෂණ සමාගම් ජනසතු කිරීම, ආදි ප්‍රගතිශීලී වැඩවලින් අධිරාජ්‍යවාදීන්ගේත් ලොකු ධනපතියන්ගේත් කෝපයට ලක් වූ ඇමතිවරයෙක් පසුගිය රජයේ හිටපු ඇමතිවරුන් අතර සිටිය නම් ඒ කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා බව මා ප්‍රකාශ කරනව. ඒ නිසා තමයි, ධනපති බලවේගයන් සියල්ලම එකතු වී එතුමා නියෝජනය කළ ආසනයෙන් පරදවන්ට ක්‍රියා කළේ. අද වුණත් ඒ මන්ත්‍රීතුමාගෙන් පලි ගන්ට අදහස් කරන්නෙ ඒ නිසයි. ඒ විශාල ධනපති කොම්පැණිකාරයින් නියෝජනය කරන අපේ අගමැතිතුමා කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා පිළිබඳව කරන ලද වැරදි ප්‍රකාශය ගැන මගේ කනගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනව. එය නිවැරදි කිරීමට දිනපතා පත්‍ර අදවත් ඉදිරිපත් වෙනවා ඇති කියා මා විශ්වාස කරනව.

අ. භා. 4.53

**පී. බී. ඒ. වීරකෝන් මයා.** (වත්තේගම)
*(திரு. பீ. பி. ஏ. வீரக்கோன்—வத்தேகம)*
(Mr. P. B. A. Weerakoon—Wattegama)

ගරු සභාපතිතුමනි, පානදුරේ ගරු මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) ප්‍රකාශ කළා, එතුමා කුකුළන් ඇති කිරීමේ ව්‍යාපාරයේ යෙදී සිටියාය, ඊට ආධාර දුන්නාය කියා. මමත් කුකුළන් ඇති කිරීමේ ව්‍යාපාරයේ යෙදී සිටිය බව මතක් කරන්ට කැමතියි. පෞද්ගලිකව මමත් ඒ ව්‍යාපාරයෙන් පාඩු වින්දා. එසේ සිදු වුණේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව නිසා යයි කියන්ට බැහැ. වෙළඳපොළේ බඩුවල මිළ ඉහල ගියා. 1959 රුපියල් 100 කට ලබා ගත් කුකුල් කෑම සඳහා 1965 පමණ වන විට රුපියල් 200 ක් තරම ගෙවන්න සිද්ධ වුණා. එමෙන්ම බිත්තරවල මිළ බහින්න පටන් ගත්ත. මට රුපියල් 7,000 ක් තරම පාඩු විඳින්න සිද්ධ වුණා. ඊට හේතු වුණේ අපට විදේශ වෙළෙඳපොළ පාලනය කරන්ට බලයක් නැති නිසයි. මම මේ ආණ්ඩුවට වත් කලින් තිබුණු ආණ්ඩුවටවත් ඒ ගැන දොස් කියන්නෙ නැහැ. මේකට තිබෙන එකම ප්‍රතිකාරය නම් පුළුවන් තරම් කුකුළු කෑම මේ රටේම නිෂ්පාදනය කිරීමයි. අපේ කෘෂිකර්ම ඇමතිතුමා ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන දැන් වියළි කලාපයේ මයියංගනය ආදී බොහෝ ප්‍රදේශවල තිරිඟු විශාල ලෙස වවාගෙන යනවා. කුකුළන් සඳහා වුවමනා කරන බෙහෙත් වර්ගවලත් මිළ වැඩි වුණා. රුපියල් 5 ට ගන්නට පුළුවන්ව තිබුණු බෙහෙත් බෝතලය රුපියල් 20, 25 දක්වා මිළ නැංගා. එයිනුත් ජනතාවට විශාල පහරක් වැදුණා.

එක් එක්කෙනාගේ ආදායම පහළ බැස්සායයි පානදුරේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. එය පුදුමයක් නොවෙයි. ලෝක වෙළඳ පොළෙහි අපේ බඩු විකුණා ගන්නට බැරිව ගියා. අපේ තේ මිල බැස්සා, පොල් මිල බැස්සා, රබර් මිලත් දැන් බැහැගෙන යනවා. ඒ නිසා අපේ ජාතික ආදායම විකෙන් වික අඩු වුණා. මීට ප්‍රතිකාරයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරකෝන් මයා.]

වශයෙන් තමයි අපට වුවමනා කරන ආහාර ද්‍රව්‍යත් වෙනත් දේවලුත් මේ රටේම නිපදවා ගන්නට මේ ආණ්ඩුව උත්සාහයක් ගන්නේ. ඒ මඟින් පිටරට යන මුදල් ඉතිරි කර ගත්තොත් ඒවා අපේ සෞඛ්‍ය, අධ්‍යාපන, මංමාවත් ආදී කටයුතුවලට වැඩි වැඩියෙන් යොදවන්නට පුළුවන් වෙනවා. ඒ විධියේ සැලැස්මක් ඇතිවයි අපේ අගමැතිතුමා දැන් වැඩ කරගෙන යන්නේ. මේ වැඩ සැලැස්ම ධනපතියන්ට පමණක් සීමා කර තිබෙනවායයි පානදුරේ ගරු මන්ත්‍රීතුමා කිව්වා. එය එහෙම නොවෙයි. මේ ව්‍යාපාරයේ කොටස් දෙකක් තිබෙනවා. ධනපති කොම්පැනි කාරයින්ට විශාල ලෙස ගොවිතැන් කිරීම සඳහා ඉඩම් දීම එයින් එක කොටසක්. මේ පිළිබඳව, අපේ කල්පනාවට භාජන කළ යුතු වැදගත් ලිපියක් අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) පත්‍රයකටත් ලියා තිබෙනු මා දක්කා. මෙයින් අප බලාපොරොත්තු වන්නේ මේ හදිසි ප්‍රස්තාවට අපට වුවමනා කරන ද්‍රව්‍ය හැකි තාක් ඉක්මනිනුත් විශාල වශයෙනුත් නිෂ්පාදනය කර ගැනීමයි. ඒ අන්දමට විශාල වශයෙන් හදිසියෙන් නිෂ්පාදන කටයුතු ආරම්භ කරන්නට අපේ දුප්පත් ගොවීන්ට පුළුවන් කමක් නැහැ. විශාල වශයෙන් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට මුදල් ඕනෑ කරනවා; ට්‍රැක්ටර් ආදී යන්ත්‍ර වුවමනා කරනවා; ඒවාට අවශ්‍ය කාර්මිකයින් වුවමනා කරනවා. එම නිසා, හදිසියෙන් මේ කටයුතු කරන්නට පුළුවන් වන්නේ මුදල් හදල් වාගේම පළපුරුදුකම්ද ඇති අයටයි. මේ ව්‍යාපාරය නිසා අපේ ආහාර ද්‍රව්‍ය සුලභ වුණොත් අපේ ජීවන වියදම ඉක්මනින් පහළ බහිනවා.

එක් අතකින් අප මේ ව්‍යාපාරය ගෙන යන ගමන්ම අනෙක් පැත්තෙන් ගමේ දුප්පත් ගොවියාට විශේෂ තැනක් ලබා දීමටත් මේ ආණ්ඩුව කටයුතු කරගෙන යනවා. මෙතෙක් කල් අපේ ගොවියාට ඔවුන්ගේ ගොවිතැන් කටයුතු කර ගැනීමේදී නොයෙක් අමාරුකම්වලට මුහුණ පාන්නට සිදුවී තිබුණා. ඊට හේතුව, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, සමුපකාර දෙපාර්තමේන්තුව ආදී ආයතන වෙන් වෙන් වශයෙන් කිසිම ඒකාබද්ධ වැඩ පිළිවෙළක් නැතිව කටයුතු කරගෙන යාමයි. එයින් ගොවීන්ගේ වැඩට විශාල වශයෙන් බාධා ඇති වුණා. එහෙත් අපේ අගමැතිතුමා දැන් ඒ තත්ත්වය වෙනස් කොට ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් අනුව වැඩ කරගෙන යාමට ඒජන්තවරුන් පවා පත් කර සිටිනවා. මේ ආණ්ඩුව බලයට පත් වුණු දවස්වලදී අපේ ප්‍රදේශයේ කෘෂිකර්ම කටයුතු වගයක් සඳහා මා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් උදලුත් ආධාර මුදලකුත් ඉල්ලා සිටි අවස්ථාවේදී ඒවා දෙන්නට බැරියයි කී සැටි මට මතකයි. අයවැය ලේඛනයෙන් ඒ සඳහා මුදල් වෙන් කර නැත කියනවා. එහෙත් පසුගිය අයවැය ලේඛනයෙන් අප ඒ කටයුතු සඳහා සෑහෙන මුදල් ප්‍රමාණයක් වෙන් කළා. එමගින් ගොවීන්ට පොහොර ගන්නට, බිත්තර වී ගන්නට, කුඹුරු හාන්නට ආධාර දුන්නා. ගොවියාට ආධාර දුන්නෙ නැත කියන්නට බැහැ. ගොවීන්ට ආධාර දෙනවා. එපමණක් නොවෙයි. නිලධාරි මහත්වරු ගමින් ගමට යනවා. නොයෙකුත් සංවිධාන ඇති කරනවා. ආදර්ශ ගොවි පොළවල් ඇති කරනවා. ගොවිතැනට සමර්ථ ගොවි මහත්වරුන්ට තව තවත් කරුණු කියා දෙනවා.

ඒ වාගේම අප "එක්ස්ටෙන්සිව් කල්ටිවේෂන්" එක තවත් දියුණු කරන්නට බලාපොරොත්තු වෙනවා. ක්‍රම දෙකක් තිබෙනවා. සමහර ස්ථානවල වපසරිය වැඩි කරගත යුතුයි. සමහර ස්ථානවල කුඹුරු වැඩි කර ගන්නට බැහැ; අස්වැන්න වැඩි කරගත යුතුයි. අස්වැන්න වැඩි කර ගන්නට නම් පොහොර දමන්නට ඕනෑ. අනෙක් රටවල කරන විධියට නවීන විද්‍යානුකූලව රසායනික පොහොර ඈම්මාදියෙන් මේ කටයුතු කරන්නට ඕනෑ. ඒ අන්දමට මේ රටේ ගොවිතැන දියුණු කරන්නට අප බලාපොරොත්තු වෙනවා.

කලක් යන විට ගොවියාට පහරක් වදින්නට පුළුවන්ය කියා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කර තිබුණා. මා එය පිළිගන්නවා. එහෙත් එය වැළැක්වීමට මිළ පාලනයක් ඇති කළ යුතුයි. මිළ පාලනයක් ඇති කළොත් අර කොම්පැනිකාරයින්ගේ නිෂ්පාදනය නිසා ගොවියාට පහරක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වදින්නෙ නැහැ. දැන් වී වලට ආණ්ඩුව සහතික මිළක් දී තිබෙනවා. ඒ ආකාරයට අනෙකුත් කෘෂි ද්‍රව්‍යවලටත් සහතික මිළක් ඇති කළ යුතුයි. ඒ වාගේ'ම මේ කුඹුරු ඉඩකඩම් යම් දිනකදී ගොවීන්ට බෙදා දීම වත් ක්‍රමයක් ඇති කළ යුතුයි. මේ කුඹුරු හා ඉඩකඩම් සදාකාලයටම පෞද්ගලික කොම්පැනිවලට භාර දෙන්නට බැහැ. එය ගම්බද ජනතාවට කරන වරදක්. යටියන් තොට ගරු මන්ත්‍රීතුමාගේ අදහස හරි. සදාකාලයටම මේ ඉඩම් කොම්පැනිකාර යින් අත තිබෙන්නට ඉඩ හැරීම ගොවීන්ට කරන වරදක්. දැන් පවතින අමාරු තත්ත් වයෙන් ගොඩ ආ විගසම මේ ඉඩකඩම් ගොවීන්ට පවරා දෙන ක්‍රමයක් මේ ආණ් ඩුව මගින් හෝ තමුන්නාන්සේලා බලයට පත් වුණොත් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවකින් හෝ ඇති කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උපාධිධර යන් පන්දහසක් පමණ අද රක්ෂා නැති ව සිටිනවාය කියා කෝට්ටේ ගරු මන්ත්‍රී තුමා කියන්නට යෙදුණා. තව අවුරුදු දෙක තුනක් ගත වන විට මේ ගණන තවත් වැඩි වෙනවා. මේ අය පිළිබඳව අප සැලැස්මක් ඇති කළ යුතුයි. මේ අයගේ ශ්‍රමය ලබා ගත යුතුයි.

ධනය නිෂ්පාදනය වන ආකාරයට අපේ අධ්‍යාපන ක්‍රමය සකස් විය යුතුයි. පළමු වෙන්ම මේ රටේ ධනය නිෂ්පාදනය කළ හැකි වන්නේ කෘෂිකර්මයෙනුයි; ඊළඟට, කෘෂිකර්මයට සම්බන්ධ, මේ රටෙන්ම ලබා ගත හැකි අමු ද්‍රව්‍ය පාවිච්චි කළ හැකි කර් මාන්තවලිනුයි. එවැනි කර්මාන්ත ශාලා මේ රටේ පිහිටුවිය යුතුයි. පසුගිය රජය කර් මාන්ත රාශියක් පටන් ගත්තා. අප එය නැත කියන්නෙ නැහැ. ඒ කර්මාන්ත මේ රජයෙනුත් කරගෙන යනවා. මුලදී ඒ කර් මාන්තවලින් පාඩු වෙන්නට පුළුවනි. එහෙත් කලක් ගත වන විට ලාභ ගන් නට පුළුවන් වේවි. ඒ කර්මාන්ත ශාලා මගින් රටට වුවමනා කරන බඩු මෙහිම නිෂ්පාදනය කර ගන්නට පුළුවන් වෙන වා. ඒ සමගම මේ කර්මාන්ත ශාලාවලින් නිෂ්පාදනය කරන බඩුවල මිළ පාලනයක් ඇති කළ යුතු බව මා මතක් කරනවා. මිළ පාලනයක් ඇති නොකළහොත් නිෂ්පාදක යින් අයුතු ලාභ ගන්නවා. ඒ කාරණය සම්බන්ධව කැබිනට් මණ්ඩලය තීරණ යක් ගෙන තිබෙන බව පත්‍රවල පළ වුණා. Quality and a fixed price—quality must be improved. ඔය දෙකම ඇති කළ යුතුයි. දැන් මේ රටේ හදන විදුලි බල්බ්ස් ගැන, රේසර් බ්ලේඩ්ස් ගැන, බලන්න. මේ කිසිවක් එක තත්ත්වයකින් නැහැ. පිටරටින් ගෙනෙන තත්ත්වයට නැහැ. මේ නිෂ්පා දනවල තත්ත්වය උසස් කරන්නට ඕනෑ. යම් කර්මාන්තයක් ආරම්භ කළ විගසින් ම එය කරන්නට බැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා නැවත වරක් අධ්‍යාපනය ගැන වචන ස්වල්ප යක් කථා කරන්නට අදහස් කරනවා. ඒ කාලයේ නිදහස් අධ්‍යාපනය ඇති කළා. එහෙත්—මා මේ කාටවත් චෝදනාවක් කරනවා නොවෙයි—එදා සිටි අය මේ රටේ ධනය වැඩි කරන ක්‍රමයට අපේ රටේ දරු වන්ගේ ඥානයත් ශ්‍රමයත් ලබා ගැනීම ගැන කල්පනා කළේ නැහැ. එම නිසා අද හුඟ දෙනෙක් අනාථ වී සිටිනවා. එහෙත් අද අපට වුවමනා කරන කර්මාන්ත ශාලා, කාර්මික විද්‍යාල, කාර්මික ගුරුවරුන්, විද්‍යා ගුරුවරුන්, වෙනත් විශේෂඥ ගුරුවරුන් නැහැ. ගරු අධ්‍යාපන ඇමතිතුමා කියා තිබෙනවා, පාඨශාලාවලට පත් කිරීම සඳහා විද්‍යා ගුරුවරුන් 200 ක් පමණ වුවමනා කර තිබෙනවාය කියා. අවශ්‍ය ඒ විද්‍යා ගුරුවරුන් නැහැ. වැඩියක්ම සිංහල මාධ්‍ය යෙන් විද්‍යාව උගන්වන ගුරුවරුන් නැහැ. අවශ්‍ය විද්‍යා ගුරුවරුන් 200 න් දැනට පත් කර තිබෙන්නේ 5 දෙනකු පමණයි. මෙතෙක් ඉතිරි ගුරුවරුන් පත් කර නැහැ. එහෙම නම් මේ පිළිබඳව අප කාටද චෝදනා කළ යුත්තේ. යම්කිසි සැලැස් මක් ඇතිව මීට කලින් වැඩ කළා නම් මේ වන විට වුවමනා කරන ගුරුවරුන් බිහි වන්නට ඉඩ තිබුණා. එහෙත් අවශ්‍ය ගුරු වරුන් ඇති වන්නටත් කලින් සිංහල මාධ්‍යයෙන් උගන්වන්නට ගියා. සිංහල මාධ්‍යයෙන් විද්‍යාව ඉගැන්වීම අරඹන්නට කලින් ඒ සඳහා ගුරුවරුනුත්, අවශ්‍ය විද්‍යාගාරත්—" apparatus " තිබුණාට මදි, සම්පූර්ණ විද්‍යාගාර—සපයා ගන්නට ඕනෑ. අද අංග සම්පූර්ණ විද්‍යාගාර තිබේ න්නේ බොහොම ස්වල්පයයි. මෙතෙක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරකෝන් මයා.]

කල් විද්‍යාව ඉගැන්නුවේ ඉංග්‍රීසි මාධ්‍යයෙනුයි. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වූ ඒ ගුරුවරුන්ම තමයි, දැන් සිංහල මාධ්‍යයෙන් උගන්වන්නට යන්නේත්. ඒ නිසා ඒ අයට මනා පුහුණුවක් දෙන්නට ඕනෑ. මේ හැම එකක් පිළිබඳව කල්පනා කර කට යුතු නොකළ නිසා අද අප මේ තත්ත්වයට මුහුණ පා තිබෙන බව අප කවුරුත් පිළිගත යුතුයි.

මා ගරු අධ්‍යාපන ඇමතිතුමාට චෝදනා කරනවා නොවෙයි. එතුමා බොහොම මහන්සි ගන්නවා අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් කරන්නට. රජයට අවුරුද්දකට ලැබෙන සම්පූර්ණ ආදායමම ඒ සඳහා යෙදුවත් ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය කරන්නට අමාරුයි. ඒ සඳහා එතුමා හෙමින් ගමන් කරන්නට ඕනෑ. අධ්‍යාපන විශේෂඥයන්ගේ ආධාරය හා අනුමැතිය ඇතිව, වුවමනා තැන්වල විද්‍යාගාර ඇති කරමින් කටයුතු කළොත් පමණයි, නියම විධියට අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් කරන්නට පුළුවන්කම ලැබෙන්නේ. ගිය සතියේ විද්‍යා ප්‍රතිඵල පිට වුණා. එයින් පැහැදිළිවම පෙනුණා, සාමාන්‍ය ගම්බද පාඨශාලාවල ළමයින් සමත් වී ඇත්තේ එක්කෙනා දෙන්නා බැගින් බව. එහෙත් එක නගරයක මධ්‍යස්ථානයක් ඇති කර, අවට ගම් සියල්ලේම ළමයින් ඒ මධ්‍යස්ථානයට එක් කර, අංග සම්පූර්ණ විද්‍යාගාර ඇති කර කටයුතු කළොත් මීට වඩා උසස් ප්‍රතිඵල ලබන්නට පුළුවනි. පාසල් කීපයකට විද්‍යා ගුරුවරුන් එක්කෙනා බැගින් පත් කරනවාට වඩා එක මධ්‍යස්ථානයකට ගුරුවරුන් රාශියක් එක් කර ඉගැන්වීමට සැලැස්වීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් බවයි, මගේ හැඟීම. මගේ කල්පනාවේ හැටියට, විශ්ව විද්‍යාලවල ආධාරයත් ඇතිව ඒ අයගේ පාලනය යටතේ මේ වැඩ කරන්නට පුළුවන්. එසේ කළොත් විශේෂයෙන් උඩරට ප්‍රදේශවල විද්‍යාගාර හිඟයත්, විද්‍යා ගුරු හිඟයත් මඟ හරවාගෙන කටයුතු කරන්නට පුළුවන්කම ලැබෙනවා. එසේ නැතිව එක එක පාසලට එක එක පොඩි විද්‍යාගාර ඇති කිරීමෙන් ප්‍රයෝජනයක් නොවන බව මතක් කරන්නට කැමතියි.

මා කල්පනා කරන හැටියට, බස්නාහිර පළාත පමණයි අධ්‍යාපනය අතින් දියුණු වෙලා යන්නේ. මධ්‍යම පළාත බලන්න; උතුරු මැද පළාත බලන්න; ඌව පළාත බලන්න. අනෙක් හැම ප්‍රදේශයකම වාගේ අධ්‍යාපනය ඉතා නොදියුණු තත්ත්වයකයි පවතින්නේ. මා හිතන හැටියට ගරු අධ්‍යාපන ඇමතිතුමා වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා, ඉංජිනේරු විද්‍යාව වැනි විද්‍යා විෂයයන්, ගණිත විෂයයන් උගන්වන්නට පුළුවන් ගුරුවරුන් ඇති කිරීමට. ලංකාවේ හැම ප්‍රදේශයකම ඉන්නා අයට එක සමාන අධ්‍යාපනයක් දෙනවා නම්, ගම්බද ප්‍රදේශවල ළමයින්ට දැනට ලැබෙන අධ්‍යාපනය ප්‍රමාණවත් නැති බව මා මතක් කරන්ට කැමතියි. කාටත් සමාන අධ්‍යාපනයක් ලැබෙන ආකාරයට කටයුතු කිරීම බොහොම අමාරු වැඩක්. එහෙත් මා ඉල්ලා සිටිනවා, කඳුකර නොදියුණු ප්‍රදේශවල ඉන්නා අය ගැන මීට වඩා සැලකිල්ලක් දක්වන හැටියට.

ගුරු වැටුප්වල නොයෙක් විෂමතා තිබෙනවා. ඒවා ගැන සොයන්නට කමිටුවක් පත් කර තිබෙනවා. ඒ ගැන මේ ආණ්ඩුවට අප ස්තුතිවන්ත වෙනවා. භාෂා භේදයෙන් තොරව ගුරු වැටුප් පරිමාණයන් සකස් කරන්නට ඕනෑ. ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමයත් රජයේ වෙනත් සේවකයන් කෙරෙහි බල පාන විශ්‍රාම වැටුප් ක්‍රමය අනුවම සකස් විය යුතුයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

බොහොම හරි.

**වීරකෝන් මයා.**
*(திரு. வீரக்கோன்)*
(Mr. Weerakoon)

ඒ පැත්තෙත් මේ පැත්තෙත් ඇත්තන් ඔක්කොම එකතු වෙලා මේ රටේ ගුරුවරුන්ගේ තත්ත්වය දියුණු නොකළොත් අපේ අනාගතයේ දියුණුවක් ඇති කරන්නට බැහැ. අපේ දරුවන් තමයි අපේ ලොකුම වස්තුව. ඒ නිසා ඒ අය ආරක්ෂා වන විධියට වැඩ කළ යුතුයි. වැඩි වැඩියෙන් ගුරුවරුන් ගැන සැලකිල්ල දැක්විය යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

අධ්‍යාපන ඇමතිකම දෙන්නට ඕනෑ වත්තේගම මන්ත්‍රීතුමාටයි.

**වීරකෝන් මයා.**
*(திரு. வீரக்கோன்)*
(Mr. Weerakoon)

මාතර ගරු මන්ත්‍රීතුමා බාධා නොකර සිටියොත් මට මගේ කථාව කරගෙන යන්නට පුළුවන් වේවි. ගුරුවරයා පහත් තැනෙක තබා ගෝලයා දියුණු කරන්නට බැහැ. ගෝලයාගේ තත්ත්වය උස්සන්නට වුවමනා නම් ගුරුවරයා උසස් තැන සිටින්නට ඕනෑ. රුපියල් සියයේ මාසික දීමනාවක් ගෙවා යම්කිසි පිරිසකගෙන් ගුරුවරුන්ගෙන් ගන්න වැඩ කරවා ගන්නට ගියොත් එයින් කෙරෙන්නේ ලොකු මෝඩකමක් බව මතක් කරන්නට ඕනෑ. රුපියල් සියයක් පමණක් ගෙවීමේ ක්‍රමය පුළුවන් තරම් ඉක්මනින් නැති කරන්නට ඕනෑ. මේ තත්ත්වය තව දුරටත් තිබීමට ඉඩ හැරීම මුළු ගුරු සංහතියටම කරන අවැඩක්. ගුරු සේවයට පවා එය ලොකු ලජ්ජාවක්. ගරු මුදල් ඇමතිතුමා සඳහන් කළ රුපියල් විස්සේ දීමනාව ලැබීමට මේ ශිෂ්‍ය ගුරුවරුනුත් සුදුසු වනු ඇතැයි මා විශ්වාස කරනවා.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

ඒ අයටත් ලැබෙනවා.

**වීරකෝන් මයා.**
*(திரு. வீரக்கோன்)*
(Mr. Weerakoon)

එහෙම නම් හොඳයි. ගුරු භවතුන් වෙනුවෙන් ගෙවනු ලබන ගමන් ගාස්තුවත් මදි. ගුරුවරුන් බොහෝ දෙනකු මාරු කරන්නේ දුෂ්කර ප්‍රදේශවලටයි. ඇතැම් ප්‍රදේශවල ගමන් පහසුව ඇත්තේම නැහැ. සමහර උදවියට බස් සේවාවන් නැති ප්‍රදේශවල හැතැප්ම දහය පහළොව ආදී වශයෙන් විශාල දුර ප්‍රමාණයන් පයින් යන්නට සිදු වෙනවා. නිවාස පහසුකම් නැති ප්‍රදේශ බොහොමයක් තිබෙනවා. ගුරු නිවාස ඇති කළ යුත්තේ විශේෂයෙන්ම නිවාස පහසුකම් නැති ප්‍රදේශවලයි.

උඩරට ප්‍රදේශවල ජනතාවට ඉගෙනීමේ පහසුකම් අඩු තැන් හුඟක් තිබෙනවා. උඩරට ප්‍රදේශ ගැන මා සඳහන් කරන්නේ ජාති භේදයක් හෝ කුල භේදයක් හෝ ඇතිව නොවෙයි. මහනුවර ගැන පමණක් නොවෙයි මා කථා කරන්නේ. ඒ අවට ප්‍රදේශ ගැනත් එක්කයි මා කරුණු ඉදිරිපත් කරන්නේ. පහසුකම් අඩු නිසා ඒ ප්‍රදේශවල ඉන්න අයට නියම ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. ගුරුවරුනුත්, ගුරු නිවාසත්, ඉස්කෝලත්, උපකරණත්, යන මේ සියල්ලක්ම ඒ ප්‍රදේශවලටත් ඉතාමත් අවශ්‍ය බව ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට මතක් කරන්නට කැමතියි. මා කථා කරන්නේ මැතිවරණ ආසන ගැන සලකා නොවෙයි. මහනුවරට පමණක් නොව බදුල්ලටත් අනුරාධපුරයටත් කුරුණෑගලටත්—ඒ කියන්නේ මධ්‍යම පළාතට පමණක් නොව ඌව පළාතටත්, උතුරු-මධ්‍යම පළාතටත්, වයඹ පළාතටත්—ගුරු හිඟය මෙන්ම වෙනත් අඩුපාඩුකම් බෙහෙවින් බල පානවා. නොදියුණු ප්‍රදේශ වශයෙන් සැලකෙන ප්‍රදේශ දියුණු නොකර එකම ප්‍රදේශයක් පමණක් දියුණු කළාට එයින් සිංහල ජාතිය දියුණු වන්නේ නැහැ. තමන්ගේ රට, තමන්ගේ ජාතිය වෙනුවෙන් දිවි පිදූ වීර පුද්ගලයන් වාසය කළ ප්‍රදේශවල දියුණුව ගැන මේ ආණ්ඩුවත් අනෙක් ගරු මන්ත්‍රීනුත් කල්පනා කළ යුතුයි.

ආණ්ඩුවේ ඉස්කෝල මෙන්ම එයින් පිටස්තර ඉස්කෝලත් තිබෙනවා. සමහර පාඨශාලා ගාස්තුවක් අය කරනවා. ඇතැම් පාඨශාලා ගාස්තුවක් අය කරන්නේ නැහැ. රජයට ඉස්කෝල ගන්න කාලයේදී පිටස්තර පාඨශාලා වශයෙන් පවත්වාගෙන යාමට නීතියෙන් ඉඩ දී තිබෙන පාඨශාලා තිබෙනවා නම් ඒවායේත් දියුණුව ගැන කල්පනා කිරීම රජයේ යුතුකමක් ලෙස කල්පනා කරන්නට ඕනෑ. රටේ දරුවන්ගේ දියුණුව ගැන කල්පනා කරන ආණ්ඩුවකින් එය ඉටු වෙන්නට ඕනෑ. ආණ්ඩුවේ පාඨශාලාවලට වරින් වර අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නැත්නම් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් පාඨමාලා ආදිය සම්බන්ධයෙන් චක්‍ර ලේඛන යවනවා. ඒවා යවන්නේ ආණ්ඩුවේ ඉසකෝලවලට පමණයි. ඇයි එවා අනෙක් පාසල්වලට නොයවන්නේ.? විරුද්ධ පාර්ශ්වයේ තමුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරකෝන් මයා.]

නාත්සේලා බලයේ ඉන්න කාලයේ ඒවා වත් නීතියෙන් ඉඩ දුන්නේ නැද්ද? ඒවා නීතියෙන් පිළිගත්තේ නැද්ද? පිළිගත්තා නම් ඒ අයට කුඩම්මාගේ සැලකිල්ල දැක්විය යුතු නැත කියා කල්පනා කළ යුතුයි. ඒ අයත් මේ රටේ පුරවැසියන්. ඒ නිසා අනික් අයට යම් පහසුකමක් දෙනවා නම් ඒ අයටත්, ඒ අයගේ දරුවන්ටත් ඒ පහසුකම් දිය යුතුයි. එසේ කරන්නට බැරි නම් ඒ පාඨශාලා රජයට ගන්න.

ඒ පාඨශාලාවල උගන්වන ගුරුවරුන්ට සහනයක් නැහැ. අනික් ගුරුවරුන්ට ලැබෙන පහසුකම් ඒ ගුරුවරුන්ට නැහැ. ඒ දෙමව්පියන්ටත් තමන්ගේ දරුවන් සඳහා හැමදාම මුදල් වියදම් කිරීම අමාරුයි. වික කාලයක් මේ පිළිවෙළට මේ පාඨශාලා ගෙන යන්නට පුළුවන් වෙයි. එහෙත් සදහටම මේ පාඨශාලා ගෙන යන්නට පුළුවන් වේද යන්නයි, ප්‍රශ්නය. ඒ පාඨශාලාවල සාධාරණව මුදල් අය කිරීමට බලයක් දෙන්න. එසේ කරන්නට බැරි නම් ඒ පාඨශාලාත් රජයට ගන්න. මේ සම්බන්ධයෙන් ස්ථිර ප්‍රතිපත්තියක් ඇතිව ක්‍රියා කළ යුතු බව අධ්‍යාපන ඇමතිතුමාටත්, එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාටත් මා මතක් කරන්නට සතුටුයි.

මහනුවරට වතුර සැපයීම ගැන කෝට්ටේ මන්ත්‍රීතුමා (ස්ටැන්ලි තිලකරත්න මයා.) සඳහන් කළා. එය සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කළ දෙයක්ය කිව්වා. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම ඒ ආණ්ඩුව විසින් කරන ලද දෙයක් බව අප පිළිගන්නවා. එහෙත් මාත් අවුරුදු 15 ක් මහනුවර නගරසභිකයකු හැටියට සිටි නිසා මා ඒ ගැන හොඳට දන්නවා. මහනුවර නගර සභාවේ සිටි ජෝජ් ඊ. ද සිල්වා මහත්මයත්, දැනටත් නගරාධිපති හැටියට කටයුතු කරන ඊ. එල්. සේනානායක මහත්මයත්, මුදල් ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම් විමලසේන මහත්මයත්, ශ්‍රීමත් බෙනට් ද සොයිසාත් වැනි බොහෝ දෙනෙක් අවුරුදු දෙකක පමණ කාලයක් මේ ගැන සටන් කළා. ඒ සටන් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දැනට සිටින රාජ්‍ය ඇමතිතුමා—ජේ. ආර්. ජයවර්ධන මහත්මයා—තුන් මාසයේ රජය කාලයේදී සැලැස්ම සාදා ගිවිසුම සූදානම් කර තිබුණා. එහෙත් රජය පෙරළුනු නිසා ගිවිසුම අත්සන් කරන්නට—කොන්ත්‍රාත් එක භාර දෙන්නට—බැරි වුණා. ඊට පසු බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවෙන් එය ක්‍රියාත්මක කළා. මහනුවර ජනතාව වෙනුවෙන් දෙගොල්ලන්ටම අපි ඒ ගැන ස්තුති කරනවා. මහනුවර නගරයට දැන් අවශ්‍ය තරමට වතුර තියෙනවා. දැන් අපට නගරය පිරිසිදු කර ගන්නට පුළුවන්. එය එක පක්ෂයකින් කළාය කීවොත් වැරදි බව මා නැවතත් සඳහන් කරන්නට කැමතියි.

ශ්‍රමදාන ව්‍යාපාරවලින් කරන්නේ බොරු වක්‍ය කියා කෝට්ටේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. ඒ කීම අපට පිළිගන්නට බැහැ. ශ්‍රමදාන ව්‍යාපාර මගින් අපේ ප්‍රදේශයේ වැඩ රාශියක් කෙරී තිබෙනවා. ආරෝග්‍යශාලාවල, පාරවල, වෙනත් අංශවල වැඩ කටයුතු රාශියක් ශ්‍රමදාන ව්‍යාපාරයෙන් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කට යුතු කළ ආණ්ඩුවේ නිලධාරීන්ට අප ස්තුතිවන්ත වෙනවා. අපේ ප්‍රදේශයේ විශාල පාරවල් රාශියක් ශ්‍රමදාන ව්‍යාපාරයෙන් කපා තිබෙනවා. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන් ඒ පාරවල් සඳහා සැලැස්මවල් සකස් කළා. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන් ඒවා මණින්නට උදව් කළා. ඒ සියළු දෙනාටම කෘතඥ වන බව සඳහන් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 5.20

**ද සොයිසා සිරිවර්ධන මයා.**

*(திரு. டி சொய்சா சிறிவர்தன)*

(Mr. de Zoysa Siriwardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම ආණ්ඩුවේ තුන් වන අයවැය ලේඛනය ගැන වචන සවල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. ගරු මුදල් ඇමතිතුමා අයවැය කථාව කරගෙන ගියේ ශෝක ප්‍රකාශයක් කියවන්නා වාගෙයි. පැයක් පමණ කාලය තුළ එතුමා කියා වූයේ විදේශ විනිමය බැසීමේ හේතු, රැකී රක්ෂා ප්‍රශ්නය උග්‍ර වීමේ හේතු, ජීවන වියදම වැඩි වීමේ හේතු ආදිය ගැන නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙය ශෝක ප්‍රකාශ අයවැය ලේඛනයක් හැටියට හඳුන්වන්නට පුළුවනි. [බාධා කිරීමක්]

"1965 වර්ෂය හා සැසඳීමේ දී, 1966 හි දී මේ රටේ අපනයන ඉපැයුම්වල රුපියල් 23 කෝටි 50 ලක්ෂයක පිරිහීමකට මුහුණ පාන්නට රටට සිදු වුණා. මේ පිරිහීම 1967 වර්ෂයෙහි පළමු කොටස දක්වාත් නොකඩවා පැවතුණා. එසේ විමට, අපනයන මිළ ගණන්වල පහළ වැටීම විශාල ලෙසම හේතුවුණු අතර, අහිතකර කාලගුණය නිසා තේ සහ පොල්වල අපනයන පරිමාව අඩුවීමත් ඊට සුළු තරමින් හේතු වුණා."

මා මේ කියැවූයේ මුදල් ඇමතිතුමාගේ අයවැය කථාවෙන් කොටසක්. වෙළෙඳ පොළේ මිළ බැසීම නිසා අපේ විදේශ විනිමය පහළ ගිය බවයි, එතුමා කියන්නේ. එහි සැහෙන සත්‍යතාවක් තිබෙනවා. එසේ වුවද වෙළෙඳ ඇමතිතුමාගේ අදක්ෂතාව නිසා මේ තත්ත්වය උදා වූ බව නිර්භයව කියන්නටත්, ඒ කියන දේ ඔප්පු කරන්නටත් පුළුවනි. අප පාලන කටයුතු භාරව සිටි කාලයේදී සමාජවාදී රටවල් සමඟ ගිවිසුම් ඇති කරගෙන අපේ තේ, පොල්, රබර් යනාදිය ඒ රටවලට දීමෙන් අපේ රටට වුවමනා කරන දේ ඒ රටවලින් ගෙන්වා ගත්තා. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංගරත්න මයා.) වෙළෙඳ ඇමතිවරයා වශයෙන් සිටි කාලයේදී මේ රටේ තිබුණු ෂෙල්, කැල්ටෙක්ස් වැනි තෙල් කොම්පැනිවලට කීවේ අපේ රටේ විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා අපේ රටේ නිපදවන දේ විකුණා ගැනීමට ඉඩ සැලසෙන පරිද්දෙන් සමාජවාදී රටවලින් පැට්‍රල් ගන්නා ලෙසටයි. එවිට ඒ කොම්පැනි කීවේ මොකක්ද? "අපි රතු තෙල් දමන්නේ නැහැ. ඒවා දමා කාර් දුවවන්නට බැහැ" යනාදී වශයෙන් කී ඒ කොම්පැනිවලට පිළිතුරක් වශයෙන් ඒ වෙළෙඳ ඇමතිතුමා කෙළේ තෙල් වෙළෙඳාම ජනසතු කිරීමයි. තෙල් වෙළෙඳාම ජනසතු කොට සමාජවාදී රටවලින් තෙල් ගෙන්වා ගැනීමෙන් අපේ රටේ නිෂ්පාදන ඒ රටවලට විකුණා ගන්නට අපට පුළුවන් වුණා. මේ විධියට කටයුතු කරගෙන යද්දී එක්සත් අරාබි ජනරජයෙන් අපට මුදල් විශාල ප්‍රමාණයක් ලැබෙන්නට තිබුණා. මේ ජාතික ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව "අපට රන් පවුම්ම ඕනෑ, ඩොලර්ම ඕනෑ, අපට මුදල්ම ඕනෑ" යයි කියන්නට පටන් ගත් නිසා එක්සත් අරාබි ජනරජය අපේ තේ ගැනීම අතහැරියා. 1966 දී මා එම රටේ සිටියදී මොන හේතුවක් නිසා ලංකාවේ තේ නොගන්නේදැයි ඇසූ විට මට ලැබුණු පිළිතුර නම්, "ලංකාණ්ඩුව තේ සඳහා මුදල්ම ඉල්ලනවා මිස බඩු ගන්නේ නැති නිසා එසේ කිරීමට සිදු වුණා" යනන්යි. වෙළෙඳ ඇමතිතුමා ඒ රටින් බඩු ගත්තේ නැහැ. කපු පුළුන් ගත්තේ අප්‍රිකාවෙනුයි. අපත් සමඟ තේ සඳහා තරඟ කරන අප්‍රිකාවෙන් කපු පුළුන් ගත්තා. මේ තත්ත්වය නිසා ඉරාකය වැනි මැද පෙරදිග රටවලට අපේ තේ විකුණා ගන්නට බැරි වුණු බව රහසක් නොවෙයි. එහෙත් අවුරුදු දෙකකට පසුව වෙළඳ ඇමතිතුමා විසින් අපේ තේ එක්සත් අරාබි ජනරජයට විකිණීමට ගිවිසුම් ඇති කර ගෙන යනවාය කියා මට දැන ගන්නට ලැබී තිබෙනවා. අපේ වෙළඳාම කොයි අන්දමට ගෙනයා යුතුද කියන එක ගැන මේ අයගේ ඇස් ඇරෙන්නට අවුරුදු 2 ක් ගත වුණා. සාමාන්‍යයෙන් අපේ තේ, රබර්, පොල් ආදී බඩු සෝවියට් දේශය, රුමේනියාව, නැගෙනහිර ජර්මනිය, ආදී රටවලට විකුණා ඒ වෙනුවට ඒ රටවලින් අපට අවශ්‍ය ද්‍රව්‍ය අපි ගන්නවා නම්, අපේ වෙළඳ තත්ත්වය මීට වඩා උසස් වෙනවාට කිසිම සැකයක් නැහැ. ළඟදී සිදු වී තිබෙන සිද්ධියක් තමුන්නාන්සේ දන්නවා ඇති. අපට ට්‍රැක්ටර් විශාල සංඛ්‍යාවක් ඕනෑ වී තිබුණා. එක්තරා සමාජවාදී රටක් පොරොන්දු වී තිබෙනවා, ඒ අයගෙන් ට්‍රැක්ටර් ගන්නවා නම් අපේ තේ ඒ අය ගන්නවාය කියා. එහෙත් එය නොකර අප වෙනත් රටවලින් කෝටි 4 ක පමණ ට්‍රැක්ටර් මුදල් දී හෝ ණයට අරගෙන තිබෙනවා. ඔන්න ඔය නිසා තමයි අපේ වෙළඳාම හුඟක්ම පහළ බැස තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දන්නම කොහු මිල දී ගැනීමට ගැනුම්කරුවන් ටික දෙනෙක් සිටිනවා. එහෙත් පසුගිය කාලයේ එවැනි තත්ත්වයක් නැතිව තිබුණා. එයට හේතුවත් මා මේ ගරු සභාවේදී පැහැදිලි කළා. කොහුවලට අපේ ස්ථිර මිලක් තිබුණා. එය ක්‍රියාත්මක නොකළ නිසයි කොහු කර්මාන්තය කඩා වැටුනේ. ඒ නිසා දහස් ගණනකට රක්ෂාව නැතිව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]
ගියා. අලුතින් රක්ෂා ඇති කිරීම කෙසේ වෙතත්, රක්ෂා තිබුණු අයටවත් රක්ෂා දීමට තරම් ශක්තියක් මේ ආණ්ඩුවට නොමැති බව මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ඕ. සී. නැත්නම් කපාපු පොල් ලෝක වෙළඳ පොලේ විකුණන්නට බැරි තත්ත්වයක් ඇති වූ අවස්ථාවක් ගැන තමුන්නාන්සේට මතක ඇති. ඒ අවස්ථාවේදී අපේ ආණ්ඩුව කළේ මොකක්ද? එවකට වෙළඳ ඇමති වශයෙන් සිටියේ කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමායි (ටී. බී. ඉලංගරත්න මයා). ඒ අවස්ථාවේ අපේ ආණ්ඩුව කළේ ඒ ෆැක්ටරිවලට රුපියල් 50,000 ක් හෝ 60,000 ක් වියදම් කර නිෂ්පාදනය හොඳ තත්ත්වයෙන් කරන්නය කියා නීතියක් පැනවීමයි. ඒ අවස්ථාවේ ලොකු සෝෂාවක් තිබුණා. එහෙත් ඒ පියවර නිසා ඕ. සී. වල තත්ත්වය නැංගා.

නියඟය නිසා පොල් නිෂ්පාදනය ටිකක් අඩු වී තිබෙනවා. විශේෂයෙන්ම අපේ කොප්පරා හා තෙල්වල මිල අඩු වී තිබෙන්නේ ඉන්දියාව රුපියලේ වටිනාකම 1/3 කින් අඩු කිරීම නිසයි. ඒ නිසා රුපියල් 225 ට තිබුණු කොප්පරා පාරම 175 දක්වා පහළ බැස තිබෙනවා. ඉන්දියාවේ විදේශ විනිමය අඩු වී යන විට තම රටට මුදල් එන අන්දමට දුර දිග බලා කටයුතු කිරීමෙන් වෙළඳාම දියුණු කර ගත් අතරම අපේ වෙළඳාම පහළ වැටෙන්නටත් එය හේතුවක් වුණා.

චීනය අපේ රබර් ගන්නේ නැත්නම් තත්ත්වය කොහොමද කියා බලන්න. දැන් නම් වෙළඳ ඇමතිතුමාගේ ඇස් ඇරී තිබෙනවා. සමාජවාදී රටවල් සමග සම්බන්ධ වී අපට අවශ්‍ය ද්‍රව්‍ය ඒ රටවලින් ගත්තොත් මීට වඩා හොඳ තත්ත්වයක් ඇති වෙනවාය කියන එක පිළිගෙන තිබෙනවා. ආණ්ඩුවක් කරගෙන යන විට ආණ්ඩුවේ දක්ෂතාව පිළිබිඹු වන්නේ මෙවැනි තැන්වලදීයි. අපි පෙට්‍රල් බෙදා හැරීම හා ගෙන්වීම ජනසතු කළ නිසා විශාල විදේශ විනිමයක් ආරක්ෂා කර ගන්නට හැකි වී තිබෙනවා. තමුන්නාන්සේලාත් සුළු වශයෙන් හෝ අද ඒ වෙළඳාම කර ගෙන යන්නේ අපි ගත් ඒ පියවර නිසයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අයවැය කථාව නමැති පොතේ 46 වැනි පිටුවේ පෙන්වා දී තිබෙනවා 1967-68 වර්ෂයේ රජයේ ආදායම රුපියල් 193 කෝටි 20 ලක්ෂයක් හැටියට ඇස්තමේන්තු කරන්නට යෙදුණාය කියා. "1967-68 වර්ෂය සඳහා රජයේ ආදායම රුපියල් 193 කෝටි 20 ලක්ෂයකට ඇස්තමේන්තු කරන්නට යෙදුණා." යනුවෙන් එක් තැනෙක සඳහන් වන අතර "1967-68 වර්ෂය සඳහා රජයේ සම්පූර්ණ වියදම රුපියල් 292 කෝටි 70 ලක්ෂයකට ඇස්තමේන්තු කර තිබෙනවා." යනුවෙන් තවත් තැනෙක සඳහන් වෙනවා. අපට ලැබී තිබෙන ලංකාණ්ඩුවේ අය හා වැය ඇස්තමේන්තුවට අනුව එම මුදල් කෙසේ වියදම් කරන්නට යනවාදැයි පෙනෙනවා. ඇතැම් මැති ඇමතිවරු ඒ ඒ ඡන්ද කොට්ඨාශවලට ගොස් මහ ලොකුවට නානාවිධ ප්‍රචාරයන් ගෙනයන බව පේනවා; කයිවාරු ගසන බව පේනවා. සෞඛ්‍ය ඇමතිතුමා මගේ කොට්ඨාශයේ නිලගමනක යෙදුණු අවස්ථාවක කියන්ට යෙදුණු කාරණයක් මට මතකයි. එතුමා ඒ අවස්ථාවේදී කොරසෙ ගමට පැමුණුනා. එහිදී එතුමාට සංදේශයක් ඉදිරිපත් කරන්නට යෙදුණා. මධ්‍යම දිස්පැන් සරිය සඳහා අඩු ගණනේ ඇඳන් 6කින්වත් යුක්ත ආරෝග්‍යශාලා ගොඩනැගිල්ලක් සාදා ගත යුතුව තිබෙනව; එම ගොඩනැගිල්ල මහජනයා විසින් සාදා දෙන්ට පොරොන්දු වන නිසා කරුණාකර එහි නඩත්තුව භාර ගන්න, කියන එකයි එම සංදේශයෙන් කළ ඉල්ලීම. [බාධා කිරීමක්] සෞඛ්‍ය ඇමතිතුමා මෙම ස්ථානයේ නැති එක ගැන මා කනගාටු වෙනවා. එම අවස්ථාවේදී මා කරුණු පැහැදිලි කළා, මේ පිළිබඳව යන වියදම දරාගෙන අපි ගොඩනැගිල්ලක් සාදා දෙනවාය කියන එකේ තේරුම කුමක්ද යන්න ගැන. රජයට ගොඩනැගිල්ලක් සාදා දෙන්නය කීවොත් මුදල් නැති බව එකපාරටම කියන හෙයින් අප එම ගොඩනැගිල්ල සාදා දෙන්නට භාර ගන්නා බවයි, මා එම අවස්ථාවේදී ප්‍රකාශ කළේ. සෞඛ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා, මේ ආණ්ඩුව එතරම් දුරට මහජනයා තළා පෙළන්නේ නැති බව. තමුන්නාන්සේලා රුපියල් 5,000 ක් පමණ යොදා එබඳු ගොඩනැගිල්ලක් සාදා දුන්නොත් අප

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇඳන් පහක් හයක් තැබිය හැකි මාතෘ නිවාසයක් සාදා දෙනවාය කියන පොරොන්දුව එතුමා විසින් දෙනු ලැබුවා. මේ ගොඩනැගිල්ල සාදන්නට පෙර කරුණාකර ඇග්‍රිමන්ට් එකක් අත්සන් කරන්නට පුළුවන්ද, මාස 3 කින් අපට අපේ ගොඩනැගිල්ල සාදන්නට පුළුවන්කම තිබෙනවාය කියන ප්‍රකාශය මා එහිදී කළා. ඒ අනුව එතුමා කියන්නට යෙදුණා, "එවැන්නක් වුවමනා කරන්නේ නැහැ; අපේ ආණ්ඩුව යමක් කරනවාය කිවොත් එය කරනවාමය" යනුවෙන්. ඒ පිළිබඳව වාර්තා කරන ලෙස මා නිලධාරීන්ට දැනුම් දුන්නා. දැන් වාර්තා කරළත් මාස ගණනක් ගත වුණා. අපි එදා එවේලේම රුපියල් 2,500 ක් ඒ වෙනුවෙන් මහජනතාව ගෙන් එකතු කළා. එකතු කර අපෙන් තැනෙන ගොඩනැගිල්ල සාදා දීම සඳහා අවසර ලබා ගන්නට උත්සාහ දැරුවා. තවම ඒ සඳහා අවසරයවත් දී නැහැ. සෞඛ්‍ය ඇමතිතුමාගේ මේවර කථාවෙන් අපට පෙනී ගියා, තත්ත්වය අමාරු බව. පසුගිය 3 වන දින සිය කථාවෙන් එතුමා මෙසේ කියා තිබෙනවා:

"I am just saying these things for this reason. When it was pointed out by the Health Department sometime back that next year there would be a large number of vacancies for doctors unfilled, some people laughed at us and said that we were talking through the hat. Strangely and sadly, what we said has come to be true, because the Cabinet has allowed me to recruit 130 doctors next year but there is no money provisions to recruit them."—[OFFICIAL REPORT, 3rd August 1967; Vol. 73, c. 457.]

මෙවැනි අමාරු තත්ත්වයක් තබාගෙන මේ අන්දමේ බොරු පොරොන්දු දෙන්නේ මන්ද කියන එකයි, අපේ ප්‍රශ්නය. සෞඛ්‍ය අංශයට 1967-68 වර්ෂය සඳහා වෙන් කර තිබෙන්නේ රුපියල් 19,50,58,670 යි. 1966-67 වර්ෂය සඳහා වෙන්කර තිබුණේ රුපියල් 17,89,07,870 යි. ඒ අනුව සෞඛ්‍ය අංශයට වැඩි වී තිබෙන්නේ ඉතා සුළු ප්‍රමාණයයි. එහෙත් අළුතින් දොස්තරවරුන් වුවමනා කරනවා; සාත්තු සේවිකාවන් වුවමනා කරනවා; තවතවත් අවශ්‍යතාවයන් තිබෙනවා. මෙම අයවැය ලේඛනයේ පරතරය කෝටි සියයකට සීමා කළත් පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරන බවද කියනවා. ඒ විධියේ පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කළොත් මේ කෝටි සියයේ අය වැය පරතරය තවත් පළල් වන බවට සැකයක් නැහැ. අළුතෙන් ගුරුවරුන් දෙදහස් හත්සියයක් බඳවා ගන්නවාය, ශිෂ්‍ය ගුරුවරුන්ගේ වැටුප රුපියල් 25 කින් වැඩි කරනවාය කියමින් අධ්‍යාපන ඇමතිතුමා කයිවාරු දොඩනව. එතුමාත් සමහරවිට පරිපූරක ඇස්තමේන්තු ගෙනෙන අදහසින් එසේ කියනවා වෙන්ට ඇති. අය වැය පරතරය පියවන අන්දම ගරු මුදල් ඇමතිතුමා අයවැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවෙදි කියා තිබෙනව. මේ විධියට කටයුතු යෙදුණොත් එය ඒ අන්දමට පියවා ගන්න බැරි බවයි මම කියා සිටින්නෙ.

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට මේ වර්ෂයේ වෙන් කර තිබෙන්නෙ රුපියල් 42,01,10,567 යි. පසුගිය අවුරුද්දෙ වෙන් කර තිබුණේ රුපියල් 40,21,75,967 යි. වැඩිවෙලා තිබෙන්නෙ ඉතා සුළු ගණනකින්. ඒ වැඩි කර තිබෙන්නෙ මොනවටද? ගිය අවුරුද්දට වඩා රුපියල්——

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
—දෙකෝටියක් විතර වැඩියි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

හොඳයි දෙකෝටියක් කියමුකො. මේ මුදලින් ජාතික උසස් අධ්‍යාපන සභාවට සහ විශ්ව විද්‍යාල ආධාරවලට වෙන් කර තිබෙන වැඩිපුර මුදල වන රුපියල් 2,74,18,928 අඩු කළාම ගිය අවුරුද්දේ වෙන් කළ මුදල් ප්‍රමාණයටත් වඩා අඩු වෙන් තමයි, මේ අවුරුද්දේ අධ්‍යාපන අංශයට මුදල් වෙන් කර තිබෙන්නෙ. එම නිසා ශිෂ්‍ය ගුරුවරුන්ට පඩි වැඩි කිරීමට හෝ අළුතින් වැඩිපුර ගුරුවරුන් බඳවා ගැනීමට මේ ඇස්තමේන්තුවලින් මුදල් වෙන් කර නැහැ. හැම දෙපාර්තමේන්තුවක්ම මේ විධියට පරිපූරක මුදල් ගෙනාවොත් මා කලින් සඳහන් කළා වගේ අය වැය පරතරය කෝටි 100 කට වඩා වැඩි වෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කම්මාන්ත හා ධීවර අමාත්‍යාංශයට මේ වර්ෂයේ වෙන් කර තිබෙන්නෙ රුපියල් 16,22,88,678 යි. ගිය අවුරුද්දෙ රුපියල් 17,64,10,451 ක් වෙන් කර තිබුණ. ගිය අවුරුද්දට වඩා රුපියල් 1,41,00,000 ක් පමණ අඩුවෙනුයි, මේ වර වෙන් කර තිබෙන්නෙ. ධීවර කර්මාන්ත දියුණු කරනවාය, ට්‍රෝලර් ගෙන්වනවාය කිව්වට ඒක කරන්නෙ කොහොමද? මීගමුවේ ගරු මන්ත්‍රීතුමා (ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.) මේ කරුණු හොඳහැටි දන්නවා ඇති. මීගමුව ප්‍රදේශය මා හොඳින් දන්න පළාතක්. තෙප්පන් පදවන්න අවශ්‍ය මෝටර් නැතුව අද විශාල ගණනක් වැඩ කරන්ට බැරි තත්ත්වයක සිටිනව. මේ තරම් අවශ්‍ය වැඩකට ධීවර ඇමතිතුමා විසින් මෝටර් ගෙන්වන්න බලය දී තිබෙන්නෙ කාටද? ජැෆර්ජී කොම්පැනියටයි.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

ජැෆර්ජී කොම්පැණිය විතරක් නොවෙයි; තවත් කොම්පැණි 4ක් 5ක් ගෙන්වනව.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ඇයි, ආණ්ඩුවට ගෙන්වන්න බැරි? වැඩ වර්ජනය නිසා දැන් මාස 4 ක සිට ජැෆර්ජී සමාගමේ බඩු ගෙන්වීම ඇණහිට තිබෙනව. හලාවත, මීගමුව, මෝදර ආදී ප්‍රදේශවල මාලු අල්ලන මිනිසුන් දැන් මාස ගණනක සිට මෝටර් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර යවා ඒවාට පිළිතුරු ලැබෙන තුරු බලා සිටිනව.

ගරු සභාපතිතුමනි, මේ විධියේ ලියුමක් මේ ගරු සභාවේ කියවන්ට මට ලැජ්ජයි. මේ ලියුම ධීවර අධ්‍යක්ෂවරයා විසින් ජැෆර්ජී සමාගමට යවා තිබෙන ලියුමක්. මෙන්න ඒ ලියුම:

"June 1, 1967.

Messrs Jafferjee Brothers Ltd.,
Colombo.

Dear Sir,

*Mercury Outboard Motor*

Mr. A. Christie Norman Fernando of 75/21, St. Maha Santiago Mawatha, Mutwal, Colombo 15 intends purchasing a 6 H.P. Mercury Outboard Motor. Please reserve one from the coming shipment and inform him when engines are cleared.

Yours faithfully,
for Director of Fisheries."

මේ මෝටර් තොගය ඒවා වුවමනා කරන අයට බෙදා දෙන්නට තරම් මේ ආණ්ඩුවට බලයක් නැද්ද? මේ ආණ්ඩුව ඒ තරම්ම දුර්වලද? කම්කරු ආරාවුල් නිරවුල් කිරීමේ මණ්ඩලයකට පවරා මේ වැඩ වර්ජනය අවසාන නොකරන්නේ ඇයි.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

වැඩ වර්ජනය කඩාකප්පල් කරන්නද කියන්නේ? එහෙම නම් කෙළින්ම කියන්න.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

කඩා කප්පල් කරන්නට නොවෙයි මා කියන්නෙ. එය බේරුමක් නොකරන්නේ ඇයි? මා දැන් තවත් ලියුමක් කියවනවා. එවිට තමුන්නාන්සේට තේරෙයි මේ ආණ්ඩුවේ තිබෙන දුර්වලකම.

"4th July, 1967.

THE CEYLON MERCANTILE UNION,
H. M. de Silva Esq.,
65, St. Maha Santiago Mawatha,
Mutwal,
Colombo 15.

Dear Sir,

*Jafferjee Brothers and Associate Firms*

We refer to your letter dated 21.6.67 and we have to confirm the discussions you had with a representative of our Union this morning, whereat you were made to understand that we have already conveyed to the Minister of Labour several weeks ago, the Union's agreement with his suggestion to refer the matters under dispute with the above-named Companies for settlement by arbitration. As such the matter rests with the Minister of Labour.

Yours faithfully,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජැපර්ජී කොම්පැනියේ වැඩ වර්ජනය දවස් 10 කින් අවසන් කරනවායයි ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙන බව මා පත්‍රයේ දක්කා. එහෙත් දැන් දවස් 11 ක් ගත වී තිබෙනවා. මා කියන්නේ මෙය බලහත්කාරයෙන් නතර කරන්නට නොවෙයි. කම්කරු ආරාවුල් බේරුම් කිරීමේ මණ්ඩලයකට ඉදිරිපත් කොට මෙය බේරුම් කරන්නට ඇමතිතුමාට ශක්තියක් නැද්ද? ඇමතිතුමා මෙහිදී නම් සමහර අවස්ථාවලදී ලොකුවට පුප්පලා කෑගහනවා. එහෙත් ජැපර්ජී සමාගමේ මේ මෝටර් තොගය අවශ්‍ය අයට ලබා දීමට එතුමාට ශක්තියක් නැහැ. ධීවර කර්මාන්තය දියුණු කරනවායයි කියමින් ලොකු ඝෝෂාවක් රජය කරගෙන යනවා. බිලි මාලු පිටරට පටවන්නටත් දැන් සූදානම් වෙනවාලු.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

සූදානම් වෙනවා නොවෙයි, දැන් යවනවා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

බොහොම හොඳයි. මා කියන්නේ මේ ධීවරයින්ගේ ප්‍රශ්න බේරුම් කරන්න කියායි. ආණ්ඩුව සමග සටන් කොට තම ප්‍රදේශයේ ධීවරයින්ගේ ප්‍රශ්න නිරාකරණය කර දෙන ලෙස මා මීගමුවේ ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ මෝටර් පිළිබඳ ප්‍රශ්නය මීගමුවට පමණක් නොව මෝදර, හලාවත ආදී ප්‍රදේශවලටත් බල පානවා. එම නිසා, මේ වැඩ වර්ජනය සමථයකට පත් කරන්නට බැරි නම් ජැපර්ජී සමාගමේ තිබෙන මෝටර් තොගය ආණ්ඩුවට ගෙන ඒවා වුවමනා කරන ධීවරයින්ට බෙදා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**
*(கௌரவ என். எச். ஏ. எம் கருணாரத்ன—சமூக சேவை அமைச்சர்)*
(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

1956 සිට 1965 දක්වා වැඩ වර්ජන 5305ක් කර තිබෙනවා. ඒව මතක නැද්ද?

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ඊළඟට අපි කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමාගේ අංශය ගැන කල්පනා කර බලමු. ගිය අවුරුද්දේ මේ අංශය වෙනුවෙන් රු. 45,89,42,061 ක් වෙන් කර තිබුණ නමුත් මේ අවුරුද්දේ ඒ සඳහා වෙන් වී තිබෙන්නේ රු. 38,23,68,465 යි. හාල් සේරුව කැපීමෙන් මුදල් ඇමතිතුමාට වාසියක් වී තිබෙන නිසා මේ මුදල අඩු වී තිබෙනවා. කෘෂිකර්ම අංශය දියුණු කිරීමට උනන්දුවක් ගන්නා බව අපට පත්‍ර මාර්ගයෙන් අසන්නට ලැබෙනවා. අප ඒ ගැන බොහොම සන්තෝෂයි. එහෙත් දැන් තිබෙන තත්ත්වය අනුව රජය හිතන තරම් එය සඵල වේද යන්න ගැන සැක සහිතයි. මේ වර මාස් කන්නයේ අස්වැන්න වෙන කවදාවත් නොවූ තරම් වැඩි වී තිබෙන බව කියමින් තමුන්නාන්සේලා ඝෝෂා කරනවා. මේ අවුරුද්දේ යල් කන්නයේ අස්වැන්න එකතු කර බලා අවුරුද්ද අන්තිමේදී අපට දන්වන ලෙස මා ඉල්ලා සිටිනවා. මා දන්නා හැටියට නම් මේ අවු අවුරුද්දේ යල් කන්නයේ වී වගාව සම්පූර්ණයෙන් විනාශ වී ගොස් තිබෙනවා. ගරු අගමැතිතුමා ඊයේ පෙරෙයිදා අනුරාධපුරයට ගිය නිසා එහි තත්ත්වය එතුමා දකින්නට ඇති. වාරියපොල මගේත් කුඹුරක් තිබෙනවා. මේ රජයේ ආහාර නිෂ්පාදන ව්‍යාපාරයට ආධාර කරන්නට මාත් එයින් වී බුසල් 10 ක් 12 ක් නිපදවා ගන්නවා. එහෙත් මේ වර නම් එහි ගන්න දෙයක් නැහැ. අනුරාධපුරයෙත් වී වගාව සම්පූර්ණයෙන්ම වියලී ගොස් තිබෙනවා.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

ඔහොම කථා කළොත් සාප වදියි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

මා මේ කියන්නේ මා දුටු දෙයයි. අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමාගේ පියාගේ අවමංගල්‍යයට සහභාගි වීම සඳහා මා පෙරේදා අනුරාධපුරයට ගියා. ඒ අවස්ථා

PUBLIC LIBRARY JAFFNA

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]
වේදී මා දුටු දෙයයි මේ කියන්නෙ. තේ, රබර් හා පොල්වලින් ලැබෙන ආදායම පහළ බැස තිබෙනවාය කියා ගරු ඇමති තුමා ප්‍රකාශ කර තිබෙනවා.

"PM hopes for self-sufficiency by 1970."

"Worry over falling prices of exports
The country is making rapid progress in food production under the National Government, and I believe that by 1970 we should be self-sufficient in food, said Mr. Dudley Senanayake, the Prime Minister addressing a meeting at Bandaragama recently."

මේ විධියට, පත්‍රවලින්, ගුවන් විදුලි යෙන් ශීඝ්‍රයෙන් වගා කරනවාය කියා නොයෙකුත් ප්‍රචාරයන් ගෙන යනවා. එහෙත් අපට නම් ඒ කිසිවක් පෙනෙන් නට නැහැ. අන්න ඒකයි මා කියන්නෙ.

අගමැතිතුමා කියන විධියට කරුණු සිදු වෙනවා නම් හොඳයි. පත්‍රවල තිබෙන හැටි යට නම් හාල් පිටරට පටවන්නත් පුළුවන් වේවි. අවුරුදු දෙකක කාලසීමා වක් ඇතුළත මේ රටේ වී ගොවිතැන් කර හාල් ලංකාවෙන් පිටරට පටවන්නත් පුළුවන් නම් එය ලොකුම සමර්ථකමක් ය කියා පිළිගන්නට පුළුවනි. හැබැයි, ඒකත් අර මාළු පිටරට යැව්වා වගේද කියා මා දන්නේ නැහැ. හාල් දැනුත් පිටරට යන වාය කියා අපට ආරංචියි. හම්බන්තොට හා උතුරු ප්‍රදේශවලින් දැනුත් හාල් ඉන්දි යාවට පටවනවාලු. අගමැතිතුමාගේ වැඩ පිළිවෙළ සාර්ථක වෙනවා නම් මා ඉතාම සන්තෝෂ වෙනවා. එය සාර්ථක වේවායි කියා අප ප්‍රාර්ථනා කරනවා. එහෙත් රජයේ වැඩ පිළිවෙළ සාර්ථක වේවිද යන්න ගැන අප තුළ ලොකු සැකයක් තිබෙනවා. 1970 වන විට හාල් සලාකය සේරු දෙකක් දී හාල් පිටරට පටවන්නත් පුළුවන් වුණොත් එය ලොකුම සමර්ථ කමක් ය කියා මා කල්පනා කරනවා. මේ විධියට කයිවාරු දෙඩුවාට මේ වැඩ පිළි වෙළ සාර්ථක වේවිද කියා අප තුළ විශාල සැකයක් තිබෙනවා.

හාල් සේරුව ශත 85 ට ගන්නට පුළු වන්ය කියා මීගමුවේ ගරු මන්ත්‍රීතුමාත් කියන්නට යෙදුණා. මීගමුවේ ගරු මන්ත්‍රී තුමාත් මමත් කිට්ටුවයි වාසය කරන්නෙ. ඔය ශත 85 හාල් මිටියක් දෙකක් මිළදී ගන්න මමත් කැමතියි. කරුණා කර මට අරගෙන දෙන්න. කැමට ගත හැකි හාල් සේරුවක් රුපියල් 1.10 ට අඩුවෙන් ගත හැකිය කියා මා සිතන්නෙ නැහැ. පත්‍ර වලින් ගෙන යන මේ ප්‍රචාරවලින් මහජන තාව රවටන්නට බැහැ. පත්‍රවලින් කරන මේ විධියෙ ප්‍රචාරවලින් පමණක් ගොවි තැන දියුණු කරන්නට බැහැ. එපමණයි ගොවිතැන ගැන මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නෙ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වාර යේ ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාං ශයට රුපියල් 38,32,56,897 ක් වෙන් කර තිබෙනවා. ගිය වාරයේ 33,01,73,244 යි වෙන් කර තිබුණේ. මේ මුදල එකවරම වැඩි වී තිබෙන්නේ මක් නිසාද කියා මා බැලුවා. ගොවි හමුදාවට රුපියල් 2,01,22,320 ක් වෙන් කර තිබෙනවා. එම නිසයි මේ වැඩි වීම. ගොවි හමුදාවෙන් කොයි තරම් වැඩ කෙරෙනවාද කියා මා නම් දන්නෙ නැහැ. අනුරාධපුරයට යන විට කොළපාට කැප් දමාගත් ගොවි හමුදා භටයින් දෙතුන් සියය බැගින් පාර දිගේ පෙළපාලි යනු මා දුටුවා. නමුත් කෙරෙන වැඩ නම් මා දුටුවෙ නැහැ. ගොවි හමුදාව මගින් වැව් සාදනවාද කියා මා දන්නෙ නැහැ. තමුන්නාන්සේලා කියන එක නොවෙයි වෙන්නෙ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආදායම කෝටි 193 යි, වියදම කෝටි 292 යි යන්න සම්පූර්ණයෙන්ම බොරුවක්. සෞඛ්‍ය ඇමති තුමා, අධ්‍යාපන ඇමතිතුමා පසුව ඉදිරිපත් කරන පරිපූරක ඇස්තමේන්තු අනුව විය දම තවත් වැඩි වෙනවා. අධ්‍යාපන ඇමති තුමා තවත් ගුරුවරුන් 2,700 ක් බඳවා ගන්නට යනවාය කියා ප්‍රකාශ කර තිබුණා. ශිෂ්‍ය ගුරුන්ටත් රුපියල් 25 ගණනෙ නොවෙයි ඊට වැඩි මුදලක් වුවත් ගෙවීම හොඳයි. ඒ අය සැහෙන සේවයක් ඉටු කරන බව අප දන්නවා. එහෙත් අයවැය ලේඛනය කොයි විධියට පියවනවාද කියා අප දන්නෙ නැහැ. නිකම් විජ්ජාවක් වගෙයි මට මේ ඉලක්කම් පෙනෙන්නෙ.

මුදල් ඇමතිතුමා තම අයවැය කථාව කළේ හරියට ශෝක ප්‍රකාශයක් කරනවා වාගෙයි. අපට වෙලා තියෙන්නෙ මේකයි: වැස්ස නැහැ; ජනගහණය වැඩි වේගෙන යනවා; සෞඛ්‍ය ඇමතිතුමා පෙති දෙන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යනවා ; ඒකත් තවම හරියට අහන්නෙ නැහැ, ආදී වශයෙන් ශෝකාලාපයක් කරන හැටියටයි මුදල් ඇමතිතුමා තම අය වැය කථාව කළේ. නමුත් මෙවැනි තත්ත්වයක් පවතින විට තමුන්නාන්සේලා කොයි ආකාරයට මහජනතාව ආරක්ෂා කරනවාදැයි අප දැනගන්නට සතුටුයි. රට ආර්ථික වශයෙන් මෙවැනි තත්ත්වය කට පත්ව තිබුණු අවස්ථාවකදී කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමති වශයෙන් ගත් පියවරවල් ගැන තමුන්නාන්සේට මතක ඇති. එතුමා තෙල් ව්‍යාපාරය ජනසතු කළා. ඒ වගේ වැඩ විශාල ගණනක් කර තිබෙනවා. පසුගිය රජය රක්ෂණ සංස්ථාව ඇති කළා. එහෙත් කියන්නට කණගාටුයි, එම සංස්ථාවේ රක්ෂා වලට මිනිසුන් දමන්නට දේශපාලන වශයෙන් ඇඟිලි ගසන නිසා එම සංස්ථාවේ සභාපතිතුමා සිය තනතුරෙන් ඉල්ලා අස් වී තිබෙනවා. ඒ වාගේම පසුගිය රජය මහජන බැංකුව ඇති කළා. පසුගිය රජය ඇති කළ ඒ දේවලින් තමුන්නාන්සේලා ප්‍රයෝජන ගන්නවා. මා ප්‍රාර්ථනා කරනවා, ඒ වැඩ කටයුතු තමුන්නාන්සේලා අතින් හරියාකාරව කෙරේවා කියා. අප විරුද්ධ පාර්ශ්වයේ සිටින නිසා කඩාකප්පල්කාරී චේතනාවෙන් මේවා කියනවා නොවෙයි. අප මේ අඩුපාඩුකම් පෙන්වා දෙන්නේ ඒවා මඟහරවාගෙන නියම විධියට කටයුතු කිරීමට තමුන්නාන්සේලාට මඟ පෙන්වා දීම සඳහායි. මුදල් ඇමතිතුමාවත්, රාජ්‍ය ඇමතිතුමාවත් මේ ගරු සභාවේ නැහැ. කර්මාන්ත ඇමතිතුමා නම් ටිකකට කලින් ඇවිත් ආපහු ගියා.

තෙප්පන්වලට අවශ්‍ය බඩු—මෝටර් ආදිය—ලබා දෙන ලෙස ඉල්ලා ලියුම් ගණනාවක් ලැබී තිබෙනවා. එහෙත් ඒවා ගෙන්වා බෙදා හැරීම භාර දී තිබෙන්නේ ජෑප්පර්ජී සමාගමටයි. දැනට ජෑප්පර්ජී සමාගමේ සේවකයන්ගේ වැඩ වර්ජනයක් තිබෙන නිසා ඒවා ලබා ගැනීම දුෂ්කර වී තිබෙනවා. ආණ්ඩුව මේ තරම් නිවට වී තිබෙන්නේ ඇයි? "අසුවලාට එකක් දෙන්න, අසවලාට එකක් දෙන්න" යනුවෙන් ජෑප්පර්ජී සමාගමට ආයාචනා කිරීමට තරම් ආණ්ඩුව නිවට තත්ත්වයකට පත් වී සිටිනවා. ජෑප්පර්ජී සමාගමට නිවට විධියට ආයාචනා කරන්නේ නැතිව තෙප්පන්, බෝට්ටු ආදියට අවශ්‍ය ඒ බඩු බෙදා හැරීමට කටයුතු කරන ලෙස මා ගරු කර්මාන්ත ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මා එකක් පෙන්වා දෙන්නට කැමතියි. මේ අයවැය වාර්තාව ගැන අප විවේචනය කරන විට ආණ්ඩු පක්ෂය කියන්නේ "අප මොනවා කළත් විරුද්ධ පාර්ශ්වයට ඒ හැමෙකක්ම වැරදියි" කියායි. අප ආණ්ඩු කරන කාලයේත් ඒ විධියට කියන්නට ඇති. මේ අවස්ථාවේ ගරු මුදල් ඇමතිතුමා මෙහි සිටීම ගැන මා සන්තෝෂ වෙනවා. මා කලින් පෙන්වා දුන්නා මුදල් ඇමතිතුමා සිය අයවැය කථාවෙන්, අයවැය පරතරය කෝටි 100 ක් හැටියට පෙන්වා තිබුණත් මේ ආණ්ඩුව කරනවාය කියන වැඩ කටයුතු කරගෙන යන විට නම් ඒ පරතරය කෝටි 100 ට වැඩි වන බව. මා අංශ දෙක තුනක් ගැන පමණයි සඳහන් කළේ. සමාජ සේවා ඇමතිතුමාටත් අවශ්‍ය තරම් මුදල් දී නැහැ. එතුමා පරිපූරක ඇස්තමේන්තුවක් ගෙනාවොත් එය අනුමත කරන්නට අප සූදානම්. ගමනාගමන ඇමතිතුමාත් අළුතින් පාරවල් දැමීමට, තිබෙන පාරවල් ප්‍රතිසංස්කරණය කිරීමට, පාරවල් පළල් කිරීමට බොහොම මහන්සියෙන් කටයුතු කරගෙන යනවා. එතුමාටත් ඒ වැඩවලට අවශ්‍ය තරම් මුදල් ලැබී නැහැ. මා මුලිනුත් කීවා වගේ, මගේ වැටහීම අනුව නම්, මේ අයවැය වාර්තාව මහජනයා රැවටීමට අදහස් කර ගණින් පියවීමට ඉදිරිපත් කළ එකක්.

මේ විවාදයට සහභාගි වන්නට මා කලින් අදහස් කළේ නැහැ. මේ වේලාවේ කථා කරන්නට කලින් සූදානම් වී සිටි ගරු මන්ත්‍රීතුමා අසනීප වීම නිසා මටත් මේ විවාදයට සහභාගි වන්නට සිදු වුණා. මා කලින් සූදානම් වී ආවා නම් මීට වඩා දීර්ඝ ලෙස, මීට වඩා ප්‍රයෝජනවත් විධියට කථා කරන්නට පුළුවන්කම තිබුණා.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.** (මීගමුව)

(*திரு. என். டென்சில் பெர்ணண்டோ—நீர்கொழும்பு*)

(Mr. N. Denzil Fernando—Negombo)

ඡන්දය විමසීමේදී අපේ පැත්තට ඡන්දය දෙන්න.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

ඒක නම් කෙරෙන්නේ නැහැ. තමුන් නාන්සේ ආණ්ඩු පක්ෂයට කියන්න, ජැ්පර්ජි කොම්පැණියට දූන්, මසුන් මරන්නන්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ගෙන්වීමේ බලපත්‍රය ආණ්ඩුවට ගන්නට කියා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

මොකක්ද ?

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

බෝට්ටු හා තෙප්පන් ආදියට අවශ්‍ය මෝටර් ආදි උපකරණ ගෙන්වා බෙදා හරින්නේ ජැ්පර්ජි කොම්පැණියයි. මාස තුන හතරක් තිස්සේ ඒවා ඉල්ලා ඇතත් ඉල්ලුම්කරුවන්ට ඒවා තවම ලැබී නැහැ. ජැ්පර්ජි කොම්පැණියේ සේවක වැඩ වර්ජනයක් නිසා ඒවා දෙන්නට බැරි වී තිබෙනවා. වැඩ වර්ජනයක් තිබෙනවා නම් ඒවා ආණ්ඩුවට ගෙන බෙදා හරින්නට පුළුවන්.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

තමුන්නාන්සේ කියන්නේ, වැඩ වර්ජනය කඩාකප්පල් කරන්න කියාද ?

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

ඇයි මේවා—[බාධා කිරීම්] අප කළ වැර දිම කරන්නට නම් තමුන්නාන්සේලා ඔය පැත්තට එන්න ඕනෑ නැහැ. දැනටමත් තමුන්නාන්සේලා මහජනයාට අප්‍රසන්න වී තිබෙනවා. අතුරු මැතිවරණ කීපයකින් ම මහජනයා නියම උත්තරය දී තිබෙ නවා. තවත් දෙකක්—බණ්ඩාරගම හා පැල්මඩුල්ල—ඉදිරියට තිබෙනවා. ඡන්ද යෙන් කියන්නේ, මහජන මතයයි. මීගමුවේ ගරු මන්ත්‍රීතුමා දිනූ එකත් පුදු මයි. අන්තිම දවස් දෙකේ [බාධා කිරීම්] බාගවෙලාවට අධ්‍යාපන ඇමතිතුමාට මොනවා සිද්ධ වෙයිද දන්නේ නැහැ. ජස්ටින් ප්‍රනාන්දු මහත්මයාත්, මීගමුවේ ගරු මන්ත්‍රීතුමාත් අතර උග්‍ර තරඟයක් තිබුණා. අන්තිම දවස් දෙකේදියි, මේ වෙනස වුණේ. කෙසේ වෙතත් තමුන් නාන්සේ දිනීම ගැන අප සන්තෝෂ වෙනවා. තෙප්පන්කරුවන්, මුදු යන් නන් වෙනුවෙන් සටන් කරන්නට අපට සිදු වී තිබෙනවා. කරුණාකර තමුන් නාන්සේත් ඒ සටන ආණ්ඩු පක්ෂය තුළ ගෙන යන්න.

ගරු කර්මාන්ත ඇමතිතුමා මෙතන සිටි යේ නැහැ. මා කියමින් සිටියේ තෙප්පම් සඳහා වුවමනා කරන මෝටර් ගෙන්වන් නේ ජැ්පර්ජි කොම්පැනිය මගින් බවත් එහි දැනට පවත්නා වැඩ වර්ජනය නිසා ඒවා ලබා දෙන්නට බැරි වූ බවත්ය. තමුන්නාන්සේගේ බලය යොදා ඒ උදවි යට මෝටර් යන්ත්‍ර ලබා දෙන මෙන් ඉල් ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරන්නට කැමතියි.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ඔය කියන විධියට බඩු මුට්ටු ගත් තොත් ස්ට්‍රයික් සටන කැඩෙනවා.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்சா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

ජැ්පර්ජි කොම්පැනිය බඩු ගෙන්වන් නේ නැහැ කියනවා. එතන ස්ට්‍රයික් තිබෙන නිසා බඩු නැහැ කියනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

එතන ස්ට්‍රයික් එකක් නැහැ. එතන තියෙන්නේ බෝයිකොට් එකක්.

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)
(The Hon. N. H. A. M. Karunaratne)

කොම්පැනියේ බඩු වර්ජනය කිරීමක්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

Why do you not refer this dispute to compulsory arbitration and settle it?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Settle what?

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

The strike.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

There is no strike in the harbour.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

මීට වඩා දීර්ඝ ලෙස කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මේ අවසථාවේදී වචන ස්වල්පයක් වත් කථා කරන්නට ඉඩ ලැබීම ගැන ඉතාමත් සන්තෝෂ වෙනවා. නියම විධියට මුදල් නොදුන්නොත් වැඩ කරගෙන යන්නට බැරි බව පෙන්වා දෙන්නට කැමතියි. මා මෙ පමණ වේලාවක් පෙන්වා දුන්නේ අය වැය ලේඛනයෙන් වෙන් කරන ලද මුදල් ගැනයි. අඩුපාඩු රාශියක් තිබෙන බව පෙනී යනවා. ඒවා නැති කර වැඩ කරන්නට සූදානම් වන්නැයි කියමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

අ. භා. 5.58

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාව ආරම්භ කළේ ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය කථාව සැක සහිත ප්‍රකාශනයක් හැටියට තේරුම් කර දෙමිනුයි. ඇත්ත වශයෙන්ම එතුමාගේ කටින් එවැන්නක් කියැවීම ගැන අප පුදුම වන්නේ නැහැ. විරුද්ධ පැත්තේ ගරු මන්ත්‍රීතුමන්ලා බලාපොරොත්තුවෙන් සිටියේ අද මේ රටේ මුදල් තත්ත්වය අමාරු අඩියක පවතින නිසා—එය කවුරුනුත් දන්නා කාරණයක්—ගරු මුදල් ඇමතිතුමා අයවැය යෝජනා ඉදිරිපත් කිරීමේදී අමාරුවේ වැටේය කියායි. එතුමා අයවැය යෝජනා ඉදිරිපත් කරන්නේ කෙසේ දැයි විරුද්ධ පැත්තේ ගරු මන්ත්‍රීන් බලාගෙන සිටියා. අයවැය කථාවට පෙර අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කළා. රටේ සංවර්ධනය සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙනවාය යන්න එයින් පෙනී ගියා. ඒ නිසා අය සහ වැය අතර විශාල පරතරයක් තිබෙන බවත් පෙනී ගියා. එවැනි අවස්ථාවක ඒ පරතරය පිය වන්නේ කොයි අන්දමට දැයි විරුද්ධ පැත්තේ ගරු මන්ත්‍රීන් සෝදිසියෙන් සිටියා.

විරුද්ධ පාර්ශ්වයේ ඇතැම් ගරු මන්ත්‍රීන් සමග මිත්‍රකමට කථා කරමින් සිටින විට රටේ තොරතුරු ගැනත් කථා කරන්නට අවස්ථා මට ලැබුණා. ඒ අවස්ථාවල ඇතැම් මන්ත්‍රීන් මගෙන් යම් යම් ප්‍රශ්න ඇසුවා. "අයිසේ, මේ පාර නම් තමුසෙලාට හරිම හරි අමාරුවකට මුහුණ පාන්නට සිද්ධ වෙනවා; බොහොම ලොකු අවදානම් අවසථාවකටයි දැන් රට පැමිණ තිබෙන්නේ. ඔය අයවැය ඇස්තමේන්තුවලට වුවමනා කරන සල්ලි කොහෙන්ද තමුසෙලා සොයා ගන්නේ? දැන් තේ මිළත් පහළ ගිහිල්ලයි තියෙන්නෙ. භාණ්ඩාගාරයත් හිස්වෙලා: බැංකුත් හිස්වෙලා. ඉතින් කොහොමද මේ රජය ගෙන යන්නේ? ඔය තියෙන තත්ත්වයේ හැටියට කෘෂිකර්ම වැඩ ආදී දේවල් නවත්වන්නට නොවෙයිද වෙන්නෙ? එහෙමත් නැත්නම් මහජනයා මත බදු බර පටවන්නට නොවෙයිද තමුසෙලාට සිද්ධ වන්නේ?" ඔය ආදී වශයෙන් යම් යම් මන්ත්‍රීන් මගෙන් ඇසුවා. ඔය තත්ත්වය යටතේ විරුද්ධ පැත්තේ ගරු මන්ත්‍රීන් බොහොම ලොකු සන්තෝෂයකින්, බොහොම ලොකු ඕනෑකමකින්, ලොකු බලාපොරොත්තු ඇතිව සිටියා. එතුමන්ලා කල්පනා කළා මේ අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමෙන් පසු—ගරු මුදල් ඇමති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

තුමාගේ කථාවෙන් පසු—මේ රටේ මහා ඝෝෂාවක් ඇති කර මේ ආණ්ඩුව. පෙරළා දමා නැවතත් වරක් තමන්ට රජ කරන්නට පුළුවන් වේය කියා. එහෙත් මුදල් ඇමතිතුමා දුප්පත් මහජනතාව පිට බර පටවන්නේ නැතිව, ඒ ජනතාවගේ ආහාරවලට, ඒ ජනතාවගේ රෙදිපිළිවලට, ඒ ජනතාවට අවශ්‍ය වෙනත් දේවලට මිළ වැඩි කරන්නේ නැතිව ඒ අය වැය පරතරය පියවන සැටි එතුමාගේ අය වැය කථාවෙන් විස්තර කළ විට මේ තරම් ලොකු බලාපොරොත්තු ඇතිව සිටි ඒ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ සිත්වල ලොකු කණගාටුවක් ඇති වුණා. ඒ නිසා මුදල් ඇමතිතුමාගේ කථාව ශෝක ප්‍රකාශයක් හැටියට ඒ අයට පෙනී යාම පුදුමයක් නොවෙයි. අපට නම් එය ශෝක ප්‍රකාශයක් හැටියට පෙනෙන්නෙ නැහැ. අපට අපේ මුදල් ඇමතිතුමා ගැන ඉතාමත් සන්තෝෂයි, ආඩම්බරයි. එතුමා කෙළේ ලෙහෙසි පහසු වැඩක් නොවෙයි, බොහොම අමාරු වැඩක්. මුදල් අතින් ඉතා අවදානම් තත්ත්වයකට අපේ රට මුහුණ පා තිබෙන බව අප කව්රුත් දන්නවා; රටේ මහජනතාවත් දන්නවා. එවැනි අවස්ථාවක දුප්පත් ජනතාව පිට බර පටවන්නේ නැතිව, ඒ අයට හිරිහැර කරන්නේ නැතිව මේ අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම ගැන අප සතුටු වන අතර ගරු මුදල් ඇමතිතුමාට අපේ ස්තුතිය පිරිනමනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ පුදුම දේවල් සිදු වී තිබෙනවා. මේ මාක්ස්වාදී සහෝදර මහත්වරුන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයට සම්බන්ධ වන්නට පෙර, මේ රටේ ඩහදිය මහන්සියෙන් වැඩ කරන ජනතාවට නොයෙක් අමාරුකම්වලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවාය, ජීවන වියදම ඉහළ නැග තිබෙනවාය, ඒ නිසා මාසයකට රුපියල් තිහක් වැඩි කරන්නට ඕනෑය කියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයෙන්—සිරිමාවෝ බණ්ඩාරනායක රජයෙන්—ඉතා තදින් ඉල්ලා සිටි බව අප කාටත් තවම අමතක වුනේ නැහැ. එහෙත් ඒ අය ආණ්ඩුවට සම්බන්ධ වුණාට පසු—යටියන්තොට මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමතිකම භාර ගත් පසු—ඩහදිය මහන්සියෙන් වැඩ කරන ජනතාව කෙරෙහි තිබුණු ඒ අනුකම්පාව කොහේ ගියාද දන්නෙ නැහැ. මාස කීපයකට පෙර සාධාරණ හැටියට පෙන්වා ඉදිරිපත් කළ ඒ ඉල්ලීම් අසාධාරණ ඒවා හැටියට පෙනී ගොස් ඒවා අමතක කළා. ගරු සභාපතිතුමනි, මහජන මන්ත්‍රීවරුන් හැටියට අප දන්නවා, රටේ මහජනතාවට මුහුණ පාන්නට සිදු වී තිබෙන අමාරුකම් පිළිබඳව. ඒ ගැන කල්පනා කරන විට අප නැවත වරක් මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, රට මුහුණ පා තිබෙන අමාරුකම් මධ්‍යයේ රජයේ සේවයේ යෙදී සිටින, යුද හමුදාවේ, නාවික හමුදාවේ, ගුවන් හමුදාවේ සේවයේ යෙදී සිටින, රුපියල් සියයට අඩු මාසික වැටුප් ලබන උදවියගේ වැටුප රුපියල් විස්සකිනුත් රුපියල් තුන් සියයට අඩු මාසික වැටුප් ලබන උදවියගේ වැටුප රුපියල් දහයකිනුත් වැඩි කර ඒ අයට සහනය සැලසීම ගැන. ඒ අතරම ගරු මුදල් ඇමතිතුමා විශ්‍රාම වැටුප් ලබන උදවියටත්, වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් ලබන උදවියටත් ඒ සහනය සැලසීම ගැන අපි ආඩම්බර වෙනවා.

ගරු මුදල් ඇමතිතුමා විසින් සුළු වේතන ලබන ජනතාවට දෙන ලද මේ දීමනාව ගැන විරුද්ධ පාර්ශ්වයෙන් කිසිම ප්‍රශංසාවක් එතුමාට ලැබුණේ නැහැ. මෙය "වැඩක් නැති වැඩක්" හැටියට මෙම ගරු සභාව තුළදීත් මින් පිටතදීත් ප්‍රකාශ කරන බව පෙනෙන්නට තිබෙනවා. සම හරුන් පුදුම අන්දමට මේ ලෝකයේ හැසිරෙනවා යයි මා මුලින් කීවේ ඒකයි. මේ අමාරු කාලයේදී මේ වගේ යෝජනාවක් ඉදිරිපත් කිරීමට විශාල ශක්තියක් තිබෙන්නට ඕනෑ. තම අයවැය ලේඛනය ගැන ලොකු විශ්වාසයක් තිබෙන්නට ඕනෑ. අයවැය ලේඛනය මගින් ඉදිරි කාලයේදී තම බලාපොරොත්තු ඉෂ්ට කර ගන්නට පුළුවන් වෙතැයි විශ්වාසයක් තිබෙන නිසා තමයි, මේ වගේ සුළු සහනයක්වත් සලසන්නට ගරු මුදල් ඇමතිතුමාට පුළුවන් වී තිබෙන්නේ.

දුප්පත් ජනතාවට පුළුවන් තරම් හිරිහැර අඩුවන අන්දමට මේ වර අයවැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන බව මා සඳහන් කළා. මේ රටේ දැනට පවතින

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමාරු තත්ත්වය මතු වුණේ ඊයේ පෙරේදා නොවෙයි. අවුරුදු කීපයක් තිස්සේම මේ තත්ත්වය ඇති වෙමින් පැවතුණා. ඇති වෙමින් පැවතුණු ඒ තත්ත්වය මඟහරවා ගැනීම සඳහා බදු අය කිරීමට එදා ක්‍රියා කළ හැටි තමුන්නාන්සේට මතක ඇති. ශත තුනක්ව තිබුණු තැපැල් පත ශත පහක් කළා; ගිනි පෙට්ටියේ මිළ වැඩි කළා; සීනිවල මිළ වැඩි කළා; පිටිවල මිළ වැඩි කළා. එදා තත්ත්වය ඒකයි. එහෙත් අද අයවැය හිඟය පියවා තිබෙන ආකාරය දෙස බැලූ විට මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (ද සොයිසා සිරිවර්ධන මයා·) වැනි අයට ශෝක ප්‍රකාශ සිහිවීම පුදුමයක් නොවෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද තර්කවලට පිළිතුරු දෙන්නට ප්‍රථම පෞද්ගලික වශයෙන් මා තුළ ලොකු බලාපොරොත්තුවක් ඇති කාරණයක් ගැන මතක් කරන්නට කැමතියි. ගරු මුදල් ඇමතිතුමා තම අයවැය කථාවේදී මේ විධියට ප්‍රකාශ කළා:

"............කුඩා ආයෝජකයාට වාසි වන පරිද් දෙන් කොටස් ප්‍රාග්ධනවල හිමිකම් ව්‍යාප්තිය උනන්දු කරවීමේ ප්‍රශ්නය ගැන සොයා බැලීම සඳහා පසුගිය කාලයේ දී කමිටුවක් පත් කරන්නට යෙදුණා. එම කමිටුවේ වාර්තාව ඉදිරිපත් කර ඇති අතර එහි යෝජනා දැන් පරීක්ෂා කරනු ලබනවා.

මට මේ ගැන අසන්නට ලැබුණු ප්‍රථම අවස්ථාවේදී මගේ සිතෙහි ලොකු සතුටක් ඇති වුණා. මේ කාරණය ඉෂ්ට කර ගන්නට රජයට පුළුවන් වුවහොත් අපේ රටටත් අපේ ජනතාවටත් විශාල සෙතක් ශාන්තියක් ප්‍රයෝජනයක් ඇති වන නිසයි, මට ඒ විධියේ සතුටක් ඇති වුණේ:

මේ කරුණ සම්බන්ධව අපේ එක්සත් ජාතික පක්ෂයේ අදහස් ප්‍රකාශ කිරීමට තමුන්නාන්සේගේ අවසරය ඉල්ලා සිටිනවා.

"එක්සත් ජාතික පක්ෂය: ප්‍රතිපත්ති ප්‍රකාශනය; 1963 සැප්තැම්බර් 28 හා 29 කළුතර පැවැත්වෙන මහා සම්මේලනයට ඉදිරිපත් කෙරෙන කෙටුම් පතයි.

ආයෝජන අරමුදල්:

ප්‍රජාතන්ත්‍ර සමාජවාදය පිළිබඳ අපේ මතයට අනුකූල වන පරිදි ලාංකික ජාතීන් අතර කාර්මික, කෘෂිකාර්මික හා වානිජ දේපළවල අයිතිය පලදායක ලෙස පැතිරීම හා සුළු ආයෝජකයාට ආර්ථික සංවර්ධනයේ නියම ප්‍රතිඵල ලබා ගන්නට සලස්වන අතර ඔහුගේ ආරක්ෂාව සැලසෙන සේ අණපනත් පනවා ආයෝජන අරමුදල් පිහිටුවීමද කරනු ඇත.

ආයෝජන සහතික භාරයන් පිළිබඳ පෞද්ගලික අයිතිකම් සීමාසහිත කරන අතර ආයෝජන අරමුදල් යෙදූ ආර්ථික ව්‍යාපාරයන් නිසි පරිදි ප්‍රජාතන්ත්‍රමය පාලනයකට යටත් කරනු ලැබේ. ඒ ඒ ඒකක වල තැපැල් කන්තෝරු වැනි ආයතනවලින් ආයෝජන සහතික සුළු ආයෝජකයන්ට ලබාගැනීමට හැකි තරම් පුළුල් ක්‍රියා මාර්ගයක් ඇති කරනු ඇත.

මේ යෝජනාවලින් බලාපොරොත්තු වන නිෂ්පාදන මාර්ගවල අයිතිය පුළුල්වීම නිසා මේ රටේ හැම ව්‍යාපාරයකම ජනයා අතර සීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් දියුණු වනු නියතය. රජය හා පෞද්ගලික ව්‍යාපාර මගින් පාලනය වන සමහර ආර්ථික ආයතන වෙනුවට ඒවායේ අයිතිය පොදු ජනතාවට හිමිවීමෙන් සම්පූර්ණ ආර්ථික පාලනය ප්‍රජාතන්ත්‍රමය වූ හිමිකමකට පත්වනු නියතය."

එයම ඉංග්‍රීසියෙන් කියන්නේ මේ විධියටයි:

"INVESTMENT TRUSTS

In consonance with our concept of Democratic Socialism, we will give consideration to the methods for effectively spreading the ownership of industrial agricultural and commercial property widely among Ceylon nationals. We will set up institutions such as Investment Trusts, within a framework of legislation designed to afford the maximum possible protection to the small investor, while giving him an appreciable return on investments, and a real share in the economic growth of the Nation.

Individual holdings of Trust Investment Certificates will be limited, and democratic control will be ensured of enterprises in which Investment Trust Funds are employed. Trust Investment Certificates will be made widely available through such institutions as Post Offices, in units within the reach of the smaller investor.

The wide diffusion of the ownership of the means of production, envisaged by these proposals, should ensure enthusiastic participation in the economic development of the country, by all sections of the people. The control of certain sections of the economy by State and Private monopolies, will progressively give place to truly democratic ownership and control of the entire economy."

ඒ කියවන්නට යෙදුණේ 1963 වර්ෂයේ තිබුණු එක්සත් ජාතික පක්ෂයේ සම්මේලනයේදී යෝජනා කර ස්ථිර කර ගෙන බාරගනු ලැබූ ප්‍රතිපත්තියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේත් නොයෙකුත් ව්‍යාපාරවල හිමිකම් ඇති කෙනෙක්. එවැනි ව්‍යාපාර ඇතිව යම් දියුණුවක් ඇති කර ගත් සුළු පිරිසක් ලංකාවේ සිටිනවා. විශාල ධනපතීන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

නැහැ. යම් දියුණුවක් ඇති කර ගත් ඒ සුළු පිරිසගේ ජීවිත දෙස බලා ගෙන යන විට පෙනී යන කරුණක් තමයි, ඒ ව්‍යාපාර ආරම්භ කරන විට ඒවා බොහොම සුළුවෙන් ආරම්භ කර තිබෙන බව. මේ රටේ තිබෙන ලොකු කොම්පැනිවල අද ලාංකිකයන්ගෙන් සුළු පිරිසක් සිටිනවා. එහි ඉතිහාසය දෙස බලාගෙන ගියොත් ඒවා ආරම්භ කර ඇත්තේ බොහොම සුළු වෙන් පටන්ගෙන බව පෙනී යනවා. බොහොම සුළුවෙන් පටන්ගත් උදවියයි ඒවා දියුණු කරගෙන ඔය තත්ත්වයට ගෙනැවිත් තිබෙන්නේ. ක්‍රමක්‍රමයෙන් ඒ උදවිය එම ආයතන දියුණු කරන්නට පටන් ගත්තා. මහන්සි වී කටයුතු කළ නිසා තමයි, ඒ මගින් අවුරුදු පතා යම් කිසි ලාභයක් ලබා ගත්තේ. එසේ ලබා ගන්නා ලද ලාභය නැවත නැවතත් එම ව්‍යාපාරවලට යොදවා කටයුතු කිරීම නිසා ක්‍රමක්‍රමයෙන් දියුණුව කරා ගමන් කර තිබෙනවා.

අද අප රටේ සංවර්ධන වැඩ රාශියක් කරන්නට තිබෙනවා. ඒ සඳහා සංයුක්ත මණ්ඩල රාශියක් ඇති කිරීමට මෙම රජය බලාපොරොත්තු වෙනවා. අපේ කෘෂිකර්ම ඇමතිතුමා ඒ පිළිබඳව පසුව විස්තර කරනවා ඇති. කුමන කුමන අන්දමේ අළුත් වැඩ පොළවල් මේ රටේ ආරම්භ කරන්නට බලාපොරොත්තු වෙනවාද කියන කාරණය එතුමාගෙන් දැන ගන්නට ලැබෙනවා ඇති. මෙවැනි සැලැස්ම වල් ක්‍රියාවේ යෙදවීම සඳහා අපට මුදල් වුවමනා කරනවා. ඒ මුදල් ලබා ගැනීමට සුදුසු මාර්ග වුවමනා කරනවා. මෙම ව්‍යාපාර පවත්වා ගෙන යාම සඳහා විදේශ රට වලින් මුදල් ලබා ගැනීමට අප සිතනවා. අවුරුද්දකට වතාවක් මෙම සභා ගර්භයට අවුත් සෑම දෙනාම වාගේ චෝදනා කරන්නේ, විශේෂයෙන් පුද්ගලික අංශය වයි. "උඹලාට මෙතරම් වරප්‍රසාද දී තිබෙන නමුත් ඒවායින් කිසිම ප්‍රයෝජන යක් ලබා දී නැහැ; කර්මාන්ත යනාදිය ඇති කර නැහැ" යන කතාවයි කියන්නේ. එසේ සිදු වන්නට එක් හේතුවක් තිබෙනවා. මේ රටේ මුදල් තිබෙන උදවිය සිටින්නේ සුළු ප්‍රමාණයයි. ඒ සුළු පිරිසත් යම්යම් කර්මාන්තවල යෙදී සිටිනවා. ඒ ඒ උදවියගේ පියවරුන් නැතිනම් මුතුන් මිත්තන් විසින් ආරම්භ කරන ලද යම් යම් කර්මාන්ත දියුණු කරමින් ඒවාගේ කටයුතු කෙරෙහි ඇස් යොමු කරගෙනයි, ඔවුන් බොහෝ දෙනා කාලය ගත කරන් නේ. එම නිසා අළුත් කර්මාන්ත ආරම්භ කරන්නට එවැනි පුද්ගලයන්ට මුදල් ඇත්තේ නැහැ.

අපි පිටරටවලින් ආධාර ලබා ගැනීමට කල්පනා කරනවා. මේ අවස්ථාවේ අප රටේ පවතින මුදල් තත්ත්වයේ හැටියට පිටරටින් ආධාර ලබා ගැනීම අවශ්‍යයි. එහෙත් එය අපට එතරම් සන්තෝෂ වන් නට හැකි කාරණයක් නොවෙයි. මේ අව දානම් අවස්ථාවේදී වෙන කරන්නට දෙයක් නොමැති නිසා තාවකාලික ප්‍රති කර්මයක් හැටියට අප පිටරටවලින් ආධාර ලබා ගන්නවා. අප "Aid" යනු වෙන් එය නම් කරනවා. එසේ නම් තැබීම වැරදියි. අපට දෙන්නේ ණය මුදලක්. අපට දෙන්නේ තෑග්ගක් එහෙම නො වෙයි. පොලියක් අය නොකර එංගලන්ත යෙන් අපට ණය මුදල් දී තිබෙන නිසා එංගලන්තයට අපි ස්තුතිවන්ත වෙනවා. ඒවාත් ආපසු ගෙවන්නට අපට සිදු වෙනවා. තවත් රටවලින් අප පොලී සහිත ණය ලබාගෙන තිබෙනවා. ඒවාත් ආපසු ගෙවන්නට ඕනෑ. දැන් සිටින සෞඛ්‍ය ඇමතිතුමා හොඳ පළපුරුද්දක් තිබෙන හිටපු මුදල් ඇමතිවරයෙක්. පිටරටවලින් සියයට 5 සියයට 6 ගෙවා මුදල් ලබාගෙන ආරම්භ කරන ව්‍යාපාරවලින් අන්තිමට ලාභය වශයෙන් ලැබෙන්නේ සියයට .5ක පමණ ප්‍රමාණයක්ය යන හැඟීම ඇතිවන අන්දමේ ප්‍රකාශයක් එතුමා විසින් කරන් නට යෙදුණා. එතුමාගේ ගණන්හිලව් හරිද නැද්ද කියන්නට මා දන්නේ නැහැ. සිය යට 5 වුවත් ඊට සුළු ප්‍රමාණයක් වැඩි වුවත් පිටරටවලින් පොලියට මුදල් ලබා ගෙන මේ කර්මාන්ත දියුණු කිරීම ගැන අප සන්තෝෂයට පත් වෙනවා නම්, එයින් අපමයි රැවටෙන්නේ. අවස්ථාවේ හැටියට මේවා ආරම්භ කරන්ට මුදල් ටිකක් අවශ්‍ය වුණත් ඒවා කෙරේම විශ්වාසය තබාගෙන සිටීම වැරදියි. අපට මුදල් අවශ්‍යයි. එහෙම නම් කොහොමද අපි මුදල් හොයන්නෙ? මේ රටේ තමන් ගේම ව්‍යාපාරවල යෙදී සිටින ව්‍යාපාරික යන් පිරිසක් සිටිනව. ඒ අය ළඟත් වැඩි පුර මුදල් නැහැ. ඒ අය කල්පනා කරන්නෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමන්ගේ කර්මාන්තය දියුණු කර ගන්නේ කොහොමද කියායි. මගේ හැඟීමේ හැටියට,—මා ගණන් බලා නැහැ —මාසයකට රුපියල් 1,000 වත් 1,500ටත් අතර මාසික ආදායමක් ලබන උදවිය 4,000 කට 5,000 කට වැඩිය ලංකාවේ නැහැ. මේ රටේ වැඩි වශයෙන් සිටින කම්කරු මහත්වරු සහ ගොවි මහත්වරු ළඟත් විශාල මුදල් නැහැ. සමහර විට මාසයකට රුපියල් 5 ක් 10 ක් ඉතිරි කිරීමට වැඩ පිළිවෙළක් සකස් කර දී කල් යාමේදී ඔවුනට ඒ මගින් විශාල ප්‍රයෝජන යක් ලබා ගන්ට පුළුවන් බව තේරුම් කර දුන්නොත් කම්කරු සහ ගොවි මහත් වරුන් විශාල පිරිසක් මේ රුපියල් 5 හෝ 10 ඉතිරි කිරීමට ඉදිරිපත් වෙන්න බැරිය කියා හිතන්න අමාරුයි.

පසුගිය අවුරුද්දට වඩා මේ වර්ෂයේ තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුවේ මහජනයා මුදල් තැන්පත් කර තිබෙන බව මුදල් ඇමතිතුමා අයවැය කථාවේදී සඳහන් කළා. ගරු සභාපතිතුමනි, කර්මාන්තශාලාවක වැඩ කරන මහත්ම යෙක් මාසෙ අන්තිමට පඩි ලබාගෙන එයින් රුපියල් 5 ක් තැන්පත් කරන්න තැපැල් කන්තෝරුවක් හොයාගෙන යයි කියා හිතන්න පුළුවන්ද? එවැනි අයට මුදල් ඉතිරි කිරීමට පහසු වැඩ පිළිවෙළක් තවම යෙදී නැහැ. එම නිසා ඒ මහත් වරුන් සමහරවිට ඉතුරු කරන්ට පුළුවන් මුදල් නාස්ති කරනව. පඩි ලැබෙන දවස් වල ප්‍රීතිවීම වරදක්ය කියනව නොවෙයි— මා කියන දේවල් වැරදියට තේරුම් ගන්න එපා—සමහරවිට පඩි ගත්තාම, මත්පැන් වලට, වුවමනා නැති ඇඳුම්, නයිලෝන් ෂර්ට්, ආදියට ඒ මුදල් වැය කරනව. ලස්සණ කමිසයක් අඳින්න කවුරුත් කැම තියි. එහෙත් මුදල් ඉතිරි කිරීමේ ක්‍රමයක් මේ අයට සකස් කර දෙනවා නම් අපේ ජනතාව එයින් ප්‍රයෝජන ලබනවා ඇති. ඒ විධියේ වැඩ පිළිවෙළක් මගින් මාසය කට රුපියල් පන් ලක්ෂයක්වත් ඉතිරි කර ගන්ට පුළුවන් වුණොත් අපට අවු රුද්දකදී කොයි තරම් විශාල මුදලක් ඉතිරි කර ගන්ට පුළුවන් වෙයිද? එයින් මේ රටේ දියුණුව සඳහා කොපමණ ප්‍රයෝජන යක් ලබා ගන්න පුළුවන්ද? එමෙන්ම මුදල් තැන්පත් කරන පුද්ගලයන්ටත් ලාභයක් ලබා ගත හැකි වන අන්දමට

ආයෝජන මණ්ඩලයක් හෙවත් "ඉන් වෙස්මන්ට් ට්‍රස්ට්" කියන ආයතනයක් පිහිටුවා ඊට තේරුම් ඇති මිනිසුන් පිරි සක් යෙදෙව්වොත් මුදල් තැන්පත් කරන පුද්ගලයන්ට තැපැල් කන්තෝරු සේවිංස් බැංකුවෙන් ලැබෙනවාට වඩා විශාල ආදා යමක් මේ මාර්ගයෙන් ලබා ගන්ට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. "ෂෙයාර්ස්" ගැනීම වැනි ව්‍යාපාරවලටී අද පුරුදු වී සිටින්නේ මේ රටේ ජනතාව ගෙන් ඉතාම සුළු පිරිසක් පමණයි. බොහෝ දෙනා ඒවා ගැන දන්නේවත් නැහැ. ඒවාට සම්බන්ධ වී සිටින අය පවා බොහෝ දෙනකු එයින් ලැබෙන මුදල් ප්‍රයෝජනයක් ලැබෙන කටයුතුවල නො යොදා නාස්ති වන්නට ඉඩ හරිනවා. මා මෙසේ කෙටියෙන් ප්‍රකාශ කෙළේ මගේ අදහස් ස්වල්පයක් පමණයි. ගරු මුදල් ඇමතිතුමා විසින් පත් කරන්නට තීරණය කර තිබෙන කොමිටිය ගැන මා ඉතාමත් සන්තෝෂ වෙනවා. මෙවැනි ව්‍යාපාරයක් ඇති කිරීමෙන් මේ රටේ හැම දෙනාම කිසියම් කර්මාන්තයක හෝ ව්‍යාපාරයක හෝ අයිතියක් ඇති කෙනකු වීම ඔවුන්ට විශාල සේවයක්. උදාහරණයක් වශයෙන් අපි ලංගමය ගනිමු. එවැනි ආයතනයක වැඩ කරන කම්කරු ජනතාවට සුළු මුදලක් ගෙවා එහිම කොටස් ගන්නට පුළුවන් කමක් ඇති වුණොත් එම සේවකයන් එය තමන්ගේම ව්‍යාපාරයක් හැටියට සල කන්නට පටන් ගන්නවා. එහෙම වුණොත් ඔවුන් ඒ ව්‍යාපාරය ගැන කොයිතරම් හැඟී මක් ආදරයක් ඇතිව වැඩ කරයිද? ටිකට් නැතිව බස්වල යන අය ගැනත්, බස්වල ආසන කපා දමන අය ගැනත් අපට නොයෙක් විට අසන්නට ලැබෙනවා. එහෙත්, ඒවායෙහි වැඩ කරන ජනතාවට එහි කොටස් හිමිවී එය ඔවුන්ගේම ව්‍යාපාර යක් බවට පත් වුණොත් අර කී විධියේ වැරදි වැඩ සිදු වන්නට පුළුවන් කමක් නැහැ.

එපමණක් නොවෙයි. යම් ආයතනයක වැඩ කරන කාන්තාවකට මේ විධියේ කොටස් ලබා ගැනීමේ අවස්ථාවක් ලැබු ණොත් හදිසියේ ඇගේ ස්වාමි පුරුෂයා නැති වුණු අවස්ථාවකදී ඒ කාන්තාවට එයින් ලැබෙන සහනය කොයි තරම්ද? මේ ආදී කරුණු ගැන තවදුරටත් හොඳහැටි කල්පනා කර බලා පුළුවන්කමක් තිබේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org
3058

[ජයසූරිය මයා.]
නම් මේ අවුරුද්දේම මේ කටයුත්ත සම්පූර්ණ කරන්නට පියවර ගන්නා ලෙස මා මතක් කරනවා.

ගරු කර්මාන්ත ඇමතිතුමාගේ අංශය ගැන බලන විට දැන් රටේ නොයෙක් අලුත් කර්මාන්ත ඇති කරන්නට කටයුතු කරගෙන යන බව පෙනෙනවා. ඒ සඳහාත් මේ මුදල් පාවිච්චි කරන්නට පුළුවන් වෙනවා ඇති. පිටරටවලට ණය නොවී, මේ රටේ ඉපයෙන මුදල් නොයෙක් කර්මාන්ත ආදියටත් සංයුක්ත මණ්ඩල වැනි ආයතනවලටත් යොදවා ඒවායේ බලය සල්ලිකාර සුළු පිරිසකට අල්ලා ගන්නට නොදී ඒවායේ කොටස් වැඩ කරන ජනතාවටත් ලබා ගත හැකි වන පිළිවෙළට පුළුල් කොට හැකි පමණ ඉක්මනින් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට පුළුවන් වෙනවා ඇති.

කර්මාන්ත ඇමතිතුමාගේ වැඩ කටයුතු ගැන අප තුළ ලොකු විශ්වාසයක් තිබෙනවා. එතුමා පසුගිය කාලය මුළුල්ලේ බොහොම නිශ්ශබ්දව කටයුතු කරගෙන ගියා. මීට කලින් අවස්ථාවකදීත් එතුමා මේ විධියටම නිශ්ශබ්දව ඉඳලා එක පාරටම ගෙනා කුඹුරු පනතින් රටේ බොහෝ අඳ ගොවීන්ට විශාල යහපතක් සිදු වුණු හැටි අපට මතකයි. දැනුත් එතුමා ඒ විධියටම නිශ්ශබ්දව සිටියත් තව මාස දෙකක් තුනක් යන විට එතුමාගේ කටයුතු විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට දකින්නට ලැබුණු විට එතුමන්ලා පුදුම වෙනවා ඇති.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මුදල් ඇමතිතුමා තම අයවැය ලේඛන කථාවේ මේ විධියට සඳහන් කර තිබෙනවා :

"The response to the Government's statement of policy regarding private foreign investment has been encouraging. About 22 projects involving both foreign technical and capital collaboration with local investors have been granted approval."—[OFFICIAL REPORT, 25th July 1967; Vol. 73, c. 41.]

විදේශික ආධාරත් ඇතිව කර්මාන්ත 22ක් ආරම්භ කරන්නට අනුමතිය දී තිබෙනවා. දැනට පවත්නා විදේශ විනිමය අපහසුකම් හේතු කොට ගෙන 1963 හි නොවැම්බර් මාසයේ සිට අළුත් ආයෝජන අනුමත කරන්නට හෝ කාර්මික ව්‍යාපාර පුළුල් කරන්නට හෝ නුපුළුවන් වූ බව ඊළඟ වාක්‍යයේ සඳහන් වෙනවා. පසුගිය රජය කර්මාන්ත හාරසිය ගණනක් ආරම්භ කළාය යන කථාව අපට නිතරම අසන්නට සිද්ධ වෙනවා. කර්මාන්ත හාරසිය ගණනක්ම ආරම්භ කළාය කියා මා කල්පනා කරන්නේ නැහැ. එහෙත් ඒ ඇරඹූ කර්මාන්ත ගැන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයට බැදී අවසාන වරට එහි මුදල් ඇමති වශයෙන් කටයුතු කළ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මොනවද කියා තිබෙන්නෙ? ඒ ඇරඹූ කර්මාන්ත වැඩි හරියක් සීනි බෝල කර්මාන්තය, නියම ලෙස කල්පනා නොකර ඒවා ආරම්භ කර තිබෙනවාය, කියා එතුමා ප්‍රකාශ කර තිබෙනවා. ඒ කර්මාන්ත බොහොමයකගෙන් මුදල් නාස්ති වීමක් වුණා හැර වෙන වැඩක් නොවුණාය කියා එතුමා ප්‍රකාශ කර තිබෙනවා. මමත් ඒ අදහස් අනුමත කරනවා.

මා පමණක් නොවෙයි, මේවා ගැන මටත් වඩා කරුණු දන්න මහත්වරුනුත් එය අනුමත කර තිබෙනවා. ටේලර් කොමිෂන් සභා වාර්තාව ගැන තමුන්නාන්සේලා දන්නවා ඇති. 1965ට පෙර ආරම්භ කළ නොයෙක් කර්මාන්ත නියම අන්දමට, ලාභ ගන්නට පුළුවන් වන අන්දමට සකස් වී නැත, ඒවායේ අඩුපාඩුකම් රාශියක් තිබෙනවාය කියා ටේලර් කොමිෂන් සභා වාර්තාවේ සඳහන් වෙනවා. එම නිසා අපේ වර්තමාන කර්මාන්ත ඇමතිතුමාට මේ අමාත්‍යාංශයේ වැඩ භාර ගත්තාට පසු, පළමුවෙන්ම අළුත් කර්මාන්ත ආරම්භ කරන්නට ප්‍රථමයෙන්, මුදල් යොදවා තිබුණු ඒ කර්මාන්තවල අඩුපාඩුකම් සපුරාලන්නටත් ඒවා හරි මාර්ගයට ගෙන එන්නටත් කටයුතු කරන්නට සිද්ධ වුණා. පළමුවෙන් තිබුණු අන්දමටම ඒ කර්මාන්ත ගෙන යන්නට ඉඩ දුන්නා නම් ඇත්ත වශයෙන්ම මේ රට බංකොලොත් තත්ත්වයකට පත් වන බව මේ කොමිෂන් සභා වාර්තාවෙන් පෙනෙනවා. ගරු කර්මාන්ත ඇමතිතුමාට අවුරුදු දෙකක කාලයක් ඒ සඳහා ගත කරන්නට සිද්ධ වුණා.

අධ්‍යාපන ඇමතිතුමාටත් එවැනි දෙයක් සිද්ධ වුණා. අප බලයට පත් වන විට අධ්‍යාපන දෙපාර්තමේන්තුව කුමන තත්ත්වයකින්ද තිබුණේ? එය ආණ්ඩුවේ කාර්යාලයක්ද නැත්නම් වෙන එකක්ද කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තෝරා ගන්නවත් බැරි තත්ත්වයක් තිබුණේ. ඒ විධියෙ දූවැද්දකුයි 1965 මාර්තු මාසයේදී අපට භාර ගන්නට සිද්ධ වුණේ.

"The National Government, however, has since granted approval for sixty new industrial undertakings by local investors"—[OFFICIAL REPORT, 25th July 1967; Vol. 73, c.41.]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විදේශීය ආධාර ඇතිව අළුත් කර්මාන්ත 22ක් සඳහා අනුමතිය දී තිබෙන බව මා කලින් සඳහන් කළා. ඊළඟට මේ රටේ මුදල් යොදවන කාර්මිකයන්ට කර්මාන්ත 60ක් ආරම්භ කිරීම සඳහා අප අනුමතිය දී තිබෙනවා. ඒ සමඟම රජයෙ සංයුක්ත මණ්ඩල මගින් තවත් කර්මාන්ත රාශියක් පිළියෙල කර තිබෙනවා. ලොරිවලට හා ට්‍රක්වලට චැසි ගැසී මේ වැඩ පොළක් ඇති කිරීම අනුමත කර තිබෙනවා. ඒ පිළිබඳ කටයුතු ඉතා ඉක්මණින් කරනවා.

"Work will also comence on a Paper Board Mill. . . "—[OFFICIAL REPORT, 25th July 1967; Vol. 73, c. 41.]

සන කඩදාසි පැක්ටරියක් ඇති කිරීමත් අනුමත වී තිබෙනවා. "Cast iron Foundry" එකේ වැඩ පටන් ගෙන තිබෙනවා. ඒ වගේම තුනී ලැලි කර්මාන්ත ශාලාව වැනි අළුත් කර්මාන්ත රාශියක් මේ රජය පටන්ගෙන තිබෙනවා.

ජාතික රජය බලයට පත් වන්නට කලින් සිමෙන්ති කර්මාන්තය ඇරඹී තිබුණා. සමහර ගරු මන්ත්‍රීවරුන් හිතන හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩු කරන කාලයේ නොවෙයි, මුල්ම සිමෙන්ති කර්මාන්ත ශාලාව ඇති වුණේ. පුත්තලම, ගාල්ල ආදි ප්‍රදේශවල එම සිමෙන්ති නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ කටයුතු අරඹා තිබෙනවා.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

සිමෙන්ති නිෂ්පාදනය තුන් ගුණයකින් වැඩි කිරීමට කටයුතු කරගෙන යනවා.

**ජයසූරිය මයා.**
(திரு. ஜயசூரிய)
(Mr. Jayasuriya)

පාර්ලිමේන්තු ලේකම්තුමා කියනවා, සිමෙන්ති නිෂ්පාදනය තුන් ගුණයකින් වැඩි කිරීමට කටයුතු කර තිබෙනවාය කියා. වැඩ රාශියක් කළායයි මා කියන්නේ නැහැ. අපට පුළුවන් තරමින්, සාධාරණ අන්දමට කර්මාන්ත අංශයෙන් සෑහෙන වැඩ කොටසක් මේ රජය කර තිබෙනවා.

විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් නිතරම සඳහන් කරන දෙයක් තමයි, රැකීරක්ෂා ප්‍රශ්නය. ඒ සම්බන්ධයෙන් ඒ ගරු මන්ත්‍රීතුමන්ලා නොයෙක් කරුණු ඉදිරිපත් කරනවා. රැකීරක්ෂා ප්‍රශ්නය අද උග්‍ර වීගෙන එනවා. රැකීරක්ෂා නොමැතියවුන් වශයෙන් අද 4,00,000ක් පමණ රැකීරක්ෂා කාර්යාලවල ලියාපදිංචි වී සිටිනවා. එහෙත් ඒ ගරු මන්ත්‍රීවරුන් කියන්නේ නැහැ, මේ කාලය තුළ කොයි තරම් ප්‍රමාණයකට රැකීරක්ෂා සපයා දී තිබෙනවාද කියා. රැකීරක්ෂා නැතියවුන් වශයෙන් ලියාපදිංචිවී සිටින සංඛ්‍යාව පමණයි, ඔවුන් සඳහන් කරන්නේ. අවුරුද්දකට කොයි තරම් සංඛ්‍යාවකට මේ ආණ්ඩුව රක්ෂා සපයා තිබෙනවාද කියා ඒ අය කියන්නේ නැහැ. 1966 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා මේ රජය රක්ෂා සපයා දී තිබෙන ප්‍රමාණය සුළු වශයෙන් හොයා ගන්නට මට පුළුවන් වුණා. මුළු ලංකාවේම නොවෙයි, කොළඹ ප්‍රධාන රැකීරක්ෂා කාර්යාලයෙන් පමණක් ගිය අවුරුද්ද තුළ 28,000කට රක්ෂා සපයා දී තිබෙනවා. මා ඒ මහතුන්ගෙන් ඇහුවා, "පසුගිය ආණ්ඩු කාලයේ අවුරුද්දකට කොපමණ සංඛ්‍යාවකට රක්ෂා සැපයුවාද?" කියා. "4,000කට 5,000 කට වඩා නැහැ" කියා පිළිතුරු දුන්නා. තත්ත්වය, ඕකයි.

රැකීරක්ෂා සඳහා වැඩියෙන් ලියාපදිංචි වන බව ඇත්තයි. එයට හේතුව මොකක්ද? අප එයත් කල්පනාකර බලන්නට ඕනෑ. දේශපාලනඥයන් වශයෙන් පක්ෂ භජනයෙන් යුතුව විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කල්පනා නොකරතැයි මා විශ්වාස කරනවා. එසේ වැඩි වැඩියෙන් අවුරුදුපතා රැකීරක්ෂා කාර්යාලවල ලියාපදිංචි වන්නේ මොන හේතුවක් නිසාද කියාත් අප දැන ගත යුතුයි. අවුරුදුපතාම මේ රටේ ජනගහණය සීග්‍රයෙන් වැඩි වෙනවා. නිදහස් අධ්‍යාපනය නිසා විභාග වලින් සමත් වී පාඨශාලාවලින් පිට වන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

ලක්ෂ සංඛ්‍යාත තරුණ පිරිස් රැකීරක්ෂා හොයාගෙන එනවා. මේ ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව මෙසේ අවුරුද්දකට 28,000 කට පමණ රක්ෂා දුන් බව නැම තැනම ආරංචි වුණා. ඒ ආරංචිය ගම් නියම් ගම්වල පැතුරුණා. "අසුවල් තැන රක්ෂා දෙනවා, අසුවල් ගණනකට රක්ෂා ලැබුණා" යන ආරංචිය උඩ වෙනදාට වඩා විශාල පිරිසක් රක්ෂා ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් රැකීරක්ෂා කාර්යාලවල ලියාපදිංචි වෙනවා.

පසුගිය කාලවල අපේ ගම්වල කාන්තාවන්—ගැහැණු ළමයින්—රැකීරක්ෂාවල් සොයා ගියේ නැහැ. ඉස්කෝලේ ගිහිල්ලා ඉවර වුණාම ගම්බද ගැහැණු ළමයින් බොහෝ දෙනෙක් ගෙදර නතර වුණා. එහෙත් දැන් ජ්‍යෙෂ්ඨ විභාගයෙන් හෝ ඒ හා සමාන වෙනත් විභාගයකින් සමර්ථ වන ගැහැණු ළමයින්ගෙන් වැඩි දෙනා රැකීරක්ෂාවල් බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා ළඟම තිබෙන රැකීරක්ෂා කාර්යාලයේ තමන්ගේ නම ලියාපදිංචි කරවා ගන්නවා. වෙනදා එහෙම තත්ත්වයක් තිබුණේ නැහැ. කාන්තාවන් රක්ෂාවල් සඳහා ලියාපදිංචි වීමේ පුරුද්දක් මේ රටේ මීට පෙර මේ තරම් තිබුණේ නැහැ. රැකීරක්ෂා ප්‍රශ්නය ගැන කල්පනා කරන විට කී දෙනෙක් රැකීරක්ෂාවල් බලාපොරොත්තුවෙන් තමන්ගේ නම් ලියාපදිංචි කරවා ගෙන සිටිත්දැයි සොයා බලනු මිස එයින් කී දෙනකුට රැකීරක්ෂා ලබා ගන්නට පුළුවන් වී දැයි සොයා බලන්නේ නැහැ. කරුණා කර ඒ ගැනත් කල්පනා කරන් නැයි මා මතක් කරනවා. රටේ ජනගහනය සීඝ්‍ර ලෙස වැඩි වේගන යන බවත් ඒ සමගම කල්පනා කරන්නට ඕනෑ.

රක්ෂාවන් සඳහා පුද්ගලයන් තෝරා ගැනීමේදී රටේ පාලක පක්ෂයට ලොකු අමාරුවකට මුහුණ දෙන්නට සිදු වෙනවා. අපේ කාලය තුළ පමණක් ඇති වූ දෙයක් ගැන නොවෙයි මා සඳහන් කරන්නේ. විරුද්ධ පාර්ශ්වයේ දැන් සිටින තමුන්නාන්සේලා මේ රටේ ආණ්ඩු බලයේ සිටිද්දීත් ඒ තත්ත්වය තිබුණා. මේ රටේ රැකීරක්ෂා බලාපොරොත්තුවෙන් සිටින් නන්ගෙන් බොහෝ දෙනෙක් රැකියාවකට පළපුරුද්දක් ලත් අය නොවීමයි ඒ අමාරුවට හේතුව. වැඩි දෙනා නුපුහුණු කම්කරු තත්ත්වයේ අයයි. ඒ අය රැකියාවකට පුහුණුවක් ලත් අය නොවෙයි. එවැන්නන් යම් කර්මාන්තායතනයකට වුවත් ඇතුළු කර ගැනීමේදී අමාරුවක් ඇති වෙනවා. ඒ අය බඳවා ගත් පසු අලුතින් පුරුදු පුහුණු කරවා ගන්නටයි සිදු වන්නේ. ඒ නිසා, හෙට බැරි වුනත් අනිද්දාවත් මේ රටේ ඇති වන ජනතාවට ප්‍රයෝජනයක් ලැබෙන වැඩ පිළිවෙළක් සංවිධානය කිරීම අවශ්‍ය බව තේරුම් ගැනීමෙනුයි ගරු අධ්‍යාපන ඇමතිතුමා අධ්‍යාපන සම්බන්ධයෙන් අලුත් ප්‍රතිපත්තියක් ඇති කළ යුතුයයි කල්පනා කළේ. ඉතාමත් ඉක්මනින් ඒ සඳහා අලුත් වැඩ පිළිවෙළක්—ක්‍රියා මාර්ගයක්—සකස් කරන්නට එතුමා බලාපොරොත්තු වන්නේ ඒ නිසයි.

ගරු කම්කරු අමාත්‍යතුමාගේ වැඩ පිළිවෙළක් අනුව පුහුණු කිරීමේ මධ්‍යස්ථාන කීපයක් ඇති කරන්නට යනවා. සමහර දේවල් විරුද්ධ පැත්තේ ඉන්න තමුන්නාන්සේලා බලයේ සිටි කාලයේදී ඇති කළ වැදගත් දේවල් බව මා පිළිගන්නවා. ඒ වැඩ පිළිවෙළ තව තවත් වේගයෙන් ගෙන යාමටයි අප ක්‍රියා කරගෙන යන්නෙ. ළමයින් වැඩට පුහුණු කරවීමේ මධ්‍යස්ථානයක් ඌරුගොඩවත්තේ තිබෙනවා. එතැන රේඩියෝ රෙපයාර් කිරීම, ඉලෙක්ට්‍රික් වැඩ කිරීම, මෝටර් රථ අලුත්වැඩියා කිරීම වැනි දේවල් පුහුණු කරනවා. ඉතා වේගයෙන් එවැනි වැඩවලට ළමයින් පුහුණු කිරීමේ වැඩ කටයුතු කරගෙන යනවා. ඉස්සර එක් වරුවක් පමණක් පැවැත්වූ මේ මධ්‍යස්ථාන දැන් දෙවරුව කර තිබෙනවා. අවුරුද්දක් ඇතුළත දහසක් පමණ ළමයින් එතැනින් පුහුණුව ලබා පිට වී යනවා. පුහුණු වූ අය අපට බෙහෙවින් අවශ්‍යයි. අපේ රටේ තිබෙන නොයෙක් වර්ගයේ කාර්මික ආයතන පාඩුවක් නැතිව පවත්වාගෙන යාමට පුහුණු වූවන් අවශ්‍යයි. ඒ අයගේ දක්ෂකම නිසා අපේ කර්මාන්තායතනවල වැඩ සාර්ථක ලෙස කරගෙන යාමට පුළුවන් වී තිබෙනවා. බාබර් වැඩටත් ළමයින් පුහුණු කරනවා. මීට පෙර ඒ වැඩ කරගෙන ගියේ පිටරටවල උදවියයි. දැන් ලාංකිකයන් පුහුණු වන නිසා ඒ අයට රක්ෂාවල් සපයා ගන්නට පුළුවන් වෙනවා. මතුවට මේ තත්ත්වය තව තවත් හොඳ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අතට හැරෙනවා. මේසන්වරුන් සහ වඩු වන් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන කලින් තිබුණේ 20 යි; දැන් ඒ ස්ථාන 40 දක්වා වැඩි කර තිබෙනවා. ඔය අන්දමට ජාතික රජයෙන් සෑහෙන වැඩ කොටසක් ඉටු වී තිබෙන බව තමුන්නාන සේලාට මතක් කරන්නට සතුටුයි. තමුන්නාන්සේලා මොනවා කිවත්, තමුන්නාන්සේලා ඇස් වසාගෙන සිටියත්, කන් වසාගෙන සිටියත්, නහය වසාගෙන සිටියත්, කොයි තරම් ශෝකය ප්‍රකාශ කළත්, ඇස් පෙනෙන, කන් ඇහෙන රටේ මහ ජනතාවට පෙනෙන්නට තිබෙනවා, රටේ ආහාර ප්‍රශ්නය විසඳීමට ජාතික රජය බොහොම උනන්දුවෙන් කටයුතු කරගෙන යන බව. ඒ උනන්දුව දෙස බලන විට තමුන්නාන් සේලා බොහෝ දෙනකුගේ සිත්වල කණගාටුවක් ඇති වන බව අප දන්නවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
කිසි කණගාටුවක් නැහැ.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
ඒ බව අහන්නත් සතුටුයි. තමුන්නාන් සේලාගේ පුරුද්ද නිසාද දන්නේ නැහැ, හැම විටම තමුන්නාන්සේලාගේ කථා වලින් ප්‍රකාශ වන්නේ මේ වැඩ පිළිවෙළ වල් කඩාකප්පල් වෙනවාය කියන එකයි. වලපනේ මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) මේ ගරු සභාවේදී කථා කරන විට කිව්වා, මුදල් ඇමතුමා බොරු කියනවාය, ගුවන් විදුලියෙන් බොරු කියනවාය කියා. වලපනේ මන්ත්‍රීතුමාගේ කථාව අගෝස්තු 2 වැනිදා හැන්සාඩ් වාර්තාවේ 232 සහ 233 තීරුවල මේ විධියට වාර්තාගත වී තිබෙනවා:

"...මේ රජයේ මුදල් ඇමතිතුමාත් ගුවන් විදුලි අංශයත් කියන්නේ අසත්‍යයක් යයි අපට කියන්න සිද්ධ වී තිබෙනවා; බොරුවක් යයි අපට කියන්න සිද්ධ වී තිබෙනවා.

අපි මෙහි ඇති එක එක කරුණ වෙන වෙනම ගනිමු. වී ගොවිතැන ගැන කියා තිබෙනවා.

අයවැය කථාවේ 28 වෙනි පිටුවේ මුදල් ඇමතිතුමා මෙසේ කියනවා:

"'මෙහි වැදගත් ලක්ෂණය වනුයේ, මේ කාලය තුළදී, සාමාන්‍ය වී අස්වැන්නෙහි ඇති වුණු වැඩි වීමයි.'"

කොහේද මුදල් ඇමතිතුමා බොරුවක් කියා තිබෙන්නේ? මේ කාලයේ දී යන් නෙන් එතුමා කියන්නේ 1966-67 අවු රුද්ද පිළිබඳවයි. කලින් අවුරුද්දේ අස් වැන්නට වඩා ඒ අවුරුද්දේ අස්වැන්න වැඩි වී තිබෙන බවයි එතුමා කියා තිබෙන්නේ. ඒක බොරුවක්ද? සම්පූර්ණ සත්‍යයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මේ විධියේ වචන පාවිච්චි කරන නෝ මහජනතාව මුළා කර ගොවිතැන සඳහා දැනට තිබෙන උනන්දුව නැති කිරීමට බවයි, අපට පිළිගැනීමට තිබෙන්නේ. කොයි තරම් හොඳ වැඩක් කරන්නට ගියත් සුළු සුළු අඩුපාඩු තිබෙන්නට පුළුවන්. රට අවදානම් තත්ත්වයකට මුහුණ පා තිබෙන මෙවැනි අවස්ථාවක දී ඒ විධියේ සුළු සුළු අඩුපාඩුකම් වසා ගෙන රට හදා ගැනීමට සියළු දෙනාම මහන්සි වන්නට ඕනෑ. එසේ කළ යුතුව තිබෙන අවස්ථාවක මේ විධියේ දේවල් කීම ඇත්තෙන්ම ඉතාමත් කණගාටුදායක දෙයක්. වලපනේ මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා, වී බුසලකට රුපියල් 12 ක් ගෙව්වේත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජයෙන්ය කියා. බොරු කිව්වේ ඒ අයයි. කව්ද ඇත්ත කියන්නේ කියා මහජනයා දැනගනීවි. ඒ අනුව මහජනයාට ඒ ඒ පක්ෂවල උදවිය මැණ ගන්නට පුළුවන් වෙනවා ඇති. එබැවින් අප ඒ ගැන ඊට වඩා කථා කරන්නේ නැහැ. වී බුසලට රුපියල් 12 ක් ගොවීන්ට දුන්නේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව මේ රට පාලනය කරන කාලයේදියි.

වලපනේ මන්ත්‍රීතුමාගේ කථාවේදී ඒ විධියේ තවත් දේ කියා තිබෙනවා. ඒවා ඒ තරම් වැදගත් දේවල් නොවෙයි. කොලොන්නාවේ මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංග රත්න මයා.) අද ජීවන වියදම පිළිබඳ ප්‍රශ්නය බරපතළ දෙයක් හැටියට පෙන්වා තිබෙනවා. අද ජීවන වියදම මණින විධිය හරි නැතිලු. හරි විධියට මණිනවා නම් අද ජීවන අංකය එකසිය දහ හතරකුත් දශම ගණනක් නොව එකසිය විස්සක් පමණ විය යුතුලු. දැනට ජීවන වියදම මණින්නේ 1956 සිට 1965 දක්වා වූ කාලය තුළ දී එය මැන්න ආකාරයටමයි. අද ලෝකයේ ජීවන වියදම ගැන කල්පනා කරන විට ඇත්තෙන්ම පුදුම හිතෙනවා. වඩාත්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

පුදුමය නම් ලංකාවේ ජීවන වියදම මේ තත්ත්වයෙන් තබාගෙන සිටීමයි. ජීවන වියදම වැඩි වී ඇති බව ඇත්තයි. එහෙත් එය සිදු වූයේ ඊයේ පෙරේදා නොවෙයි. 1956 සිට පටන් ගත් වැඩි වීම දිගටම අවුත් තිබෙනවා. මෙය උග්‍ර ලෙස වැඩි වන්නට පටන් ගත්තේ 1963 සහ 1964 දීයි. 1964 දී අන්තිම අමාරු තත්ත්වයකට ජනතාව පත් වුණා. දැන් සිදු වී තිබෙන දේ මොකක්ද? මිරිස් මිළ වැඩි වී තිබෙනවා. හාල්වල මිළ ගැන ගරු මුදල් ඇමතිතුමා විසින් කියන්නට යෙදුණා. ශත 85 කට තරම හාල් සේරුවක් ගන්නට පුළුවනි. [බාධා කිරීමක්] ශත 85ට හාල් සේරුවක් ගත නොහැකි බව සමහර ගරු මන්ත්‍රීවරුන් කියනවා. ඒ විධියට කියන ගරු මන්ත්‍රීවරුන්ට මා නියෝජනය කරන ප්‍රදේශයෙන් ශත 85 බැගින්, ශත 90 බැගින් හාල් ලබා දෙන්නට මට පුළුවනි. ජාතික පොළේත් හාල් මිළ ශත 85යි; ශත 90යි. හොරණ පැත්තේ කිදෙල්පිටියේ එඩ්මන් අමර සේකර නම් මහතකු ජාතික පොළට හාල් සහ එළවළු ගෙනැවිත් විකුණනවා. ඒ මහතා හොඳ හාල් සේරුවක් ශත 85 බැගින් විකුණනවා. රුපියල් 1.20 ට, රුපියල් 1.25 ට හාල් ගන්නවා යයි සමහර ගරු මන්ත්‍රීවරුන් කියනවා. එහෙත් ඒ ගැන තර්ක කරන්නට වුවමනාවක් නැහැ. අපත් මේවා ගැන සොයා බලා තිබෙනවා. ඊයේ මා නියෝජනය කරන කොට්ඨාශයෙහි ඇවිදින්නට මා ගිය අවස්ථාවේ දී මේ ගැන විමසූ විට ශත 85 ට, ශත 90 ට හාල් ඒ ප්‍රදේශයෙන් ලබා ගත හැකි බව මට දැන ගන්නට ලැබුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
සුණු සහල් වන්නට ඇති.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
නැහැ. හොඳ සහල්. මා නියෝජනය කරන ප්‍රදේශයේ ජනතාව සුණු සහල්ම කනවා යයි ඒ මන්ත්‍රීතුමා කල්පනා කරනවාද? එහි සිටින්නේ හොඳ සිංහල ජනතාවක්; වැඩි වශයෙන් සිටින්නේ බෞද්ධ ජනතාවක්. සහල් ශත 85 ට, 90 ට ගන්නට පුළුවනැයි ඒ අය කියනවා. ඒ කෙසේ වෙතත් මේ ප්‍රශ්නය ගැන විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් මෙම ආණ්ඩුවට ඊර්ෂ්‍යා කරනවා ඇති. එහෙත් ලංකාවේ සාමාන්‍ය ජනතාව තුළ කිසිම ඊර්ෂ්‍යාවක් නැහැ. හාල් මිළ ඔය ගණන්වලට තිබීමෙන් වාසියක් වී තිබෙන්නේ සිංහල ගොවියාටයි. ඒ සිංහල ගොවියාට වැඩිපුර මුදලක් ලැබීම ගැන සහෝදර සිංහල ජනතාව තුළ ඊර්ෂ්‍යාවක් නැහැ. ඒ අයට විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ට වගේ දේශපාලන අදහස් නැති නිසා, ආණ්ඩු පෙරළීමේ අදහස් නැති නිසා එම මුදල් සතුටෙන් ගෙවා හාල් ලබා ගන්නවා. සිංහල ගොවියාගේ දියුණුව ගැන ඒ අය සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කර්මාන්ත ඇති කරන්නැයි විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් අපට කියනවා. ඒ ඒ කර්මාන්ත මාර්ගයෙන් අප නිෂ්පාදනය කරන භාණ්ඩ වැඩි වශයෙන්ම අලෙවි කරන්නට පුළුවන් වන්නේ අපේ රට තුළමයි. වර්ගයක් දෙකක් පමණ පිටරට යවන්නට පුළුවන් වේවි. අනෙක් සියල්ල අපේ රට තුළම අලෙවි කරන්නට සිදු වෙනවා. ඒ වගේම එංගලන්තයේ ප්‍රංශයේ නැත්නම් ජර්මනියේ තරම් හොඳ නිෂ්පාදන අපේ රටේ ඇති කරන්නට බැහැ. ඒ රටවල් අවුරුදු ගණනාවක් තිස්සේ තම කර්මාන්ත දියුණු කර දැන් ඒවා උසස් තත්ත්වයකට පත් කරගෙන තිබෙනවා. ඒ නිසා ඒ රටවල කර්මාන්ත නිෂ්පාදන සමග තරඟ කරන්නට අපේ රටට කිසිසේත්ම පුළුවන් වන්නේ නැහැ. අප නිෂ්පාදනය කරන භාණ්ඩ අපේ රට තුළම විකුණා ගන්නටයි, අපට සිදු වන්නේ. එසේ නම් ඒ භාණ්ඩ මිලදී ගන්නට සූදානම් අය අපේ රටෙහි සිටිය යුතුයි. කමිස සපත්තු ආදී දේ කොතරම් සෑදුවත් වැඩි වශයෙන්ම ඒවා විකුණන්නට සිදු වන්නේ ගොවියන්ටයි. මේ රටේ වැඩි වශයෙන් සිටින්නේ ගොවියන් නිසා නිෂ්පාදනය කරන භාණ්ඩ වැඩි වශයෙන්ම විකුණන්නට වන්නේ ගොවියන්ටයි. [බාධා කිරීමක්] පිටරට යවන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොහොමදැයි ඔය රත්නරත් මන්ත්‍රීතුමා කරුණාකර කල්පනා කරන්න. මෙහි නිෂ්පාදනය කරන සෑම දෙයක්ම පිටරට යවන්නේ කොහොමද? එහෙම හිතන්නට එපා. එහෙම කරන්නට බැහැ. වැඩි වශයෙන් අප මහන්සි ගන්නට ඕනෑ මේ රටට වුවමනා කරන ප්‍රමාණය පමණක් මේ රටේ නිෂ්පාදනය කිරීමටයි. එහෙනම් ඒ කර්මාන්ත ශාලාවලින් හදන බඩු ගන්නට මේ රටේ ජනතාවට මුදල් තිබෙන්නට ඕනෑ. ඒ නිසා වැඩි ජනතාව වන ගොවි ජනතාවගේ දියුණුවක් ඇති වන්නට ඕනෑ. අද මිරිස් වැවීමෙන්, ලූනු වැවීමෙන්, වී නිෂ්පාදනයෙන් හා එළවලු වගාවෙන් ප්‍රයෝජනයක් ලබාගැනීමට අපේ ගොවි මහත්වරුන්ට පුළුවන්කම ලැබී තිබෙනවා. අවුරුදු ගණනාවකට පසුව අපේ ගොවි මහත්වරුන් අද යම්කිසි මුදලක් අතට ගන්නවා. එයට ඊර්ෂ්‍යා කරන්නට එපා. අවුරුදු ගණනාවක් තිස්සේ පෑගී සිටි අපේ ගොවි මහත්වරුන්ට ඊර්ෂ්‍යා කිරීම හොඳ නැහැ.

කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංගරත්න මයා.) අපට කියා සිටියා ඔර්ලෝසු ආදිය මේ රටට හොරෙන් ගෙනෙනවාය කියා. අප විරුද්ධ පාර්ශ්වයේ ආසනවල සිටින කාලයේදී එක්තරා ප්‍රවෘත්ති පත්‍රයක පළ වී තිබුණු පුවතක් මට මතකයි. ලංකාවේ ජන ගහනය අනුව මේ රටට ගෙන්වන ඔර්ලෝසු සංඛ්‍යාව සසඳා බලන විට කුඩා දරුවාගේ සිට හැම කෙනෙකුගේම එක අතට ඔර්ලෝසු තුන බැගින් බඳින්නට තරම් ප්‍රමාණවත් ඔර්ලෝසු සංඛ්‍යාවක් ගෙන්වා තිබෙනවාය කියා තිබුණා. ඒ කාලයේ මුදල් ඇමති වශයෙන් සිටියේ කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාද කෑගල්ලේ ගරු මන්ත්‍රීතුමාද (පී. බී. ජී. කලුගල්ල මයා.) දොම්පේ ගරු මන්ත්‍රීතුමාද (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) සී. පී. ද සිල්වා ඇමතිතුමාද කියා මට මතක නැහැ. එදා ඒ විධියේ තත්ත්වයක් තිබුණා. සමහරවිට දැනුත් එවැනි තත්ත්වයක් ඇති. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කථා කරද්දී එතුමාගේ පරණ ඉතිහාසය අමතක කළාද කියා අහන්නට ඕනෑ. යම්කිසි වැරදි ක්‍රියාවක් සිදුවන විට ඒ පිළිබඳව සුදුසු වැඩ පිළිවෙළක් යොදා එය නතර කරන්නට හදන විටම ඔන්න චෝදනා කරනවා පිට රටින් බඩු ගෙන්වනවාය, ගෙන්වීම නැවැත්වූ බඩු රටට එනවාය කියලා. එහෙත් ඔවුන් ආණ්ඩු කරන කාලයේ මෙවැනි දේවල් නතර කිරීමට කළේ මොනවාද කියා මා ප්‍රශ්න කරනවා. බෝරාකාරයින් බඩු හංගනවා යයි චෝදනා කරනවා. අපි ඒවා නවත්වන්නට හදන විට, පොලිසියෙන් සොයා බලන විට, ඒවාට හිනා වෙනවා; සමච්චල් කරනවා. තමුන්නාන්සේලාගේ කාලයෙත් බඩු හැංගුවා; බඩු හිඟයක් තිබුණා. ඒ සම්බන්ධව තමුන්නාන්සේලා කළේ මොකක්ද? සමහරු කළ දේවල් නම් මේ ගරු සභාවේදී කියන්නත් ලැජ්ජයි.

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

තව හුඟක් වෙලා කථා කරනවාද? දැන් පැයක් අරගෙන තිබෙනවා.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

අවසාන වශයෙන් මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (ද සොයිසා සිරිවර්ධන මයා.) සඳහන් කළ කරුණකට පිළිතුරක් දී මගේ කථාව අවසාන කරනවා. මුදල් පිළිබඳව මේ අමාරු තත්ත්වය අපට ඇති වී තිබෙන්නේ අපේ තේ, රබර් හා පොල්වල මිල පහත බැස තිබෙන නිසා යයි ගරු මුදල් ඇමතිතුමා කිව්වා. ඒ සමගම එතුමා කිව්වා, ඒවායේ මිල සකස් වන්නේ ලෝක වෙළඳ පොළේ මිල අනුව නිසා ඒවායේ මිල පිළිබඳව වගකියන්නට අපට පුළුවන්කමක් නැතැයි කියල. ගරු ඇමතිතුමාගේ ඒ ප්‍රකාශ සම්පූර්ණයෙන්ම වැරදි යයි ද එසේ සිදු වී තිබෙන්නේ වෙළඳ ඇමතිතුමාගේ වැඩ පිළිවෙළේ අසතුටුදායක තත්ත්වය නිසා යයි ද ගරු මිනුවන්ගොඩ මන්ත්‍රීතුමා කිව්වා. ඒ මහත්වරුන් ආණ්ඩු කරන කාලයේදී සමාජවාදී රටවල් සමග හොඳට කටයුතු කරගෙන ගියාය කියලත් ඒ සමගම කිව්වා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]

I am reading from the Budget Speech of 1963-64 of Mr. T. B. Ilangaratne, the then Minister of Finance :

"In conformity with a trend that has been consistently in evidence since 1956 the average f.o.b. price of all teas continued to decline further in 1962. . ."

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ උදවියගේ සමාජවාදී වැඩ පිළිවෙළේ හැටියට එය නවත්වන්නට බැරි වුණේ මන්ද කියා මා අහනවා. ලෝක වෙළඳ පොළේ තත්ත්වය අනුව 1956 තුළ තේවල මිල බැස්ස බව කියනවා. එහි තව දුරටත් මෙසේ කියනවා :

"The f.o.b. price of copra declined by 6.3 per cent on the average as compared with the previous year."

ඇයි මේවා බසින්නට තමුන්නාන්සේලා ඉඩ දුන්නේ කියා මා අහනවා. මෙවැනි ප්‍රශ්න තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ කාලයේදීත් ඇති වුණා. අපේ ආණ්ඩු කාලයේදීත් ඇති වෙනවා. අපේ තේ ඕනෑම රටක් විසින් ඉල්ලනවා නම් ඒ රට සමග ඕනෑම පිළිවෙළකට ගනුදෙනු කරන්නට අප සූදානමින් සිටිනවා. පළමු වන වතාවට චීනයත් සමග වෙළඳ ගිවිසුම් ඇති කරගෙන වෙළඳාම පටන් ගත්තේ අපයි. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) කීවා, එය කළේත් එම උදවිය බව. චීනයත් සමග පළමුවන වතාවට වෙළඳාම් කරන්න පටන් ගත්තේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවයි. අදත් ඒ මහත්වරුන් සමග අප වෙළඳාම් කරනවා. බොහොම සතුටුදායක අන්දමින් එම කටයුතු කෙරෙනවා. චීන රටත් සමග තියෙන අපේ මිත්‍ර සම්බන්ධතාව කිසිසේත් අඩු වී නැහැ. ඒ උදවිය අපේ අගමැතිතුමාට, මේ ආණ්ඩුවට, ගෞරව කිරීම ගැන අපි සන්තෝෂ වෙනවා. එම නිසා මහජනතාවට වැරදි අදහස් ප්‍රකාශ කිරීම අප රටේ දියුණුවට මදිකමක් බව කියන්නට ඕනෑ. මේ කරුණු අවබෝධ කරගෙන ආණ්ඩු පක්ෂයත් විරුද්ධ පාර්ශ්වයත් කටයුතු කළොත් එය අපේ යහපතට ප්‍රයෝජනවත් වෙනවායැයි අප සිතනවා. මා දැන් පැයකට වැඩි වේලාවක් කතා කර තිබෙනවා. මට ඇහුම්කන් දුන් තමුන්නාන්සේලාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව මෙතෙකින් අවසාන කරනවා.

අ. භා. 7.3

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)

(*திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய*)

(Mr. M. Tennakoon—Nikaweratiya)

අප රටේ ජාතික මමත්වය, බෞද්ධකම පිළිබඳව යම් කෙනෙක් නියමාකාරයෙන් හඬ නැගුවා නම් ඒ අනගාරික ධර්මපාලතුමාය කියා මා සිතනවා. එතුමාගේ හඬට සරිලන හඬක් තවම අපට අසන්නට ලැබී නැහැ. එතරම් ශ්‍රේෂ්ඨ ජාතික අදහස් දැරූ ජාතික වීරවරයකුගේ මුනුබුරකු වන අප අධ්‍යාපන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා අපේකම, සිංහලකම හා සිංහලයන්ගේ සමාජ දියුණුව පිළිබඳව දරන අදහස් අනගාරික ධර්මපාලතුමාගේ අදහස් සමග සසඳා බලන විට හරියට අහසට පොළොව මෙන් පරස්පරය කියන්නට පුළුවනි.

එතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා, මේ රටේ කම්කරු ජනතාව කොම්පැනිකාරයන් කිරීමේ පරිවර්තනයක් ඇති කිරීම මෙම අයවැය ලේඛනයේ එක් අරමුණක් වන බව. කම්කරු ජනතාව කොම්පැනිකාරයන් කිරීමට පමණක් එතුමාගේ අදහස් සීමා වෙලා නැහැ. එතුමා තවත් අවස්ථාවක තවත් දෙයක් ගැන ඔය හා සමානම අදහසක් දරනව. මේ රටේ පොදු මහජනතාව අතර සමානාත්මතාවක් ඇති කරන්ට නම්, ගම්බද ළමයාටත් නගරබද ළමයාටත් එක හා සමානව ඉංග්‍රීසි උගන්වන්න ඕනෑ යයි එතුමා කියනව. නිකවැරටිය වගේ අපේ ගම්බද ප්‍රදේශවල ජීවත් වන අසරණ දරුවන් ගෙදර දොරේදී තමන්ගේ අම්මල තාත්තලට ඉංග්‍රීසියෙන් කථා කිරීමේ තත්ත්වයකට පරිවර්තනය කර ගැනීමෙන් තමයි, එතුමා මේ රටේ ජනතාව අතර සමානාත්මතාවක් ගොඩ නඟන්ට අදහස් කරන්නෙ. කම්කරුවන් කොම්පැණිකාරයින් කිරීමේත්, ගම්බද පොල්අතු පැල්වල ජීවත් වන දරුවන් තම ගෙදර දොරවල ඉංග්‍රීසියෙන් කථා බස් කිරීමේත් සමාජ පරිවර්තනයක් ඇති කරන්ට අපේ අධ්‍යාපන කටයුත පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා හිතන විට, අනේ එතුමාගේ ආතා හිටිය නම් මේව ගැන මොනව හිතයිද ? ගරු සභාපතිතුමනි, කෙසේ වෙතත්, එතුමාගේ ආතාගේ අදහස් තරමක් දුරට අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාර්ලිමේන්තු ලේකම්තුමා තුළ තිබෙනව. ක්‍රමය මොකක් හෝ වේවා, රටේ ජනතාව, ජාතික ජනතාව දියුණු කරන්ට ඕනෑ කියන හොඳ හිත නම් එතුමා තුළ තිබෙනව. ඒ ගැන අපි ප්‍රශංසා කරනව. නමුත් අනුගම නය කරන ක්‍රමය වැරදියි. කරන්ට හිතන විධිය වැරදියි. එම නිසා ඒ ජාතික වීරවර යාගේ නාමයෙන් අධ්‍යාපන කටයුතු පිළි බඳ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනව, තම ආතා සිංහලයන් ආගමත් ආරක්ෂා කිරීම සඳහා යම් ප්‍රයත්නයක් දැරුව නම් ඒ ප්‍රයත්නය සඵල වන පිළිවෙළකට කටයුතු කරන්න කියා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රැකී රක්ෂා ප්‍රශ්නය පිළිබඳව කථා කර මින් අධ්‍යාපන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා ප්‍රකාශ කළා, අපි දැන් රැකීරක්ෂා ලැයිස්තු නිරා කරණය කරගෙන යනවාය, බොහෝ දෙන කුට රැකීරක්ෂා දීගෙන යනවාය කියා. ඒ වගේම එතුමා ප්‍රශ්න කළා, ඔය ඇත්තන් ආණ්ඩු කළ කාලයේදී කරන ලද දේවලින් මොනවද අපට දී තිබෙන දැවැද්ද, කියා. අද ඔය තමුන්නාන්සේලා රැකීරක්ෂා දෙන්නෙ කොහෙන්ද කියන එක මෙවැනි අවස්ථාවලදී පාර්ලිමේන්තු ලේකම්තුමාට ටිකක් සිහිපත් කරවන්න සිද්ධ වෙනව. අද ලංගමයට කොයි විධියට මිනිසුන් බඳවා ගන්නවාදැයි අපි දන්නෙ නැහැ. සතොස රක්ෂා දෙන්නෙ ශ්‍රී ලංකා කාරයින්ටය, කොමියුනිස්ට් කාරයින්ටය, ආදී වශයෙන් එදා චෝදනා කළා. එදා විරුද්ධ පාර්ශ්වයේ නායක වශයෙන් සිටි වර්තමාන අග්‍රාමාත්‍ය තුමා ඒ පිළිබඳව විශාල ආන්දෝලනයක් ඇති කළා. අද ලංගමය ගැන කල්පනා කර බැලුවාම එතැන සිදු වෙන්නෙ මොනවාදැයි අපි නම් දන්නෙ නැහැ. අපි ඒ තරම් විප රම් කරන්නෙත් නැහැ. හේතුව, විපරම් කිරීමෙන් ප්‍රයෝජනයක් නැති නිසයි. මේ ආයතනය ඒ තරම් දූෂණවලට අද ලක් වී තිබෙනව. අයථා ක්‍රියා ඉතා බහුල ලෙස සිදු වෙනවා. [බාධාකිරීමක්] එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් සමග ගියොත්, අසූර ගහන පමණින් ලංගමයේ රක්ෂා වක් ලබා ගන්ට පුළුවන් බව මට ආරංචියි. පුළුවන් නම්, මගේ කොට්ඨාශයේ අයත් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් එකතු කරගෙන ගිහින් ඒ ඇත් තන්ට රක්ෂා ලබා දෙන්න කියා මා මතක් කරනව. ඒ අයට රක්ෂා ලැබෙනව නම් ඔවුන් එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දුන්නට මට කමක් නැහැ. අපට නම් යම් කෙනකු ලංගමයට ඇතුළු කර ගැනීම ඉතාම අසීරු අමාරු වැඩක් නිසායි මා එසේ කියන්නෙ.' ඒ කෙසේ වෙතත්, මේ රටේ රැකීරක්ෂා නැතිව සිටින තරුණ තරුණියන්ට කොහෙන් හෝ රැකියා ලැබෙ නවා නම් අප ඒ ගැන සන්තෝෂ වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයින්ට හෝ විරුද්ධ පාර්ශ්වයට ළැදි වෙනත් අයට හෝ එවැනි රැකියා නොලැබී යතොත් ඒ නිසා ඔවුන්ගෙන් සිදුවන ඒ පරිත්‍යාගය හේතු කොට ගෙන එක්සත් ජාතික පාක්ෂික යින්ට ලැබෙන ප්‍රයෝජනය ගැනත් අප සන්තෝෂ වෙනවා. රැකී රක්ෂා ප්‍රශ්නය විසඳීමේ දී ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් හා විරුද්ධ පක්ෂයට ළැදි වෙන අයත් විසින් කරන පරිත්‍යාගය සිහිපත් කිරීමත් අපේ යුතුකමක් හැටියටයි අප සල කන්නේ.

අපේ ගරු අගමැතිතුමා ඇතුළු ආණ්ඩු පක්ෂයේ බොහෝ දෙනෙකු හාල් ප්‍රශ්නය ගැන බොහෝ ලොකුවට කරුණු කිව්වා. වැඩි කල් යන්නට පෙර අපේ රට හාලින් ස්වයංපෝෂණය කරනවා පමණක් නොව පිටරටවලට පවා යවන බව, අපනයනය කරන බව බොහෝම ආඩම්බරයෙන් එතුමන්ලා ප්‍රකාශ කළා. පරාක්‍රමබාහු යුගයක් යළිත් උදාවේගන එනවායයි කිව්වා. එහෙත් හාල් සේරුවක්, එතුමන්ලා කියන විධියට ශත 85 කට ගන්නට කොහේ තියෙනවාදැයි මා නම් දන්නේ නැහැ. (බාධා කිරීම්) මා මුසාවාද යක් කියනවා නම් එහි විපාක මට ලැබෙයි. මේ කියන්නේ මුසාවාදයක් නොවෙයි; ඇත්තටම මට දැනගන්නට ලැබුණු කාරණයක්. හාල් සේරුවක් කීයකට ගන්නට පුළුවන්දැයි ඊයේ හවස් වරුවේ අපේ ගම් පැත්තේ කෙනකුගෙන් මා ඇහුවා. වැඩි ගණන් නොකියා ඇත්ත වශයෙන්ම පවතින ගණන කියන ලෙසත් මා ඔහුගෙන් ඉල්ලුවා. එවිට ඔහු කීවේ රු. 1.15 කට අඩුවෙන් නම් හාල් සේරු වක් කොහෙන්වත් ගන්නට බැරි බවයි. මේ විවාදය සඳහා තර්කයක් වශයෙන් ඉදිරිපත් කරන කරුණක් නොවෙයි. ඇත්ත වශයෙන්ම රු. 1.15 කට අඩුවෙන් හාල් සේරුවක් ලබා ගන්නට පුළුවන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

තැනක් මා නම් දන්නේ නැහැ. (බාධා කිරීම්) එහෙම නම් එය අම්බලංගොඩ පැත්තේ ජනතාවටම වාසනා වේවා. ඒ කථාවේ සත්‍යාසත්‍යතාව ඒ ප්‍රදේශයේ ජනතාවගෙන්ම ඔප්පු වේවා. ඒ ගැන මා ඊට වැඩි දෙයක් කියන්නේ නැහැ. කැඩ්ච්ච හාල්—සුණු සාල්—ගන්නට පුළුවන් වෙයි ඒ ගණනට. ඒවා නියම හාලක් හැටියට සලකන්නට අපට බැහැ. මා මේ කාරණය කියන්නේ ඉතා ඕනෑකමින් අද රටේ පවතින තත්ත්වය පිළිබඳ කරුණු සොයා බැලීමෙන් පසුවයි. අද රටේ තත්ත්වය ඉතා භයානකයි. ඒවාගේම අපේ ගරු මුදල් ඇමතිතුමාගේ මේ තුන් වන අයවැය වාර්තාව තරම් භයානක තත්ත්වයක් පෙන්වන වාර්තාවක් තවත් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සත් කෝරළේ වන්නියේ කෙනෙකු මේ රජයේ මුදල් අමාත්‍ය ධුරය දැරීම ගැන අප ආඩම්බර වෙනවා. ඒවාගේම දේශපාලන නායකත්වයේ වැදගත් අංග තිබෙන කෙනකු හැටියට අප මේ මුදල් ඇමතිතුමාට සලකනවා. සමහර විට නියම චිත්‍රය සඟවන්නේ නැතිව පෙන්වීමට අවස්ථාව සලසා තිබෙන්නේ එතුමාගේ අවංකභාවය නිසා වෙන්නට පුළුවනි. නියම පින්තූරය පෙන්වීම ජනතාවටත් රටටත් ප්‍රයෝජනයක් වී තිබෙනවා. නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සත් කෝරළේ බත් කෝරළේ කියා තවත් නමකිනුත් හඳුන්වනවා. මක්නිසාද? ලංකාවේ වී නිපදවන විශාල ප්‍රදේශය වයඹ ප්‍රදේශය නිසයි. එහෙත් වයඹ ප්‍රදේශයේ බත් පිඟානට දැන් වැලි වැටී ගෙන යන බව මා කණගාටුවෙන් මතක් කරනවා. අයවැය ලේඛන පිළියෙළ කිරීමේදී කවුරුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තා උපයෝගී කර ගන්නවා. අපේ මුදල් ඇමතිතුමාගේ මේ අයවැය ලේඛනය පිළියෙළ කරන්නට උපයෝගී කරගත් මහ බැංකුවේ වාර්තාවේ රටේ මුදල් තත්ත්වය පිළිබඳව කුමක් සඳහන් කර තිබෙනවාද කියා බලමු. අද රටේ යම් භයානක තත්ත්වයක් තිබෙනවා නම් ඊට හේතුව කුමක්ද කියා ගරු මුදල් ඇමතිතුමා තම කථාවේදී කරුණු පැහැදිලි කළා. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව පටන් ගන්නේ මෙහෙමයි:

"අපනයන ඉපැයුම් සීඝ්‍රයෙන් පිරිහී යාම 1966 ආර්ථික ක්ෂෙත්‍රයෙහි කැපී පෙනෙන ලෙස දක්නට ලැබුණ ප්‍රධානතම ලක්ෂණය විය."

අපනයන ඉපැයුම අඩු වෙනවා.. ආනයන වියදම වැඩි වෙනවා. ඔය මූලික හේතුව නිසා තමයි දවසින් දවස මේ රටේ ජීවත් වීම අසීරු වෙන්නෙ; අමාරු වෙන්නෙ. ඔය ප්‍රශ්නය නිසා තමයි අපේ සම්පූර්ණ ආර්ථික ගොඩනැගිල්ල දෙදරුම් කා තිබෙන්නෙ. අප නිපදවන ප්‍රමාණය අඩුයි. අප භුක්ති විඳින ප්‍රමාණය වැඩියි. අපට ලැබෙන ආදායමේ ප්‍රමාණය අඩුයි. අපේ වියදමේ ප්‍රමාණය වැඩියි. උහුලන්නට බැරි තරමට, ජීවත් වෙන්නට බැරි තරමට අපේ එදිනෙදා වියදම වැඩිවී තිබෙනවා. මේ තත්ත්වය කවදා හරිගැස්විය හැකිද යන්න ගැන අප කල්පනා කර බලන්නට ඕනෑ. අපනයනය අඩු වෙනවා, ආනයනය වැඩි වෙනවා, මොනව කරන්නටද, අපේ නිෂ්පාදනවලට ලෝක වෙළඳ පොළේ ලැබෙන මිල අඩුයි, අපේ කාලගුණය, දේශගුණය වෙනස් වුණා, ආදී වශයෙන් මෙවැනි තත්ත්වයක් ඇති වෙන්නට හේතු ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කරනවා. "මේ කාරණා නිසයි අපට මේ තත්ත්වයට මුහුණ පාන්නට වුණේ" යනුවෙන් ගරු අගමැතිතුමා හැම අවස්ථාවකම කියන්නේ ඔකයි. අපනයනය අඩු වීමටත්, ආනයනය වැඩි වීමටත් හේතු වශයෙන් අයවැය කථාවෙන් පෙන්වන්නේ ඔය කාරණයි. ලෝක වෙළඳ පොළේ අපේ අපනයනවල මිල අඩු වීම, අපේ ආනයන ද්‍රව්‍යවල—විශේෂයෙන් හාල්වල—මිල වැඩි වීම, ජල ගැලීම, නියඟය ආදි කරුණු තමයි, මේවාට හේතු වශයෙන් මේ ආණ්ඩුව හැම දාමත් කියන්නේ.

එසේ නම් අපේ අපනයන ද්‍රව්‍යවල මිල වැඩි කර ගැනීමටත්, ආනයන ද්‍රව්‍ය අඩු මිලට ගැනීමටත්, ඒ මඟින් අපේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීමටත් මේ රජය දරා ඇති ප්‍රයත්න මොනවාද කියාත් අප සොයා බැලීම ඉතා වැදගත්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1966 යේ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ 10 වන පිටුවේ මෙසේ සඳහන් වී තිබෙනවා :

"1966 ගෙවුම් ශේෂ තත්ත්වය පසුගිය අවුරුද්ද හා සසඳා 1—4 වැනි සංඛ්‍යා සටහනෙහි කෙටියෙන් දක්වා ඇත. මේ සංඛ්‍යා තොරතුරු අනුව 1966 ලංකාවේ වර්තන ගිණුම් හිඟය මෑත වර්ෂවලදී පැවති වැඩිම හිඟය බව දැක්වෙන අතර, අපනයන ඉපැයුම් තියුණු ලෙස අඩුවීමත් ආනයන ගෙවීම් බොහෝ සෙයින් වැඩිවීමත් මෙයට හේතු වී ඇත."

මා කලින් සඳහන් කළ දේවල් තමා, ඒ වාර්තාවේ දක්වා තිබෙන්නේ. අප අද මුහුණ පා තිබෙන ආර්ථික අභේනියට හේතු වශයෙන් ගරු අගමැතිතුමාත්, ගරු මුදල් ඇමතිතුමාත් "අරහෙම වුණා, මෙහෙම වුණා" කියනවා. එහෙත් ඒ වාර්තාවේම 11 වන පිටුවේ කියා තිබෙන්නේ මොකක්ද? එය කියවීම ඉතා ප්‍රයෝජනවත් නිසා මා දැන් එය කියවනවා.

එහි මෙසේ සඳහන් වෙනවා :

"කෙටි කාලීන වශයෙන් ලංකාවේ අපනයන ඇද යම වැඩි කර ගත හැකි යැයි බලාපොරොත්තු විය හැක්කේ නොවේ. නුදුරු අනාගතයේදී තේ, රබර් සහ පොල්වල මිල වැඩි වන ලක්ෂණ දක්නට නැත. මෑත වර්ෂවලදී නොකඩවාම වැඩිවෙමින් තිබුණ තේ නිෂ්පාදනය 1966 දී අඩු විය. අනෙක් අතට, රබර් නිෂ්පාදනය සැලකිය යුතු ලෙස වැඩි වන අතර, නැවත වගා කරන ලද රබර් ඉඩම්වල කිරි කපන අවස්ථාවට එන්ම නිෂ්පාදනය තව තවත් වැඩි විය හැකිය. පොල් නිෂ්පාදනය 1966 දී තවදුරටත් අඩු විය. අනාගතයේදී පොල් නිෂ්පාදනය වැඩි වුවත්, ජනගහනය වැඩි වීමත් සමග රට තුළ පාරිභෝගයට ගන්නා ප්‍රමාණය වැඩි වන නිසා පිටරට පැටවීමට සැලකිය යුතු ඉතිරියක් ඇති වෙතැයි සිතිය නොහේ. අනිකුත් භාණ්ඩ, විශේෂයෙන් සම හර කාර්මික භාණ්ඩ, අපනයනය වැඩි වෙතැයි සිතිය හැකි වුවද, ළඟ අනාගතයේදී ඉන් සැහෙන ආදායමක් ලැබෙතැයි සිතිය නොහැකිය. මේ අනුව අපනයන ඉපැයුම් සැලකිය යුතු ලෙස වැඩි වන ලකුණු නුදුරු අනාගතයේ—"

නුදුරු අනාගතයේ. මම නව වරක් කියන්නම්.

"—නුදුරු අනාගතයේ දක්නට නොමැත. ඇඩි ඇති සංඛ්‍යා තොරතුරුවලින් මේ නිගමනය තවත් ස්ථිර වන්නේ ය."

මොකක්ද, අප ඉදිරියේ තිබෙන පින්තූරය? අඳුරු යුගයකට, භයානක යුගයකට අප පා තබා සිටිනවා. හොඳයි, මේ භයානක තත්ත්වය වෙනස් කර ගැනීමට මේ රජය දරා තිබෙන ප්‍රයත්නයන් මොනවාද කියා අපි ටිකක් සොයා බලමු.

පසුගිය කාලයේදී වෙළෙඳ පොළවල් පිළිබඳ ප්‍රශ්න, ජාතික නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ් ප්‍රශ්න, ආදී නොයෙක් ප්‍රශ්න ගැන සඳහන් කරමින් හාල් සලාකය අඩු කළා. විදේශීය රටවලින් මේ රටට ගෙන්වන ආහාර ද්‍රව්‍ය අඩු කර ඒවායෙ හිඟයක් රට තුළ ඇති කළා. එවැනි ක්‍රියා මාර්ගයන් ගෙන් බලාපොරොත්තු වන ප්‍රතිඵල ලැබෙනවා නම් අප විරුද්ධ වන්නේ නැහැ. ඒ ප්‍රතිඵල දකින්නට පුළුවන කමක් තිබෙනවාද යන්නයි දැන් අප පරීක්ෂා කර බැලිය යුත්තේ. පිටරටවලින් ගෙන්වනු ලබන නොයෙක් ද්‍රව්‍ය—අනවශ්‍ය ද්‍රව්‍ය—ගෙන්වීම නතර කර ජාතික නිෂ්පාදනයන් වැඩි කිරීමේ මාර්ග සාර්ථක වනු දකින්නට අප කැමැත්තෙන් ඉන්නවා. ස්ථිර අදහසකිනුත් පිරිසිදු චේතනාවකිනුත් ඒ සම්බන්ධ වැඩ කටයුතු පටන් ගන්නවා නම්, ඒ ආකාරයටම ඒවා කරගෙන යනවා නම්, අප සන්තෝෂ වෙනවා. ඒ කොයි හැටි වෙතත් තත්ත්වය නම් ඊට වෙනස්. ඒකයි අපේ කනගාටුවට විශේෂයෙන් හේතු වී තිබෙන්නේ. පොදු මහජනතාවට පරිහරණය කරන්නට තිබෙන නොයෙක් විධියේ අවශ්‍ය භාණ්ඩ ගෙන්වීම නතර කරන නමුත් එයින් වැඩක් වන්නේ නැහැ. ඔන්න දැන් ඉතින් ටිකක් දුක් විඳින්නට ඕනෑ, දැන් ඉතින් ටිකක් පටි තද කර ගන්නට ඕනෑ, යනාදී වශයෙන් කියනවා. එසේ කියන ගමන්ම මේ රටේ අතළොස්සක් පමණ ඉන්න ධනපති කොටසට ඒ අයගේ සැප පහසුකම් පිණිස ගෙන්වන භාණ්ඩ ප්‍රමාණය අඩු කරන්නට මේ ආණ්ඩුව ඒ තරම් සැලකිල්ලක් හෝ උනන්දුවක් හෝ දක්වන්නේ නැහැ. කොහෙන් නමුත් කමක් නැහැ, ඒ ඇත්තන්ගේ—ධනේශ්වර පන්තියේ—සැප පහසුකම් සලසා දීමටයි ක්‍රියා කරන බව පෙනෙන්නේ. මෑත යුගයක මේ රටේ ධනේශ්වර පන්තියේ උද්වියට විශාල වශයෙන් පහසුකම් ලැබුණා නම් ලැබුණේ 1965න් පසුවයි. එක් කොටසකට—සුළු පිරිසක් ඉන්න කොටසකට—සහනයන් සහ පහසුකම් හැම තැනදීම ලැබෙනවා. අනෙක් කොටසට—හැමදාම පෑගෙන කොටසට—හැම තැනදීම එන්නේ කරදරමයි. ඔකයි පවතින තත්ත්වය. ඊටයි අප විරුද්ධ වන්නේ.

නිපදවීම වැඩි කිරීමේ නාමයෙන් හෝ වේවා විදේශික විනිමය වැඩි කර ගැනීමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

සහ රැක ගැනීමේ නාමයෙන් හෝ වේවා ජාතික සංවර්ධනයේ නමින් හෝ වේවා, වෙන කොහෙන් හෝ බරක් මයි ඒ· උදවිය පිටට කවදත් පටවන්නේ. නුදුරු අනාගතයේදී යම්කිසි සහනයක් ලබා ගැනීම පිණිස එක්තරා ප්‍රමාණයක දුක් කරදරවලට මුහුණ දෙන්නට හැමෝටම එක සේ සිදු වෙනවා නම් එවැනි තත්ත්වයක් පිළිගන්නට අපත් ලැස්තියි. ඒවාට එකඟ වන්නට අපට පුළුවනි. එක් කොටසකට පමණක් ටිකක් තදින් පටිය බැඳ ගන්න ලෙසත්, ටිකක් දුක් කරදර ගිරිහැර විඳ දරා ගන්න ලෙසත් කියන අතර, තවත් කොටසකට ඔවුන්ගේ අවශ්‍යතාවන් අඩුවක් නැතිව ලැබෙන තත්ත්වයක් ඇති කරතොත් අප ඊට ඉඳුරාම විරුද්ධයි. කවදත් පෑගෙන පන්තියේ පොදු ජනතාවට අවශ්‍ය අර්තාපල් ටික ඕනෑ නැතැයි කියතොත්, පරිප්පු ටික ඕනෑ නැතැයි කියතොත්, කොත්තමල්ලි, දුරුවර්ග ලූනු ආදිය ඕනෑ නැතැයි කියතොත්, ඒ අතරම මේ රටේ ධනේශ්වර පන්තියට අයත් අතළොස්සක් වූ පිරිසට වුවමනා කරන ඔවුන් පාවිච්චි කරන භාණ්ඩ ගෙන්වීම නතර නොකරතොත්, ඒ විධියේ වැඩ පිළිවෙළකට එකඟ වන්නට පුළුවන් කාටද?

කොයි තරම් මේ ආණ්ඩුව මුදල් අනින් අමාරුවට පත් වී සිටියත් මේ රටට බ්‍රැන්ඩි, විස්කි, හැම්, බේකන්, විවිධ රෙදි වර්ග, ආදිය ගෙන්වන්නට යනවාය යන්නක් පසුගිය දවසක පුවත්පතක පළ වී තිබෙනවා මට දකින්නට ලැබුණා. ඇයි මෙහෙම කරන්නේ? අර්තාපල් ගෙඩිය, කොත්තමල්ලි ඇටය, පරිප්පු ඇටය, වැනි දේවල් ගෙන්වීම නතර කරන්නට හෝ සීමා කරන්නට හෝ බලාපොරොත්තු වනවාය කියන මේ ආණ්ඩුවට, ඇයි මා අර මුලින් සඳහන් කළ සුඛෝපභෝගී ද්‍රව්‍ය ගෙන්වීම නතර කරන්නට බැරි? මේවා කොහෙන්ද එන්නේ කියන්නට මා දන්නේ නැහැ. මේවා ගෙන්වන්නට වුවමනා වුණාම—තමන් අයිති ධනේශ්වර පන්තියේ උදවියට සහනයක් ලැබෙන දේවල් ගෙන්වන්නට වුවමනා වුණාම—ඒ සඳහා නොයෙක් ක්‍රම ගැනත් ආණ්ඩුව කල්පනා කරනවා. සල්ලි තියෙන උදවියට කාර් ගෙන්වා ගන්නට වුවමනා වුණාම මන්ත්‍රීවරුන්ගේ පාවිච්චියට පමණක් කාර් ගෙන්වන්නට යනවාය කිව්වා. ඒ ගොල්ලන්ගේම උදවියට වුවමනා කරන දේවල් ගෙන වීමට මොකක් නමුත් හේතුවක් සොයා ගන්නවා. දැන් 5 ශ්‍රී නොම්මර දරණ කාර් විශාල සංඛ්‍යාවක් පාරේ දුවනු දකින්නට ලැබෙනවා. විශාල සංඛ්‍යාවක් ලියාපදිංචි කරනු ලැබ තිබෙනවා. කොහෙන්ද ඒවා එන්නේ? ඒවා ගෙන්වීමට සල්ලි ඕනෑ තරම් තිබෙනවා. ඒකයි අපට කියන්නට වුවමනා කරන්නේ. 1965 වන තෙක් මේ රටේ ධනවත් පිරිසට තරමක රිදීමක් ඇති වුණා. ඒ අයට යම් රිදීමක් ඇති වෙනවා නම් තමයි, අනික් කොටසට—දුක් විඳින කොටසට—යම් සහනයක් ලැබෙන්නේ. එක පැත්තකට ටිකක් රිදෙන්නට ඕනෑ, අනික් පැත්තට පහසුවක් සැලසෙන්නට. එක පැත්තකට රිදවන්නේ නැතිව කවදාවත් අනික් පැත්තට පහසුවක් සලසන්නට බැහැ. 1965 වන විට මේ රටේ ධනේශ්වර පන්තියට ටික ටික රිදුණා. ඒ රිදීම්වල ප්‍රතිවිරුද්ධ සහනය මේ රටේ පොදු මහජනයාට සුළු වශයෙන් හෝ ලැබුණු බව අපට කියන්නට පුළුවන්. එහෙත් 1965 න් පසු සුළු සුළු සහනයන් ඒ ධනේශ්වර පන්තියට ලැබෙන විට එහි රිදීම දුප්පත් පන්තියට ඇති වී තිබෙන බව අප පිළිගන්නට ඕනෑ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාට නොවෙයි රිදී තිබෙන්නේ, අපටයි. තමුන්නාන්සේලාට විවිධ සූට්, අපට සරමයි, බැනියමයි. [බාධා කිරීමක්]——

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
(திரு. டென்சில் பொர்ணாண்டோ)
(Mr. Denzil Fernando)

කෝට් එකයි, කලිසමයි චීනයේ ඇඳුම. මන්ත්‍රීතුමා දන්නෙ නැතුවයි, කියන්නේ.

එම්. තෙන්නකෝන් මයා.
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

අපේ මීගමුවේ මන්ත්‍රීතුමා අයිති කොයි පන්තියටද යන්න මා අමුතුවෙන් කියන්නට වුවමනා නැහැ. ඒ පන්තිය කුමක්ද යන්න ජනතාව දන්නවා.

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
(திரு. டென்சில் பொர்ணாண்டோ)
(Mr. Denzil Fernando)

මාත් දුප්පත්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

අපේ පන්තියට නෑකම් කියන්නට පුළුවන් අය ඒ පැත්තෙත් ඉන්නවා. එහෙත් මීගමුවේ මන්ත්‍රීතුමා නම් අපේ පන්තියට කොහොත්මවත් අයිති නැහැ. ගරු සභාපතිතුමනි, මට කියන්නට වුවමනා කර තිබෙන්නේ එක පන්තියකට පිදවන්නේ නැතිව අනික් පන්තියට සහනයක් දෙන්නට බැරි බවයි. ඒ නිසා සහනය ලැබී තිබෙන අය ගැන කල්පනා කළාම පිදී තිබෙන්නේ කාටද යන්න ඉබේම දැනගන්නට පුළුවන්.

ගරු සභාපතිතුමනි, මේ ගරු සභාවේදී රාජ්‍ය ඇමතිතුමා කරන කථා මා සමහර විට ඉතා ඕනෑකමින් කියවනවා. අපේ රාජ්‍ය ඇමතිතුමා එතුමාගේ වාසියට සමහරවිට ඇත්ත කියනවා. එතුමා කොලොන්නාවේ මන්ත්‍රීතුමාගේ (වී. බී. ඉලංගරත්න මයා.) කථාවෙන් පසුව කථා කරන විට මෙසේ කියා තිබෙනවා. මා මේ කියවන්නේ අගෝස්තු 2 වැනිදා හැන්සාඩ් වාර්තාවේ 196 වැනි තීරුවෙන් '

"ඒ නිසා අප මේ අවස්ථාවේදී මැතිවරණ ප්‍රකාශනය ගැන වාද වීම යුතුයයි මා සිතන්නේ නැහැ. මැතිවරණයක් ඇති වූ විට ඔය විධියේ ප්‍රකාශන තමයි, කව්රුනුත් ඉදිරිපත් කරන්නේ. එහෙත් ක්‍රියා කරන්නට ගියවිට නොයෙක් නොයෙක් අපහසුකම් ඇති වෙනවා."

හරියටම හරි. අපේ රටේ දේශපාලනය ගරු රාජ්‍ය ඇමතිතුමා නියම විධියටම විස්තර කර තිබෙනවා. ඇත්ත කියා තිබෙනවා. මැතිවරණවලට යන විට නම් අපි අලි දෙන්නම්, කොටි දෙන්නම්, රට කිරියෙන් පැණියෙන් උතුරවන්නම් කියනවා. එහෙත් මැතිවරණයෙන් පසු ඒවා නැහැ. ක්‍රියාවේ යොදවන්නේ මැතිවරණයේදී කියන විධියට නොවෙයි. කථාව දෝලාවෙන් ගමන පයින්. එපමණක් නොවෙයි, දේශපාලනයට වංකකම කොයි තරම් ගැබ් කර තිබෙනවාද යන්න ගරු රාජ්‍ය ඇමතිතුමාගේ ප්‍රකාශයෙන් හොඳට පැහැදිලි වෙනවා. මෙතැන ඇති වැදගත්කම ඒකයි. මහජනයා ඉදිරියේ එකක් කියනවා. තව එකක් ක්‍රියාවේ යොදවනවා. මේක කොතරම් වංක කමක්ද? අහිත කරද? මැතිවරණ ප්‍රකාශනවල එකක් තිබෙනවා. බලය ලැබුණාට පසුව වෙන දෙයක් කරනවා. මෙය අන්න ඒ විධියේ රජයක් බව රාජ්‍ය ඇමතිතුමාගේ ප්‍රකාශයෙන් පොදු මහජනතාවට පැහැදිලි වෙනවා.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்ணாண்டோ)*
(Mr. Denzil Fernando)

රාජ්‍ය ඇමතිතුමා එහෙම දෙයක් කීවේ නැහැ. [බාධා කිරීමක්]

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රටේ දේශපාලන නායකයන් මහජනයාට එකක් කියා, වංකකමින් කුහකකමින් හා දුෂ්ඨකමින් යුක්තව මහජනයාට අහිතකර දෙයක් ක්‍රියාවේ යොදවනවා. මේ රටේ පරිහාණියට හේතුව අන්න ඒකයි. රාජ්‍ය ඇමතිතුමා නිර්භයව මේ ප්‍රකාශය කිරීම ගැන එතුමාට ස්තුතිවන්ත විය යුතුයි. මේ විධියේ උද වියගෙන් මේ රටේ පොදු මහජනතාවට යහපතක් සිදු වෙතැයි කියන්නට බැහැ. මැතිවරණයේදී එකක් කියන බවත්, ක්‍රියාවේදී වෙන දෙයක් කරන බවත් රජයේ නායකයකු ප්‍රකාශ කිරීම කොතරම් පහත්ද? තමන් කරන්නට බලාපොරොත්තු වන දේ මේ මේවායයි මැතිවරණ ව්‍යාපාරයේදීත් අවංකවම කියනවා නම් කොතරම් හොඳද? මේ වගේ රජයකින් පොදු මහජනතාවගේ ප්‍රශ්න ගැන අවංක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොවන බවත් කිසිම අතකින් පොදු මහජනතාවට සහනයක් නොසැලසෙන බවත් මා ස්ථිර වශයෙන්ම කියනවා.

තවත් වැදගත් කාරණයක් තිබෙනවා. නොයෙකුත් ප්‍රශ්න සම්බන්ධයෙන් ගරු අගමැතිතුමා 1965 සිට දරන අදහස් මොනවාදැයි මා සොයා බැලුවා. 1965 අගෝස්තු මස 26 වනිදා එවකට පැවැති අයවැය විවාදයට සහභාගි වෙමින් එතුමා ජීවන වියදම් ප්‍රශ්නය ගැන මේ විධියට කියා තිබෙනවා.

"අපේ මුදල් තත්ත්වය අද ඉතා භයානකයි. ඔබලා ඉතා භයානක මුදල් තත්ත්වයකිනුයි, අපට භාර දුන්නේ. දවස් කීපයකටවත් අවශ්‍ය ද්‍රව්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]
මෙරටට ගෙන්වීමට මුදල් එදා ප්‍රමාණවත්ව තිබුණේ ඨ.ෑ. එතරම් තත්ත්වයකිනුයි, අප භාර ගත්තේ."

හැන්සාඩ් වාර්තාවේ 61 වන කාණ්ඩයේ 1846 වන තීරුවෙහි ඉංගිරිසියෙන් සඳහන් වන කොටසට සිංහල පරිවර්තනයකුයි, මා ඔය කියැවූයේ. ඊළඟට 1966 දී මුදල් තත්ත්වය හොඳදැයි අපි බලමු. රාජාසන කථාව ගැන ඉදිරිපත් කරන ලද ස්තුති යෝජනාව පිළිබඳ විවාදයට සහභාගි වෙමින් 1966 ජුලි මස 21 වන දින අගමැති තුමා මෙසේ කියා තිබෙනවා.

"ලෝකයේ සෑම තැනම භාණ්ඩ මිළ වැඩි වීම ගැන රාජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී කියා සිටියා. ඔබලා විදේශීය වත්කම් ඉතුරු කර තැබුවේ නැහැ, අවශ්‍ය ද්‍රව්‍ය මෙහි ගෙන්වීමට; ජීවන වියදම අඩු කිරීම පිණිස."

1966 දී කිව්වේ ඔහොමයි. 1967 වන විට වත් මේ තත්ත්වය හොඳ වේය කියා මා හිතුවා. 1967 දී කියන්නේ මොකක්ද කියා අපි බලමු. 1967 දී ගරු අගමැතිතුමා කියන කථාව මෙන්න. 1967 තේ පැවැත් වූ රාජාසන කථාවට ගෙනෙන ලද ස්තුති යෝජනාව පිළිබඳ විවාදයේදී ගරු අගමැති තුමා මෙන්න මෙහෙම කියනවා: මෙය තිබෙන්නේ 1967 ජුලි 19 වැනිදා හැන්සාඩ් වාර්තාවේ 990 වැනි තීරුවේයි.

"දැන් සමහර කථාවල හරය වූයේ ද්‍රව්‍ය හිඟකම මිල වැඩිවීම යනාදියයි. විරුද්ධ පාර්ශ්වයේ නායි කාවත් මෙය සඳහන් කළා. යමෙක් හිතන්නට පුළුවන් ඇගේ කාලයේදී සිදු වූ දේ ගැන. සමහර විට ඒ අවධියේ ඇති වූ ලුණු හිඟය ගැන සිහිපත් කිරීම ප්‍රයෝජනවත් වෙනවා. අපට පකිස්ථානයෙන් ලුණු ගෙන්වන්නට සිදු වුණා. සමහරු ඒ ලුණු තිත්ත යයි කිව්වා. නිකවැරටියේ මන්ත්‍රීවරයා අමුඩ පෙළපාළියක් දක්වන්නට යෙදුණා උදළු නැති බව පෙන්වීම පිණිස."

ඒ කියන්නේ මගේ අමුඩ පෙළපාළිය ගැනයි. ඔන්න දක්වන හේතු. තවමත් මේ තත්ත්වය හොඳ වී නැහැ. 1967 ත් මේ තත්ත්වය හොඳ වන්නේ නැහැ. කව දාවත් මේක හොඳ වෙන්නෙ නැහැ. කලින්ම කිව්ව "උඹලා මොකවත් ඉතුරු කර දුන්නෙ නැත" කියල. දෙවැනි වතා වේ කියනවා "ලෝක වෙළඳ පොලේ තත්ත්වය මෙහෙමයි" කියලා. අද කිය නවා "ඇයි මතක නැද්ද උඹලාගේ කාල යේ තිබුණු දේවල්" කියල, අමුඩ පෙළ පාළියක් ගියාලු, උදළු නැතෙයි කිව්වලු. ඔන්න කී දේවල්. එතකොට මේ ප්‍රශ්න යට පිළිතුරක් දෙන්නට ගරු අගමැතිතුමා තවමත් ලැහැස්ති නැහැ. "උඹලා කළේ මෙහෙමයි, අපි කරන්නේ කොහොමද ?" ඔන්න පිළිතුර. ලබන අවුරුද්දෙත් ඕකම කියාවි. අවුරුදු තුනේදීම දරන්නේ එකම මතය. මේ තත්ත්වය වෙනස් කිරීමට එතුමා තවමත් යම්කිසි ක්‍රියාමාර්ගයක් අර ගෙන නැහැ. කෙසේ හෝ මේ තත්ත්වය හදාගන්නට ඕනෑ. අද රුපියල් 17.50 ක් නැතිව උදැල්ලක් ගන්නට බැහැ. උදළු ගෙන්වන්නට විනිමය නැතිලු. අනික් දේවල් ගෙන්වන්නට නම් විනිමය තිබෙ නවා. ඒ අවස්ථාවේදීම ටයර් ගැනත් ටෝච් බැටරි ගැනත් කිව්වා. දැන් වෙළඳපොලේ බැටරි කෑල්ලක් සත 80 යි. මේ තත්ත්වය වෙනස් නොකරන්නේ ඇයි ? වැඩිදෙනා මේ රජය බලයට පත් කළේ එදා තිබුණු ආණ්ඩුව නරක නිසයි. ඒ නිසා "උඹලාගේ කාලයේදී කිව්වේ මෙහෙමයි" කියා අද විරුද්ධ පාර්ශ්වයේ නායිකාවට හෝ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ට කිව් වාට හරියන්නේ නැහැ. ප්‍රශ්නයට පිළිතුරු ඒක නොවෙයි. ඒ තත්ත්වය වෙනස් කරන්නට ඕනෑ කරනවා.

අමුඩ ගැන එතුමා තවත් එකක් කිව්වා. අප අමුඩ ගහනවා ඇතෙයි කියා එතුමා බලාපොරොත්තුවෙන් සිටිනවාය කිව්වා. ඒ ගැනත් වචනයක් කියන්නට ඕනෑ. අග මැතිතුමාට ඕනෑලු මා අමුඩ ගහනවා බලන්නට. මේ රටේ පත්තර රටට ජාතියට වැඩදායක ප්‍රයෝජනවත් යමක් කතෘ වාක්‍යයකට ඇතුළත් කරන්නේ බොහොම කලාතුරකින්. එහෙත් අද "දවස" පත්‍ර යේ කතෘ වාක්‍යය මට කාලෝචිත වුණා. ඒ ගැන මා සන්තෝෂ වෙනවා. චාම් ජීවිත ව්‍යාපාරය ගැන වැදගත් කතෘ වාක්‍ය යක් අද "දවස" පත්‍රයේ පළ වී තිබෙ නවා. ගරු අගමැතිතුමා අමුඩය ගැන මතක් කළ නිසයි, මා අමුඩය ගැනම කියන්නට ලැහැස්ති වන්නේ. එවිට අමුඩ යේ වටිනාකම සිහියට ගැනීමට අගමැති තුමාට පුළුවන් වේවි. අමුඩය තරම් ප්‍රිය කරන ඇඳුමක් මට තවත් නැහැ. මා මේ ගරු සභාවට එන්නේ අමුඩ ගහන අයගේ ඡන්දයෙනුයි. ඒ නිසා ඒ අයගේ දියුණුව තමයි, මගේ දේශපාලන පරමාර්ථය. එතු මාට වුවමනා කර තිබෙනවා, මා අමුඩය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගසනවා බලන්න. ජීවන තත්ත්වයේ අසීරු කම පෙන්වන්න එතුමාට එසේ වුවමනා කර තිබෙනවා. අද "දවස" පත්‍රයේ පළ වී තිබෙන කතෘ වාක්‍යයෙන් කොටසක් මෙසේ යි :

"මහත්මා ගාන්ධි ධනවත් භාවයෙන් දුගී බවටත්, ඉසුරුමත් මාලිගාවෙන් දුප්පත් පැල්පතටත්, යුරෝපීය ඇඳුම් කට්ටලයෙන් දණකඩටත් බැස්සේය. ඒ දණකඩ සිය රටෙහිම නිපදවා ගැනීමේ දැහැණ මතුරා එංගලන්තයේ ලැංකෂයරයේ සුද්දන්ගේ මහ රෙදි කම්හල් අල්ල මත නටවා, දණකඩෙහි නොහොත් අමුඩයෙහි බලයෙන් භාරත දේශයේ නිදහස් මග පාදා දුන්නේය."

එම නිසා මා නම් අමුඩය තරම් අගය කරන වෙන දෙයක් නොමැති බව ගරු අගමැතිතුමාට මතක් කර දෙන්නට කැමතියි. මා අමුඩයෙන් සිටිනවා බලන්න අගමැතිතුමාට වුවමනා බව කියනවා. හැබැයි නිකවැරටිය ජනතාව අමුඩය ගැසූ දාට අධිරාජ්‍යවාදීන්ට ගරු කරන ඔය ධනේශ්වර කොටස්වලට යාමට සිදු වන ස්ථාන දැන්ම සොයා ගන්නැයි අප කියනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)
රට අමුඩෙන් විසි කරලයි යන්නෙ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
එහෙම නොවෙයි කිව්වෙ. අමුඩෙ නැතුව ඉන්නවා බලන්න ආස බවයි කිව්වෙ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
මා සිතා සිටියේ, ගරු අගමැතිතුමා කැමති අනික් දේවලටය කියායි.

ගරු අගමැතිතුමා මේ රටේ වී නිෂ්පාදනය ගැන උදම් අනනවා; ආඩම්බර වෙනව; පුරසාරම් දොඩනවා. අස්වැන්න වැඩි වී තිබෙන්නේ කොහේද කියා මා එතුමාගෙන් ප්‍රශ්න කරනවා. වී නිපදවීමේත් අස්වැන්න ලැබීමේත් වෙනසක් තිබෙන බව අගමැතිතුමාට මතක් කරන්නට කැමතියි. 1966 මාස් කන්නයේ වී නිපදවීම වැඩි වී තිබෙන බව ඇත්තයි. වී අස්වැන්න නොව වී නිපදවීම 1966 මාස් කන්නයේදී වැඩිවී තිබෙන්නේ මාස් වැසි යනාදිය හරියාකාර ලැබුණු නිසයි. ඒ හේතු කොටගෙන ගොඩ ගොවිතැන් ඉතා හොඳට සරු වුණා. එම නිසා හේන්වලත් වී ඉස්සා. අපේ ප්‍රදේශවල ට්‍රැක්ටර්වලින් සෑම තැනම හාලා ඉහාපු වීත් හොඳට පැසුණා. 1966 මාස් කන්නයේදී වී නිපදවීම වැඩි වුණේ ඒ හේතුවෙනුයි. නමුත් අසවැන්න වැඩි වීමක් සිදු වී නැහැ. අස්වැන්න වැඩි වෙනවා නම් අක්කරයකට නිපදවන ප්‍රමාණය වැඩි වෙන්නට ඕනෑ. වාරිමාර්ග ක්‍රම යටතේ වී ප්‍රමාණයත් කොහොමවත් වැඩි වෙලා නැහැ. මා ඒ ගැන අපක්ෂපාතීව සොයා බැලුවා. [බාධා කිරීමක්] මීගමුවේ ගරු මන්ත්‍රීතුමා (ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.) සමග වී ගැන කතා කිරීමෙන් වැඩක් නැහැ. එතුමාත් මාත් මාලු ගැන කතා කළොත් එතුමා දිනනවා ඇති.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)
වී ගැනත් දන්නවා; මාලු ගැනත් දන්නවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
අද වාරිමාර්ග ක්‍රම යටතේ අපේ කට්ටිකරුවන්ගේ අක්කරවලින් මාස් කන්නයේ වී අස්වැන්න ලබා ගන්නේ කෙසේද කියා බලමු. අපේ ප්‍රදේශයේ—වයඹ පළාතේ—අස්වැන්න අක්කරයකට බුසල් 32කට, 33කට, 34කට, 35කට හෝ 36 කට වැඩි වී නැහැ. ඒ සාමාන්‍ය ගණනයි. එහෙත් ඔය දෙපාර්තමේන්තුවල සංඛ්‍යා ලේඛන සකස් කරන ක්‍රමයට අනුව පෙනෙන තත්ත්වය කුමක්ද? දිග මෙපමණයි, පළල මෙපමණයි කියා යම්කිසි කුඹුරු ප්‍රමාණයක් මැනගෙන ඒ ප්‍රමාණය කපා බලා එමගින් තීරණයකට බැසීමේ සිරිත පවතිනවා. ඒ ක්‍රමය වැරදියි. සාමාන්‍ය ප්‍රමාණයට අනුව සොයා බැලුවොත් වයඹ පළාතෙන් අක්කරයකට බුසල් 35කට 36කට වැඩිය අස්වැන්නක් ලැබුනේ නැති බව පෙනෙනවා ඇති. හැබැයි හොඳින් පැසුණු කුඹුරක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

අඩි 16×16 හෝ එවැනි වෙනත් සම්කිසි සුළු ප්‍රමාණයක කොටසක් තෝරා ගෙන එහි අස්වැන්න කපා එවෙලේම පාගා මැන සංඛ්‍යා ලේඛන හැදුවාම නම් තත්ත්වය වෙනස්. ඒ ගැන මම අගමැතිතුමාට දොස් කියන්නේ නැහැ. එහෙත් අද සංඛ්‍යා ලේඛන සැපයීමේ ක්‍රමය ඒකයි. ඒ ගණන් බැලීමේ ක්‍රමය වැරදියි. අප විසින් බැලිය යුතුව තිබෙන්නෙ සාමාන්‍ය විධියට ගොවිතැන් කරන සාමාන්‍ය ගොවියෙක් තම කමතෙන් ගෙදර ගෙනෙන වී ප්‍රමාණය අක්කරයකට බුසල් කීයද කියලයි. වයඹ පළාතේ නම්, නිකවැරටිය කොටසෙ නම් වීවල අස්වැන්න වැඩි වී නැහැ. ඒ නිසා අපට කියන්ට පුළුවන්කමක් නැහැ, නිපදවෙන අස්වැන්න ප්‍රමාණය වැඩි වී තිබෙනව කියා. වී නිපදවීම වැඩි වුණු බව නම් අපි පිළිගන්නව. එහෙත් අස්වැන්න වැඩි වෙලා නැහැ. නිපදවීම වැඩි වීමට හේතු වුණේ මාස්කන්නයේ හොඳහැටි වර්ෂාව ලැබුණු නිසා හැම කුඹුරකම වගේ හොඳින් පැසුණු නිසයි. ඒක නොවෙයිද, නියම තත්ත්වය? හැම නරක දෙයක් ගැනම සඳහන් කරන විට කියන්නෙ අපට ඉඩෝරයට මුහුණ දෙන්ට සිදුවුනාය, අපට අධික වර්ෂාවට මුහුණ දෙන්ට සිදු වුණාය කියායි. අපනයන පහත වැටීමට හේතුව වශයෙන් පෙන්වා දුන්නෙ ඒ කාරණායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ තත්ත්වයෙන් වෙනස් වී 1970 වන විට අපට පිටරට හාල් යවන්ට පුළුවන්ය කියන විශ්වාසය ඇතිව ගරු අගමැතිතුමා ක්‍රියා කරනවා නම් ඒ බලාපොරොත්තු රහිත විශ්වාසය නිසා අප අමාරුවේ වැටෙන්ට පුළුවන්. ඒක මිරිඟුවක්.

ඊළඟ කාරණය මේකයි: මේ රටේ වී ගොවිතැන සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ ආදිය සඳහා පිටරට ඇදී යන මුදල් ප්‍රමාණය වැඩිවෙමින් පවතිනව. ට්‍රැක්ටර් ආදිය ගෙන්වීම සඳහා රුපියල් කෝටි 4 කට වැඩි මුදලක් වැය කර තිබෙන බව ප්‍රකාශ කරමින් ගරු අගමැතිතුමා ආඩම්බරයෙන් කථා කළා. 1966 අවුරුද්දේ රුපියල් කෝටි 2 කට ටිකක් වැඩි මුදලක් ඒ සඳහා වැය කර තිබෙන බව මට පෙනී ගියා. අද වී නිෂ්පාදනය සඳහා කොතරම් විශාල මුදල් ප්‍රමාණයක් පිටරට ඇදී යනවා දැයි අපි මොහොතක් කල්පනා කළයුතුව තිබෙනව. ට්‍රැක්ටරයක් මෙරටට ගෙන්වා ගොඩ බෑ වෙලාවේ සිට ඊට වියදම් වන සෑම මුදලක්ම පිටරට ඇදී යන මුදලක් බව මතක් කරන්ට ඕනෑ. ට්‍රැක්ටර් ගෙන්වන න—ගෙන්වන්න ක්‍රම ක්‍රමයෙන් මේ රටෙන් පිටරට ඇදී යන මුදල් ප්‍රමාණය වැඩි වෙනව. එම නිසා ට්‍රැක්ටර් ගෙන්වීම මේ රටේ ගොවිතැන් දියුණුවට යෝග්‍යයයි මා නම් පිළිගන්නෙ නැහැ. ට්‍රැක්ටර් ගෙන්වීම නිසා ගම්බද ගොවියාගේ ආදායම් මාර්ගයක් අද සම්පූර්ණයෙන්ම අඩපණ වීගෙන යනව. හේතුව මෙයයි: ට්‍රැක්ටර් ගෙන්වන්න කලින්, තමන්ගේ කුඹුරු සාගන්න තමාගේ හරකා බාන ගොවියා විසින් යොදා ගනු ලැබුව. එයින් තමාගේ ශ්‍රමය ගවයා සමග යෙදවීමෙන් වීවලින් උපයා ගන්න ආදායමින් වැඩි කොටස ගොවියා අතේ රුඳුණ. හරකා බාන තමාගේම නිසා ඔවුන්ට කෑම බිම සඳහා කරන වියදම හැර වෙන වියදමක් ගොවියාට දරන්ට සිදු වුණේ නැහැ. දැන් තත්ත්වය කොහොමද? අද ට්‍රැක්ටර් සොයා දවස් ගණනක් රස්තියාදු වන්ට ගොවීන්ට සිදු වෙනව. ට්‍රැක්ටරයකින් අක්කරයක් හාන්න කුලිය රුපියල් 55 ක් විතර අය කරන බව සමහර ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළත් ඒ සඳහා ඊටත් වැඩි ගාස්තුවක් අය කරනවා කියන එකයි, මගේ හැඟීම. අනෙක් කාරණය ගොවියාගේ ශ්‍රමය වැය වීමක් නැතිකමයි. උපයන මුදල සම්පූර්ණයෙන්ම වාගේ ට්‍රැක්ටර් මුදලාලිට යන නිසා ගොවියාගේ ආදායම ආරක්ෂා වන්නෙත් නැහැ. ඒවාගේම ට්‍රැක්ටරය මඩ කුඹුරට යෝග්‍ය වන්නෙත් නැහැ. මේ බව අද ඕනෑම ගොවි මහත්මයකුගෙන් ඇහුවොත් පැහැදිලිව කියයි. ට්‍රැක්ටරය මඩ කුඹුරට යෙදූ විට කුඹුර ඕනෑවාට වැඩියෙන් හෑරෙනවා. ඒ නිසා යට තිබෙන පස උඩ මතු වී කුඹුරෙහි තිබෙන පෝර ගතිය සාරවත් ගතිය සම්පූර්ණයෙන්ම නැති වී කුඹුර නිසරු වෙනවා. මේ ක්‍රමය යටතේ අස්වැන්න වැඩි වී නැතැයි මා කීවේ ඒ නිසයි. මේ පිළිබඳ වැදගත් කරුණු අඩංගු පොතක් මට ලැබී තිබෙනවා. මේ පොත ලියා තිබෙන ග්‍රිස්ට් නමැති මහත්මයා ඉතාම අවංකව මෙහි කරුණු දක්වා තිබෙනවා. අපේ රටේ විශේෂඥයන්ගෙන් නම් අද අවංක අදහස් ලබා ගැනීම අපට අමාරුයි. සමහර විටක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ අය අවංකව අපක්ෂපාතව අදහස් ඉදිරිපත් කරන නට ලැස්ති වුණත් රජයේ මත අනුව විශේෂඥ මත වෙනස් වෙනවා.

අද අපේ පාසල්වල කෘෂිකර්මය ඉගෙන ගන්නා ළමයින් පවා ජ්‍යෙෂ්ඨය සමත් වුණායින් පසු නගුල අල්ලාගෙන හරකුන් පසුපස යන්නට කැමැත්තක් දක්වන්නේ නැහැ. ඔවුන් ආශාවක් දක්වන්නේ කලිසම ඇඳගෙන ට්‍රැක්ටරයක් එළවන්න ටයි. ඒ නිසා ඔවුන්ටත් ඊට ඉඩ සැලසීමක් වශයෙන් අද ට්‍රැක්ටර් යෙදවීමට අප පුරුදු වී සිටිනවා. මෙය භයානක තත්ත්වයක්. අපේ විනිමය ආරක්ෂා වන්නේ මොන විධියෙන්ද යන්න මිස වැඩ ඉක්මන් වන්නේ මොන ක්‍රමයෙන්ද යන්න නොවෙයි ප්‍රශ්නය. ජ්‍යෙෂ්ඨය සමත් වුණු අය ගොවිතැනට යෙදවිය යුතු නිසාත් කලිසම ඇඳ ට්‍රැක්ටරයක් එලවීමට ඔවුන් තුළ ඇති ආශාවට ඉඩ දිය යුතු නිසාත් අද අප හැම තැනටම ට්‍රැක්ටර් යෙදවීමට පුරුදු වී සිටිනවා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

කාර් බස්වලින් නොගිහින් පයින්ම ගමන් බිමන් යනවා නම් තවත් සල්ලි ඉතිරි කර ගන්නට පුළුවනි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

දැන් මා ඩී. එච්. ග්‍රිස්ට් මහත්මයාගේ පොතෙන් කොටසක් කියවන්නට අදහස් කරනවා. ගොවිතැන් කටයුතුවලට යන්ත්‍ර සූත්‍ර යෙදීම ගැන පරීක්ෂණයක් කර ඇති ඒ මහතා අද ලෝකයේ ඇති වැදගත්ම ධාන්‍ය වර්ගය "රයිස්" හෙවත් හාල් බව මෙහි කියා තිබෙනවා. මේ පොතේ 204 වැනි පිටුවෙහි ඒ මහත්මයා, ගොවිතැනට යන්ත්‍ර යෙදවීම ගැන කියා තිබෙන්නේ මෙසේයි :

"Mechanization within the existing framework of peasant colonization is another matter, a matter of untried agronomic experiment. Work should proceed with caution; the Government and the peasant must beware of the pushful commercial pedlars of the apparent panacea of mechanization, and even look in the mouth of gift-horses which arrive under the Colombo Plan."

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

ඒකෙ කිසි වරදක් නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ගොවිතැන් කටයුතු සඳහා ට්‍රැක්ටර් යෙදවීම සම්පූර්ණයෙන් අසාර්ථක අත් හදා බැලීමක් බවයි ඒ මහතා අදහස් කරන්නේ. ගොවියාගේ ශ්‍රමය වැය වීමට අවස්ථාවක් නොලැබීමත් ට්‍රැක්ටර් යන්ත්‍ර ගෙනා දා සිට රටේ ආදායම විදේශවලට ඇදී යාමත් ගොවියාට අවශ්‍ය වේලාවට ඒවා ලබා ගන්නට පුළුවන්කමක් නැති වීමත් යන කරුණු ඊට හේතු වශයෙන් දක්වන්නට පුළුවනි. ට්‍රැක්ටර් හොයමින් දවස් ගණන් රස්තියාදු වන්නට අද ගොවීන්ට සිදුවී තිබෙනවා. කුඹුර හෑමට හෝ මැඩවීමට හෝ තමන් ළඟ හරකුන් සිටිනවා නම් ඒ කටයුත්ත නියම වේලාවට කර ගන්නට ගොවියාට කිසිම අපහසුවක් නැහැ. ට්‍රැක්ටර් නිසා ගොවියාගේ ආදායම් තත්ත්වයත් පිරිහී යනවා. ට්‍රැක්ටර් මුදලාලිලාගේ ගසාකෑම නිසා, ගොවියාගේ ආදායම ඔහු ළඟ රැඳෙන්නේ නැහැ. ඔහුට කොතෙක් ආදායම් ලැබුණත් ඉන් වැඩක් නැහැ. ඔහුගේ ආර්ථික තත්ත්වය පිළිබඳව කිසිම ආරක්ෂාවක් ඔහුට නැහැ. ඒ අතරම ඔහුගේ එදිනෙදා ජීවිතයේ විය හියදම් බොහෝ වැඩි වී තිබෙනවා. ඔහු උදැල්ලකට රු. 17.50 ක් ගෙවන්නට ඕනෑ ; ඔහුගේ පාසල් යන ළමයකුට එක්සර්සයිස් පොතක් ගන්නට ශත 25 ක් 30 ක් ගෙවන්නට ඕනෑ ; පැන්සලයකට ශත 20 ක් ගෙවන්නට ඕනෑ. මේ ආදී ආර්ථික ප්‍රශ්න නිසා ගොවියා අතේ කිසිම මුදලක් රැඳෙන්නේ නැහැ. මේ ආදී කරුණු අනුව අපේ ගොවියා මොන තත්ත්වයකින් ජීවත් වෙනවාද යන්න අපක්ෂපාතව සොයා බැලීම අපගේ යුතුකමක්.

ඔව්, අපේ සෞඛ්‍ය තත්ත්වය බැස තිබෙනවාය කියා ගරු සෞඛ්‍ය ඇමතිතුමා කියනවා. ඇත්ත වශයෙන්ම ගම්බද සෞඛ්‍ය තත්ත්වය දැන් සම්පූර්ණයෙන්ම පිරිහීගෙන යනවා. ඒවාගේම ජනතාව මන්ද පෝෂණයෙන් පෙළෙනවා. ජනතාව මන්දපෝෂණයෙන් පෙළීම පුදුමයක් නොවෙයි. අද ගම්වල හරකුන් 'ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]
කිරීමක් නැහැ. මසට හරකුන් මැරීම තහනම් කරන්නටය කියා අප මේ ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කළා. එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමට හේතු මොනවාද කියා අප කරුණු පෙන්වා දුන්නා. හරකා නැත්නම් මී හරකා නැතිව ගොවිතැන සාර්ථක කර ගන්නට බැහැ. හරකුන් මැරීම තහනම් නොකර අඩුම ප්‍රමාණයට සරිලන පරිද්දෙන් හරකුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීමක් කරන්නට බැහැ. ඒවාගේම ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කර ගැනීමටත් අපට හරකා වුවමනා වෙනවා. මේ රටේ ගොවියාට ගවයාගේ සහාය ලබාදීමට ක්‍රියාකාරී වැඩ පිළිවෙළක් අත්‍යවශ්‍යයි. සාර්ථක ලෙස, අවංක ලෙස එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන තුරු කවදාවත් මේ රටේ ගොවිතැන සාර්ථක කර ගන්නට බැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කෘත්‍රිම පොහොර වර්ග යෙදීම ගැන ග්‍රිස්ට් මහත්මයාගේ පොතේ මේ විධියට සඳහන් කර තිබෙනවා :

"Cattle manure is generally considered the most satisfactory form of organic matter for the paddy crop. . ."

ඒ විධියට කියාගෙන ගිහින් මෙසේත් සඳහන් කර තිබෙනවා :

"Trials in Lower Burma showed that cattle manure supplying 70 lb. nitrogen gave a five-year increase over controls of 68.7 per cent. while the residual value of the dressing was 37.7 per cent. greater than the controls."

මේ කියන්නෙ කුඹුරට, ගොයමට, පොළවට, වී වගාවට ගොම පොහොර තරම් අනර්ඝ පොහොරක් තවත් නැත යන්නයි. කොටින්ම ඒ මහත්මය කියන්නෙ මේකයි :

"ගොයමට දැමිය යුතු පොහොර අතින් ගොම පොහොර සතුටුදායක පොහොරක් වශයෙන් සලකනු ලැබේ . . .

පහළ බුරුමයේදී කරන ලද පරීක්ෂණවලදී ගොම පොහොර යෙදීමෙන් අවුරුදු 5 කදී අස්වැන්න සියයට 68.7 කින් වැඩිවූ බවත් පොළොව මතු පිට පසෙහි පොහොර තත්ත්වය සියයට 37.7 කින් වැඩි වූ බවත් සොයා ගෙන ඇත."

මා නොවෙයි, ග්‍රිස්ට් මහත්මයයි මේ කියන්නෙ. පරීක්ෂණ පවත්වා තිබෙනවා. ප්‍රතිඵල සොයා ගෙන තිබෙනවා. වී නිෂ්පාදනය සාර්ථක කර ගත හැක්කේ කෙසේද යන්න එතුමාගේ පොතේ විස්තර කර තිබෙනවා. මේ රටේ වී නිෂ්පාදනය වැඩි කර ගන්නට අපට වුවමනා කර තිබෙනවා. අපට විදේශීය රටවලින් හාල් බලාපොරොත්තු වෙන්නට බැහැ. එම නිසා වී නිෂ්පාදනය කිරීමේ වැඩ පිළිවෙළ සාර්ථක වන අන්දමට ක්‍රියාවේ යොදවන්න. එය අසාර්ථක වන අන්දමට ක්‍රියාවේ යොදවන්නට එපා. සංඛ්‍යා ලේඛනවලින් රවටන්නට එපා. වී ගොවිතැන් ගැනත් පොහොර ගැනත් මා මේ අවස්ථාවේදී කියන්නෙ එපමණයි. ඇතැම් පොහොර වර්ග යෙදීම නිසා අද සමහර කුඹුරුවල අස්වැන්න අඩුවී තිබෙනවා. ක්‍රමානුකූලව ඒ පොහොර යෙදුවත් ඒ සඳහා වැය වෙන මුදල අධික නම් ඒ පොහොර යෙදීමේ තේරුමක් නැහැ. එම නිසා කුඹුරු ගොවිතැන ගැන කල්පනා කර බලන විට සෑම අංශයකින්ම ගොවියාට ප්‍රයෝජනයක් ලබෙනවාද නොලැබෙනවාද කියා අප අවංකවම කල්පනා කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අයවැය ලේඛන විවාදයේ දීත් ඊට පෙරත් ගරු අගමැතිතුමා කර්මාන්ත ගැන සඳහන් කර තිබෙනවා. අප වැඩියෙන් කල්පනා කළ යුත්තේ කෘෂිකාර්මික කර්මාන්ත ගැනය කියා එතුමා කියනවා. අපේ රට කෘෂිකාර්මික රටක්. එම නිසා අපේ කර්මාන්තත් කෘෂිකාර්මික පදනමක් උඩ තිබෙන්නට ඕනෑය කියා එතුමා කියනවා. එහෙත් මේ රජය කෘෂිකර්මය දියුණු කරන්නට, ගොවිතැන දියුණු කරන්නට කුමක් කර තිබෙනවාද කියා මා ප්‍රශ්න කරනවා. කර්මාන්ත ගැන ආඩම්බරයෙන් මෙන්න මෙහෙම සඳහන් කර තිබෙනවා. අද සෑම අවස්ථාවේම ඇස්ති වන්නේ ආසියාවේම ලොකු දේවල් කරන්නටයි. ඊට නිදර්ශනයක් වශයෙන් අයවැය කථාවේ 31 වැනි පිටුවේ ඇති මේ කොටස මා පෙන්වා දෙන්නට කැමතියි.

"තුල්හිරියෙහි, ඇතැම් විට පෙරදිග පිහිටි විශාලතම කර්මාන්ත ශාලාවලින් එකක් විය හැකි, ඒකාබද්ධ රෙදිපිළි කර්මාන්ත ශාලාව පිහිටුවීම පිළිබඳ වැඩ ද මේ වර්ෂයේ දී ආරම්භ කෙරුණා."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රෙදි පිළි කර්මාන්තය සම්බන්ධයෙන් එම පිටුවේම මෙසේද සඳහන් වෙනවා:

"වේයන්ගොඩ රෙදි පිළි කර්මාන්ත ශාලාවෙහි විවීම් අංශය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන ලද අතර, ඉදවරු වැඩ ක්‍රමය ද ආරම්භ කරනු ලැබුණා."

එහෙත් එක කපු පැළයක්වත් සිටුවීම ගැන මේ අයවැය කථාවේ සඳහන් වී නැහැ. රෙදි පිළි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය නූල් සාදා ගැනීමට නම් කපු පැළ සිටුවන්නට ඕනෑ.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

උඩවලවේ ගියා නම් කපු පැළ ඕනෑ තරම් දැක ගන්නට තිබුණා. එහෙත් ගරු මන්ත්‍රීතුමා ඒ සංචාරයට එක් වුණේ නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

රෙදි පිළි නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය සපයා ගැනීමට මාර්ග යොදා නැහැ. ඒවා හැම දාමත් පිටරටින් ගෙන්වා ගැනීමටද, බලාපොරොත්තු වන්නේ? කපු පැළ සිටුවීම ගැන අයවැය කථාවේ එක වචනයක්වත් සඳහන් වී නැහැ.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

උඩවලවේ ව්‍යාපාරයේ අක්කර සිය ගණනක කපු වගා කර තිබෙනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

අද ගම්බද ප්‍රදේශවල රෙදි විවීම පිළිබඳව ඉතා උනන්දුවකින් කටයුතු කරගෙන යනවා. එහෙත් සිදු වී තිබෙන්නේ මොකක්ද? නූල් හිඟය නිසා ගම්බද ප්‍රදේශවල රෙදි විවීමේ කර්මාන්තය කරන්නට බැරි තත්ත්වයක් උද්ගත වී තිබෙනවා. මේවා පිළිගන්නට ඕනෑ. නූල් ගන්නට ගියාම නොයෙකුත් අපහසුකම්වලට, දූෂණවලට ලක් වෙනවා. ඒ නිසා රෙදි විවීමේ මධ්‍යස්ථාන සමහරක් වසා දමන්නට පවා සිද්ධ වී තිබෙනවා. [බාධා කිරීම්] කෘෂිකාර්මික පදනමක් මත මේ රට දියුණු කරනවායැයි ගරු අගමැතිතුමා කියනවා. එහෙත් එය වචනයට පමණක් සීමා වී තිබෙනවා. අද ගම්බද ප්‍රදේශවල රෙදි විවීමේ කර්මාන්තය ඇනහිට තිබෙනවා. ඊට හේතුව, නූල් හිඟයයි. ඒ නිසා රෙදි විවීමේ යෙදී සිටින ගම්බද උදවිය නොයෙකුත් අසීරුකම්වලට, අමාරුකම්වලට මුහුණ පානවා. කෘෂිකාර්මික පදනමක් මත මේ රට දියුණු කරනවායැයි කටින් කියමින් එය ක්‍රියාවට නොනැඟීම ගැනයි, අප කණගාටු වන්නේ. ඒ නිසා තමයි, අපේ විදේශ විනිමය නාස්ති වන්නේ. අපේ අනාගතය අඳුරුයි; භයානකයි.

දේශ සංචාරකයන් මෙරටට අද්දා ගැනීම සඳහා මුදල් වියදම් කරන්නට පුළුවන් වීම ගැන රාජ්‍ය ඇමතිතුමා බොහොම සන්තෝෂ වෙනවා. ඒ සඳහා රුපියල් 35,50,000ක් වියදම් කරන්නට ලැස්ති වෙනවා. වෙනත් කිසිම කර්මාන්තයක් සඳහා වැය නොකරන තරමේ මුදලක් දේශ සංචාරකයන් අද්දා ගැනීම සඳහා වැය කරන්නට සූදානම් වෙනවා.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

එයින් කොපමණ හම්බ කර ගන්නට පුළුවන්ද?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

දේශ සංචාරකයන්ගෙන්ද, වැඩියෙන් සල්ලි හම්බ කර ගන්නට ලැස්ති වන්නේ? දේශ සංචාරය පිළිබඳව කටයුතු කරද්දී අද ලෝකයේ ඇති වී තිබෙන තත්ත්වයත් සොයා බලන්නට ඕනෑ. හැම ද්‍රව්‍යයකම වාගේ මිළ වැඩි වී තිබෙන බව මේ අයම කියනවා. ලෝකයේ හැම රටකම පාහේ ජීවන වියදම වැඩි වී තිබෙනවා. ඒ නිසා ඒ රටවලට යම් දවසක සිදු වෙනවා, විනෝදය සඳහා දේශ සංචාරයේ යෙදෙන අයට දෙන මුදල සීමා කරන්නට. එහෙම වුණොත්—එහෙම වන්නේ නැතැයි සිතන්නට බැහැ; යුද්ධයක් ඇති වුණොත්?—දේශ සංචාරකයන් මාර්ගයෙන් උපයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]
ගන්නට, බලාපොරොත්තු වන මුදල අපට ලැබෙයිද ? අද නොයෙකුත් රටවල ආරාවුල්, යුද්ධ ඇති වී තිබෙනවා. ඒ නිසා අපට බලාපොරොත්තු වන ආදායම දේශ සංචාරකයන්ගෙන් නොලැබෙන්නට හොඳ ටම ඉඩ තිබෙනවා. එවැනි යුද්ධ කාලයකදී, ආර්ථික අගේතියකදී කිසිම රටක් දේශ සංචාරකයන් සඳහා විශාල මුදලක් වෙන් කරන්නේ නැහැ.

එහෙත් මට එක කාරණයක් පෙනෙනවා. තෙල් සම්බන්ධයෙන් අපට ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන්ගෙන් ලෙහෙසියෙන් බේරෙන්නට පුළුවන් වුණේ නැහැ; බොහොම අමාරු වුණා. තෙල් ව්‍යාපාරය අතට ගෙන සිටි අධිරාජ්‍යවාදීන්ගෙන් බේරෙන්නට බොහොම අමාරු වුණු හැටි කාටත් මතකයි. මා තුළ දැන් තවත් බියක් ඇතිවේගන එනවා. දේශසංචාරයේ නාමයෙන්, සංචාරකයින් මේ රටට ගෙන්වා ගැනීමේ ව්‍යාපාරයේ නාමයෙන්, නැවත වරක් අපට ඔය ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන් අතට යට වන්නට සිදු වේද යන භයානක ප්‍රශ්නය දැන් අප තුළ ඇතිවේගන එනවා. විදේශිකයන් දේශසංචාරකයින් වශයෙන් අපේ රටට පැමිණීම අපේ සතුටට කාරණයක්. දේශසංචාරක ව්‍යාපාරය යටතේ අපේ රටට පැමිණෙන විදේශිකයන් අතර අපේ සමාජ තත්ත්වය, අපේ බෞද්ධාගම, අපේ නැටුම්, අපේ ගැයුම්, අපේ වැයුම් ආදී සියලු දෙයක්ම ප්‍රචාරය කරන්නට පුළුවන් නම් ඒ ගැන අප සන්තෝෂ වෙනවා. අපේ උතුම් දේවල්, ලෝකයේ වෙන කිසිම රටක නැති දේවල්, ලොවට ඉදිරිපත් කරන්නට පුළුවන් නම් හොඳයි. ඒ කොයි හැටි වෙතත් මේ තරම් ඉක්මනින් මේ ව්‍යාපාරය ආරම්භ කර, ඒ වෙනුවෙන් විශාල ධනස්කන්ධයකුත් වැය කර, අන්තිමේදී එය අසාර්ථක වුනොත් අප කරන්නේ කුමක්ද? එය මේ ප්‍රශ්නයේ එක් පැත්තක් පමණයි. අනෙක් පැත්තත් ඒ තරම්ම භයානකයි. සංචාරක ව්‍යාපාරයක් ඇති කිරීමේ පනත් කෙටුම්පත මේ ගරු සභාවේ විවාදයට භාජන වූ අවස්ථාවේත් ඒ ගැන කියා තිබෙනවා. මේ ව්‍යාපාරයෙන් සම්පූර්ණ අධිරාජ්‍යයක් ඇති වන්නට පුළුවනැයි අප විසින් බියක් පළ කර තිබෙනවා. දේශසංචාරක ව්‍යාපාරයේ නාමයෙන් මේ රටේ නොයෙක් කර්මාන්ත ඇති වන්නට පුළුවනි. ගොවිතැන් කටයුතුවල යෙදෙන්නටත් පුළුවනි. සංචාරකයන් ගෙන්වා ගැනීමටය කියා ඔය විධියේ නොයෙක් දේවල් ඇති කළ හැකි බව එදාත් අප කියා තිබෙනවා. ඒ නිසා නැවතත් ඒ කාරණය කෙරෙහි මේ ආණ්ඩුවේ සැලකිල්ල යොමු කරන්නට කැමතියි.

මේ ආණ්ඩුව වැඩකරන ජනතාවගේ යහපත සඳහා රුපියල් විස්ස, රුපියල් දහය ආදී වශයෙන් විශේෂ දීමනාවක් ගෙවන්නට අදහස්කර තිබෙනවා. ඒ ගැනත් මතක් කරන්නට ඕනෑ. පොදු මහජනතාවගේ යහපත සඳහා ඒ දීමනාව දෙන්නටයි යන්නේ. මා අද උදේ බස් රියෙන් කොළඹට එන විට මේ විශේෂ දීමනාව ගැන රජයේ සේවකයන් අතර ඇති වූ කථාවක් අහන්නට ලැබුණා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
පයින්ම ආවා නම් ඒ මුදලත් ඉතිරි කර ගන්නට තිබුණේ නැද්ද ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
බොහොම ස්තුතියි. මට අහන්නට ලැබුණු ඒ කථාවේ හරයයි මේ අවස්ථාවේ කියන්නට බලාපොරොත්තු වන්නේ. මට ඇහුණු විධියටයි මා තේරුම් ගත්තේ. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විධියටයි මං ඒ කථාව කියන්නේ. ආණ්ඩුව නම් හිතනවා ඇත්තේ අප හිතන්නත් හැටියටයි. මේ වැඩිපුර දෙන්නට යන මුදල ගැන කොයි තරම් කිව්වත් ඇත්ත වශයෙන්ම කල්පනා කර බලන විට දවසකට ශත තිස්තුනක්ද කොහේදෝ සුළු ගණනක් නොවෙයිද? තක්සේරු කර බලන කෙනකුට ඒ මුදලේ ප්‍රමාණය පැහැදිලි වෙනවා. රැවටීමට නොවෙයිද මේ මුදල දෙන්නට යන්නේ? අද රජයේ සේවකයාගේ තත්ත්වය ඊට වඩා වෙනස්. රජයේ සේවකයා දැන් දියුණු වීමේ මං නැතිව අතරමං වූවකුගේ තත්ත්වයට වැටී සිටිනවා. ඔහුට ඉදිරියට යන්නට තිබුණු මාර්ග ක්‍රමක්‍රමයෙන් වහනවා. පසුගිය රජය කණිෂ්ඨ සේවකයාගේ තත්ත්වය ගැන කල්පනා කර, පහත් පෙළේ තනතුරකින් පටන් ගත් රජයේ සේවකයාට ඉහළ යාමට පුළුවන් වන ආකාරයට වැඩ පිළිවෙළක් සකස් කළා. ඒ අයට දියුණුවේ දොර විවෘත කර දුන්නා. අද ඒ අයට ඒවා නැහැ. දැන් ක්‍රමක්‍රමයෙන් ඒ දොර වහගෙන යනවා. ඒ එකක්. තවත් දුක්ගැනවිලි රාශියක්ම රජයේ සේවකයා ඉදිරිපත් කරනවා.

සිංහල ප්‍රවීණතාව ලත් රජයේ සේවකයාට දැන් මොකක්ද ලැබෙන්නේ? පහත් පෙළේ තනතුරු ලැබිය යුතු අයට උසස් තැන් ලැබෙනවා. ඒ අතර උසස් තනතුරු ලැබිය යුතු අයට පහත් තැන්වලට යන්නට සිදුවේගන යනවා. ඒවා තමයි දැන් සිද්ධවේගන යන්නේ. මා කියන මේ කථාව සත්‍ය බවට ඔය රුපියල් විස්සේ, රුපියල් දහයේ දීමනාව ලැබීමට හිමිකම් ලබන සේවකයන්ම සාක්ෂ්‍ය දරණු ඇතැයි මා කල්පනා කරනවා. මා ඒ ප්‍රකාශ කළේත් මට අහන්නට ලැබුණ පරිදි එක් කෙනකු ප්‍රකාශ කළ අවංක මතයයි. එය එසේම නොවෙයිද?

රුපියල් දහයක් නැත්නම් රුපියල් විස්සක් අතිරේක වශයෙන් දී රජයේ සේවකයා රවටන්නට බැහැ. මේ මුදල දීම ආර්ථික වශයෙන් කල්පනා කර බලන විට බඩු මිළ ඉහළ යාමට හේතුවක් වෙනවා ඇති. ඒ කාරණයත් ඔය පිරිස සාකච්ඡා කළ හැටි මට අසන්නට ලැබුණා. අපට දැන් වුවමනා කර තිබෙන්නේ වැඩිපුර යම් මුදලක් ලබා ගැනීමට නොවෙයි. අප මිළයට ගන්නේ මොනවාද, ඒවා වෙනුවෙන් වැඩි මිළක් ගෙවන්නට වුනොත් අපට සිදු වන්නේ මොකක්ද, ආදි වශයෙන් ඒ අය කථා කළා. අවශ්‍ය භාණ්ඩ වෙනුවෙන් ගෙවන්නට සිදු වන මිළ අඩු කර සුළු මුදලකින් ජීවත් වන්නට ඉඩ ලැබෙන වැඩ පිළිවෙළක් සකස් කරනු දකින්නටයි කවුරුනුත් කැමැත්ත දක්වන්නේ. එහෙම නැතිව වැඩිපුර මුදලක් දී ඒ මුදල ආපසු යන්නට පාර කැපීම කාගේවත් සතුටට කාරණයක් වන්නේ නැහැ. මේ විශේෂ දීමනාව නම් හරියට මේ සාක්කුවේ තිබෙන සල්ලි අරන් අනික් සාක්කුවට දමන්නා වාගේ වැඩක් නොවෙයිද? රජයේ සේවකයින්ගෙන් කොටසකට රුපියල් දහයක්-විස්සක් දෙන විට ජීවන වියදම් වැඩි වෙනවා. බඩු මිළ නගිනවා. එයින් වැඩක් නැහැ. මේ රටේ පොදු ජනතාව පරිහරණය කරන භාණ්ඩවල මිළ අඩු කරන්නටයි වැඩ පිළිවෙළක් ඇති කළ යුත්තේ. ඒ සඳහා නිෂ්පාදන වැඩි කරන්නටත් ඕනෑ. අප නිපදවන දේවල් සඳහා අපට හොඳ මිළක් ලබා දෙන්නටත් උත්සාහ කරන්නට ඕනෑ.

ලෝක වෙළෙඳ පොළේ බඩුමිළ ඉහළ යාම හෝ පහළ යාම හෝ නතර කරන්නට පුළුවන්කමක් සාමාන්‍ය මිනිසාට ඇත්තේ නැහැ. ඒ වගේම අපේ රටේ තිබෙන ධනය පිටරටවලට ඇදී යාම නතර කිරීම ගැනත් වැඩ පිළිවෙළක් සකස් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

දිය යුත්තේ ආණ්ඩුවෙනුයි. ඒවා ගැන සැලකිල්ලක් නොදක්වා රජයේ සේවය කරන එක් කොටසකට රුපියල් දහය විස්ස ආදී වශයෙන් සුළු දීමනාවක් ගෙවූ තරමින් ඔය ප්‍රශ්න විසඳන්නට බැහැ.

රජයේ සේවකයා ලබා සිටින ප්‍රවීණතාව අනුව ඔහුට ඉදිරියට යාමට අවස්ථාව සලසා දිය යුතුයි. එහෙම නොකර රුපියල් දහයක් හෝ විස්සක් ගෙවීමෙන් රජයේ සේවකයා සතුටට පත් කරන්නට බැහැ. එහෙම රවටන්නට උත්සාහ කිරීම ප්‍රයෝජනයක් වන දෙයක් නොවෙයි. මැලේරියා මර්දන ව්‍යාපාරයේ ඕවර්සියර්වරුන් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්‍ෂණයක් ඊයේ-පෙරේදා කුරුණෑගලදී පවත්වන්නට යෙදුණු බව මට ආරංචියි. දැන් මැලේරියාව නැවතත් වැඩි වේගෙන එනවා. මේ වතාවේ මැලේරියාව හැදුණොත් බොහොම භයානක තත්ත්වයක් ඇති වෙනවා, අද රටේ තියෙන මන්දපෝෂණය නිසා. අද ගම්වල සෞඛ්‍ය තත්ත්වය බොහොම තදින් පිරිහිලා. කෙසේ වෙතත් ඔය මැලේරියා ඕවර්සියර්වරුන් බඳවා ගැනීමේ පරීක්ෂණය සඳහා සිංහල ජ්‍යෂ්ඨ සමත් අය කම්කරු කාර්යාලවලින් පරීක්ෂණ සඳහා කැඳවා තිබෙනවා. එහෙත් සිංහල ජ්‍යෂ්ඨ සමත් ඒ අය සම්මුඛ පරීක්ෂණයට කැඳවා ප්‍රශ්න අසා තිබෙන්නෙ ඉංග්‍රීසියෙන්. ඔන්න, සිංහලට තැන දෙන හැටි. අද රජයේ සේවකයන් තුළ විශාල කලකිරීමක් තිබෙනවා. ඒ අය ඒ බව එළි කරන්නෙ නැහැ. එළි කළොත් උන්දැලා සුන්; තියෙන ටිකත් නැහැ. ඒ ඇයි? අද යුතුකම් ඉෂ්ට වන්නෙ නැහැ. මහන්සි වී සිංහල උගත් අයට අද උසස්වීම් වැහිල. සිංහල ඉගෙන ගත්තේ නැත කියා හිතුවක්කාරකමට සිටි උදවියට සිංහල උගත් අයට වඩා උසස් වීම් ලැබී තිබෙනවා. මේ සම්බන්ධව මට දැනගන්නට ලැබුණු කාරණයක් මම කියන්නම්.

නිකවැරටියේ තැපැල් කන්තෝරුවක තැපැල් ස්ථානාධිපතිවරයෙක් සිටියා. එතුමා ජ්‍යෂ්ඨතා ලේඛනයෙහි හතර වැනියා හෝ පස් වැනියා වී තිබෙනවා. එහෙත් මේ රජය බලයට ඇවිත් සිංහල ප්‍රවීණතාවය අවශ්‍ය නැත කිව්වට පස්සේ සිංහල ඉගෙනීම නිසා සිංහල පිළිබඳ දක්ෂතාවය නිසා ජ්‍යෂ්ඨතා ලේඛනයෙහි හතර වැනියා හෝ පස් වැනියා වී සිටි මේ තැනැත්තා අනූ වැනියා දක්වා පහත බැස තිබෙනවා. මේ විධියට සමහර තැන්වල ජ්‍යෂ්ඨතා ලේඛනවල උඩට ඇවිත් සිටි තැනැත්තන් බලාපොරොත්තු රහිතව හොඳටම පහත වැටී තිබෙනවා. එසේ සිදු වී තිබෙන බවට රජයේ සේවයේ යෙදී සිටින අය සාක්ෂි දරයි. රුපියල් 10 ක් හෝ 20 ක් දී ඒ අය සන්තෝෂ කරන්නට උත්සාහ කළාට ඒක කරන්නට බැහැ. ලැබෙන ආදායමින් යැපෙන්නට පුළුවන් වන විධියට භාණ්ඩවල මිළ අඩු කරන්නට ඕනෑ. භාණ්ඩවල මිළ අඩු නම් පඩිය අඩු කළත් කමක් නැහැ. ඒ නිසා ඉතා ඕනෑකමින් සිංහල ඉගෙන ගන්නා අයට උසස් වීමේ මාර්ග ඇති කරන හැටියට අප ඉල්ලා සිටිනවා. අද සමහර අය ලැස්තියි, කම්කරුවන් හැටියට හෝ රජයේ සේවයට බැඳෙන්න. සිංහල උගත්කම නිසා උසස් වීමට මාර්ගය සලස්වා ගන්නට පුළුවන්ය, ඒ නිසා එසේ බැඳෙන්නය කියා අප උපදෙස් දෙනවා. එහෙත් දැන් අප ඒ විධියට උපදෙස් දෙන්නේ කොහොමද? දැන් සිංහල උගත් අයට උසස් වීමේ අවස්ථා වැහිලා. කෙනකුගේ දක්ෂතාවය අනුව උසස් වන්නට බැහැ. වේදිකාවේ නම් සිංහලට තැන දෙනවා. නිදර්ශනයක් වශයෙන් මම පොලිස් සේවය ගැන කියන්නම්.

පසුගිය කාලවලදී උප පොලිස් පරීක්ෂකවරුන් වශයෙන් බඳවාගෙන තිබෙන්නේ කොහොමද කියා ලේඛන අරගෙන බලන්න. සිංහලයෙන්, ඉංග්‍රීසියෙන් ජ්‍යෂ්ඨය සමත් අය කොස්තාපල්වරුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හැටියට සේවයේ ඉන්නවා. ඒ අය කොස්තාපල්වරුන් වශයෙන් අවුරුදු ගණන් සේවය කර තිබෙනවා. ජ්‍යෙෂ්ඨය සමත් වී තිබෙනවාය කියා ඒ අයවත් සම්මුඛ පරීක්ෂණවලට කැඳෙව්වත් ඒ අයගෙන් කී දෙනකුද අරගෙන තිබෙන්නේ ? සියයට එක් කෙනකුවත් අරගෙන තිබෙනවා ද දන්නෙ නැහැ. උසස් විද්‍යාලවල ඉගෙන ගත්ත, උසස් පසුබිමක් ඇති, උසස් දෙමව්පියන්ගේ දරුවනුයි, අරගෙන තිබෙන්නේ. දෙමව්පියන් පොලිස් සේවයේ ඉන්න ඕනෑය කියනවා. එසේ නැත්නම් දෙමව්පියන්ගේ පසුබිම හොඳට තිබෙන්නට ඕනෑය කියනවා. ඒ අය ගැනීම ගැන අප විරුද්ධ නැහැ. එහෙත් සේවයේ සිටින සුදුසුකම් ඇති අයටත් සාධාරණ ලෙස සලකන්නට ඕනෑ. කව්රුත් මේ රටේ අයයි. ඒ අයට තැනක් දෙන්නට එපාය කියා අප කියන්නේ නැහැ. එහෙත් වැඩියෙන් තැන දෙන්නට ඕනෑ දුක් විඳින අයටයි; දක්ෂතාවය තියෙන අයටයි; ක්‍රියාකාරිත්වයෙන් සමර්ථකම පෙන්වා තිබෙන අයටයි. ඒ නිසා රුපියල් දහයක් දුන්නත්, රුපියල් විස්සක් දුන්නත් ආත්ම ගෞරවයක් තියෙන අය ඒක ඒ තරම් ලොකු දෙයක් හැටියට සලකන්නෙ නැහැ. ඒ නිසයි, මා මුලින්ම මට බස් රියේදී අසන්නට ලැබුණු දෙයක් කිව්වේ. දවසට ශත 33ක් දී අප සන්තෝෂ කරන්නට බලාපොරොත්තු වීම ලජ්ජා නැති වැඩක්ය කියා ප්‍රකාශ වුණා. ඒ මුදල නොවෙයි වුවමනා කරන්නේ. සේවාවේ සැනසීමක් ඒ අයට තියෙන්නට ඕනෑ. රජයේ සේවකයන් රජයට පක්ෂපාත වන්නට ඕනෑ. අප එය නැත කියන්නේ නැහැ. එහෙත් අද රජයේ සේවකයන් සියලු දෙනාම ඉන්නේ තවු වහගෙනයි. ඒ අය අද කිසි දෙයක් කරන්නේ නැහැ. අද ඔවුන් අයිතිවාසිකම් ඉල්ලන්නට ගියොත් සුන්. මේ ආණ්ඩුවේ උදවිය කථා කරන්නේ නම් ප්‍රජාතන්ත්‍රවාදය ගැනයි; නිදහස ගැනයි. මේ ආණ්ඩුවේ උදහසට ලක් වෙතැයි භයෙන් සමහරුන් රෙද්ද බැනියම ඇඳීම නතර කර තිබෙන බවත් මට ආරංචියි. රෙද්ද බැනියම ඇන්දොත් සිංහල පමණක් කාරයන්; එහෙම නැත්නම් ශ්‍රී ලංකා කාරයන්.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
(திரு. டென்சில் பெர்னாண்டோ)
(Mr. Denzil Fernando
රෙද්ද බැනියම දකුණු ඉන්දියාවේ ඇඳුමයි.

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)
මීගමුවේ ගරු මන්ත්‍රීතුමා තත්ත්වය පැහැදිලි කළා. ඒ අය හිතන හැටි එතුමාගේ කියමනෙන් පේනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
(திரு. ரீ. பி. தென்னக்கோன்)
(Mr. T. B. Tennekoon)
නොදන්න දේ කියනවාට වඩා නොකියා සිටිනවා නම් වඩා හොඳයි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)
(The Hon. N. H. A. M. Karunaratne)
කලිසම උඩරට ඇඳුම.

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)
සමාජ සේවා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ සමානාත්මතාව දැන් නම් හොඳට පේනවා. එතුමා කොස් පොලොස් කන අයගේ ඇඳුම, සාමාන්‍ය ජනතාවගේ ඇඳුම අහකට දමා දැන් රුපියල් හාර පන්සියයේ ඇඳුම ඇඳගෙනයි, මෙම ගරු සභාවට එන්නේ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)
(The Hon. N. H. A. M. Karunaratne)
රුපියල් එක්දහස් දෙසීයේ ඒවාත් අඳිනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)
කෝ සමානාත්මතාව ? කෝ වාම් ජීවිතය ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

තමුන්නාන්සේලා දකුණු ඉන්දියාවේ ඇඳුම අඳිනවා නම් අපට චීන ඇඳුම අඳින්නට බැරිද?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

රෙද්ද බැනියම අඳින්නන් අද අමුතු ජාතියක් හැටියට හංවඩු ගසාගෙන යන නිසා සමහරුන් ඒ ඇඳුම අයින් කොට දැන් කලිසම අඳින්නට පටන්ගෙන තිබෙනවා. රෙද්ද බැනියම ඇන්දොත් ස්ථාන මාරුවක් ලැබෙතැයිද, ශ්‍රී ලංකා කාරයන් හැටියට හංවඩු ගැසෙතැයිද ඇති භය නිසා සමහරුන් දැන් කලිසම අඳින්නට පටන්ගෙන තිබෙනවා. රෙද්ද බැනියම අඳින්නන්ට දැන් නොයෙකුත් අවහිරවලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

නියම උඩරට ඇඳුම කලිසම. උඩරට නිලමෙ ඇඳුම. [බාධා කිරීමක්.]

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

අපට වුවමනා කරන්නේ සමානාත්මතාවයි. රෙද්ද බැනියම ඇඳීමේ පරමාර්ථය සමානාත්මතාව පෙන්වීමයි. පහළ පන්තියේ උදවියට සැලකිල්ලක් වශයෙනුයි, රෙද්ද බැනියම අඳින්නේ. රෙද්ද බැනියම අඳින්නේ චාම් ජීවිතයක් සඳහායි. සමානාත්මතාව ඇති කරන්නේ නැතිව මේ රටේ ප්‍රශ්න විසඳන්නට බැහැ. සමානාත්මතාව නැත්නම් ක්‍රෝධය ඊෂ්‍යාව ඇති වෙනවා. සමහරුන් ඇඳුමෙන් උද්දච්ඡකම ඇති කරගන්න හදනවා. මාන්නය උද්ධච්ඡකම, ආඩම්බරය අහංකාරය පෙන්වන්නට සමහරුන් ඇඳුම් අඳිනවා. එහෙත් අපට වුවමනා කරන්නේ ඒ ගති නැතිකොට කාටත් සමානාත්මතාවක් දක්වීමවයි. හැම දෙනාම එක සමානයි ලෙසින් වීමටයි, අපට වුවමනා කරන්නේ. සමානාත්මතාව කොතරම් දුරට මේ රජයේ පරමාර්ථය වී තිබෙනවාදැයි ඔය විධියේ කථාවලින් අපට දැන ගන්නට පුළුවනි. කිසියම් දවසක සමාජ සේවා ඇමතිතුමාගේ ආදර්ශමත් ජීවිතය ගැන අපට කියන්නට පුළුවන් වේවි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

මුලදී කලිසම ගැහුවා. ඊට පස්සෙ රෙද්ද. දැන් ආයෙත් කලිසම.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

පොදු මහජනතාව වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් එන කොට ඇන්දේ රෙද්ද සහ බැනියමයි. අද එතුමා පොදු මහජනතාවගෙන් අයින් වී වෙනත් ඇඳුමක් අඳිනවා. බොහෝ මිළ වන ඇඳුම් අඳිනවා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

එකදස් දෙසියේ ඒවා අඳිනවා. ඊට වැඩි මිළ ඒවා තිබෙනවා නම් ඒත් ගන්නවා. අපේ තාත්තා හම්බ කර තිබෙනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

දැන් ජේනවා නේද තත්ත්වය? අපට වුවමනා කරන්නේ උස් තැන් කපා මිටි තැන් පුරවාලීමයි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

අප තමුන්නාන්සේ වගේ දුදුරු ඕය ළඟ උපවාස කරන්නේ නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

මගේ ජීවිතයේ ඉතාමත්ම ප්‍රීතිමත් කාලය ඇල්වතුර පොදක්වත් නැතිව දින හයක් තිස්සේ මහජනතාව වෙනුවෙන් කළ ඒ උපවාසයයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
පැරදිච්ච අමාරුව.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
පැරදුණේ නැහැ. කොහොමද පැරදුණේ? පැරදුණේ නැහැ. පරදින්න බය නම් අස් වී යන්නට ඕනෑ නැහැ. ප්‍රතිපත්ති උඩ අස් වුණා; ඒ ප්‍රතිපත්ති උඩ නැවත තරඟ කළා. අප අදත් ඉන්නේ ඒ ප්‍රතිපත්ති උඩ මයි. මහජනයා කැමති නම් ඡන්දය දී ඔවුන්ගේ නියෝජිතයා වශයෙන් අප පත් කරපුදෙන්; එහෙම නැත් නම් ගෙදර ඉන්නට වුණත් අපි ලැහැස්තියි: ප්‍රතිපත්ති නම් වෙනස් කරන්නේ නැහැ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
අපිත් නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ඒවා ගැන කථා කරන්න ඕනෑ නැහැ. ඒ සියල්ලක්ම ලක් වන්නේ අපේ මිත්‍ර සමාජ සේවා ඇමතිතුමාටයි. හැබැයි දූන් පිං පඩිත් කපලා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
තමුන්නාන්සෙගේද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
එක් අයකුට ලැබෙන්නෙ රුපියල් 9යි. දවසකට සත 30 යි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
රුපියල් 7.50ක් ලැබුණු අයට දැන් ලැබෙන්නේ රුපියල් 5යි. රුපියල් 5ක් ලැබුණු අයට ඇත්තෙම නැහැ.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)
එහෙනම් මිනිස්සු මැරිලා ඇති.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
මැරෙන නොමැරෙන එක වෙනම දෙයක්. මා මේ කියන්නේ ඔබතුමන්ලා ජාතික සංවර්ධනයේ තත්ත්වයයි.

මේ අයවැය කථාවේනුත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවේනුත්, අපේ රටේ අඳුරු යුගයක් ගැන සම්පූර්ණයෙන්ම පැහැදිලි කර තිබෙනවා. එය පැහැදිලි කිරීම ගැන ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා තුළ ඇති යම්කිසි ලක්ෂණයක් නිසා ඒ අඳුරු තත්ත්වය ගැන පැහැදිලි කර තිබෙනවා. කොතරම් හැංගුවත් ඒ තත්ත්වය එළියට ඇවිත් තිබෙනවා. නොකියා කියා තිබෙනවා. කොතරම් වහන්නට හැදුවත් එය එළිදරව් වී තිබෙනවා. මෑතක ඇති නොවුණු අඳුරු තත්ත්වයක් ගැන මේ අයවැය කථාවෙන් එළිදරව් වී තිබෙනවා. අපට වුවමනා කළේ රටටත් මහජනතාවටත් ඒ තත්ත්වය පැහැදිලි කර දීමටයි. ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් මේ රටේ බලය අරගෙන අවුරුදු 3 ක් තිස්සේ ප්‍රජාතන්ත්‍රවාදයටත්, සිංහල කමටත්, ජාතික ගතිපැවතුම්වලටත්, සිරිත් විරිත්වලටත් පයින් ගසා නැවත වරක් ඉංගිරිසි සිරිත් විරිත් ගති පැවතුම් ඇති කර අපේ සාමාන්‍ය මහජනතාව පාගා රුපියල් 1,200 ක් එක ඇඳුම් කට්ටලයට වියදම් කරන්නට ලැහැස්ති වන අතලොස්සක් පමණ වූ පිරිසකට පමණක් සේවය සැලසීමට මේ අයවැය ලේඛනයෙන් සූදානම් වීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ගැන අපේ බලවත් විරෝධය ප්‍රකාශ කර මින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

ඒවාට වියදම් කරන්නේ අපේ පෞද්ගලික සල්ලි.

**එකල්හි වේලාව අ. භා. 8.30 වූයෙන් කටයුතු අත් සිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1967 අගෝස්තු 8 වන අඟහරුවාදා පවත්වනු ලැබේ.**

*அப்போது பி. ப. 8.30 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது.*

1967 ஓகஸ்ட் 8 ஆம் தேதி செவ்வாய்க்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

*It being 8.30* P.M., *Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Tuesday, 8th August, 1967.*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**එකල්හි වේලාව අ. භා. 8.31 වූයෙන්, කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.**

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 8.31ට, 1967 ජූලි 25 වන දින සභා සම්මතිය අනුව, 1967 අගෝස්තු 8 වන අඟහරුවාදා පූ. භා. 10 තෙක් කල් ගියේ ය.

*அப்போது பி. ப. 8.31 மணியாகிவிடவே குழுக்களின் உப அக்கிராசனர் வினா விடுக்காமலேயே சபையை ஒத்திவைத்தார்.*

*அதன்படி, சபை அதனது 1967 ஜூலை 25 ஆம் தேதிய தீர்மானத்திற்கிணங்க 1967 ஓகஸ்ட் 8, செவ்வாய்க்கிழமை மு. ப. 10 மணி வரை ஒத்திவைக்கப் பெற்றது.*

*And it being 8.31* P.M., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned the House without Question put.*

*Adjourned accordingly until 10* A.M. *on Tuesday, 8th August, 1967, pursuant to the Resolution of the House of 25th July 1967.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩක්. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org